
# චිත්‍ර කලාව

12 ගුරු මාර්ගෝපදේශය

(2017 සිට ක්‍රියාත්මක වේ)

12 ශ්‍රේණිය



සෞන්දර්ය අධ්‍යයන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# චිත්‍ර කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 12 වන ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

**මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

චිත්‍ර කලාව
12 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : සැන්වින් (පුද්ගලික) සමාගම
අංක 35/3, කැරගල පාර, හැලුම්මහර, දෙල්ගොඩ

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි, යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය

සමාජ ප්‍රගමනයෙහිලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර, ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ උසස්පෙළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශය මුද්‍රණය කර බෙදාහැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මේම ගුරු මාර්ගෝපදේශය, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සඳ් කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**අයි.එම්.කේ.බී. ඉලංගසිංහ,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2017.04.02

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **අධීක්ෂණය** | : | එස්. වර්ණසිංහ - අධ්‍යක්ෂ (වැ.ආ.) (සෞ.අ.දෙ) |
| **විෂය සම්බන්ධීකරණය** | : | එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා -<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>රවීන්ද්‍ර තේනුවර මයා, කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**විෂය විශේෂඥ උපදෙස් :**

| | | |
|---|---|---|
| මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය රම්‍යවර්ධන පොඩිනිලමේ | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය මංගලිකා ජයතුංග | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ටී. සනාතනන් | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය උපාලි රංජිත් රණවක | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය :**

| | | |
|---|---|---|
| එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ඥානසිරි බී. ගමගේ මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| රවීන්ද්‍ර තේනුවර මයා | - | කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| චමරි තපස්වරගේ මිය | - | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| මනෝරා ප්‍රේමතිලක මිය | - | සහකාර කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**බාහිර සම්පත් දායකත්වය :**

| | | |
|---|---|---|
| එච්. ඒ සංජීවි මංජරී මිය | - | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |
| ජේ. ඒ. වජිර නලින්ද ජයතිලක මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| ප්‍රසන්න රණබාහු මයා | - | කථිකාචාර්ය, පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ |
| ශ්‍රීමතී ඒකනායක මිය | - | කථිකාචාර්ය (බාහිර), කැලණිය විශ්වවිද්‍යාලය |
| එච්. එම්. එස්. පී. එච්. බණ්ඩාර මයා | - | චිත්‍ර කලා ආචාර්ය, ශාන්ත සිල්වෙස්තර විද්‍යාලය, මහනුවර |
| දීප්ත ශ්‍රී උදයංග මයා | - | චිත්‍ර කලා ආචාර්ය, රාජකීය විද්‍යාලය, මොණරාගල |
| කේ. එම්. ඒ. අනුපමා බණ්ඩාර මිය | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | ශ්‍රීනාත් ගණේවත්ත මයා |
| **පරිගණක යතුරු ලියනය,<br>ඡායාරූප පිටු සැකසුම හා<br>පිටකවර නිර්මාණය** | : | රවීන්ද්‍ර තේනුවර මයා, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **විවිධ සහාය** | : | දීපා ශිරෝමණී මෙය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ප්‍රේමරත්න පෙරේරා මයා,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

වර්ෂ 2015 ආරම්භ වී ක්‍රියාත්මක වන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වාදෙනු ලබන 12 ශ්‍රේණිය විෂය නිර්දේශය පදනම් කරගෙන සම්පාදනය කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය වර්ෂ 2017 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ය. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙය ඔබ අතට පත් කෙරේ. මෙම පොත පරිශීලනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය.

- පාසලේ වාර්ෂික වැඩ සැලසුමට අනුකූල වන සේ චිත්‍ර කලාව විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කාලය කළමනාකරණය කරගන්න.

- සමබර පුද්ගල පෞරුෂ සංවර්ධනය පදනම් කරගෙන ගොඩනඟා ඇති නිපුණතා 07කින් මෙම ගුරු මාර්ගෝපදේශයේ විෂය අන්තර්ගතය සමන්විත වේ. ඒවා සියල්ල ම අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීම අපේෂිත ය.

- විෂය අන්තර්ගතයෙහි 1.0 සිට 5.0 දක්වා වන ප්‍රායෝගික නිපුණතාවන්හි නිපුණතා මට්ටම් සඳහා ආදර්ශ ක්‍රියාකාරකමක් පමණක් ඇතුළත් කර ඇත. එම නිපුණතා මට්ටම්වලට අදාළ ව යෝජනා කර ඇති මාතෘකා හෝ සුදුසු වෙනත් මාතෘකා පදනම් කරගෙන අනෙකුත් ක්‍රියාකාරකම් නිර්මාණය කරගන්න. යෝජිත මෙන් ම සම්පාදනය කර ගන්නා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.

  - සෞන්දර්ය හෝ වෙනත් විෂය සමෝධානිත රසවත් ඉදිරිපත් කිරීම් මඟින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාගෙන සිසුන් පාඩමට ඇදබැඳ ගැනීම හා පෙර දැනුම විමසීමට පොලඹවා ගැනීම ඔස්සේ ක්‍රියාකාරකමට පිවිසීම.
  - සිසුන්ගේ ශක්‍යතා හඳුනා ගෙන යෝජනා කර ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද මෙන් ම ඔබ විසින් අනුගමනය කරනු ලබන වෙනත් නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රම භාවිත කර, ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබාදෙමින් ක්‍රියාකාරකම අවසානයක් කරා ගෙනයෑමෙන් අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ළඟා වීම.
  - ඉදිරිපත් කිරීම්, ඇගයීම්, සමාලෝචනය, පසු වැඩ පැවරීම, ඇතුළත් ව සමස්ත පාඩම නිමා කිරීම.

- නිපුණතා අංක 6.0 හා 7.0හි සියලු ම නිපුණතා මට්ටම්වලට අදාළ විෂය කරුණු ඇතුළත් ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. සෑම ක්‍රියාකාරකමකට ම අයත් විෂය කරුණු සාරාංශ ගත ව දක්වා ඇත. එම කරුණු පදනම් කර ගනිමින් විෂය කොටස් ප්‍රමාණවත් පරිදි විස්තරාත්මක ව ඉගැන්වීම ඔබ විසින් කළ යුතු වේ.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්වලට පසු ව 6.0 හා 7.0 නිපුණතාවල අන්තර්ගත විෂය කරුණුවලට අදාළ සියලු ම ඡායාරූප සහ රූප සටහන් ඉදිරිපත් කර ඇත. සිසුන්ට විෂය කරුණු ඉගැන්වීමේ දී ඒවා සුදුසු පරිදි භාවිතයට ගැනීම වඩාත් ඵලදායක වනු ඇත.

- ගුරු මාර්ගෝපදේශය මඟ පෙන්වීමක් පමණි. ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති විෂයබද්ධ ග්‍රන්ථ මෙන් ම අන්තර්ජාලය, පුවත් පත්, සඟරා වැනි වෙනත් අධ්‍යාපනික මාධ්‍ය හා ඉගෙනුම් ද්‍රව්‍ය පරිශීලනය කිරීමෙන් ගුරුවරයාත් ශිෂ්‍යයාත් දැනුමෙන් හා අවබෝධයෙන් සන්නද්ධ වීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- නිර්මාණශීලී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා සරල මඟ පෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය චිත්‍ර කලා විෂය ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීමේ කාර්ය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවායි පතමු.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iii |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxxviii |
| ක්‍රියාකාරකම් වාරවලට බෙදා දැක්වීම | xxxix-xliv |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 169 |
| ඡායාරූප එකතුව | 171 - 306 |
| අතිරේක කියවීම් සඳහා ග්‍රන්ථ නාමාවලිය | 307 - 309 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# 1.0 හැඳින්වීම

සෞන්දර්ය විෂය අතර චිත්‍ර කලාව, පුද්ගල රස වින්දන ශක්තිය දියුණු කිරීමෙහි ලා බෙහෙවින් උපකාර වන්නකි. දෘශ්‍ය කලාව යටතේ වර්ගීකරණය වන චිත්‍ර කලාව පාසල් සෞන්දර්ය විෂයමාලාවෙහි කැපී පෙනෙන විෂයයකි. එය පාසල් ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී පෞරුෂ වර්ධනයක් ඇති කිරීමට දායකත්වය සපයයි. නිපුණතා පාදක ව සැකසුණු චිත්‍ර කලාව විෂය නිර්දේශයෙහි න්‍යායික මෙන් ම ප්‍රායෝගික විෂය කරුණු තුලනාත්මක ව අධ්‍යයනයට යොමු කිරීමෙන් එම කාර්යය වඩාත් සාධනීය ව ඉටු කර ගැනීමට අවකාශ සලසා ඇත.

2015 සිට 6 වන ශ්‍රේණියෙන් ආරම්භ වී ක්‍රියාත්මක වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ  යටතේ 2017 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ, 12 සහ 13 ශ්‍රේණි සඳහා චිත්‍ර කලාව නව විෂය නිර්දේශය හඳුන්වා දෙනු ලැබේ. දැනුම, ආකල්ප, කුසලතා, හා පරිපූර්ණ ජීවිත අත්දැකීම් දූයේ දරුවන්ට උදාකර දෙනු වස් නිර්දිෂ්ට නිපුණතා හතකින් මෙම විෂය නිර්දේශය සමන්විත ව ඇත. ඒ සඳහා ප්‍රායෝගික විෂය ක්ෂේත්‍ර ඇතුළත් නිපුණතා පහක් සහ කලා රසාස්වාදය හා කලා ඉතිහාසය ආවරණය කරන නිපුණතා දෙකක් අන්තර්ගත ය. පාසල් සිසුන්ගේ නිර්මාණශීලී චින්තනය, ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කලාත්මක මානයන් ඔස්සේ එළි දක්වමින් ඔවුන් තුළ ඉවසීම, සංයමය, චිත්තවේග පාලනය හා සහයෝගිතාව වැනි ප්‍රබල පෞරුෂ ගුණාංග සංවර්ධනයට දායක වන පරිදි චිත්‍ර කලා ප්‍රායෝගික විෂය කොටස් ඇතුළත් නිපුණතා හා නිපුණතා මට්ටම් පෙළ ගස්වා ඇත. විචාරශීලී ව, තාර්කික ව හා සමබර මනසකින් යුතු ව නිර්මාණ ඇගයීමට හා රස වින්දනයටත් ඒ ඇසුරෙන් ලබන දැනුම ස්වයං නිර්මාණකරණය සඳහා පාදක කර ගැනීමටත් අවශ්‍ය පරිකල්පන ශක්තිය නංවාලීම පිණිස කලා ඉතිහාසයට හා රසවින්දනයට අදාළ නිපුණතා හා නිපුණතා මට්ටම් අධ්‍යයනය සඳහා අවස්ථා සලසා ඇත.

සෑම නිපුණතා හා නිපුණතා මට්ටමකට ම අදාළ ඉගෙනුම් පල විෂය නිර්දේශයෙහි අන්තර්ගත ය. එමඟින් විෂය පිළිබඳ ව සිසුන්  සාක්ෂාත් කළ යුතු සාධන මට්ටම් කල්තියා අවබෝධ කර ගැනීමට ගුරුවරයාට හැකියාව ලැබේ. ඉගෙනුම් පල පිළිබඳ සැලකිලිමත් වීම ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමටත් විධිමත් ව තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියේ නිරත වීමටත් පහසුවක් වනු ඇත.

එක් එක් නිපුණතා යටතේ ඉදිරිපත් කර ඇති විෂය සන්ධාරය ක්‍රමික ව පෙළ ගස්වා ඇත.  කලා ඉතිහාසයට සහ රසාස්වාදයට අදාළ විෂය සන්ධාරය පෙළ ගැස්වීමේ දී නිපුණතා හා ඊට අදාළ මට්ටම් සාධනයට අදාළ විෂය කරුණු පමණක් ම තෝරා ගැනීමට සැලකිලිමත් ව ඇත. එහි දී ශ්‍රී ලංකා, ඉන්දීය හා යුරෝපීය කලා ඉතිහාසයෙන් තෝරාගත් විෂය සන්ධාරයක් ඇසුරෙන් චිත්‍ර කලාවේ විවිධ දිශානතීන් පිළිබඳ ව අධ්‍යයනයට අවස්ථාව උදා වේ.

මෙම විෂය නිර්දේශය හැදෑරීමෙන් චිත්‍ර කලාවෙහි විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ මූලික අවබෝධයක්  හා ඉදිරි අධ්‍යයන කාර්ය සඳහා නිවැරදි මඟ පෙන්වීමක් සිසුන්ට ලැබෙනු  ඇත. එමෙන් ම පුද්ගල ජීවිතයට අත්‍යවශ්‍ය සෞන්දර්ය රස වින්දනය සඳහා මනා අවබෝධයක් හා ජීවිතයේ විවිධ අභියෝග හමුවේ නිරවුල් ශුභවාදී තීරණ හා තීන්දු නිර්මාණශීලී ප්‍රවේශ ඔස්සේ ලබා ගැනීමට අවැසි මානසික සූදානම ඇති කිරීමට ද මෙය උපකාරී වේ. නූතන වැඩ ලෝකයට අත්‍යවශ්‍ය ප්‍රායෝගික කුසලතා හා එහි විවිධ මාන පිළිබඳ ව දැනුම්වත් කරවීමෙන් අනාගත අභියෝග පහසුවෙන් ජය ගැනීමට මාර්ගෝපදේශ සැපයේ. අනාගත ලෝකයේ භාරකරුවන් වන පාසල් සිසුන් යහපත් චර්යාවන්ගෙන් සපිරි නිර්මාණශීලී පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අපේක්ෂණය ඉටු කර ගැනීම සඳහා මෙම විෂය නිර්දේශය ගුරුභවතුන්හට මහෝපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

## 2.0 ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම, ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා උපයෝගී කර ගැනීම



**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, තීන්ද්‍ර, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV)** **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



**(V)** **ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI)** **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII)** **''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## 4.0 චිත්‍ර කලා විෂය අරමුණු

1. **පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය** - පරිසරයේ සියලු සංසිද්ධීන් මිනිස් ජීවිත හා බැඳී පවතී. සොබාදහමේ අපූර්ව චමත්කාරය හා එහි අපූර්ව රිද්මය පුද්ගලයා තුළ ඇති කරන ආස්වාදජනක අද්දැකීම් කලා කෘති බිහිකිරීමෙහි ලා අවැසි පරිකල්පන ශක්තිය පුබුදුවාලයි. එහෙයින් සොබාදහමේ සෞන්දර්යාත්මක අත්දැකීම් හා වටිනාකම් නිර්මාණශීලී ප්‍රවේශ ඔස්සේ සිසුන් වෙත ළඟා කර දෙමින් ඔවුන්ගේ රසවින්දන ශක්තිය වර්ධනය කරලීම මෙමඟින් අපේක්ෂිත ය.

2. **නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය** - තරගකාරී ජීවන පැවැත්මෙහි දී මුහුණ දෙන විවිධ ගැටලු හා අභියෝග හමුවේ නොසැලෙමින් නිර්මාණශීලී විසඳුම් හා ප්‍රවේශ වෙත ළඟා වීමට අවශ්‍ය චින්තන ශක්තිය වර්ධනයටත්, කලාව හා සම්බන්ධ පෞද්ගලික හා සමාජ අපේක්ෂණ සන්තෘප්ත කරලීම උදෙසා නිර්මාණශීලී කලා නිමැවුම් උත්පාදනයට අවශ්‍ය කුසලතා සංවර්ධනයත්, මෙමඟින් අපේක්ෂා කෙරේ.

3. **ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය** - කාර්යක්ෂමතාව, අන්‍යෝන්‍ය සුහදතාව, එකිනෙකා පිළිබඳ ගෞරවනීය හැඟීමෙන් කටයුතු කිරීම ඵලදායී ජීවිතයක කැපී පෙනෙන අංගයෝ ය. එපමණක් නොව කලාත්මක මාන ඔස්සේ තම ආකල්ප හා කුසලතා සංවර්ධනය ජීවිතයේ සුබිතවත් බව කෙරෙහි ඉවහල් වේ. ඒ සඳහා මඟ පෙන්වීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

4. **දේශීය හා විදේශීය කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම** - දේශීය මෙන් ම විදේශීය චිත්‍ර කලා විෂය ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් හා ඒ ඇසුරෙන් ලබන නිපුණතා ස්වයං නිර්මාණකරණයේ දී සුභාවිත කිරීමෙහි ලා අවශ්‍ය කුසලතා දියුණු කරලීමත්, දේශීය සංස්කෘතික විවිධත්වය හඳුනා ගැනීමටත්, විශ්ව කලා නිර්මාණවල ඇසුර ලබමින් තම කලාත්මක ඥානය සංවර්ධනයටත්, අවශ්‍ය විෂයානුබද්ධ නිපුණතා ළඟා කර දීම.

5. **විචාර ශක්තිය වර්ධනය** - බහුවිධ මාධ්‍ය ඔස්සේ මුණ ගැසෙන චිත්‍ර කලාව හා සම්බන්ධ, ගුණාත්මක බවින් ඉහළ අගයක් ගන්නා නිර්මාණ තෝරා ගැනීමටත්, ඒවා විචාරාත්මක ව රසවින්දනයටත්, අවශ්‍ය කුසලතා සංවර්ධනය.

6. **අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය** - අනාගත වැඩ ලෝකය බෙහෙවින් අභියෝගාත්මක ය. ඒවා ජය ගත හැක්කේ නිරවුල් හා නිර්මාණශීලී මනසකින් යුත් සමබර පුද්ගල පෞරුෂයන්ට පමණි. කලාත්මක චින්තනයෙන් තම අනාගත ඉලක්ක වෙත නොසැලී මුහුණ දිය හැකි සුසමාහිත පෞරුෂයෙන් යුත් අනාගත පරපුරක් ඇති කරලීම මෙම අරමුණෙන් බලාපොරොත්තු වේ.

## 5.0 ජාතික පොදු අරමුණු සහ චිත්‍ර කලාව විෂය අරමුණු අතර සම්බන්ධතා දැක්වීම

| චිත්‍ර කලාව විෂයයේ අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. පරිසරය ඇසුරින් වින්දන ශක්තිය වර්ධනය | | | ✓ | ✓ | ✓ | | | |
| 2. නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය | | | ✓ | | ✓ | | | |
| 3. ඵලදායි දිවි පැවැත්මකට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය | | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ |
| 4. දේශීය හා විදේශීය කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනා ගැනීම හා අගය කිරීම | ✓ | ✓ | | | | | | ✓ |
| 5. විචාර ශක්තිය වර්ධනය | | | | | ✓ | | ✓ | |
| 6. අනාගත වැඩ ලෝකයේ අභියෝගවලට මුහුණ දිය හැකි ධාරිතාවලින් සමන්විත සමබර පෞරුෂ වර්ධනය | | ✓ | | | ✓ | | ✓ | |

## 6.0 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය, ඉගෙනුම් පල සහ කාලච්ඡේද

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.** | 1.1 රේඛා භාවිතයෙන් මානව හා සත්ත්ව රූප අඳියි. | • රේඛා මගින් අධ්‍යයනය<br>- මානව ඉරියව්<br>- සත්ත්ව ඉරියව්<br>• වර්ණ භාවිතය | • රේඛා හා වර්ණ භාවිතයේ ශක්‍යතා හඳුනාගෙන විවිධ මානව හා සත්ත්ව රූපවල දළ සටහන් අඳියි. | 45 |
| | 1.2 ස්වභාවරූපී සංරචන ක්‍රම භාවිතයෙන් ස්වාභාවික සහ නිර්මිත පරිසරය චිත්‍රණය කරයි. | • මානව සහ සත්ත්ව රූප<br>• වෘක්ෂලතා<br>• නිර්මිත වස්තු<br>• හැඟීම් ප්‍රකාශනය<br>• විවිධ සමාජ සංසිද්ධි<br>• සංරචන සිද්ධාන්ත භාවිතය<br>- සම්පිණ්ඩනය<br>- පර්යාවලෝකය<br>- පරිමාණය සහ පරිමාව<br>- ත්‍රිමාණ ලක්ෂණ<br>- සමබරතාව<br>• විවිධ වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම<br>- කොලාජ්<br>- පෝස්ටර් සායම්<br>- දියසායම් (දියර ක්‍රමය/ඝන ක්‍රමය)<br>- පැස්ටල්<br>- ඇක්‍රලික්<br>• විවිධ ශෛලීන්<br>• ශිල්පීය ලක්ෂණ | • රේඛාව හැසිරවීමේ ප්‍රාගුණ්‍ය ප්‍රදර්ශනය කරමින් විවිධ තේමාවලට අදාළ දළ සටහන් අඳියි. | |
| | 1.3 ස්වභාවරූපී නොවන සංරචන ක්‍රම භාවිතයෙන් ස්වාභාවික සහ නිර්මිත පරිසර චිත්‍රණය කරයි. | | • ස්වාභාවික හා නිර්මිත පරිසරය ආශ්‍රිත තේමා ස්වභාවරූපී ව හා ස්වභාවරූපී නොවන ලෙස සංරචනය කරයි.<br>• චිත්‍ර සංරචන මූලිකාංග හා සිද්ධාන්ත නිවැරදි ව භාවිත කරයි.<br>• විවිධ වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම නිවැරදි ව හසුරුවමින් චිත්‍ර සංරචනය කරයි.<br>• චිත්‍ර සංරචනය කිරීමේ දී ස්වාධීන ශිල්පීය ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් නිර්මාණකරණයේ නිරත වෙයි.<br>• පරිසරය පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **2.0 පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.** | 2.1 විවිධ ස්වාභාවික හා නිර්මිත වස්තු වෙන් වෙන් ව අධ්‍යයනය කර දළ සටහන් අඳියි.<br><br>2.2 ස්වාභාවික හා නිර්මිත වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි. | • රේඛා මඟින් අධ්‍යයනය<br>• ස්වාභාවික හා නිර්මිත වස්තු<br>- විවිධ ජ්‍යාමිතික හැඩ සහිත වස්තු<br>- ශාක කොටස්<br>• රේඛාවේ විවිධතා<br>• ත්‍රිමාණ ලක්ෂණ හා එළිය අඳුර<br>• විවිධ වර්ණ මාධ්‍ය භාවිතය<br><br>• තලය භාවිතය<br>• ඇස් මට්ටම<br>• සංරචනය කිරීමේ මූලික සිද්ධාන්ත<br>- පරිමාණය හා පරිමාව<br>- පර්යාවලෝකය<br>- ත්‍රිමාණ ලක්ෂණ හා එළිය අඳුර<br>- සමබරතාව<br>• මතුපිට ස්වභාවය (වයනය)<br>• වර්ණ භාවිතය හා ශිල්ප ක්‍රම<br>- දියසායම්<br>- පැස්ටල්<br>- ඇක්‍රලික්<br>- මිශ්‍ර මාධ්‍ය<br>• ශිල්පීය ලක්ෂණ | • වස්තුවල සහ ශාක කොටස්වල ස්වභාවය හොඳින් නිරීක්ෂණය කරමින් දළ සටහන් අඳියි.<br>• රේඛා භාවිතයේ විවිධතා අනුගමනය කරමින් වස්තුවල සහ ශාක කොටස්වල ත්‍රිමාණ ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරයි.<br>• අදාළ සිද්ධාන්ත හා මූලධර්ම නිවැරදි ව අනුගමනය කරමින් තලයට ගැළපෙන සේ ද්‍රව්‍ය සමූහය අඳියි.<br>• විවිධ වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම නිසි ලෙස යොදා ගනිමින් ද්‍රව්‍යවල ත්‍රිමාණ ලක්ෂණ, එළිය අඳුර හා ගති ස්වභාවය මතුවන සේ වර්ණ ගන්වයි.<br>• ද්‍රව්‍ය සම්පිණ්ඩනයට උචිත පරිදි පසුබිම වර්ණ කරයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **3.0 පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.** | 3.1 විවිධ බඳුන් සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි. | • පාරිභාරික/ව්‍යාවහාරික අවශ්‍යතා<br>• පරිසර අධ්‍යයනය<br>• සැලසුම් සංකල්ප<br>• අලංකරණයට තබන විවිධ බඳුන්<br>- ඓතිහාසික<br>- සමකාලීන (දේශීය/විදේශීය)<br>• දළ සටහන්<br>• විවිධ හැඩ ආශ්‍රිත නිර්මාණ<br>- සත්ත්ව හැඩ<br>- ශාක හැඩ<br>• සැලසුම<br>• සැලසුම් මූලධර්ම<br>- රිද්මය<br>- සමබරතාව<br>- සුසංගත බව<br>- ඒකත්වය<br>• සැලසුම් චිත්‍ර<br>• ත්‍රිමාණ කෘති<br>• ආකෘති නිර්මාණය<br>• මාධ්‍ය භාවිතය<br>- සිමෙන්ති<br>- කඩදාසි පල්ප<br>• වර්ණ හා ශිල්ප ක්‍රම භාවිතය<br>• අධ්‍යයන සටහන්/වාර්තා සැකසීම | • පරිසර අධ්‍යයනයෙන් භාණ්ඩ හා සැරසිලි සඳහා සැලසුම් සංකල්ප නිර්මාණය කරයි.<br>• උචිත ක්‍රමවේද භාවිත කරමින් මාධ්‍ය සකස් කරයි.<br>• නිර්මාණයේ ගුණාත්මක බව වැඩි දියුණු වන සේ උපකරණ හැසිරවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• අධ්‍යයන කාර්යයක් පිළිබඳ විධිමත් ව තොරතුරු එක් රැස් කර වාර්තාවක් සකස් කරයි.<br>• අනාගත වැඩ ලෝකයට සරිලන ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්මාණකරණයේ නිරත වෙයි.<br>• සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණ අගය කරයි. | 45 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 ගෘහයන්හි ස්ථාවර අංග සඳහා නව නිර්මාණ කරයි. | • පාරිභාරික/ව්‍යාවහාරික අවශ්‍යතා<br>• සැලසුම් සංකල්ප<br>• වා කවුළු<br>- ඓතිහාසික<br>- වර්තමාන<br>• දළ සැලසුම්<br>• විවිධ හැඩ<br>• සැලසුම් මූලධර්ම<br>- රිද්මය<br>- සමබරතාව<br>- සුසංගත බව<br>- ඒකත්වය<br>• ත්‍රිමාණ චිත්‍ර<br>• වයනීය ලක්ෂණ<br>• වර්ණ භාවිතය<br>• අධ්‍යයන සටහන්/වාර්තා සැකසීම | • විවිධ මූලාශ්‍රය භාවිතයෙන් වා කවුළු කැටයම් පිළිබඳ තොරතුරු ගවේෂණය කර නිර්මාණකරණයට අවශ්‍ය දත්ත රැස් කරයි.<br><br>• වා කවුළු කැටයමක ඇතුළත් විය යුතු ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් සැලසුම් මූලධර්මවලට අනුව දළ සැලසුම් අඳියි.<br><br>• අවසන් නිර්මාණය සඳහා භාවිත කරන මාධ්‍යයේ ගති ස්වභාවය මතුවන සේ සැලසුම් චිත්‍රය ත්‍රිමාණ රූපී ව වර්ණ ගන්වයි.<br><br>• නිර්මාණ කාර්යයට උචිත ශිල්ප ක්‍රම නිවැරදි ව භාවිත කරයි.<br><br>• ගුණාත්මක නිමැවුමක් සඳහා සංයමයෙන් යුතු ව අනුපිළිවෙළින් කාර්යයක නිරත වෙයි.<br><br>• නිර්මාණ කාර්යයක් පිළිබඳ ක්‍රමානුකූල ව සටහන් තබා ගනිමින් වාර්තාවක් සකස් කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 විවිධ අවශ්‍යතා සඳහා සැරසිලි චිත්‍ර නිර්මාණය කරයි. | • පාරිභාරික/ව්‍යාවහාරික අවශ්‍යතා<br>• විවිධ සැරසිලි<br>- ව්‍යාප්ත සැරසිලි<br>- මුළුතල සැරසිලි<br>- වාටි සැරසිලි<br>• කර්මාන්තයට සුදුසු බව<br>• දළ සටහන්<br>• විවිධ හැඩ<br>• සැරසිලි ඒකක<br>• නැවත නැවත යෙදීම<br>• රටා<br>• ප්‍රමාණ<br>• සැලසුම් මූලධර්ම<br>- රිද්මය<br>- සමබරතාව<br>- සුසංගත බව<br>- ඒකත්වය<br>• නව නිර්මාණ<br>• වර්ණ භාවිතය<br>• ශිල්ප ක්‍රම<br>• නිමාව | • විවිධ සැරසිලිවල ලක්ෂණ නිදසුන් සපයමින් ප්‍රකාශ කරයි.<br>• අදාළ මූලිකාංග හා මූලධර්ම මත පිහිටා සැරසිලි නිර්මාණකරණයේ නිරත වෙයි.<br>• පාරිභාරික අවශ්‍යතා හා කර්මාන්තයට සුදුසු බව කෙරෙහි සැලකිලිමත් වෙමින් නිර්මාණාත්මක සැරසිලි අඳියි.<br>• උචිත වර්ණ හා විවිධ ශිල්ප ක්‍රම භාවිතයෙන් සැරසිලි වර්ණ ගන්වයි.<br>• පරීක්ෂාකාරී ව, පිරිසිදු ව හා ඉවසීමෙන් කාර්යයක් අවසන් කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | 4.1 පෘථුල තේමා යටතේ පෝස්ටර් නිර්මාණය කරයි. | • අවශ්‍යතාව<br>• සැලසුම<br>• තලය හා අවකාශ භාවිතය<br>• මුද්‍රණයට යෝග්‍ය බව<br>• සන්නිවේදනාර්ථ<br>• නිර්මාණාත්මක අක්ෂර<br>• සංකේත චිත්‍ර<br>• වර්ණ හා ශිල්ප ක්‍රම භාවිතය | • තේමාව මැනවින් සන්නිවේදනය කළ හැකි සංකේත රූප ඇසුරෙන් පෝස්ටර් නිර්මාණ සඳහා දළ සැලසුම් අඳියි.<br>• තලය හා අවකාශය පිළිබඳ අවබෝධයෙන් සංකේත රූප හා අක්ෂර ස්ථාන ගත කර පෝස්ටර් චිත්‍ර සැලසුම් කරයි.<br>• තේමාවට හා සැලසුමට අනුව අක්ෂර රටා හා ප්‍රමාණ භාවිත කරයි.<br>• සන්නිවේදනාර්ථ මතු කෙරෙන සේ වර්ණ භාවිතයෙන් නිර්මාණකරණයේ යෙදෙයි.<br>• පෝස්ටර් චිත්‍ර නිර්මාණයට උචිත ලෙස වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | 45 |
| | 4.2 විවිධ නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි. | • වාණිජමය අවශ්‍යතා<br>• සන්නිවේදනාර්ථ<br>• රේඛා හා හැඩතල භාවිතය<br>• වර්ණ හා ශිල්ප ක්‍රම<br>• අක්ෂරකරණය<br>- අක්ෂර රටා<br>- අක්ෂර ප්‍රමාණ<br>• විවිධ ග්‍රැෆික් නිර්මාණ<br>- ලේබල් - ලාංඡන<br>- දවටන - දැන්වීම්<br>- සුබ පැතුම් පත් | • ග්‍රැෆික් නිර්මාණයේ වාණිජමය අවශ්‍යතාවට උචිත රූප හා හැඩ භාවිතයෙන් දළ සැලසුම් අඳියි.<br>• සුදුසු අක්ෂර රටා හා ප්‍රමාණ, රූප සමඟ ගළපමින් තලය හා අවකාශයට උචිත පරිදි සම්පිණ්ඩනය කරයි.<br>• නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය වඩාත් තීව්‍රවන සේ වර්ණ හා ශිල්ප ක්‍රම භාවිත කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.3 තෝරාගත් පරිගණක මෘදුකාංග ඇසුරෙන් ග්‍රැෆික් නිර්මාණ කරයි. | • පරිගණක මෘදුකාංග<br>- Gimshop<br>- Inkscape<br>- Photoshop<br>- Illustrator<br>- Paint<br>- PowerPoint<br>• විවිධ ග්‍රැෆික් නිර්මාණ<br>- පෝස්ටර්<br>- ලාංඡන<br>- සුබ පැතුම් හා ආරාධනා පත්<br>- සංඥා නාම<br>- පොත් පිටකවර<br>• වාණිජමය අවශ්‍යතා<br>• දෘශ්‍ය රූප<br>• අක්ෂර<br>• වර්ණ<br>• සන්නිවේදනාර්ථ<br>• මුද්‍රණයට යෝග්‍ය බව | • විවිධ ග්‍රැෆික් නිර්මාණවල සන්නිවේදනාර්ථ හඳුනාගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.<br>• ග්‍රැෆික් නිර්මාණකරණයට අදාළ පරිගණක මෘදුකාංග භාවිතයේ හැකියා ප්‍රදර්ශනය කරයි.<br>• වාණිජමය අවශ්‍යතාවලට සරිලන පරිදි ග්‍රැෆික් නිර්මාණකරණයේ යෙදෙයි.<br>• මුද්‍රණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් භාවයෙන් යුතු ව පරිගණක ග්‍රැෆික් නිර්මාණ සැලසුම් කරයි.<br>• පරිගණක තාක්ෂණික ශිල්ප ක්‍රම හා ශිල්පීය හැකියා සංකලනයෙන් ග්‍රැෆික් නිර්මාණකරණයේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | |
| | 4.4 විශේෂාංග ලිපි හා ළමා කතන්දර පොත්වල ඇතුළු පිටු සඳහා සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි. | • විශේෂාංග ලිපි<br>• ළමා කතන්දර<br>• දළ සටහන්<br>• රේඛා<br>• හැඩතල<br>• වර්ණ භාවිතය හා ශිල්ප ක්‍රම<br>• සන්නිවේදනාර්ථ<br>• අන්තර්ගතයට යෝග්‍ය බව<br>• මුද්‍රණ කාර්යයට සරිලන ප්‍රමාණ<br>• ශිල්පීය ලක්ෂණ | • අන්තර්ගතය හා ප්‍රමාණ පිළිබඳ සැලකිලිමත් වෙමින් රේඛා හා හැඩතල හසුරුවමින් දළ සටහන් අඳියි.<br>• උචිත වර්ණ හා ශිල්ප ක්‍රම භාවිතයෙන් සන්නිදර්ශන චිත්‍ර වර්ණ ගන්වයි.<br>• ස්වාධීන ශිල්පීය ලක්ෂණ නිර්මාණ කාර්යයේ දී ප්‍රශස්ත ලෙස භාවිත කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.** | 5.1 තෝරා ගත් තේමාවකට අනුව ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් උන්නත කැටයමක් නිර්මාණය කරයි. | • තේමාවට අදාළ දළ සටහන්<br>• ශිල්ප ක්‍රමයට උචිත සැලසුම<br>• මාධ්‍ය භාවිතය<br>- සිමෙන්ති<br>• ශිල්ප ක්‍රම භාවිතය<br>• ශිල්පීය ලක්ෂණ<br>• වයනය<br>• වර්ණ භාවිතය<br>• සම්පිණ්ඩනය<br>• නිර්මාණාත්මක බව | • ඇඹීමේ ශිල්ප ක්‍රමය පිළිබඳ අවබෝධයෙන් උන්නත කැටයමක් සඳහා දළ සටහන් අඳියි.<br>• තේමා ප්‍රකාශනයට වඩාත් උචිත හැඩතල සම්පිණ්ඩනය කරයි.<br>• මාධ්‍ය සකස් කිරීමේ හා හැසිරවීමේ නිවැරදි ක්‍රමවේද භාවිත කරයි.<br>• ඇඹීමේ ශිල්ප ක්‍රමය ප්‍රශස්ත ලෙස භාවිතයෙන් නිර්මාණකරණයේ නිරත වෙයි.<br>• කැටයම අවසන් කිරීමේ දී අභිමත වයනීය ලක්ෂණ මතු කර දක්වයි.<br>• උපකරණ හැසිරවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• සැලසුම් සහගත ව අනුපිළිවෙළින් කාර්යයක නිරත වෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 මිශ්‍ර මාධ්‍ය භාවිතයෙන් උද්‍යාන මූර්තියක් නිර්මාණය කරයි. | • දළ සටහන්<br>• ශිල්ප ක්‍රමයට උචිත සැලසුම<br>• විවිධ මාධ්‍ය භාවිතය<br>• ශිල්ප ක්‍රම භාවිතය<br>• ත්‍රිමාණරූපී බව<br>• ශිල්පීය ලක්ෂණ<br>• වර්ණ භාවිතය<br>• සම්පිණ්ඩනය<br>• නිර්මාණාත්මක බව | • උද්‍යාන මූර්තියක් සඳහා උචිත ස්ථානයක් හා අවකාශයක් තෝරා ගනියි.<br>• විවිධ මාධ්‍ය භාවිතයෙන් උද්‍යාන මූර්තියක් ගොඩනැගීම සඳහා දළ සටහන් අඳියි.<br>• මාධ්‍යවල අනන්‍යතා ලක්ෂණවලට අනුව උචිත ශිල්ප ක්‍රම භාවිත කරමින් නිර්මාණකරණයේ නිරත වෙයි.<br>• සුදුසු වර්ණ හා වර්ණ ගැන්වීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් ත්‍රිමාණරූපී බව පිළිබඳ සැලකිලිමත් වෙමින් වර්ණ ගන්වයි.<br>• නිවැරදි ව උපකරණ භාවිතය පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• තම නිර්මාණශීලී හැකියා සාමූහික කටයුතු වෙනුවෙන් දායක කරයි.<br>• ආරම්භයේ සිට අවසානය තෙක් සංයමයෙන් යුතු ව නිර්මාණ කාර්යයක නිරත වෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි. | 6.1 දෘශ්‍ය කලාව හා එහි මූලිකාංග සහ මූලධර්ම අධ්‍යයනය කරයි. | • දෘශ්‍ය කලාව හැඳින්වීම<br>• දෘශ්‍ය කලා මූලිකාංග<br>- වර්ණ<br>- රේඛා<br>- හැඩ<br>- අවකාශය<br>- වයනය<br>- ආකෘතිය<br>• දෘශ්‍ය කලා මූලධර්ම<br>- සමබරතාව<br>- රිද්මය<br>- ඒකීයත්වය හා විවිධත්වය<br>- සුසංයෝගය<br>- පර්යාවලෝකය<br>- පරිමාණ<br>- ත්‍රිමාණ ලක්ෂණ<br>• දෘශ්‍ය කලාවේ විවිධ කලා ව්‍යාපාර, කලා ශෛලීන් සහ සංකල්ප<br>- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදය<br>- යථාර්ථවාදය<br>- උපස්ථිතිවාදය<br>- ඝනිකවාදය<br>- අධියථාර්ථවාදය<br>- අලංකාරවාදය<br>- පෙරදිගවාදය | • දෘශ්‍ය කලාවේ වපසරිය සහ එහි බහුවිධ ශාඛා හඳුනා ගෙන විස්තර කරයි.<br>• දෘශ්‍ය කලා මූලිකාංග හා මූලධර්ම වර්ගීකරණය කරයි.<br>• කලා කෘතියක ප්‍රකාශනය සඳහා දෘශ්‍ය කලා මූලිකාංග හා මූලධර්මවල වැදගත්කම හා දායකත්වය විස්තර කරයි.<br>• දෘශ්‍ය කලාවේ ශෛලීය විවිධත්වය හා අදහස් ගවේෂණය කරයි.<br>• විවිධ කලා ශෛලීන්හි දෘශ්‍ය කලා මූලිකාංග හා මූලධර්ම භාවිතයේ ඇති වෙනස්කම් පැහැදිලි කරයි. | 40 |
| | 6.2 තෝරාගත් දේශීය කලාකරුවන්ගේ නිර්මාණ රසාස්වාදනය කරයි. | • ඒ. සී. ජී. එස්. අමරසේකර<br>- යකැදුරාගේ දියණිය<br>- වඩුගෙදර/රැකියා නැත්තෝ | • තෝරා ගත් ශ්‍රී ලාංකේය කලා ශිල්පී නියැදියක නිර්මාණ පසුබිම් හා බහුවිධ (ආගමික/ආගමික නොවන) කලා ප්‍රවේශ විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • ඩේවිඩ් පේන්ටර්<br>- ජෙරුසෙලමට විජයග්‍රාහී ව ඇතුළු වීම<br>- යහපත් සමරිතානුවා<br>• ජේ. ඩී. ඒ. පෙරේරා<br>- නළඟන(චන්ද්‍රලේඛා/ලෝරෙත්)<br>- සීතා ද සේරම්ගේ ආලේඛ්‍ය චිත්‍රය<br>• එම්. සාර්ලිස්<br>- මහාමායා දේවියගේ සිහිනය<br>- සරණ මංගල්‍යය<br>• සෝලියස් මැන්දිස්<br>**කැලණි විහාරයේ බිතු සිතුවම්**<br>- බුදු රජාණන් වහන්සේ මහියංගණයට වැඩම කිරීම<br>- ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීම<br>• සෝමබන්දු විද්‍යාපති<br>**බෙල්ලන්විල විහාරයේ බිතු සිතුවම්**<br>- සරණ මංගල්‍යය<br>- මාර පරාජය<br>• නාරායණ ස්වාමි<br>**වැල්වැටිතුරේ මුත්තු අම්මාන් කෝවිලේ බිතු සිතුවම්**<br>- සුර සම්හාරම්<br>- අසංකාසුර සම්හාරම් | • ශ්‍රී ලාංකේය දෘශ්‍ය කලාව කෙරෙහි අපරදිග හා පෙරදිග කලා සම්ප්‍රදායවල බලපෑම පැහැදිලි කරයි.<br><br>• ශ්‍රී ලාංකේය කලා ශිල්පීන්ගේ තෝරා ගත් නිර්මාණ එකතුවක් විචාරාත්මක ව රසවින්දනය කරයි. | |
| | 6.3 ඉන්දියානු කලාකරුවන්ගේ කලා කෘති අධ්‍යයනය කරයි. | • රාජා රවි වර්මා<br>- සරස්වතී<br>- ඉන්ද්‍රජිත්ගේ ජයග්‍රහණය<br>• අබනීන්ද්‍රනාත් තාගෝර්<br>- භාරත මාතා<br>- අශෝක දේවිය සහ බෝධිය<br>• නන්දලාල් බෝස්<br>- ශිව වස බීම<br>- රාධාගේ විරහව | • යටත්විජිතකරණය සහ පෙරදිග වාදය ඉන්දීය දෘශ්‍ය කලාවට බලපාන ලද ආකාරය විස්තර කරයි.<br><br>• ඉන්දීය නවජීවන කලා ව්‍යාපාරයේ ලක්ෂණ එහි පුරෝගාමී කලා ශිල්පීන්ගේ නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.4 යුරෝපීය පුනර්ජීවන යුගයේ කලාකරුවන්ගේ කලා කෘති අධ්‍යයනය කරයි. | • ලියොනාඩෝ ඩාවින්චි (Leonardo da Vinci)<br>- මොනාලිසා (Mona Lisa)<br>- අවසාන භෝජන සංග්‍රහය (The Last Supper)<br>- පර්වත මස්තකයේ දේව මෑණියෝ/ගිරි අරණෙහි කන්‍යා මරිය තුමිය (Vergin of the Rocks)<br>• මයිකල් ආන්ජිලෝ (Michelangilo)<br>- සිස්ටයින් දෙව්මැදුරේ චිත්‍ර (Paintings in the Systine Chapel)<br>- අවසාන විනිශ්චය (Last Judgement)<br>- ආදම් මැවීම (Creation of Adam)<br>- පියෙටා ප්‍රතිමාව (Pieta)<br>- ඩේවිඩ් ප්‍රතිමාව (David)<br>- මෝසස් ප්‍රතිමාව (Moses)<br>• රෆායල් සන්සියෝ (Raphael Sanzio)<br>- ඇතන්ස් ගුරුකුලය (School of Athens)<br>- පර්නාසිස් (Parnassus)<br>- ඇල්බා මැඩෝනා (Alba Madona) | • ඇන්ග්ලෝ-ඉන්දියානු සහ නවජීවන ව්‍යාපාරයේ නිර්මාණ අතර ශෛලීය, වස්තු විෂය, ශිල්ප ක්‍රමවල වෙනස්කම් විශ්ලේෂණය කරයි.<br>• යුරෝපීය පුනරුදයේ කලා නිර්මාණ සඳහා පදනම් වූ සමාජ සන්දර්භය විස්තර කරයි.<br>• පුනරුදය යුගයේ කලාවේ ලක්ෂණ සහ සම්භාව්‍යවාදී රීතීන්හි භාවිතය පිළිබඳ තෝරා ගත් කලාකරුවන් නියැදියක් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• අපරදිග කලා ශිල්පීන්ගේ නිර්මාණ විචාරාත්මක ව රසවින්දනය කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි. | **උපස්ථිතිවාදීහු (Impressionists)**<br>• ක්ලෝඩ් මොනේ (ClaudeMonet)<br>- හිරු උදාවඃ ධාරණාවක් (Sunrise;Impression)<br>- වෝටර් ලිලී හා ජපන් පාලම (Water Lilies and the Japanese Bridge)<br>- රොවුන් දේවස්ථානය (පූර්ණ හිරු එළිය (Rouen Cathedral; Full Sunlight)<br>• එඩ්ගා ඩෙගා (Edgar Degas)<br>- නැටුම් පන්තිය (The Dance Class)<br>- නාන බේසම (The Tub)<br>- හිස පීරන ස්ත්‍රිය (Woman Combing Her Hair)<br>• මේරි කසාට් (Mary Cassat)<br>- නිල් කාමරය (The Blue Room)<br>- හිස සකසන ගැහැනු ළමයා (Girl Arranging her Hair)<br>- ස්නානය (The Bath) | • උපස්ථිතිවාදී කලාවේ මූලික ලක්ෂණ සහ උපස්ථිතිවාදී කලාව සඳහා පදනම් වූ පසුබිම පැහැදිලි කරයි.<br><br>• උපස්ථිතිවාදී කලා නිර්මාණවල ශිල්ප ක්‍රම, වස්තු විෂය හා ශෛලිය යන ලක්ෂණ විස්තර කරයි. | |
| | | **පශ්චාත් උපස්ථිතිවාදීහු (Post-Impressionists)**<br>• වින්සන්ට් වැන්ගෝ (Vincent Van Gogh)<br>- අර්තාපල් බුදින්නෝ (The Potato Eaters)<br>- තරු පිරි රැය(The Starry Night)<br>- පුටුව (Vincent's Chair) | • පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන් විසින් සිදු කරන ලද නිර්මාණාත්මක වෙනස්කම් හා අත්හදාබැලීම්, දෘශ්‍ය කලාවේ නූතනවාදී ප්‍රවේශ කෙරෙහි ඇති කළ බලපෑම විමර්ශනය කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • පෝල් ගොගැන් (Paul Gauguin)<br>- කහ පැහැති ක්‍රිස්තුන් ස්වහන්සේ (The Yellow Christ)<br>- දෙවියන්ගේ දිනය (The Day of the God)<br>- අප එන්නේ කොහි සිට ද?, අපි කවුරු ද?, අප යන්නේ කොහේට ද? (Where do we come from? What are we? Where are we going?)<br>• පෝල් සෙසාන් (Paul Cezanne)<br>- කාඩ් සෙල්ලම් කරන්නෝ (The Card Players)<br>- ඇපල් වට්ටිය - (The Basket of Apple)<br>- භූමි දර්ශන : ඉරිතැළුණු බිත්ති සහිත නිවස (The House with the Cracked Walls) | | |
| | 6.6 යුරෝපීය ඝනිකවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි. | • පැබ්ලෝ පිකාසෝ (Pablo Picasso)<br>- අවිග්නොන්හි යුවතියෝ (The Maids of Avignon /Les Demoiselles d' Avignon)<br>- ගුවර්නිකා (Guernica)<br>- වැලපෙන කත (The Weeping Woman) | • ඝනිකවාදී කලා ව්‍යාපාරයේ මූලික ලක්ෂණ සහ ඝනිකවාදය නූතන කලාව සම්බන්ධයෙන් කළ බලපෑම විග්‍රහ කරයි.<br><br>• ඝනිකවාදී නිර්මාණ විචාරාත්මක ව රසවින්දනය කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • ජෝර්ජස් බ්‍රාක් (Georges Braque)<br>- නිවාස සහ ගස් (Houses and Trees)<br>- මිනිසා සහ ගිටාරය (Man with a Guitar)<br>- පාදම සහිත මේසය (Pedestal Table) | | |
| 7.0 දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. | 7.1 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිත්තම් අධ්‍යයනය කරයි. | • ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම්<br>- තන්තිරිමලේ<br>- දොරවක්කන්ද/දොරවක<br>- බිල්ලෑව<br>- වෙට්ටම්බුගල | • ශ්‍රී ලංකාවේ තෝරාගත් ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම්වල වස්තු විෂය, සංකේත භාවිතය, ශිල්ප ක්‍රම හා ප්‍රකාශන ස්වරූප විස්තර කරයි. | 70 |
| | 7.2 යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිත්තම් අධ්‍යයනය කරයි. | • යුරෝපා ප්‍රාග් ඓතිහාසික ගුහා සිත්තම්<br>- ලැස්කෝ (Lascaux -France)<br>- අල්ටමීරා (Altamira-Spain)<br>- චෝවේ/ෂොවේ (Chauvet-France)<br>- ෆොන්ඩ් ගෝම් (Font de Gaume - France) | • යුරෝපීය ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම්වල වස්තු විෂය, සංකල්ප, ශෛලිය, ශිල්ප ක්‍රම හා ප්‍රකාශන ස්වරූප විස්තර කරයි. | |
| | 7.3 ශ්‍රී ලංකාවේ ස්තූපය හා ඒ ආශ්‍රිත වාස්තු විද්‍යා නිර්මාණ අංග අධ්‍යයනය කරයි. | • ස්තූපයේ ප්‍රභවය හා විකාශය<br>• ස්තූප ආකෘති<br>• ස්තූප අංග<br>• ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්තූප<br>- ථූපාරාමය<br>- රුවන්වැලි මහා සෑය<br>- අභයගිරිය<br>- ජේතවනාරාමය<br>- රන්කොත් වෙහෙර | • ශ්‍රී ලංකාවේ ස්තූප කලාවේ ප්‍රභවය හා එහි විකාශය පැහැදිලි කරයි.<br>• ස්තූප ආකෘති පිළිබඳ විස්තර කරයි.<br>• අනුරාධපුර සහ පොලොන්නරු යුගවල තෝරාගත් ස්තූපවල ආකෘති, වාස්තු විද්‍යා අංග විස්තරාත්මක ව පැහැදිලි කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | - කිරි වෙහෙර<br>- හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ ස්තූපය | • ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්තූප නිර්මාණවල කලාත්මක අගය රසවින්දනය කරයි. | |
| | 7.4 ශ්‍රී ලංකාවේ තෝරාගත් ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි. | • ශ්‍රී ලංකාවේ තෝරාගත් ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ<br>- ආසනඝර<br>- බෝධිඝර<br>- පධානඝර<br>- උපෝසථඝර<br>- ජන්තාඝර | • ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණවල අරමුණු, සංකල්ප හා කලාත්මක ලක්ෂණ විග්‍රහ කරයි.<br>• ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණවල ශිල්ප ක්‍රම, මාධ්‍ය භාවිතය හා උපයෝගීතාව විස්තර කරයි. | |
| | 7.5 ස්තූපය හා වෙනත් ඓතිහාසික ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය කරයි. | • වාහල්කඩ<br>• සඳකඩපහණ<br>• මුරගල<br>• කොරවක්ගල<br>• පියගැටපෙළ<br>• පුන්කලස් | • ස්තූපය හා ඓතිහාසික ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණවල ප්‍රභවය, විකාශය, ආකෘති හා කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි. | |
| | 7.6 අනුරාධපුර හා පොලොන්නරු යුගවල වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි. | • තිවංක පිළිම ගෙය<br>• ථූපාරාම පිළිම ගෙය<br>• ලංකාතිලක පිළිම ගෙය<br>• ශිව දේවාලයය අංක 01<br>• ශිව දේවාලයය අංක 02<br>• වෛජයන්ති ප්‍රාසාදය<br>• නිශ්ශංක ලතා මණ්ඩපය<br>• පොලොන්නරු වටදාගෙය<br>• තිරියාය වටදා ගෙය<br>• මැදිරිගිරිය වටදා ගෙය<br>• පොකුණු | • අනුරාධපුර සහ පොලොන්නරු යුගවලට අයත් වාස්තු විද්‍යා නිර්මාණ සඳහා පදනම් වූ අරමුණු, ආගමික හා විදේශීය බලපෑම විමර්ශනය කරයි.<br>• අනුරාධපුර සහ පොලොන්නරු යුගවලට අයත් වාස්තු විද්‍යා නිර්මාණවල සැලසුම්කරණය, තාක්ෂණය, මාධ්‍ය භාවිතය, ශිල්පක්‍රම හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.7 ඉසුරුමුණි විහාරය ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය කරයි. | • පෙම් යුවළ කැටයම<br>• මිනිසා සහ අශ්ව හිස කැටයම<br>• රජ පවුල කැටයම<br>• ජල ක්‍රීඩා කරන ඇතුන් දක්වෙන කැටයම් | • ඉසුරුමුණි කැටයම්වලට පාදක වූ වස්තු විෂය හා ඒ පිළිබඳ ඇති මතවාද විමර්ශනය කරයි.<br>• ඉසුරුමුණි කැටයම්වල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම, කලාත්මක ලක්ෂණ හා ඒ සඳහා බලපෑ ආභාසය විස්තර කරයි. | |
| | 7.8 අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරයි. | • බුදු පිළිමයේ ප්‍රභවය<br>• මහඉළුප්පල්ලමේ හිටි පිළිමය<br>• සමාධි බුද්ධ ප්‍රතිමාව (මහමෙවුනා උයන)<br>• තොළුවිල බුද්ධ ප්‍රතිමාව<br>• පන්කුලිය බුද්ධ ප්‍රතිමාව<br>• අවුකන හිටි පිළිමය | • ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවය හා විකාශය විමර්ශනය කරයි.<br>• අනුරාධපුර යුගයේ තෝරා ගත් බුද්ධ ප්‍රතිමාවල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම, කලාත්මක ලක්ෂණ හා බලපාන ලද ආභාසය විස්තර කරයි. | |
| | 7.9 පොලොන්නරු, ගම්පොළ සහ මහනුවර යුගවල විවිධ ප්‍රතිමා නිර්මාණ අධ්‍යයනය කරයි. | • පොලොන්නරු යුගයේ ප්‍රතිමා<br>- ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා<br>- වට දා ගේ බුද්ධ ප්‍රතිමා<br>- පොත්ගුල් විහාර ප්‍රතිමාව<br>• ගම්පොළ සහ මහනුවර යුගයේ ප්‍රතිමා<br>- ගඩලාදෙණි බුද්ධ ප්‍රතිමාව<br>- ලංකාතිලක බුද්ධ ප්‍රතිමාව<br>- දඹුලු බුද්ධ ප්‍රතිමා | • පොලොන්නරු, ගම්පොළ සහ මහනුවර යුගවල බුද්ධ ප්‍රතිමාවල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම, කලාත්මක ලක්ෂණ විස්තර කරයි.<br>• පොත්ගුල් විහාර ප්‍රතිමාවේ ශිල්ප ක්‍රම, මාධ්‍ය භාවිතය, කලාත්මක ලක්ෂණ හා ඒ පිළිබඳ ඇති මතවාද සාකච්ඡා කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.10 ශ්‍රී ලංකාවේ ලෝහ කලා නිර්මාණ අධ්‍යයනය කරයි. | • අර්ධනාරී නටේශ්වර<br>• අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාව<br>• තාරාදේවි<br>• දැදිගම කොටවෙහෙර ඇත් පහන<br>• නටරාජ<br>• ශිව සෝමස්කන්ධ මූර්ති | • ශ්‍රී ලංකාවේ තෝරාගත් ලෝහ ප්‍රතිමාවල වස්තු විෂය, ශිල්ප ක්‍රම, ආගමික පසුබිම හා කලාත්මක ලක්ෂණ විමර්ශනය කරයි.<br><br>• අනුරාධපුර සහ පොලොන්නරු යුගවල ලෝහ නිර්මාණ සඳහා බලපෑ විදේශීය ආභාසය සාකච්ඡා කරයි. | |
| | 7.11 ශ්‍රී ලංකාවේ ඓතිහාසික චිත්‍ර කලාව අධ්‍යයනය කරයි. | • අනුරාධපුර යුගයට අයත් සිතුවම්<br>- සීගිරිය<br>- හිඳගල<br>- ගොනාගොල්ල<br>- මහියංගණ ධාතු ගර්භය<br><br>• පොලොන්නරු යුගයේ සිතුවම්<br>- තිවංක පිළිම ගෙය<br>- විද්‍යාධර ගුහාව<br>- දිඹුලාගල මාරාවීදිය<br><br>• මහනුවර සම්ප්‍රදායයේ සිතුවම්<br>• උඩරට ශෛලිය<br>- දෙගල්දොරුව<br>- මැදවල ටැම්පිට විහාරය<br>- දඹුල්ල ලෙන් විහාරය<br>• පහතරට ශෛලිය<br>- කතළුවේ පූර්වාරාමය<br>- මුල්කිරිගල විහාරය<br>- කරගම්පිටිය සුබෝධාරාමය<br>- තෙල්වත්ත විහාරය | • ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිතුවම් කලාව කෙරෙහි බල පෑ ආගමික හා ලෞකික පසුබිම විශ්ලේෂණාත්මක ව පැහැදිලි කරයි.<br><br>• අනුරාධපුර හා පොලොන්නරු යුගවල සිතුවම්හි මාධ්‍ය භාවිතය, තාක්ෂණය, ශිල්ප ක්‍රම, ශෛලිය හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි.<br><br>• මහනුවර සම්ප්‍රදායයේ සිතුවම්වල ශෛලිය, වස්තු විෂය, ශිල්ප ක්‍රම, තාක්ෂණය හා කලාත්මක ලක්ෂණ විමර්ශනය කරයි.<br><br>• මහනුවර සම්ප්‍රදායයේ සිතුවම්වල උඩරට හා පහතරට ශෛලිය වෙනස්කම් සඳහා බල පෑ සාධක හා ආභාසය විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.12 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණ අධ්‍යයනය කරයි. | • වාස්තු විද්‍යා නිර්මාණ<br>- ඇතුළු නගරය<br>- පිටත නගරය<br><br>• මූර්ති<br>- කවන්ධ රූප<br>- නළඟන රුව<br>- තාපස රුව<br>- මවු දෙවඟන<br>• මුද්‍රා<br>- යෝගාසන දේව රූපය (පශුපති)<br>- රුක් දෙවියෝ (දෙවියා ශ්‍රාවකයන් සහ එළුවා)<br>- ව්‍යාඝ්‍රයන්/කොටියන් දෙදෙනෙකු සමග සටන් කරන මිනිසා | • ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වාස්තුවිද්‍යා නිර්මාණවල සුවිශේෂතා විස්තර කරයි.<br><br>• ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මූර්ති නිර්මාණවල වස්තු විෂය, මාධ්‍ය භාවිතය, ශිල්පක්‍රම හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි.<br><br>• ඉන්දු නිම්න මුද්‍රාවල තාක්ෂණය, සංකල්ප, ශිල්ප ක්‍රම, මාධ්‍ය භාවිතය හා කලාත්මක ලක්ෂණ පිළිබඳ තොරතුරු විවරණය කරයි. | |
| | 7.13 ඉන්දීය මෞර්ය කලා කෘති අධ්‍යයනය කරයි. | • සාංචි ස්තූපය<br>• අශෝක ස්තම්භ<br>- ලෞරියා නන්දන්ගර් ස්තම්භය<br>- සාරානාත් ස්තම්භ ශීර්ෂය<br>- රාම්පූර්වා ස්තම්භ ශීර්ෂය | • බෞද්ධ ස්තූප කලාවේ ආරම්භක ලක්ෂණ සාංචි ස්තූපය ඇසුරෙන් විමර්ශනය කරයි.<br><br>• සාංචි ස්තූපයේ වාස්තු විද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි.<br><br>• අශෝක ස්තම්භ හා ශීර්ෂ නිර්මාණවල වස්තු විෂය, මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම සහ කලාත්මක ලක්ෂණ සාකච්ඡා කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.14 ඉන්දීය සාතවාහන හා ශුංග යුගවලටට අයත් කලා නිර්මාණ අධ්‍යයනය කරයි. | • සාංචි තොරණ කැටයම්<br>• භාරුත් ගල්වැට කැටයම් | • ඉන්දීය සාංචි හා භාරුත් කැටයම්වල වස්තු විෂය කෙරෙහි ස්වදේශීය ආගමික සංකල්පවල බලපෑම විශ්ලේෂණය කරයි.<br>• ඉන්දීය සාංචි හා භාරුත් කැටයම්වල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම, නිර්මාණ ආකෘති හා කලාත්මක ලක්ෂණ සංසන්දනාත්මක ව විස්තර කරයි. | |
| | 7.15 ඉන්දීය ගන්ධාර හා මථුරා සම්ප්‍රදායවල කලා කෘති අධ්‍යයනය කරයි. | • ගන්ධාර සම්ප්‍රදායයේ කලා කෘති<br>- කණිෂ්ක රජුගේ කාසිය<br>- හෝර්ට් මන්දාර් බුදු පිළිමය<br>- බ්‍රෙගම් පිළිමය<br>- තක්තිබහීර් පිළිමය<br>- සහරි බහ්ලොල් පිළිමය<br>- දුෂ්කර ක්‍රියාව පිළිමය<br>• මථුරා සම්ප්‍රදායේ කලා කෘති<br>- කත්‍රා බුදු පිළිමය<br>- කණිෂ්ක රුව | • ඉන්දීය බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවය හා විකාශය විශ්ලේෂණය කරයි.<br>• ඉන්දීය ගන්ධාර හා මථුරා සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කෙරෙහි දේශීය හා විදේශීය සංස්කෘතික බලපෑම තර්කානුකූල ව විස්තර කරයි.<br>• ඉන්දීය ගන්ධාර හා මථුරා සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණවල මාධ්‍ය භාවිතය, භාව ප්‍රකාශනය, ශිල්ප ක්‍රම සහ කලාත්මක ලක්ෂණ විග්‍රහ කරයි. | |
| | 7.16 ඉන්දීය අමරාවතී සම්ප්‍රදායයේ කලා කෘති අධ්‍යයනය කරයි. | • අමරාවතී කැටයම්<br>- රහල් කුමරු දායාද ඉල්ලීම<br>- මහාමායා සිහිනය<br>- අභිනිෂ්ක්‍රමණය<br>- නාලාගිරි දමනය<br>• අමරාවතී කැටයම්වල දැක්වෙන බුද්ධ ප්‍රතිමා | • අමරාවතී සම්ප්‍රදායයේ චෛත්‍ය පුවරු හා ගල් වැට කැටයම්වල වස්තු විෂය, මාධ්‍ය භාවිතය, ශෛලිය, ශිල්පක්‍රම අවකාශ භාවිතය හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි.<br>• අමරාවතී සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමාවල කලාත්මක ලක්ෂණ විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.17 ඉන්දීය ගුප්ත සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරයි. | • මථුරා හිටි බුදු පිළිමය<br>• සාරානාත් හිඳි බුදු පිළිමය | • ඉන්දීය ගුප්ත සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණ සඳහා දේශීය ප්‍රතිමා සම්ප්‍රදායවල බලපෑම විශ්ලේෂණය කරයි.<br>• ගුප්ත සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමාවල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම, භාව ප්‍රකාශනය හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි. | |
| | 7.18 ඉන්දීය ලෙන් චිත්‍ර අධ්‍යයනය කරයි. | • අජන්තා චිත්‍ර<br>- පද්මපාණී බෝසත් රුව<br>- අප්සරා රුව<br>- මරණාසන්න කුමරිය<br>- කුලුනට හේත්තු වූ කුමරිය<br>- සිංහලාවදානය<br>- බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම<br>- ඡද්දන්ත ජාතකය | • ඉන්දීය අජන්තා චිත්‍රවල වස්තු විෂය හා තේමා භාවිතය පිළිබඳ විශ්ලේෂණය කරයි.<br>• අජන්තා චිත්‍රවල ශිල්ප ක්‍රම, ශෛලිය, සංරචනය, භාව ප්‍රකාශනය හා කලාත්මක ලක්ෂණ විග්‍රහ කරයි. | |
| | 7.19 ඊජිප්තියානු (මිසර) වාස්තුවිද්‍යාත්මක නිර්මාණ අධ්‍යයනය කරයි. | • කුෆු (චියොප්ස්) පිරමීඩය (Pyramid of Khufu /Cheops)<br>• කාෆ්රේ පිරමීඩය (Pyramid of Khafre)<br>• අබුසිම්බල් දේවස්ථානය (Temple of Abu Simbel)<br>• ලුක්සෝර් දේවස්ථානය (Temple of Luxor) | • ඊජිප්තියානු වාස්තුවිද්‍යාවට පදනම් වූ ඇදහිලි, සංකල්ප, වාස්තුවිද්‍යා ක්‍රමවේද, තාක්ෂණය හා ශිල්ප ක්‍රම විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.20 ඊජිප්තියානු (මිසර) මූර්ති හා කැටයම් නිර්මාණ අධ්‍යයනය කරයි. | • නර්මේර්/නාමර් ඵලකය (Pallet of King Narmer)<br>• මෙන්කුරේ රජු සහ ඔහුගේ බිරිය (King Menkaure and his wife, queen Khamererenebty)<br>• ස්ක්‍රයිබ් ප්‍රතිමාව (The Seated Scribe)<br>• නෙෆර්ටිටි උඩුකය මූර්තිය (The Bust of Nefertiti) | • ඊජිප්තියානු මූර්ති හා කැටයම් කලාවේ වස්තු විෂය, ශෛලීය ලක්ෂණ, ශිල්ප ක්‍රම, උපයෝගීතාව, තොරාගත් නිර්මාණ එකතුවක් ඇසුරෙන් පැහැදිලි කරයි. | |
| | 7.21 ඊජිප්තියානු (මිසර) චිත්‍ර අධ්‍යයනය කරයි. | • කුරුලු දඩයම (Fawling Scene)<br>• මීඩම්හි පාත්තයෝ (Geese of Meidum)<br>• නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ (Musicians and Dancers) | • ඊජිප්තියානු චිත්‍ර කලාවේ වස්තු විෂය, ශෛලීය ලක්ෂණ, ශිල්ප ක්‍රම, තෝරාගත් නිර්මාණ එකතුවක් ඇසුරෙන් පැහැදිලි කරයි. | |
| | 7.22 ග්‍රීක වාස්තු විද්‍යාත්මක නිර්මාණ අධ්‍යයනය කරයි. | • පාතිනොන් දේවස්ථානය (The Parthenon Temple) | • පාතිනොන් දේවස්ථානයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ, අලංකරණාංග සහ ආගමික අවකාශයක් ලෙස භාවිතය විස්තර කරයි. | |
| | | • ග්‍රීක ස්තම්භ (Greek Columns)<br>- ඩොරික් (Doric)<br>- අයොනික් (Ionic)<br>- කොරින්තියන් (Corinthian) | • ග්‍රීක වාස්තුවිද්‍යාවේ ඇති ස්තම්භ වර්ගීකරණය කර ඒවායේ ඇති නිර්මාණාත්මක ලක්ෂණ සංසන්දනාත්මක ව පැහැදිලි කරයි. | |
| | 7.23 ග්‍රීක මැටි බඳුන් අධ්‍යයනය කරයි. | • මැටි බඳුන් (Greek Pottery)<br>- කාල වර්ණ රූප මැටි බඳුන් (Black figure pottery)<br>- රක්ත වර්ණ රූප මැටි බඳුන් (Red figure pottery) | • ග්‍රීක මැටි බඳුන් කලාවේ තාක්ෂණය, උපයෝගීතාව සහ අලංකරණය සඳහා භාවිත චිත්‍ර-සැරසිලි විස්තරාත්මක ව රචනය කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.24 ග්‍රීක මූර්ති අධ්‍යයනය කරයි. | • පැරණි සහ සම්භාව්‍ය අවධිය (Greek Old and Classical Period)<br>- කුරොස් සහ කෝරේ මූර්ති (Kouros and Kore)<br>- කවපෙත්ත විසි කරන්නා (Discobolus)<br>- හෙල්ල දරා සිටින්නා (ඩොරිෆරස් -Doryphoros)<br>- හර්මීස් සහ ඩයොනිසස් (Hermes and the Infant Dionysus)<br><br>• හෙලනිස්ටික අවධිය (Hellenistic Period)<br>- ලැඔකූන් (Laocoon)<br>- සාමෝත්‍රාස්හි විජයග්‍රහණයේ දෙවඟන (Winged Victory of Samothrace / Nike)<br>- මිය යන ගෝල්වරයා (The dying Galatian/Gaul) | • ග්‍රීක පැරණි, සම්භාව්‍ය හා හෙලනිස්ටික කලාවේ වස්තු විෂය, ශෛලිය ලක්ෂණ, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ සංසන්දනාත්මක ව විග්‍රහ කරයි. | |

# ක්‍රියාකාරකම් වාරවලට බෙදීම

## පළමු වන වාරය


| | ක්‍රියාකාරකම | කාලච්ඡේද | පිටුව |
|---|---|---|---|
| 1.1.1 | විවිධ ඉරියවු සහිත මානව රූප අඳිමු | 02 | 1 |
| 1.1.2 | විවිධ සත්ත්ව ඉරියවු රේඛාවෙන් අධ්‍යයනය කරමු | 02 | 3 |
| 1.2.1 | 'අස්වනු නෙළන ගොවි ගෙවිලියෝ' තේමාවට චිත්‍රයක් නිර්මාණය කරමු | 04 | 5 |
| 1.3.1 | 'අවුරුදු උදාව' තේමාව යටතේ චිත්‍රයක් නිර්මාණය කරමු | 04 | 7 |
| 1.2.2 | 'නාගරික පරිසරය' තේමාව ඇසුරෙන් සිත්ගත් සිද්ධියක් චිත්‍රණය කරමු | 04 | 6 |
| 2.1.1 | සනකයක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයකට දමූ මල් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කරමු | 02 | 9 |
| 2.1.2 | පෙට්ටියක් (සුදු කඩදාසියකින් ආවරණය කළ) හා ඒ මතින් දමන ලද රෙදි කඩක් විවිධ මාධ්‍යවලින් අධ්‍යයනය කරමු | 02 | 10 |
| 2.1.3 | ප්ලාස්ටික් ජෝගුවකට දමූ ක්‍රෝටන් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කරමු | 02 | 10 |
| 2.1.4 | කුඩා කළයකට සමාන මැටි බඳුනක්, පෙට්ටියක් හා වීදුරුවක් රේඛාවෙන් අධ්‍යයනය කරමු | 02 | 10 |
| 2.2.1 | පෙට්ටියක්, රෙදිකඩක්, කුඩා මැටි කළයක දමූ අරලිය මල් අත්තක්, ගස්ලබු ගෙඩියක්. වීදුරු බඳුනකට (Bowl) දමූ කඩදාසි රෝලක් සහිත ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු | 04 | 11 |
| 3.1.1 | ආලින්දයේ අලංකාරයට තබන බඳුනක් සැලසුම් කර නිර්මාණය කරමු | 05 | 13 |
| 3.1.2 | සාම්ප්‍රදායික මෝස්තරවලින් සැරසිලි කරන ලද ස්වර්ණාභරණ බහා තැබීමට සුදුසු මංජුසාවක් ඇඳ වර්ණ ගන්වමු | 03 | 15 |
| 3.3.1 | ෂඩස්‍රාකාර ලෝහ බන්දේසියකට සුදුසු මුළු තල සැරසිල්ලක් ඇඳ වර්ණ කරමු | 04 | 18 |
| 3.3.2 | ළමා අවශ්‍යතාවලට භාවිත කළ හැකි රෙදි සඳහා උචිත ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කරමු | 04 | 19 |
| 4.1.1. | 'ආගමික සහජීවනය මගින් යහපත් සමාජයක් ගොඩ නඟමු' යන තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරමු | 04 | 20 |
| 4.2.1. | 'යුවතියන්ගේ හිසකෙස්වල ආලේප කිරීමට නිෂ්පාදනය කළ නවතම තෙල් වර්ගයක් (hair oil) බහලූ බෝතලයක් සඳහා ලේබලයක්' නිර්මාණය කරමු | 04 | 22 |
| 4.2.2 | නවතම චොක්ලට් වර්ගයක් සඳහා දවටනයක් නිර්මාණය කරමු | 02 | 23 |
| 4.3.1 | 'තම හොඳ ම යහළුවාගේ උපන් දිනය වෙනුවෙන් සුභ පැතුම් පතක්' නිර්මාණය කරමු | 02 | 24 |
| 4.4.1 | 'බක් මාසේ අවුරුදු සිරි' නමින් පුවත්පතක පළ කෙරෙන විශේෂාංග ලිපියක් සඳහා වර්ණ සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු | 04 | 26 |
| 5.1.1 | උන්නත කැටයමක් නිමවමු | 07 | 28 |
| 6.1.1 | දෘශ්‍ය කලාව හඳුනා ගනිමු | 02 | 32 |
| 6.1.2 | දෘශ්‍ය කලා මූලිකාංග හඳුනා ගනිමු | 02 | 34 |
| 6.1.3 | දෘශ්‍ය කලා මූලධර්ම අධ්‍යයනය කරමු | 02 | 36 |
| 6.1.4 | දෘශ්‍ය කලාවේ විවිධ කලා ව්‍යාපාර, කලා ශෛලි සහ සංකල්ප හඳුනා ගනිමු | 02 | 38 |
| 6.2.1 | ලංකා කලා සංගමයේ ශිල්පීන් ගේ නිර්මාණ අගයමු (ඒ. සී. ජී. එස්. අමරසේකර, ඩේවිඩ් පේන්ටර්, ජේ. ඩී. ඒ. පෙරේරා) | 03 | 40 |
| 6.3.1 | ඉන්දීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගයමු (රාජා රවි වර්මා) | 01 | 48 |

| | ක්‍රියාකාරකම | කාලච්ඡේද | පිටුව |
|---|---|---|---|
| 7.1.1 | ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අධ්‍යයනය කරමු (තන්තිරිමලේ, බිල්ලෑව, දොරවක්කන්ද, වෙට්ටම්බුගල) | 02 | 76 |
| 7.2.1 | යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අධ්‍යයනය කරමු (ලැස්කෝ, අල්ටමීරා, චෝවෙ, ෆොන්ඩ් ගෝම්) | 02 | 80 |
| 7.3.1 | ශ්‍රී ලංකාවේ ස්තූප අධ්‍යයනය කරමු (ථූපාරාමය, රුවන්වැලි මහා සෑය, අභයගිරිය, ජේතවනාරාමය, රන්කොත් වෙහෙර, කිරි වෙහෙර, හඟුරන්කෙත රජ මහා විහාරයේ ස්තූපය) | 02 | 83 |
| 7.4.1 | ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරමු (ආසන ඝර, බෝධි ඝර, පධාන ඝර, උපෝසථ ඝර, ජන්තා ඝර) | 02 | 86 |
| 7.5.1 | ස්තූපය හා වෙනත් ඓතිහාසික ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණ අගයමු (වාහල්කඩ, සඳකඩපහණ, මුරගල, කොරවක්ගල, පියගැට පෙළ, පුන්කලස්) | 02 | 88 |
| 7.12.1 | ඉන්දු නිම්න වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරමු | 02 | 130 |
| 7.12.2 | ඉන්දු නිම්න මූර්ති හා මුද්‍රා අධ්‍යයනය කරමු<br>(මූර්ති - කවන්ද රුව, නර්තන විලාසයක් පෙන්වන කවන්ද රුව, නළඟන රුව, පූරක රුව, මව් දෙවඟන රූප<br>මුද්‍රා - යෝගාසන දේව රූපය (අං සහිත දෙවියා/පශුපති), රුක් දෙවියන් (දෙවියා ශ්‍රාවකයන් සහ එළුවා), ව්‍යාඝ්‍රයන් දෙදෙනෙකු සමග සටන් කරන මිනිසා) | 03 | 132 |
| 7.13.1 | සාංචි ස්තූපය හා අශෝක ස්ථම්භ පිළිබඳ අධ්‍යයනය කරමු (සාංචි ස්තූපයේ කලාත්මක අංග, අශෝක ස්ථතම්භ - ලෞරියා නන්දන්ගර් ස්ථම්භය, සාරානාත් ස්ථම්භ ශීර්ෂය, රාම්පූර්වා ස්ථම්භ ශීර්ෂය) | 02 | 136 |
| 7.14.1 | සාංචි තොරණ කැටයම් හා භාරුත් ගල්වැට කැටයම් අධ්‍යයනය කරමු | 02 | 139 |
| 7.19.1 | කුෆු සහ කාෆ්රේ පිරමීඩ අධ්‍යයනය කරමු | 01 | 154 |
| 7.19.2 | අබුසිම්බල් හා ලුක්සෝර් දේවස්ථාන අධ්‍යයනය කරමු | 01 | 156 |
| 7.20.1 | නර්මේර්/නාමර් ඵලකය, මෙන්කුරේ රජු සහ ඔහුගේ බිරිය, ස්ක්‍රයිබ් හා නෙෆර්ටිටි යන ප්‍රතිමා අධ්‍යයනය කරමු | 02 | 158 |
| 7.21.1 | ඊජිප්තියානු චිත්‍ර අධ්‍යයනය කරමු (කුරුලු දඩයම, මීඩම්හි පාත්තයෝ, නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ) | 01 | 160 |

## දෙ වන වාරය


| | ක්‍රියාකාරකම | කාලච්ඡේද | පිටුව |
|---|---|---|---|
| 1.2.3 | 'වෙරළාසන්න ධීවර පරිසරය' තේමාව ඇසුරෙන් චිත්‍රයක් නිර්මාණය කරමු | 04 | 6 |
| 1.2.4 | 'කෘෂිකාර්මික පරිසරය' ආශ්‍රිත සංසිද්ධියක් චිත්‍රණය කරමු | 04 | 6 |
| 1.3.2 | ඇළ, දොළ, ගංගා, වැව්, පොකුණු ආශ්‍රිත මානව හා සත්ත්ව රූප ඇතුළත් සංසිද්ධියක් චිත්‍රණය කරමු | 04 | 8 |
| 1.3.3 | ප්‍රීතිය, ශෝකය, ත්‍රාසය වැනි හැඟීම් දනවන අවස්ථාවක් චිත්‍රණය කරමු | 04 | 8 |
| 2.1.5 | ඇන්තූරියම් මල් පෝච්චියක් රේඛාවෙන් අධ්‍යයනය කරමු | 02 | 10 |
| 2.1.6 | ගස් ලබු ගෙඩියක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයකට දමූ වද මල් අත්තක් අධ්‍යයනය කරමු | 02 | 10 |
| 2.2.2 | ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු | 04 | 12 |
| 2.2.3 | ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු | 04 | 12 |
| 3.1.3 | වැහිපීල්ලෙන් වැසි ජලය පතිත වන ස්ථානයක තැබීමට සුදුසු බඳුනක් සඳහා ත්‍රිමාණ සැලසුමක් ඇඳ වර්ණ ගන්වමු | 03 | 15 |
| 3.1.4 | ආයතනයක පරිහරණයට සුදුසු තෙත කුඩ රැඳවීම සඳහා භාවිත කළ හැකි බඳුනක් සැලසුම් කර ග්‍රීක මැටි බඳුන්වල චිත්‍ර ඇසුරෙන් සැරසිලි කරමු | 03 | 15 |
| 3.2.1 | මල්ලියකමින් සැරසූ වා කවුළු කැටයමක් අඳිමු | 04 | 16 |
| 3.3.3 | වෘත්තාකාර කුශන් කවරයක් සඳහා වියුක්ත රූපී හැඩතල සහිත සැරසිල්ලක් නිර්මාණය කරමු | 04 | 19 |
| 4.1.2 | 'වන සම්පත අපේ මිතුරෙකි. අපි එය සුරකිමු' තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරමු | 04 | 21 |
| 4.2.3 | පාසල් මාධ්‍ය ඒකකය සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරමු | 02 | 23 |
| 4.3.2 | කලා උලෙළක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරමු | 02 | 25 |
| 4.3.3 | ඩෙංගු රෝගයේ භයානක කම ගැන දැනුම්වත් කෙරෙන දැන්වීමක් නිර්මාණය කරමු | 02 | 25 |
| 4.4.2 | ළමා කතන්දර පොතක ඇතුළු පිටුවක් සඳහා වර්ණ සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු | 04 | 27 |
| 5.2.1 | උද්‍යාන රූ නිමැවුම් නිමවමු | 08 | 30 |
| 6.2.2 | 20 වන සියවසේ ශ්‍රී ලාංකේය ආගමික සිතුවම් අගයමු (එම්. සාර්ලිස්, සෝලියස් මැන්දිස් (සොයිලියස් මැන්දිස්), සෝමබන්දු විද්‍යාපති) | 03 | 43 |
| 6.3.2 | ඉන්දීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගයමු (අබනින්ද්‍රනාත් තාගෝර්, නන්දලාල් බෝස්) | 02 | 50 |
| 6.2.3 | නාරායණ ස්වාමිගේ නිර්මාණ අගයමු | 01 | 46 |
| 6.4.1 | යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන්ගේ නිර්මාණ අගයමු (ලියොනාඩෝ ඩාවින්චි) | 02 | 52 |
| 6.4.2 | යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන්ගේ නිර්මාණ අගයමු (මයිකල්/මීකෙල් ආන්ජිලෝ) | 02 | 55 |
| 6.4.3 | යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන්ගේ නිර්මාණ අගයමු (රෆායල් සන්සියෝ) | 02 | 58 |
| 7.6.1 | පිළිම ගේ (පඨිමා ඝර) නිර්මාණ අගයමු (තිවංක පිළිම ගෙය, ථූපාරාම පිළිම ගෙය, ලංකාතිලක පිළිම ගෙය) | 02 | 92 |
| 7.6.2 | පොළොන්නරු යුගයේ ශිව දේවාල අධ්‍යයනය කරමු (ශිව දේවාල අංක 01, ශිව දේවාල අංක 02) | 01 | 94 |
| 7.6.3 | විජයොත්පාය සහ නිශ්ශංක ලතා මණ්ඩපය අධ්‍යයනය කරමු | 01 | 96 |

| | ක්‍රියාකාරකම | කාලච්ඡේද | පිටුව |
|---|---|---|---|
| 7.6.4 | වට දා ගේ (ථූප ඝර) නිර්මාණ අගයමු (පොලොන්නරුව වටදා ගෙය, තිරියාය වටදා ගෙය, මැදිරිගිරිය වටදා ගෙය) | 01 | 98 |
| 7.6.5 | පොකුණු නිර්මාණ අගයමු (අනුරාධපුර කුට්ටම් පොකුණ, ඉසුරුමුණි රන්මසු උයනේ පොකුණ, පොලොන්නරුවේ කුමාර පොකුණ, පොලොන්නරුවේ නෙළුම් පොකුණ,) | 01 | 100 |
| 7.7.1 | ඉසුරුමුණි කැටයම් අධ්‍යයනය කරමු (ඉසුරුමුණි පෙම් යුවළ, මිනිසා සහ අශ්ව හිස, රජ පවුල, ජල ක්‍රීඩා කරන ඇත්තු) | 02 | 102 |
| 7.8.1 | අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු (මහඉලුප්පල්ලම හිටි පිළිමය, සමාධි බුද්ධ ප්‍රතිමාව, තොළුවිල බුද්ධ ප්‍රතිමාව පන්කුලිය බුද්ධ ප්‍රතිමාව, අවුකන හිටි පිළිමය) | 02 | 105 |
| 7.11.1 | අනුරාධපුර යුගයේ සිතුවම් අධ්‍යයනය කරමු (සීගිරි චිත්‍ර, හිඳගල චිත්‍ර, ගොනාගොල්ල චිත්‍ර, මහියංගණ සෑයේ ධාතු ගර්භයේ චිත්‍ර) | 04 | 119 |
| 7.15.1 | ගන්ධාර සම්ප්‍රදායයේ කලා කෘති අධ්‍යයනය කරමු (කණිෂ්ක රජුගේ කාසිය, හෝර්ටි මන්දාර් බුදු පිළිමය, බ්‍රෙගම් පිළිමය, තක්තිබහීර් පිළිමය, සහරි බහ්ලොල් පිළිමය, දුෂ්කර ක්‍රියාව පිළිමය) | 02 | 141 |
| 7.15.2 | මථුරා සම්ප්‍රදායයේ කලා කෘති අධ්‍යයනය කරමු (කත්‍රා බුද්ධ ප්‍රතිමාව, කණිෂ්ක රජ රුව) | 01 | 144 |
| 7.16.1 | අමරාවතී සම්ප්‍රදායයේ කලා කෘති අධ්‍යයනය කරමු (මහාමායා සිහිනය, රාහුල කුමරු දායාද ඉල්ලීම, නාලාගිරි දමනය, අභිනිෂ්ක්‍රමණය, අමරාවතී කැටයම්වල දැක්වෙන බුද්ධ ප්‍රතිමා) | 02 | 146 |
| 7.17.1 | ගුප්ත සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු (මථුරා හිටි බුදු පිළිමය (ජමල්පූර් හිටි පිළිමය), සාරානාත් බුදු පිළිමය) | 02 | 149 |
| 7.22.1 | පාතිනොන් දේවස්ථානය සහ ග්‍රීක කුලුනු අධ්‍යයනය කරමු (ග්‍රීක කුලුනු - ඩොරික් කුලුනු, අයොනික් කුලුනු, කොරින්තියානු කුලුනු) | 02 | 162 |
| 7.23.1 | ග්‍රීක මැටි බඳුන් අධ්‍යයනය කරමු (කාලරූපී මැටි බඳුන්, රක්තරූපී මැටි බඳුන්) | 02 | 164 |

## තුන් වන වාරය


| | ක්‍රියාකාරකම | කාලච්ඡේද | පිටුව |
|---|---|---|---|
| 1.2.5 | 'ක්‍රීඩා තරගයක උද්වේගකර අවස්ථාවක්' චිත්‍රණය කරමු | 04 | 6 |
| 1.3.4 | දේශීය කර්මාන්ත ආශ්‍රීත තේමාවක් චිත්‍රණය කරමු | 04 | 8 |
| 1.3.5 | ආගමික පරිසරය ආශ්‍රිත තේමා ඇසුරෙන් සිත් ගත් අවස්ථාවක් චිත්‍රණය කරමු | 04 | 8 |
| 2.2.4 | ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු | 04 | 12 |
| 2.2.5 | ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු | 04 | 12 |
| 2.2.6 | ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු | 04 | 12 |
| 3.1.5 | 'තේ කොළ' අපනයනයේ දී ඇසුරුම් සඳහා භාවිත කිරීමට සුදුසු බඳුනක් චිත්‍රණය කරමු | 03 | 15 |
| 3.1.6 | ඔසුපැන් අලෙවි සැලක් ඉදිරිපස තැබිය හැකි, එහි අර්ථය ප්‍රකාශිත විශාල ප්‍රමාණයේ බඳුනක් චිත්‍රණය කරමු | 03 | 15 |
| 3.3.4 | ආයත චතුරස්‍රාකාර බුමුතුරුණකට සුදුසු සැරසිල්ලක් නිර්මාණය කරමු (මොනෝ ක්‍රෝම් ක්‍රමයට වර්ණ ගන්වන්න) | 04 | 19 |
| 3.3.5 | කාන්තා හෝ පිරිමි හෝ ඇඳුම් සඳහා සුදුසු වාටි සැරසිල්ලක් නිර්මාණය කරමු | 04 | 19 |
| 3.3.6 | සාම්ප්‍රදායික සිංහල සැරසිලි මෝස්තර ඇසුරෙන් ආයත චතුරස්‍රාකාර වියන් තලයක් සැරසීම සඳහා මෝස්තරයක් නිර්මාණය කරමු | 04 | 19 |
| 4.1.3 | 'මනා සෞඛ්‍යයක් පවත්වා ගැනීම සඳහා යහ පුරුදු වඩවමු' තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරමු | 04 | 21 |
| 4.2.4 | නව වසරට සුබ පැතීම සඳහා සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරමු | 02 | 23 |
| 4.3.4 | පාසලේ පැවැත්වෙන විද්‍යා ප්‍රදර්ශනයක් පිළිබඳ දැනුම්වත් කෙරෙන ප්‍රචාරක පෝස්ටරයක් නිර්මාණය කරමු | 04 | 25 |
| 4.4.3 | ලෝක කම්කරු දිනය වෙනුවෙන් පුවත්පතක පළ කෙරෙන විශේෂාංග ලිපියක් සඳහා කළු සුදු සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු | 03 | 27 |
| 6.5.1. | උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (ක්ලෝඩ් මොනේ) | 01 | 60 |
| 6.5.2 | උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (එඩ්ගා ඩෙගා) | 01 | 62 |
| 6.5.3 | උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (මේරි කසාට්) | 01 | 64 |
| 6.5.4 | පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (වින්සන්ට් වැන්ගෝ) | 01 | 66 |
| 6.5.5 | පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (පෝල් ගොගැන්) | 02 | 68 |
| 6.5.6 | පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (පොල් සෙසාන්) | 02 | 70 |
| 6.6.1 | ඝනිකවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (පැබ්ලෝ පිකාසෝ) | 02 | 72 |
| 6.6.2 | ඝනිකවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු (ජෝජස් බ්‍රාක්) | 01 | 74 |

| | ක්‍රියාකාරකම | කාලච්ඡේද | පිටුව |
|---|---|---|---|
| 7.9.1 | පොලොන්නරුව ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා සහ වට දා ගේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු | 02 | 109 |
| 7.9.2 | පොලොන්නරුව පොත්ගුල් විහාර ප්‍රතිමාව අධ්‍යයනය කරමු | 01 | 112 |
| 7.9.3 | ගම්පොළ සහ මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු (ගඩලාදෙණිය හිඳි බුද්ධ ප්‍රතිමාව, ලංකාතිලක හිඳි බුද්ධ ප්‍රතිමාව, දඹුල්ල බුද්ධ ප්‍රතිමා) | 02 | 113 |
| 7.10.1 | ලෝහ කලා නිර්මාණ අධ්‍යයනය කරමු (අර්ධනාරී නටේශ්වර, අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව, මාලා තාරා, දැදිගම කොටවෙහෙර ඇත් පහන, නටරාජ, ශිව සෝමස්කන්ධමූර්ති) | 03 | 116 |
| 7.11.2 | පොලොන්නරු යුගයේ සිතුවම් අධ්‍යයනය කරමු (තිවංක පිළිම ගෙයි සිතුවම්, ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ සිතුවම්, දිඹුලාගල මාරාවිදිය සිතුවම්) | 04 | 122 |
| 7.11.3 | මහනුවර සම්ප්‍රදායයේ සිතුවම් අධ්‍යයනය කරමු (උඩරට ශෛලිය - දෙගල්දොරුව, මැදවල ටැම්පිට විහාරය, දඹුල්ල ලෙන් විහාරය) | 03 | 124 |
| 7.11.4 | මහනුවර සම්ප්‍රදායයේ සිතුවම් අධ්‍යයනය කරමු (පහතරට ශෛලිය - කතළුවේ පූර්වාරාමය, මුල්ගිරිගල විහාරය, කරගම්පිටියේ සුබෝධාරාමය, තෙල්වත්ත විහාරය) | 04 | 127 |
| 7.18.1 | අජන්තා චිත්‍ර හා අධ්‍යයනය කරමු | 04 | 151 |
| 7.24.1 | පැරණි සහ සම්භාව්‍ය අවධියට අයත් ග්‍රීක මූර්ති අධ්‍යයනය කරමු (කුරෝස් සහ කෝරේ මූර්ති, කවපෙත්ත විසි කරන්නා, හෙල්ල දරා සිටින්නා (ඩොරිෆරස්), හර්මීස් සහ ඩයොනිසස්) | 02 | 166 |
| 7.24.2 | හෙලනිස්ටික අවධියට අයත් ග්‍රීක මූර්ති අධ්‍යයනය කරමු (ලැඔකූන්, සාමෝත්‍රාස්හි විජයග්‍රහණයේ දෙවඟන, මිය යන ගෝල්වරයා) | 02 | 168 |

# ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1** : **රේඛා භාවිතයෙන් මානව හා සත්ත්ව රූප අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 1.1.1** : **විවිධ ඉරියවු සහිත මානව රූප අඳිමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : රේඛා අධ්‍යයනයට සුදුසු කඩදාසි, පැන්සල් (2B, 4B, 6B), පැස්ටල්, චාකෝල්, විවිධ මානව ඉරියවු සහිත රේඛා චිත්‍ර, චිත්‍ර ශිල්පීන්ගේ රේඛා චිත්‍ර ආදර්ශන

**ඉගෙනුම් පල** :

- මානව ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර විවිධ මානව ඉරියවුවල දළ සටහන් අඳියි.
- මානව රූ දළ සටහන් ඇඳීමේ දී පරිමාව, පරිමාණ ලක්ෂණ අනුගමනය කරයි.
- මානව ඉරියවුවල ස්වාභාවික හැඩ, ගති ලක්ෂණ, රිද්මානුකූල බව දළ සටහන් මඟින් ඇඳ දක්වයි.
- විවිධ වයස් මට්ටම්වලට අයත් මානව රූප ඇඳීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- රේඛාව හැසිරවීමේ විවිධ ක්‍රමවේද භාවිතයෙන් ත්‍රිමාණ ලක්ෂණ සහිත මානව රූප අඳියි.
- විවිධ මාධ්‍යවලට ආවේණික ශිල්ප ක්‍රම භාවිතයෙන් රේඛා චිත්‍ර ඇඳීමේ හැකියා පෙන්නුම් කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, නිරීක්ෂණය, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- මානව රූපවල මූලික හැඩ සහ පරිමාණ ලක්ෂණ
- විවිධ ක්‍රියාකාරී ඉරියවු සහිත මානව රූප
- එළිය අඳුර, ත්‍රිමාණ ලක්ෂණ
- රේඛාවේ විවිධත්වය උචිත පරිදි භාවිතය
- විවිධ මාධ්‍ය හැසිරවීමේ කුසලතා

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :

- පාසල් පරිසරයේ සිසුන් හා ගුරුභවතුන් විවිධ ක්‍රියාකාරකම්වල නිරතවන ආකාරය හා ඔවුන්ගේ විවිධ ඉරියවු නිරීක්ෂණයට යොමු කරවන්න.

- එම නිරීක්ෂණ ඇසුරෙන් විවිධ මානව ඉරියවුවල දළ සටහන් ඇඳීම සඳහා සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලබා දෙන්න.

- සජීව නිරීක්ෂණයෙන් මානව රූපවල හැඩ ක්ෂණික ව ඇඳීමේ දී, ඉරියවු අනුව මානව රූපවල දළ ආකෘතිය සටහන් කර ගැනීමේ සරල ක්‍රමවේද පිළිබඳ නිදසුන් පෙන්වා දෙන්න.

- නිරීක්ෂණ මෙන් ම සිසුන්ගේ පරිකල්පනය ඇසුරෙන් ද විවිධ මානව රූප ඇඳීමට යොමු කරවන්න.

- යථාරූපී ව මානව රූප ඇඳීමේ දී පරිමාව, පරිමාණ ලක්ෂණ අනුගමනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ ව උපදෙස් ලබා දෙන්න.

- ඝන රේඛා, සියුම් රේඛා වැනි රේඛාවේ විවිධ ශක්තීන් සුදුසු පරිදි භාවිතයෙන් රූපවල හැඩ හා ත්‍රිමාණ ලක්ෂණ මතු කිරීමට උපදෙස් හා සහය ලබා දෙන්න.

- ඇඳීම සඳහා භාවිත කරන මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම හා රේඛාවේ විවිධ ගති ස්වභාව සැලකිල්ලට ගනිමින් රූපවල ත්‍රිමාණ ලක්ෂණ මතු කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.

- විවිධ වයස් කාණ්ඩ අනුව මානව රූපවල පරිමාණ, ඉරියව්, හැඟීම් ප්‍රකාශන, සිරුරේ බාහිර ස්වරූපය සහ වෙනත් හඳුනාගත හැකි ලක්ෂණ වෙනස් වන ආකාරය නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.

- විවිධ වයස් මට්ටම්වලට අදාළ ව විවිධ ඉරියව්වලින් යුත් ස්ත්‍රී සහ පුරුෂ රූප ඇඳීමට සිසුන් යොමු කරවන්න.

- සිසුන්ගේ සාධන මට්ටම් සැලකිල්ලට ගනිමින් මානව රූපයක කොටස් (අත්, පාද, මුහුණ වැනි කොටස්) වෙන් වෙන් ව දළ සටහන් ඇඳීමට යොමු කරවන්න.

- නිරන්තර අභ්‍යාසකරණයේ නිරත වීමෙන් ගුණාත්මක බවින් වැඩි මානව රූප ඇඳීමේ කුසලතා සංවර්ධනය කර ගත හැකි බව අවබෝධ කරවන්න.

**ඇගයීම** :

- විවිධ ඉරියව්වලින් යුත් මානව රූපවල දළ සටහන් අඳින්න.
- මානව රූපවල ඉරියව්වේ ස්වභාවය අනුව රූපවල රිද්මය, පරිමාව, පරිමාණ, හා ගති ස්වභාවය දළ සටහන් මඟින් මතු කර දක්වන්න.
- විවිධ මාධ්‍ය හා ඒවාට අදාළ ශිල්ප ක්‍රම භාවිතයෙන් මානව රූප අඳින්න.
- විවිධ වයස් මට්ටම්වලට අයත් මානව රූප අඳින්න.
- මානව රූප දළ සටහන් ඇඳීම සඳහා පොතක් සකස් කර එය යාවත්කාලීන වන සේ අභ්‍යාසකරණයේ නිරත වන්න.

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1** : **රේඛා භාවිතයෙන් මානව හා සත්ත්ව රූප අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 1.1.2** : **විවිධ සත්ත්ව ඉරියවු රේඛාවෙන් අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- රේඛා අධ්‍යයනයට සුදුසු කඩදාසි, පැන්සල් (2B, 4B, 6B), පැස්ටල්, චාකෝල්, රේඛා භාවිතයෙන් අඳින ලද විවිධ සත්ත්ව ඉරියවු සහිත නිදර්ශන චිත්‍ර, සතුන්ගේ විවිධ ඉරියවු දැක්වෙන ඡායාරූප මෙන් ම සංයුක්ත තැටි හා පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- සත්ත්ව ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර සතුන්ගේ විවිධ ඉරියවුවල දළ සටහන් අඳියි.
- සත්ත්ව රූප ඇඳීමේ දී පරිමාව, පරිමාණ ලක්ෂණ නිවැරදි ව අනුගමනය කරයි.
- සතුන්ගේ ස්වාභාවික හැඩතල හා ඉරියවු දළ සටහන් මගින් ඇඳ දක්වයි.
- රේඛා ඇඳීමේ විවිධ ක්‍රමවේද භාවිත කර සත්ත්ව රූපවල ත්‍රිමාණ ලක්ෂණ හා ගති ස්වභාව මතු කරයි.
- විවිධ මාධ්‍ය භාවිතයෙන් රේඛාකරණයේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : ගවේෂණ, නිරීක්ෂණ, පැවරුම්, ව්‍යාපෘති, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- විවිධ සතුන්ගේ ඉරියවු හා ක්‍රියාකාරී ස්වරූප
- සත්ත්ව රූපවල මූලික ආකෘති හා හැඩ
- සත්ත්ව රූපවල නිවැරදි පරිමාව හා පරිමාණ ලක්ෂණ
- එළිය අඳුර, ත්‍රිමාණ ලක්ෂණ හා ගති ලක්ෂණ මතු කිරීම
- රේඛාවේ විවිධත්වය උචිත පරිදි භාවිතය
- විවිධ මාධ්‍ය හැසිරවීම

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :

- විවිධ සතුන් දැක්වෙන ඡායාරූප හා වීඩියෝ දර්ශන නිරීක්ෂණයට හා ගවේෂණයට යොමු කර ඔවුන්ගේ විවිධ හැඩ, ඉරියවු හා ක්‍රියාකාරී ස්වරූප හඳුනා ගැනීමට සිසුන් යොමු කරවන්න.
- රේඛා භාවිතයෙන් අඳින ලද විවිධ සත්ත්ව ඉරියවු සහිත නිදර්ශන චිත්‍ර ඇසුරෙන් සත්ත්ව ඉරියවු ඇඳීම සඳහා රේඛාව භාවිත කර ඇති ආකාරය පෙන්වා දෙන්න.
- රේඛා භාවිතයෙන් සත්ත්ව රූප ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- සරල මූලික ආකෘති ඇසුරෙන් පියවරෙන් පියවර සංවර්ධනය කර නිවැරදි ව සත්ත්ව රූපයක් අඳින අයුරු පෙන්වා දෙන්න.
- ස්වාභාවික ව සත්ත්ව හැඩ හා ඉරියවු ඇඳීමේ දී පරිමාව, පරිමාණ හා ගති ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් වීමට උපදෙස් දෙන්න.
- රේඛා ඇඳීමේ විවිධ ක්‍රමවේද භාවිතයෙන් එළිය අඳුර දක්වමින් ත්‍රිමාණ ලක්ෂණ හා ගති ස්වභාව මතු කිරීමට යොමු කරවන්න.

- විවිධ වර්ණ මාධ්‍ය භාවිත කර රූප ඇඳීමේ ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.
- සිසුන්ට අවශ්‍ය සිද්ධාන්තමය දැනුම සහ අවශ්‍ය සහය ලබා දෙන්න.

**ඇගයීම** :

- විවිධ සත්ත්ව ඉරියවු සහිත දළ සටහන් අඳින්න.
- සත්ත්ව රූපවල පරිමාව හා පරිමාණ ලක්ෂණ නිවැරදි ව දක්වන්න.
- රේඛා ඇඳීමේ විවිධ ක්‍රමවේද භාවිතයෙන් එළිය අඳුර, ත්‍රිමාණ ලක්ෂණ සහ ගති ලක්ෂණ පෙන්වන්න.
- විවිධ මාධ්‍ය භාවිතයෙන් සත්ත්ව රූප ඇඳීමේ ක්‍රියාකාරකම්වල නිරත වන්න.

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.2** : **ස්වභාවරූපී සංරචන ක්‍රම භාවිතයෙන් ස්වාභාවික සහ නිර්මිත පරිසරය සංරචනය කරයි.**

**ක්‍රියාකාරකම 1.2.1** : **''අස්වනු නෙළන ගොවි ගෙවිලියෝ'' තේමාවට චිත්‍රයක් නිර්මාණය කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- චිත්‍ර අඳින කඩදාසි, පැන්සල්, පින්සල්, විවිධ මාධ්‍ය (පැස්ටල්, දිය සායම්, ඇක්‍රලික්)
- විවිධ මාධ්‍යයෙන් ස්වභාවරූපී සංරචන ක්‍රම භාවිතයෙන් නිර්මාණය කරන ලද නිදර්ශන චිත්‍ර
- දේශීය හා විදේශීය ප්‍රවීණ චිත්‍ර ශිල්පීන් විසින් නිර්මාණය කරන ලද ස්වභාවරූපී සංරචන චිත්‍රවල ඡායාරූප

**ඉගෙනුම් පල** :
- ''අස්වනු නෙළන ගෙවිලියෝ'' තේමාවට අදාළ ව ස්වභාවරූපී ව චිත්‍රයක් නිර්මාණය කිරීම සඳහා දළ සටහන් අඳියි.
- චිත්‍ර ඇඳීමේ සිද්ධාන්ත සුදුසු පරිදි භාවිත කරමින් රේඛාවෙන් චිත්‍රය ඇඳ දක්වයි.
- තෝරාගන්නා ලද වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් චිත්‍රය වර්ණ ගන්වයි.
- එළිය අඳුර භාවිතයෙන් ත්‍රිමාණ ලක්ෂණ මතු කරයි.
- ස්වභාවරූපී ව චිත්‍ර ඇඳීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, නිරීක්ෂණය, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :
- තේමාවට අදාළ ස්වභාවරූපී හැඩතල සහිත විවිධ මානව ඉරියවු හා පරිසරය
- චිත්‍ර සංරචනය කිරීමේ සිද්ධාන්ත භාවිතය
- වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම අනුගමනය කිරීම
- උපකරණ නිවැරදි ව හැසිරවීම
- තමන්ට ආවේණික ශිල්පීය ලක්ෂණ
- ප්‍රකාශන ගුණය හා නිර්මාණාත්මක බව

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :
- නිදර්ශන චිත්‍ර හා ප්‍රවීණ චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ ඇතුළත් ඡායාරූප ඇසුරෙන් ස්වභාවරූපී සංරචන ක්‍රමයට චිත්‍ර නිර්මාණය කිරීම පිළිබඳ අධ්‍යයනයට අවස්ථාව ලබා දෙන්න.
- ස්වභාවරූපී චිත්‍රවල ලක්ෂණ හඳුනා ගැනීමට සිසුන්ට සහය වන්න.
- ස්වාභාවරූපී ව ඇඳීම හා වර්ණ කිරීම පිළිබඳ නිදර්ශන ඇසුරෙන් පැහැදිලි කරදෙන්න.
- මාතෘකාවට අදාළ ව චිත්‍රය සංරචනය සඳහා දළ සටහන් ඇඳීමට සිසුන් යොමු කරවන්න.

- චිත්‍ර අඳින තලය නිසි පරිදි භාවිතයෙන් හා සංරචන සිද්ධාන්ත අනුගමනය කරමින් රේඛාවෙන් චිත්‍රය ඇඳීමට උපදෙස් දෙන්න.
- තේමාවට අදාළ ව මානව රූපවල රිද්මය, ක්‍රියාකාරී ඉරියවු, හැඟීම් ප්‍රකාශනය, හා ශිල්පීය අනන්‍යතා මතු කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- භාවිත කරන මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම හා උපකරණ නිසි ලෙස භාවිත කර චිත්‍රයේ ස්වභාවරූපී ලක්ෂණ මතු කර දක්වීමට උපදෙස් හා සහය ලබා දෙන්න.
- ස්වභාවරූපී ව ඇඳීමේ දී එළිය අඳුර, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝකය වැනි ශිල්ප ක්‍රම අනුගමනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.
- සංයමයෙන් යුතු ව ක්‍රියාකාරකමක නිරත වීම, නිර්මාණයේ සාර්ථකත්වයට හේතුවන බව පැහැදිලි කර දෙන්න.

**ඇගයීම** :

- තේමාවට අදාළ ව ස්වභාවරූපී හැඩ භාවිතයෙන් චිත්‍රයේ දළ සටහන් අඳින්න.
- තලය නිසි පරිදි හසුරුවා (අවකාශ භාවිතය - මෙහි දී පෙර බිම. මැද බිම හා පසුබිම පිළිබඳ සැලකිලිමත් වීම) චිත්‍රය සංරචනය කරන්න.
- චිත්‍රයේ ස්වභාවරූපී ලක්ෂණ මතු වන සේ වර්ණ මාධ්‍ය භාවිත කරන්න.
- අදාළ සිද්ධාන්ත හා ශිල්ප ක්‍රම නිසි පරිදි අනුගමනය කරන්න.
- ශිල්පීය අනන්‍යතා ප්‍රදර්ශනය වන සේ නිර්මාණකරණයේ නිරත වන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

- 1.2 නිපුණතා මට්ටම යටතේ පහත සඳහන් තේමාවලට අනුව සුදුසු මාතෘකා ගොඩනගා ගෙන ස්වාභාවික හා නිර්මිත පරිසරය ආශ්‍රිත චිත්‍ර ඇඳීමේ ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

1.2.2 - 'නාගරික පරිසරය' තේමාව ඇසුරෙන් සිත්ගත් සිද්ධියක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

1.2.3 - 'වෙරළාසන්න ධීවර පරිසරය' තේමාව ඇසුරෙන් චිත්‍රයක් නිර්මාණය කරමු. - (කාලච්ඡේද - 04)

1.2.4 - 'කෘෂිකාර්මික පරිසරය' ආශ්‍රිත සංසිද්ධියක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

1.2.5 - 'ක්‍රීඩා තරගයක උද්වේගකර අවස්ථාවක්' චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

**නිපුණතාව 1.0** : **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

**නිපුණතා මට්ටම 1.3** : **ස්වභාවරූපී නොවන සංරචන ක්‍රම භාවිතයෙන් ස්වාභාවික සහ නිර්මිත පරිසරය චිත්‍රණය කරයි.**

**ක්‍රියාකාරකම 1.3.1** : **''අවුරුදු උදාව'' තේමාව යටතේ චිත්‍රයක් නිර්මාණය කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- චිත්‍ර අඳින කඩදාසි, පැන්සල්, විවිධ මාධ්‍ය (පැස්ටල්/ දියසායම්/ ඇක්‍රලික්/ පෝස්ටර් සායම්)
- විවිධ මාධ්‍යයෙන් ස්වභාවරූපී නොවන සංරචන ක්‍රම භාවිතයෙන් නිර්මාණය කරන ලද චිත්‍ර නිදර්ශන
- මහනුවර යුගයේ විහාර චිත්‍ර ඇතුළත් ඡායාරූප පිටපත්

**ඉගෙනුම් පල** :
- තේමාවට අදාළ ව ස්වභාවරූපී නොවන හැඩ භාවිත කර චිත්‍රයේ දළ සටහන් අඳියි.
- දළ සටහන් ඇසුරෙන් පැන්සල් රේඛා චිත්‍රය අඳියි.
- තෝරාගත් ස්වභාවරූපී නොවන සංරචන ක්‍රමයට උචිත පරිදි වර්ණ හා රේඛා භාවිත කර චිත්‍රය නිර්මාණය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, නිරීක්ෂණය, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :
- තේමාවට අදාළ ස්වභාවරූපී නොවන හැඩතල සහිත විවිධ මානව ඉරියවු හා පරිසර
- විවිධ ස්වභාවරූපී නොවන සංරචන ක්‍රම
- චිත්‍ර අඳින ශෛලියට උචිත වර්ණ මාධ්‍ය භාවිතය හා රේඛාකරණය
- ශිල්ප ක්‍රමවලට අදාළ ව උපකරණ හැසිරවීමේ කුසලතා
- ප්‍රකාශන ගුණය හා නිර්මාණාත්මක බව

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :
- නිදර්ශන චිත්‍ර සහ මහනුවර යුගයේ විහාර බිතු සිතුවම් පිටපත් නිරීක්ෂණයෙන් ස්වභාවරූපී නොවන සංරචන ක්‍රමවලට නිර්මාණය කළ චිත්‍ර පිළිබඳ අධ්‍යයනයට සිසුන් යොමු කරවන්න.
- ස්වභාවරූපී නොවන සංරචන ක්‍රමයට නිර්මාණය කළ චිත්‍රවල ලක්ෂණ හඳුනා ගැනීමට සිසුන්ට සහය වන්න. ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.
- ස්වාභාවික හා නිර්මිත හැඩතල ස්වභාවරූපී නොවන ස්වරූපයෙන් ඇඳීම සහ වර්ණ කිරීමේ දී අනුගමනය කළ හැකි ක්‍රමවේද පැහැදිලි කර දෙන්න.
- මාතෘකාවට අදාළ ව දළ සටහන් ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
- තලය නිසි පරිදි භාවිත කර ස්වභාවරූපී නොවන ලක්ෂණ මතු වන සේ රිද්මානුකූල, නිර්මාණාත්මක හැඩ ඇසුරෙන් චිත්‍රය රේඛාවෙන් ඇඳීමට යොමු කරවන්න.
- ස්වභාවරූපී නොවන ලක්ෂණ මතු වන සේ පැතලි/ද්විමාන ලෙස චිත්‍රය වර්ණ ගැන්වීමට යොමු කරවන්න.
- උපකරණ නිසි පරිදි භාවිත කරමින් වර්ණ ගැන්වීමේ ශිල්ප ක්‍රම උචිත පරිදි භවිත කිරීමට මග පෙන්වන්න.

- වර්ණ පූරණයෙන් පසු ව චිත්‍රයේ ස්වභාවය අනුව රේඛාවෙන් රූප මතු කිරීමට හෝ නොකිරීමට හෝ උපදෙස් දෙන්න.
- සංයමයෙන් යුතු ව චිත්‍රය නිම කිරීමට අවශ්‍ය සහය හා උපදෙස් ලබා දෙන්න.

**ඇගයීම** :

- තේමාවට අදාළ ව ස්වභාවරූපී නොව හැඩ භාවිතයෙන් දළ සටහන් ඇඳ චිත්‍රය රේඛාවෙන් ගොඩ නඟන්න.
- විවිධ වර්ණ මාධ්‍ය භාවිතයෙන් චිත්‍රය අඳින ලද ශෛලියට ගැලපෙන සේ වර්ණ පූරණය කරන්න.
- චිත්‍රයේ ස්වභාවය අනුව සියුම් ව හා රිද්මානුකූල ව රේඛා අඳින්න.
- සුදුසු පරිදි ස්වාභාවික නොවන ලක්ෂණ මතු කර දක්වමින් චිත්‍රය ඇඳ අවසන් කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

- 1.3 නිපුණතා මට්ටම යටතේ පහත සඳහන් තේමාවලට අනුව සුදුසු මාතෘකා ගොඩනගා ගෙන චිත්‍ර නිර්මාණකරණයේ සිසුන් යොදවන්න.

1.3.2 - ඇළ, දොළ, ගංගා, වැව්, පොකුණු ආශ්‍රිත මානව හා සත්ත්ව රූප ඇතුළත් සංසිද්ධියක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

1.3.3 - ප්‍රීතිය, ශෝකය, ත්‍රාසය වැනි හැඟීම් දනවන අවස්ථාවක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

1.3.4 - දේශීය කර්මාන්ත ආශ්‍රිත තේමාවක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

1.3.5 - ආගමික පරිසරය ආශ්‍රිත තේමා ඇසුරෙන් සිත් ගත් අවස්ථාවක් චිත්‍රණය කරමු. - (කාලච්ඡේද - 04)

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.1** : **විවිධ ස්වාභාවික හා නිර්මිත වස්තු වෙන් වෙන් ව අධ්‍යයනය කර දළ සටහන් අඳියි.**

**ක්‍රියාකාරකම 2.1.1** : **සනකයක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයකට දමූ මල් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : සනකයක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයකට දමූ මල් අත්තක් (වද මලක් සහිත අත්තක්/ක්‍රෝටන් අත්තක්/රුක් අත්තන අත්තක්), භාණ්ඩ තැබීමට ධාරකයක් (Drawing Board), රේඛා අධ්‍යයනයට සුදුසු කඩදාසි, චාකෝල්/පැන්සල් (2B, 4B,6B), චාකෝප් පැස්ටල්, විවිධ ක්‍රමයට රේඛා අධ්‍යයනයෙන් කළ ආදර්ශ චිත්‍ර

**ඉගෙනුම් පල** :
- ධාරකය මත තබා ඇති ද්‍රව්‍යවල විවිධ හැඩ හා ඒවායේ මතුපිට ස්වභාවය විස්තර කරයි.
- ද්‍රව්‍යවල විවිධත්වය නිරීක්ෂණයෙන් හඳුනා ගනියි.
- පරිමාව හා පරිමාණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව, ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අඳියි.
- විවිධ මාධ්‍ය භාවිතයෙන් ඝන සහ සියුම් රේඛා ඇසුරෙන් ද්‍රව්‍යවල හැඩ, ත්‍රිමාණ ලක්ෂණ හා මතුපිට ස්වභාවය ඇඳ දක්වයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, නිරීක්ෂණය, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :
- ධාරකය මත ඇස් මට්ටමට පහළින් සහ ඉහළින් පිහිටන සේ ද්‍රව්‍ය තබා ඒවා හොඳින් නිරීක්ෂණය කිරීම.
- ද්‍රව්‍යවල හැඩ හා මතුපිට ස්වභාවයේ විවිධත්වය
- ආලෝකයට අනුව ද්‍රව්‍යවල හැඩ හා ත්‍රිමාණ ලක්ෂණ මතු වන අයුරු
- ද්‍රව්‍ය බලා ඇඳීමේ දී අදාළ සිද්ධාන්ත භාවිතය (පරිමාව, පරිමාණය, පර්යාවලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, මතුපිට ස්වභාවය/වයනය)
- විවිධ පැන්සල් හා වෙනත් මාධ්‍ය භාවිතයේ දී රේඛාවේ විවිධතා, ශක්තීන් පෙන්වමින් ද්‍රව්‍යවල ත්‍රිමාණ රූපී බව හා ගති ලක්ෂණ පෙන්වීම.

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :
- ධාරකය මත ඇස් මට්ටමට පහළින් සහ ඉහළින් පිහිටන සේ සුදුසු පරිදි ද්‍රව්‍ය තබා ඒවා හොඳින් නිරීක්ෂණයට සිසුන් යොමු කර, ද්‍රව්‍යවල හැඩ සහ මතුපිට ස්වභාවය පිළිබඳ ව විමසන්න.
- ආලෝකය පතිත වන ආකාරය අනුව ද්‍රව්‍යවල හැඩ සහ එළිය, අඳුර මඟින් ත්‍රිමාණ ලක්ෂණ මතු වන ආකාරය අවබෝධ කර දෙන්න.
- ආදර්ශ චිත්‍ර ආධාරයෙන්, විවිධ මාධ්‍ය භාවිත කරන ආකාරය ගවේෂණයට සිසුන්ට අවස්ථාව සලසන්න.
- ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් තොර ව නිදහස් අතින් ඇඳීමට උපදෙස් දෙන්න.

- ද්‍රව්‍යවල මූලික ජ්‍යාමිතික හැඩ හඳුනාගෙන ඇඳ, ඒ ඇසුරෙන් අදාළ ද්‍රව්‍යයේ භෞතික හැඩය ඇඳීමට මඟ පෙන්වන්න.
- ඝන රේඛා, සියුම් රේඛා වැනි රේඛාවේ විවිධ ශක්තීන් සුදුසු පරිදි භාවිතයෙන් ද්‍රව්‍යවල හැඩ හා ත්‍රිමාණ ලක්ෂණ මතු කිරීමට උපදෙස් හා සහය ලබා දෙන්න.
- ද්‍රව්‍යවල ගති ස්වභාවය ඉතා හොඳින් මතු කර දැක්වීම සඳහා රේඛාවේ විවිධත්වය උචිත පරිදි භාවිත කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.
- විවිධ මාධ්‍ය භාවිතයෙන් අභ්‍යාසකරණයේ නිරත කරවන්න.

**ඇගයීම** :

- ද්‍රව්‍යවල දැකිය හැකි විවිධතා විස්තර කරන්න.
- පරිමාව හා පරිමාණය අනුව ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අඳින්න.
- රේඛාවේ විවිධතා හා ශක්තීන් භාවිත කර ද්‍රව්‍යවල ත්‍රිමාණ ලක්ෂණ මතු වන සේ එළිය අඳුර හා ගති ස්වභාව දක්වන්න.
- විවිධ මාධ්‍ය නිර්මාණකරණයට උචිත පරිදි හැසිරවීමේ කුසලතා ප්‍රදර්ශනය කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

2.1.2 - පෙට්ටියක් (සුදු කඩදාසියකින් ආවරණය කළ) හා ඒ මතින් දමන ලද රෙදි කඩක් විවිධ මාධ්‍යවලින් අධ්‍යයනය කිරීම. - (කාලච්ඡේද - 02)

2.1.3 - ප්ලාස්ටික් ජෝගුවකට දැමූ ක්‍රෝටන් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කරමු. - (කාලච්ඡේද - 02)

2.1.4 - කුඩා කළයකට සමාන මැටි බඳුනක්, පෙට්ටියක් හා වීදුරුවක් රේඛාවෙන් අධ්‍යයනය කරමු. - (කාලච්ඡේද - 02)

2.1.5 - ඇන්තූරියම් මල් පෝච්චියක් රේඛාවෙන් අධ්‍යයනය කරමු. (කාලච්ඡේද - 02)

2.1.6 - ගස් ලබු ගෙඩියක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයකට දැමූ වද මල් අත්තක් අධ්‍යයනය කරමු. - (කාලච්ඡේද - 02)

**නිපුණතාව 2.0** : **පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**නිපුණතා මට්ටම 2.2** : **ස්වාභාවික හා නිර්මිත වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.**

**ක්‍රියාකාරකම 2.2.1** : **පෙට්ටියක්, රෙදිකඩක්, කුඩා මැටි කළයක දමූ අරලිය මල් අත්තක්, ගස්ලබු ගෙඩියක්. වීදුරු බඳුනකට (Bowl) දමූ කඩදාසි රෝලක් සහිත ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් චිත්‍රණය කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :

- සුදු කඩදාසියකින් ආවරණය කරන ලද පෙට්ටියක් ( උදා: මාරි බිස්කට් පෙට්ටියක්) හා ඒ මත රැළි සිටින සේ ඇතිරූ වර්ණවත් රෙදි කඩක්, අරලිය මල් අත්තක් දමූ කුඩා කළයකට සමාන මැටි බඳුනක්, අඩක් ඉදුණු ගස් ලබු ගෙඩියක්, වීදුරු බඳුනකට (Bowl) දමූ කඩදාසි රෝලක්,
- භාණ්ඩ තැබීමට ධාරකයක්
- වර්ණ මාධ්‍ය හැසිරවීමට උචිත කඩදාසි
- පින්සල් හා වර්ණ
- විවිධ වර්ණ මාධ්‍යයෙන් අඳින ලද ද්‍රව්‍ය සම්පිණ්ඩනවල ආදර්ශ චිත්‍ර

**ඉගෙනුම් පල** :

- ධාරකය මත තබා ඇති ද්‍රව්‍යයන්ගේ විවිධත්වය විස්තර කරයි.
- පරිමාව, පරිමාණය. ඇස් මට්ටම, පර්යාවලෝකය හා අවකාශ භාවිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අඳියි.
- තලය භාවිතයේ දී ද්‍රව්‍ය සමූහයට ගැළපෙන සේ ධාරකය පරිමාණානුකූල ව ඇඳ දක්වයි.
- විවිධ වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම නිසි ලෙස භාවිත කර ද්‍රව්‍ය සමූහයේ එළිය අඳුර දැක්වීමෙන් ත්‍රිමාණ ලක්ෂණ, වයනය, පර්යාවලෝක ලක්ෂණ මතු කරයි.
- ද්‍රව්‍ය සමූහය මතු කෙරෙන සේ පසුබිමට වර්ණ භාවිත කරයි.
- තම නිර්මාණ හා අන් අයගේ නිර්මාණ අගයයි. රස විඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණය, නිරීක්ෂණය, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- ද්‍රව්‍ය සමූහය ධාරකය මත ඇස් මට්ටමට පහළින් සහ ඉහළින් පිහිටන සේ සකස් කර හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සැලසීම.
- ද්‍රව්‍යවල හැඩ හා ගති ලක්ෂණවල විවිධත්වය
- ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍ර ඇඳීමේ දී අනුගමනය කළ යුතු සිද්ධාන්ත භාවිතය (පරිමාව, පරිමාණ, පර්යාවලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, වයනය, අවකාශ භාවිතය, ඇස් මට්ටම)
- විවිධ වර්ණ මාධ්‍ය භාවිතය (දිය සායම්/පැස්ටල්/ඇක්‍රලික්)
- විවිධ උපකරණ හැසිරවීම

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :

- ඇස් මට්ටමට පහළින් සිටින සේ ධාරකය තබා, ද්‍රව්‍ය සමූහය ගැළපෙන පරිදි සකස් කරගන්න. පසුබිමට සුදු පැහැති පෘෂ්ඨයක් /තලයක් (white board/regiform) තබන්න.

- පන්ති කාමරයේ ඩෙස් පුටු අර්ධ කවාකාර ව සකසා, සිසුන් ස්ථාන ගත කර ද්‍රව්‍ය සමූහය සියලු සිසුන්ට හොඳින් පෙනෙන සේ තැබීමට සැලකිලිමත් වන්න.
- ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරවන්න.
- ද්‍රව්‍යයන්ගේ හැඩ හා ගති ලක්ෂණවල විවිධතා සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ආලෝකය වැටෙන ආකාරය අනුව ද්‍රව්‍යවල හැඩ, ත්‍රිමාණ ලක්ෂණ මතු වන අයුරු විමසමින් පැහැදිලි කරන්න.
- ආදර්ශ චිත්‍ර ඇසුරෙන් තලය සමබර ව භාවිත කරන ආකාරය, විවිධ වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම භාවිත කර ඇති ආකාරය පෙන්වා දෙමින් ගවේෂණයට අවස්ථාව ලබා දෙන්න.
- අවකාශ  භාවිතය පිළිබඳ අවබෝධයෙන් තලය සමබර වන සේ ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අඳින අයුරු හුනු පුවරුව ආධාරයෙන් පැහැදිලි කරන්න. මෙහි දී ද්‍රව්‍ය සමූහයේ සමස්ත උස හා පළල අනුව අඳින කඩදාසිය භාවිත කිරීම, ද්‍රව්‍ය සමූහයට ගැළපෙන සේ ධාරකය පරිමාණානුකූල ව වෙනස් කර ඇඳීම  පිළිබඳ අවධානය යොමු කරවන්න.
- අදාළ සිද්ධාන්තවලට අනුව වර්ණ මාධ්‍යයන්ට උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් ද්‍රව්‍ය සමූහය වර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.
- වර්ණ මාධ්‍ය හා උපකරණ නිවැරදි ව හැසිරවීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ද්‍රව්‍ය සම්පිණ්ඩනයට උචිත ලෙස පසුබිම වර්ණ කිරීමට  උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකමේ නිරත වීමේ දී  සිසුන්ට අවශ්‍ය උපදෙස් හා සහය  ලබා දෙන්න.
- සුදුසු පරිදි කාලය කළමනාකරණය කර ගනිමින් විවිධ ද්‍රව්‍ය සම්පිණ්ඩන ඇඳීමේ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

**ඇගයීම** :
- පරිමාව, පරිමාණ හා පර්යාවලෝක ලක්ෂණ අනුව තලයට ගැළපෙන සේ ද්‍රව්‍ය සමූහය අඳින්න.
- ද්‍රව්‍යවල විවිධත්වය, මතුපිට ස්වභාවය මතු වන සේ වර්ණ ගන්වන්න.
- සංරචන සිද්ධාන්ත හොඳින් මතු කෙරෙන සේ වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම භාවිත කරන්න.
- ද්‍රව්‍ය සම්පිණ්ඩනයට උචිත පරිදි පසුබිමට වර්ණ යොදා චිත්‍රය අවසන් කරන්න.

**ක්‍රියාකාරකම් සඳහා යෝජිත ද්‍රව්‍ය** :

- ඝනක, ඝනකාභ හැඩ - සුදු කඩදාසියකින් ආවරණය කරන ලද පෙට්ටි
- මෝස්තර සහිත හෝ රහිත හෝ වර්ණවත් රෙදි
- ගෝලාකාර වස්තු - අත් පන්දුව/පා පන්දුව/ගස් ලබු/තැඹිලි/කොමඩු/ඇපල්/දොඩම්/ අන්නාසි වැනි ගෙඩි වර්ග/මැටි බඳුන්
- සිලිංඩරාකාර වස්තු - බෝතල්/ජෝග්/ටින්/කෝප්ප/වීදුරු
- මල් සහිත හා රහිත විචිත්‍ර පැළෑටි හා අතු වර්ග - ඇන්තූරියම්/අරලිය/රුක් අත්තන/ක්‍රෝටන්
- පීරිසි, බන්දේසි, වීදුරු බඳුන්, මේස පිහි, කඩදාසි රෝල්, පින්සල් ආදි ද්‍රව්‍ය

- ඉහත සඳහන් විවිධ හැඩ හා විවිධ ස්වභාවයෙන් යුතු නිර්මිත හා ස්වාභාවික වස්තු කිහිපයක් සුදුසු පරිදි තෝරාගෙන ද්‍රව්‍ය සම්පිණ්ඩන සැලසුම් කර  ඇඳීමේ ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න. එහි දී පහත දක්වා ඇති අංක සහ කාලච්ඡේද අනුව ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

- 2.2.2, 2.2.3, 2.2.4, 2.2.5, 2.2.6 ක්‍රියාකාරකම් සඳහා කාලච්ඡේද සතර (04) බැගින් යොදා ගන්න.

**නිපුණතාව 3.0** : **පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.1** : **විවිධ බඳුන් සඳහා සැලසුම් හා සැරසිලි නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.1.1** : **ආලින්දයේ අලංකාරයට තබන බඳුනක් සැලසුම් කර නිර්මාණය කරමු.**

**කාලච්ඡේද** : 05 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- නිදර්ශන රූප සටහන්
- විවිධ බඳුන්වල ඡායාරූප සහිත සංයුක්ත තැටි හා පරිගණක යන්ත්‍ර
- සිමෙන්ති/පල්ප්
- චිත්‍ර අඳින කඩදාසි
- සිමෙන්ති මාධ්‍ය භාවිතයට අවශ්‍ය උපකරණ
- බයින්ඩින් කම්බි
- කම්බි දැල්
- ඩිමයි කඩදාසි
- කම්බි

**ඉගෙනුම් පල** :
- පරිසර අධ්‍යයනයෙන් භාණ්ඩ හා සැරසිලි සඳහා සැලසුම් සංකල්ප නිර්මාණය කරයි.
- අපේක්ෂිත අවසන් නිමැවුමට අදාළ සැලසුම, වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් වර්ණ ගන්වයි.
- උචිත ක්‍රමවේද භාවිත කරමින් මාධ්‍ය සකස් කරයි.
- නිර්මාණයේ ගුණාත්මක බව වැඩි දියුණු වන සේ උපකරණ හැසිරවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- අධ්‍යයන කාර්ය පිළිබඳ විධිමත් ව තොරතුරු එක් රැස් කර වාර්තාවක් සකස් කරයි.
- අනාගත වැඩ ලෝකයට සරිලන ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්මාණකරණයේ නිරත වෙයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :
- පරිසර අධ්‍යයනය
- සැලසුම් සංකල්ප
- අලංකරණයට තබන විවිධ බඳුන්
  - ඓතිහාසික
  - සමකාලීන (දේශීය හා විදේශීය)
- දළ සටහන්
- විවිධ හැඩ ආශ්‍රිත නිර්මාණ
  - සත්ත්ව හැඩ
  - ශාක හැඩ
- සැලසුම
- සැලසුම් මූලධර්ම
  - රිද්මය
  - සමබරතාව
  - සුසංගත බව
  - ඒකත්වය

- සැලසුම් චිත්‍ර
- ත්‍රිමාණ කෘති
- ආකෘති නිර්මාණය
- මාධ්‍ය භාවිතය
  - සිමෙන්ති
  - කඩදාසි පල්ප
- වර්ණ හා ශිල්ප ක්‍රම
- අධ්‍යයන සටහන්/වාර්තා සැකසීම

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස් :**

- අලංකාරයට තබන විවිධ බඳුන් පිළිබඳ ව අතීත, වර්තමාන හා දේශීය විදේශීය සාධක ඇසුරින් අධ්‍යයනයට යොමු කරවන්න.
- පරිසර අධ්‍යයනයෙන් අනාවරණය කරගත් හැඩවලට අනුව සැලසුම් මූලධර්ම පදනම් කරගෙන නව නිර්මාණයක් සඳහා දළ සැලසුමක් ඇඳීමට සිසුන් මෙහෙයවන්න.
  - දළ සැලසුම නිර්මාණයේ දී බඳුන තැබීමට අපේක්ෂිත ස්ථානය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව.
  - පරිසරයෙන් අනාවරණය කරගත් හැඩ සහ තල නිර්මාණශීලී ව සරල කර ගත හැකි බව, සිසුන්ට අවබෝධ වන ලෙස මඟ පෙන්වීම.
- නිර්මාණය කරන බඳුනට අදාළ ත්‍රිමාණ සැලසුම් චිත්‍රය වර්ණ මාධ්‍යවලට උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් වර්ණ ගැන්වීමට සිසුන් යොමු කරවන්න.
- නිමා කළ කෘතියේ පැති පෙනුම දිස්විය යුතු ආකාරය දළ සැලසුම් දෙකකින් ඇඳීමට උපදෙස් දෙන්න.
- සැලසුමට අනුව බඳුන නිර්මාණය කිරීමට අපේක්ෂිත මාධ්‍ය හා නිමැවුම කිරීමට අපේක්ෂිත ස්වභාවය තීරණය කිරීමට සහාය වන්න.
- සැලසුමට අනුව බඳුන නිර්මාණය කිරීම සඳහා තෝරාගත් මාධ්‍ය සකස් කර ගැනීමට මඟ පෙන්වන්න.
- කම්බි, කම්බි දැල් හා බයින්ඩින් කම්බි ආධාරයෙන් මූලික ආකෘතිය සකසා ගැනීමට උපදෙස් දෙන්න.
- නිර්මාණකරණයේ දී ඇති වන ගැටලු නිරවුල් කර ගැනීමට මඟ පෙන්වන්න.
- යොදා ගන්නා මාධ්‍ය හා උපකරණ නිසි පරිදි හැසිරවීමට සහය වන්න.
- කෘතිය මනා නිමාවකින් යුතු විය යුතු බව සිසුන්ට පැහැදිලි කරන්න.
- මෙම ක්‍රියාකාරකමට අදාළ තොරතුරු ගවේෂණය ආරම්භ කළ අවස්ථාවේ සිට අවසාන අවස්ථාව දක්වා රැස් කළ තොරතුරු පොත් පිංචක් ලෙස සකස් කර නිර්මාණය සමඟ ඉදිරිපත් කරන ලෙස ක්‍රියාකාරකම ආරම්භයේ දී ම සිසුන්ට දන්වන්න.

**ඇගයීම :**

- පරිසරයේ දක්නට ලැබෙන සත්ත්ව හා ශාක හැඩ, මෝස්තර නිර්මාණකරණයේ දී මෝස්තර ඒකක ලෙස නිර්මාණාත්මක ව භාවිත කළ හැකි ආකාරය උදාහරණ සහිත ව විස්තර කරන්න.
- සත්ත්ව හා ශාක හැඩ ඇතුළත් අලංකාර බඳුනක් සඳහා සුදුසු දළ සැලසුමක් සැලසුම් මූලධර්මවලට අනුව නිර්මාණය කරන්න.
- සැලසුම් රේඛා චිත්‍ර, අපේක්ෂිත අවසන් නිමැවුමට අදාළ වර්ණ භාවිතයෙන් ත්‍රිමාණ රූපී ව වර්ණ ගන්වන්න.
- සැලසුමට අනුව සිමෙන්ති/පල්ප් භාවිතයෙන් බඳුන නිර්මාණය කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

3.1.2 - සාම්ප්‍රදායික මෝස්තරවලින් සැරසිලි කරන ලද ස්වර්ණාභරණ බහා තැබීමට සුදුසු මංජුසාවක් ඇඳ වර්ණ ගන්වමු. (කාලච්ඡේද - 03)

3.1.3 - වැහිපීල්ලෙන් වැසි ජලය පතිත වන ස්ථානයක තැබීමට සුදුසු බඳුනක් සඳහා ත්‍රිමාණ සැලසුමක් ඇඳ වර්ණ ගන්වමු. (කාලච්ඡේද - 03)

3.1.4 - ආයතනයක පරිහරණයට සුදුසු තෙත කුඩ රැඳවීම සඳහා භාවිත කළ හැකි බඳුනක් සැලසුම් කර ග්‍රීක මැටි බඳුන්වල චිත්‍ර ඇසුරෙන් සැරසිලි කරමු. (කාලච්ඡේද - 03)

3.1.5 - "තේ කොළ" අපනයනයේ දී ඇසුරුම් සඳහා භාවිත කිරීමට සුදුසු බඳුනක් චිත්‍රණය කරමු. (කාලච්ඡේද - 03)

3.1.6 - ඔසුපැන් අලෙවි සැලක් ඉදිරිපස තැබිය හැකි, එහි අර්ථය ප්‍රකාශිත විශාල ප්‍රමාණයේ බඳුනක් චිත්‍රණය කරමු. (කාලච්ඡේද - 03)

**නිපුණතාව 3.0** : **පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.2** : **ගෘහයන්හි ස්ථාවර අංග සඳහා නව නිර්මාණ කරයි.**

**ක්‍රියාකාරකම 3.2.1** : **මල්ලියකමින් සැරසූ වා කවුළු කැටයමක් අඳිමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ හැඩැති වා කවුළු කැටයම් සහිත රූප සටහන්
- කැටයම් මෝස්තර සහිත වා කවුළුවල ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි
- පරිගණක යන්ත්‍ර
- විවිධ මෝස්තර හා සැරසිලි දැක්වෙන රූප සටහන්
- චිත්‍ර අඳින කඩදාසි
- වර්ණ
- පිටපත් කිරීමේ කඩදාසි (Tracing papers)

**ඉගෙනුම් පල** :
- විවිධ වා කවුළු හැඩ හා වා කවුළුවක අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡා කරයි.
- සැලසුම් මූලධර්ම භාවිත කර සැලසුම් අඳියි.
- ද්‍රව මාධ්‍ය මතුපිට ලක්ෂණ ප්‍රකට වන සේ චිත්‍ර වර්ණ ගන්වයි.
- සංයමයකින් යුතු ව ක්‍රියාකාරකමේ නිරත වෙයි.
- නිර්මාණ අගයයි. රස විඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, ලිඛිත ඉදිරිපත් කිරීම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- වා කවුළු කැටයම්
  - ඓතිහාසික
  - වර්තමාන
- විවිධ හැඩ
- නව නිර්මාණ
- කලාත්මක ලක්ෂණ
- සැලසුම් මූලධර්ම
  - රිද්මය
  - සමබරතාව
  - සුසංගත බව
  - ඒකත්වය
- දළ සැලසුම් හා ත්‍රිමාණ චිත්‍ර
- ද්‍රව මාධ්‍යයේ ස්වභාවය (වයනීය ලක්ෂණ)
- වර්ණ භාවිතය
- අධ්‍යයන සටහන්

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :

- සුදුසු පරිදි අදාළ ගුණාත්මක යෙදවුම් භාවිත කර විවිධ මූලාශ්‍රය ඇසුරින් වා කවුළු පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

- අධ්‍යයනයෙන් අනාවරණය කරගත් කරුණු පදනම් කරගෙන උචිත පරිදි සැරසිලි යොදා වා කවුළුවකට දළ සැලැස්මක් අඳින්න.

- විෂය කරුණු අවධාරණය වන පරිදි දළ සැලසුම අවසන් චිත්‍රය තෙක් සංවර්ධනය කිරීමට සහය වන්න.

- දැව මාධ්‍යයේ වයනීය ලක්ෂණ ප්‍රකට වන සේ වර්ණ කිරීම සඳහා සිසුන්ට මඟ පෙන්වන්න.

- සාර්ථක නිර්මාණයක් කිරීම සඳහා සිසුන් මෙහෙයවන්න.

- පන්තියේ සමස්ත නිර්මාණ සාකච්ඡා මඟින් ඇගයීමට ලක් කරන්න.

- සමස්ත ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය තෙක් රැස්කර ගන්නා ලද දත්ත සියල්ල ගොනුවක් සේ සකස් කර, අවසන් නිර්මාණය සමඟ ඉදිරිපත් කළ යුතු බවට ක්‍රියාකාරකම ආරම්භයේ දී ම සිසුන්ට උපදෙස් දෙන්න.

**ඇගයීම** :

- වා කවුළුවක තිබිය යුතු විශේෂ ලක්ෂණ හා අවශ්‍යතාව විස්තර කරන්න.
- වා කවුළු පිළිබඳ ඓතිහාසික හා වර්තමාන තොරතුරු සාකච්ඡා කරන්න.
- අභිමත හැඩයකට මල්ලියකම් සහිත කැටයමක දළ සැලැසුමක් අඳින්න.
- උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් අඳින ලද කැටයම වර්ණ ගන්වන්න.

**නිපුණතාව 3.0** : **පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.**

**නිපුණතා මට්ටම 3.1** : **විවිධ අවශ්‍යතා සඳහා සැරසිලි චිත්‍ර නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 3.3.1** : **ෂඩස්‍රාකාර ලෝහ බන්දේසියකට සුදුසු මුළු තල සැරසිල්ලක් ඇඳ වර්ණ කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ මෝස්තර යෙදූ පිත්තල/රිදී සහ වෙනත් ලෝහ බන්දේසිවල ඡායාරූප, රූප සටහන්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර
- සාම්ප්‍රදායික සිංහල සැරසිලි ඒකක ඇතුළත් රූප සටහන්
- චිත්‍ර ඇඳීමේ උපකරණ
- වර්ණ මාධ්‍ය
- පිටපත් කිරීමේ කඩදාසි සහ චිත්‍ර අඳින කඩදාසි

**ඉගෙනුම් පල** :
- මෝස්තර නිර්මාණයේ දී සාම්ප්‍රදායික සැරසිලි ඒකක නිර්මාණශීලී ව භාවිත කළ හැකි ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.
- පිත්තල, රිදී, තඹ සහ වෙනත් ලෝහ භාවිතයෙන් නිර්මාණය කරන ලද බන්දේසිවල ඇති සැරසිලි රටා පිළිබඳ සාකච්ඡා කරයි.
- මෝස්තරයක් නිර්මාණය කිරීමේ සිද්ධාන්ත නිවැරදි ව අනුගමනය කරමින් මුළු තල මෝස්තරයක් චිත්‍රණය කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සැලසුම් කරණයේ සිට අවසන් චිත්‍රය තෙක් නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරයි.
- පාරිභාරික අවශ්‍යතා සහ මාධ්‍යවල ගති ස්වභාවය පිළිබඳ අවබෝධයෙන් නිර්මාණකරණයේ යෙදෙයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :
- පාරිභාරික/ව්‍යාවහාරික අවශ්‍යතා
- විවිධ සැරසිලි
  - මුළු තල සැරසිලි
  - වාටි සැරසිලි
- කර්මාන්තයට සුදුසු බව
- දළ සටහන්
- විවිධ හැඩ
- සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා රටා
- ප්‍රමාණ
- සැලසුම් මූලධර්ම
  - රිද්මය
  - සමබරතාව
  - සුසංගත බව
  - ඒකත්වය
- නව නිර්මාණ
- වර්ණ හා ශිල්ප ක්‍රම
- නිමාව

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස්** :

- සාම්ප්‍රදායික සිංහල සැරසිලි මෝස්තර නිරීක්ෂණයට හා අධ්‍යයනයට අවස්ථාව ලබා දෙන්න.
- මෝස්තර මූලිකාංග හා මූලධර්ම සපයා ගත් නිදර්ශන ඇසුරෙන් සාකච්ඡා කරන්න.
- විවිධ සැරසිලි සහිත පිත්තල, රිදී, තඹ සහ වෙනත් ලෝහ බන්දේසි ඇතුළත් ඡායාරූප සිසුන්ගේ නිරීක්ෂණයට යොමු කරවන්න.
- වෙන් කරගත් නිශ්චිත සීමාවක් තුළ කරනු ලබන සැරසිලි මුළුතල සැරසිලි ලෙස හඳුන්වන බවට, නිදසුන් පෙන්වා දෙමින් පැහැදිලි කරන්න.
- ෂඩස්‍රාකාර බන්දේසියකට සැරසිලි සැලසුම් කිරීමේ දී අනුගමනය කළ යුතු සැලසුම් ක්‍රමවේද සහ පියවර පිළිබඳ සිසුන් දැනුවත් කර දළ සටහන් ඇඳීමට යොමු කරවන්න.
- පරිමාණ ලබා ගැනීමේ දී ජ්‍යාමිතික උපකරණ නිවැරදි ව භාවිත කර සැලසුම් ඇඳීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- බන්දේසියේ සමස්ත මුහුණතට (තලයට) උචිත ආකාරයෙන් සැරසිලි ඇතුළත් කළ යුතු බව පහදා දෙන්න.
- නිර්මාණය කරන ලද සැරසිලි ඒකක බන්දේසියේ තලයට පිටපත් කිරීමට/ඇඳීමට සිසුන් යොමු කරවන්න.
- එක ම ඒකකය නැවත නැවත යෙදෙන්නේ නම්, ඒ සඳහා පිටපත් කිරීමේ කඩදාසි (Tracing paper) භාවිත කිරීමට උපදෙස් දෙන්න.
- රේඛා චිත්‍රය වර්ණ ගැන්වීමේ දී බන්දේසිය නිර්මාණය කිරීමට බලාපොරොත්තුවන ලෝහ මාධ්‍යයේ (රිදී/පිත්තල/තඹ හෝ වෙනත් ලෝහ) ස්වභාවය මතු වන සේ වර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- යොදා ඇති සැරසිලි ඒකකවල උත්තල හා අවතල නෙරීම් මතු වන සේ වර්ණ කිරීමෙන් චිත්‍රයේ ත්‍රිමාණ ලක්ෂණ මෙන් ම අලංකාරය ද මතු කළ හැකි බව තහවුරු කරන්න.

**ඇගයීම** :

- පාරිභාරික අවශ්‍යතා සහ මාධ්‍ය පිළිබඳ සැලකිලිමත් වෙමින් ෂඩස්‍රාකාර ලෝහ බන්දේසියකට සුදුසු මුළු තල මෝස්තරයක් සැලසුම් කර චිත්‍රණය කරන්න.
- විවිධ ලෝහවලින් නිර්මාණය කිරීමට අඳින මුළු තල මෝස්තර සඳහා සාම්ප්‍රදායික සිංහල සැරසිලි නිර්මාණශීලී ව භාවිත කරන්න.
- මෝස්තර නිර්මාණකරණයේ සිද්ධාන්ත මුළු තල මෝස්තර චිත්‍ර නිර්මාණයේ දී උචිත පරිදි භාවිත කරන්න.
- නිර්මාණයට උචිත වර්ණ හා ශිල්ප ක්‍රම අනුගමනය කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

3.3.2 - ළමා අවශ්‍යතාවලට භාවිත කළ හැකි රෙදි සඳහා ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කරමු. (කාලච්ඡේද - 04)

3.3.3 - වෘත්තාකාර කුශන් කවරයක් සඳහා වියුක්ත රූපී හැඩතල සහිත සැරසිල්ලක් නිර්මාණය කරමු.
(කාලච්ඡේද - 04)

3.3.4 - ආයත චතුරස්‍රාකාර බුමුතුරුණකට සුදුසු සැරසිල්ලක් නිර්මාණය කරමු (මොනෝ ක්‍රෝම් ක්‍රමයට වර්ණ ගන්වන්න). (කාලච්ඡේද - 04)

3.3.5 - කාන්තා හෝ පිරිමි හෝ ඇඳුම් සඳහා සුදුසු වාටි සැරසිල්ලක් නිර්මාණය කරමු. (කාලච්ඡේද - 04)

3.3.6 - සාම්ප්‍රදායික සිංහල සැරසිලි මෝස්තර ඇසුරෙන් ආයත චතුරස්‍රාකාර (සෘජුකෝණාශ්‍රාකාර) වියන් තලයක් සැරසීම සඳහා මෝස්තරයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද - 04)

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.1.** : **පෘථුල තේමා යටතේ පෝස්ටර් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.1.1.** : **"ආගමික සහජීවනය මඟින් යහපත් සමාජයක් ගොඩ නගමු" යන තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ තේමා යටතේ නිර්මාණය වූ පෝස්ටර් චිත්‍ර
- චිත්‍ර ඇඳින කඩදසි
- පිටපත් කිරීමේ කඩදාසි, පැන්සල්, ජ්‍යාමිතික උපකරණ, පින්සල්,
- පෝස්ටර් වර්ණ හෝ වෙනත් උචිත වර්ණ මාධ්‍යයක්

**ඉගෙනුම් ඵල** :
- පෝස්ටර් චිත්‍ර ග්‍රැෆික් චිත්‍ර කලාවට අයත් බව ප්‍රකාශ කරයි.
- පෝස්ටර් චිත්‍රයක ලක්ෂණ හඳුනාගෙන අනෙක් චිත්‍රවලින් එය වෙනස් වන්නේ කෙසේ දැයි විස්තර කරයි.
- තේමාවට අදාළ ව සංකේත රූප හා අක්ෂර උචිත පරිදි භාවිත කර තලය, අවකාශය හසුරුවමින් පෝස්ටරය සැලසුම් කරයි.
- සන්නිවේදනාර්ථ මතු කෙරෙන සේ පෝස්ටර් නිර්මාණයට උචිත ලෙස මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිත කරයි.
- පෝස්ටර් චිත්‍ර අගයයි. රස විඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය/ගවේෂණ හා නිරීක්ෂණ/ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පෝස්ටර් චිත්‍රයක ලක්ෂණ හා වැදගත්කම, සංකීර්ණ තේමාවක් පිළිබඳ පණිවිඩයක් සරල ව, නිරවුල් ව, අර්ථාන්විත ව, වේගවත් ව සන්නිවේදනය කිරීම.
- රූප හා වර්ණ සංකේතාත්මක ව භාවිත කිරීම.
- තේමාවට ගැළපෙන සරල, අර්ථාන්විත, කෙටි, නිර්මාණශීලි පාඨයක් උචිත අක්ෂර භාවිතයෙන් සැලසුම් කිරීම.
- සංකේත රූප හා පාඨය තලය හා අවකාශයට ගැළපෙන සේ සැලසුම් කිරීම.
- පෝස්ටරය මනා නිමාවකින් යුතු ව නිර්මාණය කිරීම.

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස් :**

- පෝස්ටර් චිත්‍රයක ලක්ෂණ සිසුන්ගෙන් විමසමින් එය අනෙක් චිත්‍රවලින් වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න.
- ආදර්ශ පෝස්ටර් චිත්‍ර නිරීක්ෂණයෙන් තලය, අවකාශය, සංකේත රූප, අක්ෂර, වර්ණ තේමාවට උචිත පරිදි භාවිත කර ඇති ආකාරය ගවේෂණයට සිසුන්ට අවස්ථාව සලසන්න.
- පෝස්ටර් චිත්‍රයකින් දෙන පණිවුඩය නිරවුල් ව වේගවත් ව සන්නිවේදනය විය යුතු බව පැහැදිලි කරන්න.
- විවිධ කාරණයන්හි දී රූප හා වර්ණ සංකේතාත්මකව භාවිත කරන අයුරු අවබෝධ කර දෙන්න.
- තේමාවට අදාළ ව සැලසුම් කිරීමේ දී දළ සැලසුම් ඇඳීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- පෝස්ටර් සැලසුම් කිරීමේ දී ජ්‍යාමිතික උපකරණ නිසි ලෙස භාවිත කිරීමට උපදෙස් දෙන්න.

- පෝස්ටර් චිත්‍රයට ගැළපෙන පාඨයක් ගොඩ නගා අක්ෂරකරණයේ ක්‍රමවේද නිවැරදි ව අනුගමනය කර පෝස්ටරයට ඇතුළත් කරවන්න.
- සුදුසු ක්‍රමවේද භාවිතයෙන් සැලසුම් චිත්‍රය අඳින කඩදාසියට පිටපත් කිරීමට යොමු කරන්න (සැලසුම් අඳින ලද පිටපත් කිරීමේ කඩදාසිය පිටුපස පැන්සලෙන් පාට කර අඳින කඩදාසිය මත තබා නැවත රූප හා අක්ෂර උඩින් තද කර ඇඳීම/කාබන් කොළයක් භාවිත කිරීම.)
- උචිත ශිල්ප ක්‍රම භාවිතයෙන් පෝස්ටර් වර්ණ හෝ වෙනත් සුදුසු වර්ණ මාධ්‍යයක් හෝ උපයෝගි කොටගෙන වර්ණ කිරීමට සලස්වන්න.
- වර්ණ කළ පෝස්ටර් චිත්‍රය මත අදාළ පාඨය පිටපත් කර වර්ණ ගැන්වීමට යොමු කරන්න.
- පෝස්ටර් නිර්මාණය මනා නිමාවකින් යුතු වීමේ වැදගත්කම පහදන්න.
- ක්‍රියාකාරකමේ දී සිසුන්ට අවශ්‍ය උපදෙස් හා සහය ලබා දෙන්න.

**ඇගයීම** :
- පෝස්ටර් චිත්‍රයක මූලික ලක්ෂණ නම් කරන්න.
- තේමාවට අදාළ ව තලය, අවකාශය, සංකේත රූප හා අක්ෂර භාවිත කර පෝස්ටර් චිත්‍රය සැලසුම් කරන්න.
- උචිත වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයෙන් මනා නිමාවකින් යුතු ව පෝස්ටරය නිර්මාණ කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම් :**

4.1.2 - "වන සම්පත අපේ මිතුරෙකි. අපි එය සුරකිමු."තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 04)

4.1.3 - "මනා සෞඛ්‍යයක් පවත්වා ගැනීම සඳහා යහ පුරුදු වඩවමු."තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 04)

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.2.** : **විවිධ නිෂ්පාදන හා සේවා ප්‍රචාරණය සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.2.1.** : **"යුවතියන්ගේ හිසකෙස්වල ආලේප කිරීමට නිෂ්පාදනය කළ නවතම තෙල් වර්ගයක් (hair oil) බහලු බෝතලයක් සඳහා ලේබලයක්" නිර්මාණය කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම** :
- විවිධ නිෂ්පාදන සඳහා වූ ලේබල් කිහිපයක්
- චිත්‍ර අඳින කඩදාසි, පිටපත් කිරීමේ කඩදාසි
- පැන්සල්, ජ්‍යාමිතික උපකරණ, පින්සල්
- වර්ණ මාධ්‍ය (දිය සායම්/පෝස්ටර් සායම්/ඇක්‍රලික්)

**ඉගෙනුම් ඵල** :
- නිෂ්පාදන අවශ්‍යතා සඳහා යොදා ගන්නා ලේබල්, ග්‍රැෆික් චිත්‍ර කලාවේ වැදගත් අංගයක් බව ප්‍රකාශ කරයි.
- ලේබලයක අන්තර්ගත විය යුතු මූලික අංග නම් කරයි.
- සැලසුම්කරණයේ දී ජ්‍යාමිතික උපකරණ භාවිත කරයි.
- තලය, අවකාශය පිළිබඳ අවබෝධයෙන් රූප, අක්ෂර හා වර්ණ සම්පිණ්ඩනය කරයි.
- වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම, අනුගමනය කර තේමාවට අනුව ලේබලයක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ හා නිරීක්ෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විවිධ නිෂ්පාදන ප්‍රචාරණයේ දී සහ අලෙවියේ දී ලේබල් භාවිතය
- නිෂ්පාදනය පිළිබඳ ඍජු ව සන්නිවේදනය කිරීමට උචිත රූප හා වර්ණ
- නිෂ්පාදන නාමය මතු කිරීමට යෝග්‍ය අක්ෂර (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
- බෝතලයේ හැඩයට ලේබලය ගැළපීම
- ලේබලයේ අඩංගු විය යුතු මූලික අංග හැඩය තුළ මනා ව ගොනු කිරීම
- මුද්‍රණයට උචිත පැහැදිලි බව හා නිමාව

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස් :**

- ලේබලයක උපයෝගිතාව විමසන්න.
- ආදර්ශ ලේබල් නිරීක්ෂණයෙන් ලේබලයක මූලික අංග හා නිෂ්පාදනයට උචිත ලෙස ඒවා යොදා ඇති අයුරු ගවේෂණයට යොමු කරන්න.
- තේමාවට උචිත රූප, අක්ෂර හා වර්ණ භාවිත කරන අයුරු සාකච්ඡා කරන්න.
- ලේබලයේ හැඩය බෝතලයට ගැළපීම වැදගත් බව පෙන්වා දෙන්න.
- දළ සැලසුම් ඇඳ සුදුසු සැලසුමක් තෝරා පිටපත් කිරීමේ කඩදාසි මඟින් අඳින කඩදාසියට පිටපත් කිරීමට උපදෙස් දෙන්න.
- උචිත ශිල්ප ක්‍රම භාවිත කර සුදුසු මාධ්‍යයකින් වර්ණ කරවන්න.
- නිර්මාණශීලී ලෙස පැහැදිලි හා මනා නිමාවකින් යුතු ව ලේබලය නිර්මාණය කරවන්න.

**ඇගයීම** :

- ලේබලයක අවශ්‍යතාව හා මූලික ලක්ෂණ විස්තර කරන්න.
- රූප, අක්ෂර, වර්ණ මාධ්‍ය හා ශිල්ප ක්‍රම උචිත පරිදි නිර්මාණ සැලසුම් කාර්යයේ දී භාවිත කරන්න.
- සන්නිවේදනාර්ථ මතු වන සේ හා පැහැදිලි නිමාවකින් යුතු ව ලේබල් නිර්මාණය කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

4.2.2 - නවතම චොක්ලට් වර්ගයක් සඳහා දවටනයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 02)

4.2.3 - පාසල් මාධ්‍ය ඒකකය සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 02)

4.2.4 - නව වසරට සුබ පැතීම සඳහා සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 02)

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**නිපුණතා මට්ටම 4.3** : **තෝරාගත් පරිගණක මෘදුකාංග ඇසුරෙන් ග්‍රැෆික් නිර්මාණ කරයි.**

**ක්‍රියාකාරකම 4.3.1** : **"තම හොඳ ම යහළුවාගේ උපන් දිනය වෙනුවෙන් සුබ පැතුම් පතක් නිර්මාණය කරමු."**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ සුබ පැතුම් පත්
- ග්‍රැෆික් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග ඇතුළත් පරිගණක
- මුද්‍රණ යන්ත්‍ර
- මුද්‍රණ කඩදාසි

**ඉගෙනුම් පල** :
- පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණයට යොදාගත හැකි මෘදුකාංග නම් කරයි.
- පරිගණක ග්‍රැෆික් නිර්මාණ වත්මන් සමාජයේ වැදගත් සන්නිවේදන කාර්යයක් ඉටුකරන බව පිළිගනී.
- ග්‍රැෆික් නිර්මාණයට අදාළ පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ ව ලබාගත් දැනුම හා හැකියාව ප්‍රායෝගික ව භාවිත කරයි.
- අවශ්‍යතාවට අනුව ග්‍රැෆික් සැලසුම්කරණයේ යෙදෙයි.
- චිත්‍ර විෂය හැදෑරීමෙන් ලබන අත්දැකීම් ග්‍රැෆික් නිර්මාණවල කලාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා උපයෝගී කර ගනියි.
- ග්‍රැෆික් නිර්මාණ අගයයි. රස විඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ හා නිරීක්ෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණයට වත්මන් සමාජය තුළ ඇති වැදගත්කම.
- පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග හඳුනා ගැනීම හා භාවිතය. (Gimshop, Inkscape,Photoshop, Illustrator, Paint, Power point)
- පරිගණක ග්‍රැෆික් නිර්මාණයේ දී යොදාගැනෙන මූලිකාංග (දෘශ්‍ය රූප, අක්ෂර, වර්ණ සහ තාක්ෂණික ක්‍රම ශිල්ප)
- අවශ්‍යතාවට උචිත බව, සන්නිවේදනාර්ථය මතු කිරීම හා මුද්‍රණයට යෝග්‍ය බව.
- නිර්මාණශීලීත්වය හා ආකර්ෂණීය බව.

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස් :**
- පාසලේ පරිගණක විද්‍යාගාරය භාර ආචාර්යවරයා සම්බන්ධ කොට ගෙන ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ගන්න.
- පරිගණක විෂය භාර ආචාර්යවරයාගේ සම්පත් දායකත්වය සුදුසු පරිදි යොදාගෙන පරිගණකය හා ග්‍රැෆික් නිර්මාණ මෘදුකාංග භාවිතය පිළිබඳ මූලික දැනුම සිසුන්ට ලබා දෙන්න.
- උපන් දින සුබ පැතුම් පතක් නිර්මාණයට යොදාගත හැකි දෘශ්‍ය රූප හා අක්ෂර වර්ග පරිගණකයෙන් සොයා ගැනීමට සිසුන්ට සහය වන්න. (අවශ්‍ය නම් රූප අතින් ඇඳ ස්කෑන් යන්ත්‍රයක් මඟින් පරිගණකය වෙත ලබා ගැනීමට පහසුකම් සලසා දෙන්න).
- ආදර්ශ සුබ පැතුම් පත් ඇසුරෙන් නිර්මාණ සැලසුම්කරණයේ හා පරිගණක මෘදුකාංග ශිල්ප ක්‍රම භාවිතයේ විශේෂතා හඳුන්වා දෙන්න.

- නිර්මාණයට යොදාගන්නා මෘදුකාංග භාවිතයේ දී අවශ්‍ය සහය ලබා දෙන්න.
- නිර්මාණකරණයේ දී වෙනස්කම් සිදුකළ යුතු අවස්ථාවල මෘදුකාංග ශිල්ප ක්‍රම හා ඊට අදාළ උපකරණ (tools) ගැළපෙන පරිදි යොදා ගැනීමට මග පෙන්වන්න.
- නිර්මාණය කළ සුබ පැතුම් පත වර්ණයෙන් මුද්‍රණය සඳහා අවස්ථාව සලසා දෙන්න.

**ඇගයීම** :

- පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණයට යොදාගත හැකි මෘදුකාංග නම් කරන්න.
- පරිගණක ආශ්‍රයෙන් මුද්‍රණයට අවශ්‍ය දේ නිර්මාණය කිරීමේ ඇති වාසි ලැයිස්තු ගත කරන්න.
- පරිගණකය ඇසුරෙන් උපන්දින සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.
- ග්‍රැෆික් නිර්මාණ මෘදුකාංගවල ශිල්ප ක්‍රම උචිත පරිදි නිර්මාණ කාර්යයේ දී භාවිත කරන්න.

**යෝජිත ක්‍රියාකාරකම්** :

4.3.2 - කලා උලෙළක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 02)

4.3.3 - ඩෙංගු රෝගයේ භයානක කම ප්‍රකටවන දැන්වීමක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 02)

4.3.4 - පාසලේ පැවැත්වෙන විද්‍යා ප්‍රදර්ශනයක් පිළිබඳ විස්තර කියැවෙන ප්‍රචාරක පෝස්ටරයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 04)

**නිපුණතාව 4.0** : **නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 4.4** : **විශේෂාංග ලිපි හා ළමා කතන්දර පොත් ඇතුළු පිටු සඳහා සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 4.4.1** : **"බක් මාසේ අවුරුදු සිරි"නමින් පුවත්පතක පළ කෙරෙන විශේෂාංග ලිපියක් සඳහා වර්ණ සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු.**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විශේෂාංග ලිපි සඳහා පුවත්පත්වල පළ වූ විවිධ සන්නිදර්ශන චිත්‍ර
- චිත්‍ර අඳින කඩදාසි, පිටපත් කිරීමේ කඩදාසි, පැන්සල්, පින්සල්
- විවිධ මාධ්‍ය (දිය සායම්/පැස්ටල්/පාට පැන්සල්/ඇක්‍රලික්/ජෙල් පෑන් )

**ඉගෙනුම් පල** :
- 'සන්නිදර්ශන චිත්‍ර' ග්‍රැෆික් නිර්මාණ අංගයක් බව ප්‍රකාශ කරයි.
- සන්නිදර්ශන චිත්‍රවල සුවිශේෂතා විස්තර කරයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණාංගවලට අනුව සන්නිදර්ශන චිත්‍රවල ස්වාභාවය වෙනස් වන බව පිළිගනී.
- තේමාවට අදාළ ව දළ සටහන් අඳියි.
- විශේෂාංග ලිපියේ සන්නිවේදනාර්ථ මතු වන සේ රේඛාව, හැඩතල, වර්ණ භාවිත කරයි.
- අවකාශය සුදුසු පරිදි යොදාගෙන තේමාවට අදාළ ව සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරයි.
- නිර්මාණ අගයයි. රස විඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය, ගවේෂණ හා නිරීක්ෂණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පුවත් පත්, සඟරා, කතා පොත්, ආදියේ පළ වන සාහිත්‍යමය නිර්මාණවල අර්ථය වඩා පැහැදිලි කිරීම හා ඍජු ව ග්‍රහණය කර ගැනීම සඳහා අඳින චිත්‍ර සන්නිදර්ශන චිත්‍ර නම් වේ.
- නිර්මාණාංගවලට ගැලපෙන ලෙස විවිධ ශෛලියෙන් යුත් සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කළ හැකි බව.
- සන්නිදර්ශන චිත්‍ර මඟින් යම් නිර්මාණයක අර්ථය සහ පාඨකයාට නිර්මාණය පිළිබඳ රසවත් භාවයක් ඇති කිරීමට හැකි වීම.
- රේඛා, හැඩතල හා වර්ණ භාවිතයෙන් ස්වාභාවික නැතහොත් ශෛලිගත/නිර්මාණාත්මක ක්‍රමයකට සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය.
- දළ සටහන් මඟින් ගොඩනඟන චිත්‍රය, පිටපත් කිරීමේ කඩදාසි භාවිතයෙන් අඳින කඩදාසියට පිටපත් කිරීමේ වැදගත්කම.
- යම් සාහිත්‍ය නිර්මාණයක සන්නිදර්ශන චිත්‍ර යොදන ස්ථාන සහ අක්ෂර යොදා ඇති ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් චිත්‍ර නිර්මාණය.

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස් :**

- සන්නිදර්ශන චිත්‍ර පිළිබඳ ව සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- සන්නිදර්ශන චිත්‍රවල සුවිශේෂතා නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
- විවිධ නිර්මාණාංගවලට අනුව සන්නිදර්ශන චිත්‍රවල ස්වභාවය (කළු සුදු සහ වර්ණ) වෙනස් වන අයුරු පහදා දෙන්න.
- ආදර්ශ සන්නිදර්ශන චිත්‍ර නිරීක්ෂණයෙන් විශේෂාංග ලිපි සඳහා ඒවා භාවිත කර ඇති අයුරු ගවේෂණයට සිසුන්ට අවස්ථාව සලසන්න.
- රේඛාව, සන්නිදර්ශන චිත්‍රයක මූලික සාධකයක් වන බව පැහැදිලි කරන්න.
- විශේෂාංග ලිපියේ අන්තර්ගතය සන්නිදර්ශන චිත්‍රයෙන් සන්නිවේදනය විය යුතු බව අවධාරණය කරන්න.
- ලිපියේ අක්ෂර යොදා ඇති ආකාරය ගැන අවබෝධයෙන් සන්නිදර්ශන චිත්‍රය ස්ථානගත කරන අයුරු වටහා දෙන්න.
- නිර්මාණාංගයට හා තේමාවට උචිත ශෛලියක් අනුගමනය කිරීම, සන්නිදර්ශන චිත්‍ර භාවිතයේ ගුණාත්මක බව වැඩි වීමට හේතු වන ආකාරය නිදර්ශන ඇසුරෙන් පෙන්වා දෙන්න.
- රූප හා වර්ණ සංකේතාත්මක ව භාවිත කළ හැකි අයුරු පැහැදිලි කරන්න.
- අක්ෂර සහිත කොටසට උචිත පරිදි චිත්‍රයේ පසුබිම වර්ණ ගැන්වීම හෝ වර්ණ නොගැන්වීම හෝ සිදු කළ හැකි බව පෙන්වා දෙන්න.
- දළ සටහන් ඇඳීමෙන් ගොඩනඟන චිත්‍රය පිටපත් කිරීමේ කඩදාසියෙන් අඳින කඩදාසියට පිටපත් කිරීමට යොමු කරන්න.
- මනා නිමාවක් සහිත ව වර්ණ ගන්වා, අඳින ලද ශෛලියට අනුව අවශ්‍ය නම් බාහිර රේඛාවෙන් මතු කිරීමට මඟ පෙන්වන්න. මේ සඳහා ජෙල් පෑනක් භාවිත කළ හැකි ය.

**ඇගයීම** :

- සන්නිදර්ශන චිත්‍ර වර්ග හා ඒවායේ විශේෂ ලක්ෂණ විස්තර කරන්න
- මුද්‍රිත මාධ්‍ය, පිටු සැලසුමට අදාළ අවකාශය හා තේමාව පිළිබඳ සැලකිලිමත් වෙමින් උචිත ශෛලියකට අනුව සන්නිදර්ශන චිත්‍රය සැලසුම් කරන්න.
- රේඛා, හැඩතල, වර්ණ සහ ශිල්ප ක්‍රම උචිත ලෙස භාවිත කරන්න.
- සන්නිදර්ශන චිත්‍රයෙන් සාහිත්‍ය නිර්මාණාංගයේ අර්ථය පැහැදිලිව මතු කිරීමට සැලකිලිමත් වන්න.

**යෝජිත ක්‍රියාකාරකම් :**

4.4.2 - ළමා කතන්දර පොතක ඇතුළු පිටුවක් සඳහා වර්ණ සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 04)

4.4.3 - ලෝක කම්කරු දිනය වෙනුවෙන් පුවත්පතක පළ කෙරෙන විශේෂාංග ලිපියක් සඳහා කළු සුදු සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරමු. (කාලච්ඡේද 03)

**නිපුණතාව 5.0** : **විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති සහ කැටයම් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.1** : **තෝරා ගත් තේමාවකට අනුව ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් උන්නත කැටයමක් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 5.1.1** : **උන්නත කැටයමක් නිමවමු.**

**කාලච්ඡේද** : 07 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- අඩි 1 1/2 X 1 1/2 ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් තහඩු
- ඇඹීම සඳහා අවශ්‍ය උපකරණ
- සිමෙන්ති, වැලි, ජලය
- ඩිමයි කඩදාසි
- වර්ණ ගැන්වීම සඳහා සුදුසු වර්ණ
- ලැකර්, ඉමල්ෂන්, බැනර් පේන්ට්, ඇක්‍රලික්
- විවිධ ප්‍රමාණයේ පින්සල්

**ඉගෙනුම් පල** :
- තෝරාගත් තේමාවකට අනුව, සිමෙන්ති මාධ්‍යයෙන් උන්නත කැටයමක් නිර්මාණය සඳහා සුදුසු දළ සටහන් අඳියි.
- තලය සකස් කර ගැනීමේ සිට, ඇඹීමේ නිවැරදි පියවර අනුගමනය කරමින් නිර්මාණයේ යෙදෙයි.
- නිවැරදි ව උපකරණ හසුරුවයි.
- ත්‍රිමාණ බව, සමබරතාව සහ රිද්මය, වයනය, නිර්මාණශීලී බව පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.
- නිර්මාණය වර්ණ ගැන්වීමේ දී උචිත ශිල්ප ක්‍රම අනුගමනය කරයි.
- ආරම්භයේ සිට අවසානය තෙක් අනුපිළිවෙළින් නිර්මාණ කාර්යයක නිරත වෙයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** :
- ගවේෂණ, සාකච්ඡා, කේවල ක්‍රියාකාරකම්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- උන්නත කැටයමක් සඳහා දළ සටහන් ඇඳීමට සිසුන් යොමු කිරීම.
- සිමෙන්ති මාධ්‍යය මිශ්‍රණය සකස් කර ගැනීම සහ තලය සකස් කර ගැනීමේ සිට නිම කෘතිය තෙක් අනුගමනය කළ යුතු පියවර පිළිබඳ ව වැටහීමක් ලබා දීම.
- උන්නත කැටයමක් නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු සෛද්ධාන්තික කරුණු පැහැදිලි කරදීම.
  - ඇඹීමේ ශිල්ප ක්‍රමය
  - ත්‍රිමාණ බව
  - රිද්මය
  - සම්පිණ්ඩනය
  - සමබරතාව
  - වයනය
  - වර්ණ භාවිතය
  - ශිල්පීය ලක්ෂණ සහ නිර්මාණශීලිත්වය
- නිවැරදි ව උපකරණ භාවිතය

**ක්‍රියාකාරකම සංවර්ධනයට උපදෙස් :**

- උන්නත කැටයමක නිදර්ශන හෝ ඡායාරූප හෝ ඉදිරිපත් කරමින් උන්නත කැටයමක ස්වභාවය පිළිබඳ ව සිසුන්ට කියා දෙන්න.
- ප්‍රමාණ පිළිබඳ ව කියා දී ඊට ගැළපෙන ලෙස ඩිමයි කඩදසි මත උන්නත කැටයම සඳහා දළ සටහන් නිර්මාණයට සිසුන් යොමු කරවන්න.
- නිර්මාණය කරන ලද දළ සටහන් අතුරින් වඩාත් සුදුසු දළ සැලසුම, සපයා ඇති අඩි 1 1/2 x 1 1/2 ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් තහඩුව මත පිටපත් කර ගැනීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- ඇස්බැස්ටෝස් තහඩුව මත පිටපත් කර ගන්නා ලද දළ සටහනට අනුව, සිමෙන්ති, වැලි මධ්‍ය භාවිතයෙන් උන්නත කැටයම ඇඹීමට සිසුන් යොමු කරවන්න.
- සිමෙන්ති-වැලි මිශ්‍රණය සකස් කර ගැනීමට සිසුන්ට සහය වන්න. මෙහි දී වැලි 3ට සිමෙන්ති 1 (3:1) අනුපාතයට ගෙන ප්‍රමාණවත් පරිදි ජලය එක්කර මාධ්‍ය සකස් කර ගැනිමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඇඹීමේ ශිල්ප ක්‍රමය සහ සිද්ධාන්ත භාවිතය පිළිබඳ සිසුන්ට උපදෙස් සහ මඟපෙන්වීම් ලබා දෙන්න.
- නිවැරදි උපකරණ භාවිතය සහ ක්‍රම ශිල්ප අනුගමනයට උපදෙස් ලබා දෙන්න.
- කැටයම අවශ්‍ය ප්‍රමාණයට වියළුණ පසු ව නිර්මාණයේ තේමාවට සහ උපයෝගී කර ගත් ශිල්පීය ක්‍රමයට උචිත වර්ණ රටා භාවිත කිරීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

**ඇගයීම :**

- කැටයම නිර්මාණයට තෝරාගත් තලයේ ප්‍රමාණය සහ තේමාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් උන්නත කැටයමක් සඳහා දළ සැලසුම් අඳින්න.
- අඳින ලද දළ සැලසුම් අතරින් වඩාත් උචිත සැලසුම තෝරා ගෙන එය තලය මතුපිට පිටපත් කරන්න.
- නිවැරදි අනුපාතයට සිමෙන්ති සහ වැලි මිශ්‍රණය සකස් කර ගෙන පියවරෙන් පියවර කැටයම නිර්මාණය කරන්න.
- සෛද්ධාන්තික කරුණු හා උපකරණ භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.
- සුදුසු ශිල්ප ක්‍රම අනුගමනය කර නිර්මාණය වර්ණ ගන්වා අවසන් කරන්න.

**නිපුණතාව 5.0** : **විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති සහ කැටයම් නිර්මාණය කරයි.**

**නිපුණතා මට්ටම 5.2** : **මිශ්‍ර මාධ්‍ය භාවිතයෙන් උද්‍යාන මූර්තියක් නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම 5.2.1** : **උද්‍යාන රූ නිමැවුම් නිමවමු.**

**කාලච්ඡේද** : 08 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ මාධ්‍ය
    - සිමෙන්ති, යකඩ, වැලි, ගල්, කම්බි, ප්ලාස්ටික්, දැව සහ වෙනත් සුදුසු මාධ්‍ය
- උද්‍යාන මූර්තියක් ගොඩනැගීම සඳහා අවශ්‍ය උපකරණ
- ඩිමයි කඩදාසි, පැන්සල්
- වර්ණ ගැන්වීම සඳහා සුදුසු තීන්ත (ඉමල්ශන්, ලැකර්, ඇක්‍රලික්)
- මිශ්‍ර මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කර ඇති උද්‍යාන මූර්ති ඇතුළත් ඡායාරූප, පින්තූර නැතහොත් කුඩා ප්‍රමාණයේ ආදර්ශන

**ඉගෙනුම් පල** :
- මිශ්‍ර මාධ්‍යයෙන් උද්‍යාන මූර්තියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු තේමාවකට අනුව දළ සැලසුමක් අඳියි.
- සුදුසු ස්ථානයක් තෝරා ගනිමින් සාමූහික ව උද්‍යාන මූර්තියක් ගොඩනගයි.
- මූර්තිමය ශිල්පක්‍රම සහ සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් නිර්මාණය සිදු කරයි.
  (සම්පිණ්ඩනය, සමබරතාව, රිද්මය, මතුපිට ස්වභාවය, ත්‍රිමාණ බව, ශෛලීය ලක්ෂණ සහ ශිල්ප ක්‍රම)
- උද්‍යාන මූර්තිය වර්ණ ගන්වයි.
- සාමූහික කටයුත්තක් වෙනුවෙන් තම නිර්මාණශීලී හැකියාව දායක කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : ගවේෂණ, නිරීක්ෂණ, කණ්ඩායම් ක්‍රමය, ව්‍යාපෘති ක්‍රමය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- උද්‍යාන මූර්තියක් සඳහා භාවිත කළ හැකි විවිධ මාධ්‍ය හඳුනා ගැනීම.
- උද්‍යාන මූර්තියක් නිර්මාණය සඳහා පාසලේ සුදුසු ස්ථානයක් තෝරා ගැනීම.
- උචිත තේමාවක් තෝරා ගැනීම.
- "**අවකාශය** "පිළිබඳ සැලකිලිමත් වෙමින් මිශ්‍ර මාධ්‍ය භාවිතයෙන් ගොඩනැඟිය හැකි උද්‍යාන මූර්තියක් සැලසුම් කිරීම.
- සම්පිණ්ඩනය, සමබරතාව, රිද්මය, ත්‍රිමාණ ලක්ෂණ සහ මාධ්‍යයන්ට ආවේණික ගති ස්වභාවය මෙන් ම විවිධ ශිල්පක්‍රම අනුගමනය කිරීම පිළිබඳ කුසලතා
- තේමාවට උචිත වර්ණ රටා සහ නිර්මාණශීලීත්වය

**පාඩම සංවර්ධනය කිරීමට උපදෙස් :**

- විවිධ මාධ්‍ය එකතු කර නිර්මාණය කරන ලද උද්‍යාන මූර්ති කිහිපයක් ඡායාරූප හෝ ආදර්ශන හෝ සිසුන්ට ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ අදහස් විමසන්න.
- තෝරා ගත් පාසල් පිරියතේ අවකාශයට ගැළපෙන පරිදි උද්‍යාන මූර්තියක දළ සැලසුම් ඇඳීමට, සිසුන් කණ්ඩායම් කර හෝ තනි තනි ව හෝ යොමු කරවන්න.
- සිසුන් විසින් අඳින ලද දළ සටහන් අතරින් වඩාත් උචිත නිර්මාණශීලී සැලසුම තෝරා ගෙන, එය නිර්මාණය කිරීම සඳහා සිසුන් මෙහෙයවන්න.
- මූර්තිය නිර්මාණය සඳහා භාවිත කරන මාධ්‍ය අනුව අඳින ලද දළ සැලසුම වෙනස් විය හැකි බැවින්, ඒ පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සුදුසු ප්‍රායෝගික ක්‍රම වේද භාවිත කිරීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ත්‍රිමාණ ලක්ෂණ, සමබරතාව, ශිල්පීය ක්‍රම භාවිතය සහ මතු පිට ස්වභාවය (වයනීය ලක්ෂණ) පිළිබඳ සැලකිලිමත් වීමට සිසුන් යොමු කරවන්න.
- නිර්මාණයේ ස්වභාවය අනුව එය වර්ණ ගැන්විය යුතු ද නැද් ද යන්න පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කර සුදුසු පියවරක් අනුගමනය කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**ඇගයීම** :

- මිශ්‍ර මාධ්‍ය භාවිතයෙන් උද්‍යාන මූර්තියක් නිර්මාණය සඳහා තෝරාගත් තේමාවකට අනුව දළ සැලසුමක් අඳින්න.
- පාසලේ සුදුසු ස්ථානයක් තෝරාගෙන සාමූහික ව උද්‍යාන මූර්තියක් නිර්මාණය කරන්න.
- මූර්ති නිර්මාණය කිරීමේ සිද්ධාන්ත නිර්මාණ කාර්යය සඳහා ප්‍රායෝගික ව භාවිත කරන්න.
- උද්‍යාන මූර්තියෙහි වැඩ අවසන් කරන්න (වර්ණ ගන්වන්නේ නම්, වර්ණ ගැන්වීමේ උචිත ක්‍රම වේද භාවිත කරන්න).

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **දෘශ්‍ය කලාව හා එහි මූලිකාංග සහ මූලධර්ම අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.1** : **දෘශ්‍ය කලාව හඳුනා ගනිමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- දෘශ්‍ය කලාව පුළුල් වපසරියකින් යුතු විෂය ක්ෂේත්‍රයක් බව විස්තර කරයි.
- දෘශ්‍ය කලාවේ ශාඛාවන් වර්ගීකරණය කර දක්වයි.
- විද්‍යාත්මක හා තාක්ෂණික ජයග්‍රහණ දෘශ්‍ය කලාවේ සීමා පුළුල් කර ඇති ආකාරය පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් නැතහොත් ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

**දෘශ්‍ය කලාව හැඳින්වීම**

- දෘශ්‍ය කලාව යන්නෙහි සරල වාච්‍යාර්ථය වන්නේ 'ඇස' සහ 'දැකීම' මූලික කර ගත් කලා මාධ්‍යය යන්නයි.

- චිත්‍රය සහ මූර්තිය දෘශ්‍ය කලාවේ ආරම්භක ශාඛා ලෙස අනාදිමත් කාලයක සිට ම පිළිගැනිණි. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ආදි ම නිර්මාණ බහුල ව හමු වන්නේ ද චිත්‍ර සහ මූර්ති වශයෙනි.

- පසුකාලීන ව ගෘහ නිර්මාණ කලාව ද දෘශ්‍ය කලාවේ ශාඛාවක් ලෙසින් වර්ධනය වන්නට විය. දහනව වන සියවසේ දී ඡායාරූප කලාව සහ ඉන් ඉක්බිති ව සිනමාව දෘශ්‍ය කලාවේ ශාඛා බවට පත් විය.

- වර්තමානයේ දී දෘශ්‍ය කලාව යන වදනින් ඉතා පුළුල් වපසරියක් ආවරණය කෙරෙයි. එහි වඩාත් ප්‍රචලිත ශාඛා කිහිපයක් පහත දැක්වේ.

උදා :-

- චිත්‍ර (Painting)
- මූර්ති (Sculpture)
- ග්‍රැෆික් නිර්මාණ සැලසුම් (Graphic Design)
- මුද්‍රණ කලාව (Print Making)
- සිනමාව (Cinema)
- සෙරමික් (Ceramic)
- වාස්තු විද්‍යාව(Architecture)
- බහු මාධ්‍ය කලාව (Multimedia Art)
- ඡායාරූප කලාව (Photography)
- ස්ථාපන (Installations)
- රෙදිපිළි සහ ඇඟලුම් කලා (Textile And Wearable Art)
- නිරූපණ/අභිවාහ්‍ය/දෘශ්‍ය රංග (Performance)

**ඇගයීම** :

- දෘශ්‍ය කලාව හඳුන්වා දී එහි වපසරිය සාකච්ඡා කරන්න.
- දෘශ්‍ය කලාවේ ශාඛා ලැයිස්තු ගත කරන්න.
- චිත්‍ර, මූර්ති, සහ ග්‍රැෆික් යන විෂය ක්ෂේත්‍රවලට අදාළ අනු ශාඛාවන් මොනවාදැයි සාකච්ඡා කර වගුවක් සකස් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **දෘශ්‍ය කලාව හා එහි මූලිකාංග සහ මූලධර්ම අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.2** : **දෘශ්‍ය කලා මූලිකාංග හඳුනා ගනිමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- දෘශ්‍ය කලා මූලිකාංග නම් කරයි.
- දෘශ්‍ය කලා කෘතියක අර්ථ ප්‍රකාශනය විෂයෙහි දෘශ්‍ය කලා මූලිකාංගවල වැදගත්කම පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- දෘශ්‍ය කලා මූලිකාංග -
  - රේඛාව (line) - චලනය වන ලක්ෂයක ගමන් මාර්ගය නැතහොත් යම් කිසි වස්තුවක බාහිර මායිම රේඛාව ලෙස හැඳින්විය හැකි ය. එය සරල රේඛා, වක්‍ර රේඛා, ඝනකම් රේඛා, සිහින් රේඛා, ආදි වශයෙන් ප්‍රභේද සහිත ය. රේඛාව වෙනස් කිරීම මඟින් නිර්මාණයක භාව ප්‍රකාශනය වෙනස් කළ හැකි ය. එසේ ම රේඛාව මඟින් රේඛීය පර්යාවලෝකය මෙන් ම ත්‍රිමාණත්වය ද දැක්විය හැකි ය. රේඛාව චිත්‍රයට පමණක් නොව මූර්ති, ගෘහ නිර්මාණ කලාව ආදියෙහි ද සැලකිල්ලට ගැනේ (උදා:- අවුකන පිළිමයේ සිවුරේ රැළි).
  - වර්ණය (colour) - ආලෝකය මූලික කොටගෙන ගොඩනැගෙන දෘශ්‍ය කලා මූලිකාංගයකි. චිත්‍රණය කරන ලද කලා කෘතියේ පෘෂ්ඨයෙන් සිදු වන ආලෝක පරාවර්තනයට අනුරූප ව වර්ණ ඇසට දෘශ්‍ය වේ. නිල්, කහ, රතු යන වර්ණ චිත්‍ර කලාවේ මූලික වර්ණ ලෙස සැලකෙන අතර ඒවා මිශ්‍රවීමෙන් තැනෙන කොළ, රඹ, දම් ද්විතීය වර්ණ වේ. මීට අමතර ව ශීත වර්ණ සහ උණුසුම් වර්ණ යනුවෙන් ප්‍රභේද දෙකකි. දෘශ්‍ය කලා ශිල්පීන් ස්වකීය කලා මාධ්‍යයේ ස්වභාවය අනුව RGB හෝ CMYK වර්ණ චක්‍ර භාවිතයට ගනියි. වර්ණය කලා නිර්මාණයක ප්‍රකාශනයට දැඩි බලපෑමක් සිදු කරයි (උදා - රතු වර්ණය විරෝධය, කෝපය, ප්‍රචණ්ඩත්වය ආදිය නිරූපණයෙහි සුලභ ව භාවිත වීම).
  - හැඩය (shape) - මායිමකින් සීමා කරන ලද ක්ෂේත්‍රයක් හැඩයක් ලෙස සැලකිය හැකි ය. බොහෝ විට හැඩය ද්විමානත්වය සමග සාකච්ඡාවට ගැනෙන්නකි. හැඩ විවිධාකාරයෙන් වර්ගීකරණය කළ හැකි අතර ඒ අතරින් 'ජ්‍යාමිතික හැඩ' සහ 'ජ්‍යාමිතික නොවන හැඩ'යන බෙදීම වඩාත් සුලභ ය. ඝනිකවාදී කලා ව්‍යාපාරය ජ්‍යාමිතික හැඩ කලා නිර්මාණවල ප්‍රබල ව භාවිත කර ඇත.

- **අවකාශය** (space) - අවකාශය කලා මාධ්‍යයේ ස්වරූපය අනුව වෙනස් වේ. චිත්‍ර කලාවේ දී අවකාශය මූලික ව ම පෙර බිම (foreground), පසු බිම (background) හා මධ්‍ය/මැද බිම (middle-ground) යන සාධක සමඟ සුලභ ව හඳුනා ගැනේ. මෙම කොටස්වල කිසියම් දෘශ්‍ය අරමුණක් පිහිටු වූ විට ඒවාට ලැබෙන අවධාරණය එකිනෙකින් වෙනස් වේ. මීට අමතර ව ධන අවකාශය (positive space) සහ ඍණ අවකාශය (negative space) යනුවෙන් භාවිතාවන් දෙකක් දෘශ්‍ය කලාවේ ඇත. ධන අවකාශය යනු කිසියම් දෘශ්‍ය අරමුණක් විසින් සත්‍ය වශයෙන් ම අත්පත් කර ගන්නා වූ අවකාශ සීමාවයි. ඍණ අවකාශය වනාහි කිසියම් තෝරාගත් දෘශ්‍ය අරමුණක් අවධාරණය කිරීමට භාවිත කෙරෙන එම අරමුණෙන් පරිබාහිර හෝ ප්‍රතිපක්ෂ අවකාශ සීමාව යි.

- **වයනය** (texture) - වස්තුවක මතුපිට ස්වභාවය වයනය ලෙස සැලකේ. ස්වාභාවික වයනය සහ කෘත්‍රිම වයනය ලෙස මෙය වර්ග කෙරේ. ස්වාභාවික ව සැකසෙන මතුපිට ස්වභාවය, ස්වාභාවික වයනය වන අතර, මිනිසා විසින් නිර්මිත ද්‍රව්‍යවල වයනය කෘත්‍රිම වයනය වේ. දෘශ්‍ය කලාවේ දී වයනය, සත්‍ය වයනය සහ මායාත්මක වයනය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි. නිදසුනක් ලෙස දැව, සිමෙන්ති, ලෝකඩ ආදී මාධ්‍යකින් නිමවා ඇති මූර්තියක සැබෑ පෘෂ්ඨීමය ස්වභාවය සත්‍ය වයනය යි. චිත්‍ර නිර්මාණවල දී බහුල ව භාවිතයට ගැනෙනුයේ මායාත්මක වයනය යි. නිදසුනක් ලෙස ලෝහ බඳුනක් සිතුවමට නැගුවිට එම බඳුනෙහි ඇත්තේ මායාත්මක වයනයකි.

- **ආකෘතිය** (form) - මෙම මූලිකාංගය බොහෝවිට සැලකිල්ලට ගැනෙනුයේ ත්‍රිමාණ මාධ්‍යයේ දී ය. ඒ අනුව දිග, පළල, උස (හෝ ගැඹුර) යන සාධක අනුව ආකෘතිය සාකච්ඡා කෙරේ. ද්විමාන නිර්මාණවල දී එළිය අඳුර දැක්වීම මඟින් ද අවධාරණය කෙරෙනුයේ ආකෘතිය යි. ජ්‍යාමිතික ආකෘති (geometric forms) සහ ඓන්ද්‍රිය ආකෘති (organic forms) ලෙස මූලික බෙදීමක් දෘශ්‍ය කලා ක්ෂේත්‍රයේ හඳුනා ගත හැකි ය. සොබාදහමෙහි පවතින හැඩ අයත් වන්නේ ඓන්ද්‍රිය ආකෘති ගනයටයි.

(**සැ.යු.** දෘශ්‍ය කලා මූලිකාංග ඉහත දෙන ලද කොටස්වලට පමණක් සීමා නොවන බව දත යුතුයි).

**ඇගයීම :**

- දෘශ්‍ය කලා මූලිකාංග නම් කරන්න.
- වර්ණය කලා කෘතියක අර්ථ සම්පාදනයෙහි ලා සපයන දායකත්වය නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.
- රේඛාව චිත්‍ර ශිල්පියෙකුට නිර්මාණ ක්‍රියාවලියේ දී ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න.
- විවිධ වර්ගයේ හැඩ (shapes) කලා කෘතියක අර්ථ ප්‍රකාශනයෙහි ලා සපයන දායකත්වය නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.
- වයනය සහ ආකෘතිය පැහැදිලි කර දෘශ්‍ය කලාකරුවා එකී මූලධර්ම භාවිත කරන ආකාරය විමසන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **දෘශ්‍ය කලාව හා එහි මූලිකාංග සහ මූලධර්ම අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.3** : **දෘශ්‍ය කලා මූලධර්ම අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- දෘශ්‍ය කලා මූලධර්ම නම් කරයි.
- දෘශ්‍ය කලා කෘතියක ප්‍රකාශනය විෂයෙහි දෘශ්‍ය කලා මූලධර්මවල වැදගත්කම පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- දෘශ්‍ය කලා මූලධර්ම -
    - **සමබරතාව** (balance) - කිසියම් කලා කෘතියක ඇති දෘශ්‍ය අරමුණු සමූහයක් විධිමත්, නිශ්චල හෝ තර්කානුකූල සම්බන්ධතාවක් සහිත ව ගොඩනැගීම සමබරතාවයෙන් සිදු කෙරේ.
    - **රිද්මය** (rhythm) - දෘශ්‍ය අරමුණු සමූහයක් කිසියම් රටාවකට පෙළ ගැස්වීමෙන් හා පිහිටුවීමෙන් රිද්මය ගොඩනැගිය හැකි ය. නිදසුනක් ලෙස පලා පෙති මොස්තරයේ ඇත්තේ එක ම ආකෘතිය පුන පුනා පිහිටුවීමෙන් ගොඩනගන ලද රිද්මික ප්‍රකාශනයකි.
    - **ඒකාග්‍රතාව/ඒකත්වය** (unity) - කිසියම් කලා කෘතියක ඇති දෘශ්‍ය අරමුණු සමූහය සමස්තයක් වශයෙන් එකට බැඳී ක්‍රියාත්මක වීම ඒකීයත්වය යි.
    - **සුසංයෝගය** (harmony) - කලා කෘතියක දෘශ්‍ය අරමුණු එකිනෙකා හා අන්‍යෝන්‍ය වශයෙන් මනා සේ ගැලපීම සුසංයෝගය යි.
    - **පර්යාවලෝකය** (perspective) - ද්විමාන මාධ්‍යයේ දී ඈත සහ මෑත පෙන්වීමට භාවිත කරන දෘශ්‍යමය උපක්‍රමයකි. රේඛීය පර්යාවලෝකය, අවකාශාත්මක පර්යාවලෝකය සහ වර්ණ පර්යාවලෝකය ආදී වශයෙන් මෙහි ප්‍රභේද කිහිපයකි.
    - **සමානුපාතය/අනුපාතය** (proportion) - සමානුපාතය යනු යම් වස්තුවකට හිමි ගණිතමය අනුපාත සමූහය යි. පරිමාණ එකී වස්තුව දෘශ්‍යමය වශයෙන් නිවැරදි ව ගොඩනැගීම සම්බන්ධයෙන් මෙන් ම වස්තු දෙකක් අතර වෙනස පෙන්වීම සම්බන්ධයෙන් ද වැදගත් වේ.

- **ත්‍රිමාන ලක්ෂණ** (3-dimentional features) - ප්‍රකෘති ලෝකයේ වස්තුවල ස්වභාවය ද්විමාන මාධ්‍යයක දැක්වීමේ දී භාවිත කෙරේ. එළිය අඳුර දැක්වීම, වර්ණවල තීව්‍රතාව වෙනස් කිරීම, ආදිය ත්‍රිමාන ලක්ෂණ ගොඩ නැගීමට උපකාරී වේ.

**(සැ.යු. දෘශ්‍ය කලා මූලධර්ම ඉහත දෙන ලද කොටස්වලට පමණක් සීමා නොවන බව දත යුතුයි).**

**ඇගයීම** :

- දෘශ්‍ය කලා මූලධර්ම නම් කරන්න.
- කලා කෘතියක අර්ථ ප්‍රකාශනයෙහි ලා දෘශ්‍ය කලා මූලධර්මවල දායකත්වය සාකච්ඡා කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : **දෘශ්‍ය කලාව හා එහි මූලිකාංග සහ මූලධර්ම අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.1.4** : **දෘශ්‍ය කලාවේ විවිධ කලා ව්‍යාපාර, කලා ශෛලි සහ සංකල්ප හඳුනා ගනිමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- දෘශ්‍ය කලාවේ විවිධ කලා ව්‍යාපාර, කලා ශෛලි හා සංකල්ප නම් කරයි.
- විවිධ කලා ව්‍යාපාර, කලා ශෛලි හා සංකල්ප අතර පවත්නා වෙනස්කම් දෘශ්‍ය කලා මූලිකාංග හා මූලධර්ම ඇසුරෙන් පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **ශාස්ත්‍රාලයීය යථාර්ථවාදය** (Academic Realism) - බ්‍රිතාන්‍ය රාජකීය ශාස්ත්‍රාලය (Royal Academy) මූලික කොට ගෙන ව්‍යාප්ත වූ රීතියකි. මෙහි මූලික අරමුණු අතර ප්‍රශස්ත සෞන්දර්ය රීතියකින් මිනිස් සිරුර නිරූපණය, සීමිත වර්ණ මාලාවක් යොදා ගනිමින් සූක්ෂ්ම වර්ණවල මධ්‍යම පැහැය ගොඩ නැගීම සහ පර්යාවලෝකය මූලධර්මය නිවැරදි ව භාවිතය ආදිය දැක්විය හැකි ය.
- **යථාර්ථවාදය** (Realism) - යථා ලෝකයේ පවතින වස්තුවිෂය ඒ අයුරින් ම නිවැරදි ව සහ තථ්‍යවාදී ව නිරූපණය කිරීම පදනම් කොටගෙන බිහි වූ කලා ව්‍යාපාරයකි. 19 වන සියවසේ දී ප්‍රංශය කේන්ද්‍රීය ව ප්‍රචලිත විය.
- **උපස්ථිතිවාදය** (Impressionism) - ප්‍රකෘති ලෝකයේ විවිධ වස්තු මත ආලෝකය පතිත වන ආකාරය හා ඒ මඟින් ඇතිවන විපර්යාස අධ්‍යයනය කිරීම මෙම කලා ව්‍යාපාරය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් විය. එහි දී වේගවත් පින්සල් පහරවල් සහ නුමුහුන් වර්ණාවලියක් හරහා අදාළ සංසිද්ධීන් ප්‍රතිනිර්මාණයට මූලිකත්වය දුන් ව්‍යාපාරයකි. ප්‍රංශයේ නාගරික ජීවිතය අධ්‍යයනය සහ ගෘහස්ත ජීවිතය අධ්‍යයනය ද මෙම කලා ව්‍යාපාරයට අයත් ශිල්පීන්ගේ ප්‍රධාන ගවේෂණ අතර වේ.

- **ඝනිකවාදය** (Cubism) - බ්‍රාක් සහ පිකාසෝ විසින් දියුණු කරන ලද කලා ව්‍යාපාරයකි. වස්තූන් බහුවිධ කෝණයන්ගෙන් නිරීක්ෂණය කොට ඝනිකමය ආකෘති අවධාරණය වන පරිදි කැන්වසය මත ප්‍රතිනිර්මාණය කිරීම මෙහි දී සිදු විය.

- **අධියථාර්ථවාදය** (Surrealism) - අවිඥානිකත්වයේ සහ අතාර්කිකත්වයේ මූලයන්ගෙන් පැන නැගුණ පරිකල්පනීය අරමුණු මෙම කලා ව්‍යාපාරයේ සුලභ ලක්ෂණයකි. අතිශයෝක්තියට නැගූ යථාර්ථය සහ මනස්සෘෂ්ටිය (fantasy) ස්වරූපය මෙහි සුලභ ව අවධාරණයට ලක් කෙරේ.

- **විචිත්‍ර අද්භූතවාදය/අලංකාරවාදය, රොමැන්තිකවාදය** (Romantism) - තනි පුද්ගල අත්දැකීම් ප්‍රකාශනය අලංකාරවාදයේ දී වැදගත් කොට සලකා තිබේ. රොමැන්තිකවාදී අපේක්ෂාව තුළ සංවේදනය, සහජ බුද්ධිය ප්‍රකාශනය, යහපත් මනුෂ්‍යත්වය මෙන් ම, අතීත පුරුෂාර්ථවල (අතීත පරමාදර්ශී අදහස්) ශෝභනත්වය /ලාලිත්‍ය වර්තමාන මිනිස් අපේක්ෂා සමඟ සහසම්බන්ධ කිරීම, සොබාදහම පිළිබඳ බලවත් අභිරුචිය මතු කිරීම වැනි කරුණු අන්තර්ගත වේ. බුද්ධිය සහ ඵලය ඉක්මවා ගිය හැඟීම් සහ සංවේදීතා උත්කර්ෂයට පත්වීම ද දැක ගත හැකි ය.

- **පෙරදිගවාදය** (Orientalism) - පෙරදිගවාදය යනු චිත්‍ර ඇඳීමේ ශෛලියක් නොව, එය බටහිර ලේඛකයන්, කවියන්. චින්තකයන්, චිත්‍ර ශිල්පීන් විසින් පෙරදිග සම්බන්ධයෙන් ගොඩ නගන ලද අදහසකි. මෙම අදහස විසින් බටහිර ජාතීන් අගය කරනු ලැබුවේ පෙරදිග ලෝකයේ චමත්කාර බව, අරුමබව සහ ගුඪබව යි.

**(සැ.යු. ඉහත දක්වා ඇත්තේ තෝරා ගන්නා ලද කලා ව්‍යාපාර සහ මතවාද කිහිපයක් පමණි).**

**ඇගයීම :**

- කලා ඉතිහාසයෙහි හමුවන ප්‍රකට කලා ව්‍යාපාර 04 ක් නම් කරන්න.
- ඉහත දක්වා ඇති කලා ව්‍යාපාර 04හි මූලික ලක්‍ෂණ සංසන්දනාත්මක ව පෙනෙන පරිදි වගුවක් සකස් කරන්න.
- අලංකාරවාදයේ සහ පෙරදිගවාදයේ මූලික ලක්ෂණ හඳුන්වන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.2** : **තෝරාගත් දේශීය කලාකරුවන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.2.1** : **ලංකා කලා සංගමයේ ශිල්පීන් ගේ නිර්මාණ අගයමු.**
- **ඒ. සී. ජී. එස්. අමරසේකර**
- **ඩේවිඩ් පේන්ටර්**
- **ජේ. ඩී. ඒ. පෙරේරා**

**කාලච්ඡේද** : 03 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- 'ලංකා කලා සංගමය' බිහි වීමට තුඩු දුන් පසුබිම විස්තර කරයි.
- ලංකා කලා සංගමයට අයත් ශිල්පීන් හඳුනාගෙන ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.
- ලංකා කලා සංගමයේ ශිල්පීන් අනුගමනය කළ කලා සම්ප්‍රදායයේ ශිල්ප ක්‍රම හා ශෛලිය ලක්ෂණ පැහැදිලි කරයි.
- ලංකා කලා සංගමයේ සිතුවම්වල තේමා විමර්ශනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- ලංකා කලා සංගමය 1891 දී ආරම්භ විය. එහි ප්‍රධාන අරමුණ වූයේ ශාස්ත්‍රාලයීය කලා සම්ප්‍රදායය ශ්‍රී ලාංකික කලා ක්ෂේත්‍රයේ ආයතන ගත කිරීම යි. දෘශ්‍ය කලාව විෂයයෙහි මෙමගින් අවධානය යොමු වූයේ ශාස්ත්‍රාලයීය යථාර්ථවාදය ගුරු කොටගත් කලා රීතින් කෙරෙහි ය. මෙය බ්‍රිතාන්‍ය අනුග්‍රාහකත්වය ලද ආයතනික ව්‍යූහයකි.

- **ඒ. සී. ජී. එස්. අමරසේකර** (1883-1983) -
  - අමරසේකර තෙල් සායම්, දිය සායම් හා පැස්ටල් යන මාධ්‍ය තුනෙන් ම නිර්මාණකරණයේ යෙදුණු ශිල්පියෙකි.
  - ඔහුගේ නිර්මාණවලින් ශාස්ත්‍රාලයීය යථාර්ථවාදය (Academic Realism), රොමැන්තිකවාදය (Romanticism) සහ පෙරදිගවාදය (Orientalism) පිළිබඳ විශ්වාස, ශෛලිය සහ ආභාසය පළ වෙයි.
  - අමරසේකර ආලේඛ්‍ය සිත්තරකු වශයෙන් ද ප්‍රකට ය. එසේ ම ඔහු දිය සායම් මාධ්‍යයෙන් භූමි දර්ශන රැසක් ද නිර්මාණය කර ඇත.
  - ස්වාභාවික හා යථාර්ථවාදී රීතී අනුව එළිය-අඳුර දැක්වීම, පරිමාණ ලක්ෂණ භාවිතය, පර්යාවලෝකය යෙදීම මොහුගේ චිත්‍රවල දක්නට ලැබේ.

(I) **යකැදුරාගේ දියණිය** -
- ගිනි ජාලාවකින් බියපත් ව සිටින තරුණ ස්ත්‍රියක මෙයට විෂය වී ඇත.
- අද්භූත රසය ජනනය කෙරෙන පරිදි සිතුවම ගොඩනගා තිබේ.
- එළිය හා අඳුර චිත්‍රයේ රසය වැඩි වන පරිදි සාර්ථක ව යොදා ඇත.
- පිටුපස ඇති කාන්තාවගේ දැවැන්ත සෙවණැල්ල සිදුවීමේ බියකරු බව තීව්‍ර කරන සාර්ථක භාවිතයකි. බිත්තිවල ඇති වෙස් මුහුණු, බිම වැටුණු උඩැක්කිය සහ වසන ලද දොර චිත්‍රයේ ඇති සංකේතාත්මක වස්තු වෙයි.

(II) **වඩුවාගේ ගෙදර/රැකියා නැත්තෝ/විරැකියාව** -
- පීඩිත පාන්තික සමාජයේ දරිද්‍රතාව පිළිබඳ ව සාකච්ඡා කෙරෙන නිර්මාණයකි. අමරසේකරගේ චිත්‍ර අතර වෙනස් මඟක් ගත් කෘතියක් සේ සැලකේ.
- ගෘහ මූලිකයා පුටුවක් මත හිඳගෙන බෙහෙවින් පරාජිත ස්වරූපයෙන් මෙවලම් පොදිය දෙස බලා හිඳියි. පය පා මුල සිටින කළු බළලා, ඇඳෙහි සිටින රෝගී දරුවා, බිමට හරවා මේසය මත තැබූ වළන් ආදිය සිතුවමෙහි ප්‍රබල සංකේත වේ.
- එළිය-අඳුර ඉතා සාර්ථක අයුරින් භාවිත කර ඇත.
- කාමරය තුළ ඇති 'අඳුර' නිවැසියන්ගේ දුක්ඛිත ජීවිත පිළිබඳ සංකේතාර්ථයක් බඳු ය.

- **ඩේවිඩ් පේන්ටර් (1900-1975)** -
  - එංගලන්තයේ රෝයල් ඇකඩමියේ පුහුණුව ලැබූ, ශාස්ත්‍රාලයීය යථාර්ථවාදි රීතියට අනුව සිතුවම් නිර්මාණය කළ ශිල්පියෙකි.
  - ආලේඛ්‍ය චිත්‍ර ඇඳීම පිළිබඳ විශේෂඥ සිත්තරකු වූ පේන්ටර් විසින් නේරුතුමාගේ නිල ආලේඛ්‍ය රුව ද අඳිනු ලැබ තිබේ.
  - ඔහු විසින් මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ අඳින ලද සිතුවම්, පෙරදිග ක්‍රිස්තියානි සිතුවම් කලාවේ සුවිශේෂ නිර්මාණ සමූහයක් ලෙස සැලකේ.
  - කිතුනු තේමා ස්වදේශික 'මානව' හා 'පරිසර පද්ධති' සමඟ ගළපා නව අරුතකින් ප්‍රති නිර්මාණය කර ඇත. ඩේවිඩ් පේන්ටර් ශාස්ත්‍රාලයීය සම්ප්‍රදායයට අනුව ජීවාදර්ශ යොදා ගනිමින් මානව රූප සම්පිණ්ඩනයක් කර ඇත.

(I) **විජයග්‍රාහි ව ජෙරුසෙලමට ඇතුළු වීම** -
- කිතුනු ආගමික වස්තු විෂය හා බැඳුණු තේමාවකි.
- දුඹුරු පැහැයේ ප්‍රභේද බහුල ව භාවිතයට ගෙන ඇත. දිගටි හැඩයෙන් යුතු රූප දැකිය හැකි ය.
- කඳු සහිත පරිසරයක් පසුපසින් අන්තර්ගත කොට තිබේ.
- රූපවල කාය ව්‍යූහ ලක්ෂණ, පරිමාණ නිවැරදි ව භාවිත කර ඇත. පර්යාවලෝකය, එළිය අඳුර දක්වා ඇත.

(II) **යහපත් සමරිතානුවා** -
- ත්‍රිත්ව දෙව් මැඳුරේ ඇති සිතුවමක් වන මෙය ද කිතුනු ආගමික තේමාවක් හා බැඳේ.
- ස්වදේශික පුද්ගල හා පරිසර ලක්ෂණ අන්තර්ගත කර තිබේ.
- රෝගී පුද්ගලයකුට උපස්ථාන කරන්නකු පෙර බිමෙහි දක්වා තිබෙන අතර පසු බිම අඳුරු වර්ණ මාලාවකින් ගොඩ නගා තිබේ.

- **ජේ. ඩී. ඒ. පෙරේරා (1897-1967)** -
  - මරදාන කාර්මික විද්‍යාලයයේ බාර්ට්ලර් මහතා යටතේ චිත්‍ර කලාව හදාරා ඇත.
  - ආලේඛ්‍ය චිත්‍රකරණය විෂයෙහි ජේ. ඩී. ඒ. පෙරේරා සුවිශේෂ සමත් බවක් දක්වා ඇත.
  - ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ආභාසය ලබා ඇත.
  - රජයේ ලලිත කලායතනයේ අධිපතිවරයා ලෙස එහි වර්ධනයට සුවිශේෂ සේවයක් ඉටු කළේ ය.

(I) **නළඟන (චන්ද්‍රලේඛා/ලෝරෙන්)** -

- නාට්‍යාංගනාවකගේ උඩුකය විෂය කර ගත් නිර්මාණයකි.
- ඇය නර්තනයකට සූදානම් වූ අයුරින් සිටිය ද මුහුණෙහි ඇත්තේ ශෝකාකුල හා කල්පනාකාරී ඉරියව්වකි. ඇගේ එක් පසක් අඳුරු වූ මුහුණ එම හැඟීම් වඩාත් තීව්‍ර කරයි.
- පසුපසින් ගන රැළි සහිත අඳුරු පැහැ තිරයකි.
- හුදු විචිත්‍රවත් නර්තනයකට වඩා නර්තකයාගේ අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනය අරමුණු කරගත් නිර්මාණයක් සේ සැලකිය හැකි ය.

(II) **සිතා ද සේරම්ගේ විද්ධ/ආලේඛ්‍ය රුව** -

- අසුනක් මත හිඳගෙන පොතක් බලන කාන්තා රූපයකි.
- කොළ පැහැති සාරියකින් සැරසී සිටින ඇය තියුණු බැල්මකින් ඉදිරිපස බලා හිඳියි.
- තරමක් වේගවත් පින්සල් පහරවල් සහිත ශෛලියකින් සිතුවම ගොඩනගා තිබේ.
- චිත්‍රයට ගෝචර වූ පුද්ගලයාගේ කියවීමට ඇති කැමැත්තත් පොත්පත් සමඟ ඇය දක්වන සබැඳියාවත් සිත්තරා විසින් නිරූපණය කරනු ලැබ ඇත.

**ඇගයීම** :

- ලංකා කලා සංගමය බිහි වූ පසුබිම පැහැදිලි කර එහි පුරෝගාමී වූ සිත්තරුන් නම් කරන්න.
- ඒ. සී. ජී. එස්. අමරසේකරගේ කලා නිර්මාණ පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- ඩේවිඩ් පේන්ටර්ගේ කලා නිර්මාණ පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- ජේ. ඩී. ඒ. පෙරේරාගේ කලා නිර්මාණ පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- ලංකා කලා සංගමයේ සිත්තරුන්ගේ නිර්මාණවල පොදු සමානතා සාකච්ඡා කරන්න.

**නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.2 : තෝරාගත් දේශීය කලාකරුවන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.**

**ක්‍රියාකාරකම 6.2.2 : 20 වන සියවසේ ශ්‍රී ලාංකේය ආගමික සිතුවම් අගයමු.**
- **එම්. සාර්ලිස්**
- **සෝලියස් මැන්දිස් (සොයිලියස් මැන්දිස්)**
- **සෝමබන්දු විද්‍යාපති**

**කාලච්ඡේද** : 03 යි.

**ගුණාත්මක යෙදවුම්** :
- කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- 20 වන සියවසේ, ආගමික තේමා විෂය කර ගත් ශ්‍රී ලාංකේය සිත්තරු හා ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.
- ශ්‍රී ලාංකේය බෞද්ධ හා හින්දු ආගමික කලා නිර්මාණකරණයේ නියැළි ශිල්පීන්ගේ නිර්මාණ ඇගයීමට ලක් කරයි.
- ශ්‍රී ලාංකේය ආගමික සිත්තරුන්ගේ නිර්මාණ සඳහා පෙරදිග හා අපරදිග කලා සම්ප්‍රදායවල ආභාසය ලැබී ඇති ආකාරය විමර්ශනය කරයි.
- 20 වන සියවසේ බෞද්ධ/හින්දු චිත්‍ර කලාවේ නිර්මාණාත්මක සන්ධිස්ථාන පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **එම්. සාර්ලිස් - (1880-1955) -**
  - 20 වැනි සියවසේ මුල් භාගයේ ලංකාවේ ජනප්‍රිය ම විහාර සිත්තරා එම්. සාර්ලිස් වේ. රිචඩ් හෙන්රිකස් යටතේ යුරෝපීය ක්‍රමවේද අනුව චිත්‍ර ඇඳීමට පුහුණුව ලැබී ය. චිත්‍ර මෙන් ම මූර්ති නිර්මාණයෙහි ද සමතෙකි.
  - සිතුවම් අඳින ලද්දේ යුරෝපීය ස්වාභාවිකවාදී චිත්‍ර සම්ප්‍රදායයේ ලක්ෂණ අනුගමනය කරමිනි. ඒ අනුව එළිය - අඳුර දැක්වීම, ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝක මූලධර්ම භාවිතය මොහුගේ සිතුවම්වල දක්නට ලැබේ.
  - යුරෝපීය ක්‍රමවේද භාවිත කළ ද සිතුවම්වල ගොඩනැඟිලි සහ වස්ත්‍රාභරණ ආදිය ඇඳ ඇත්තේ ඉන්දීය ආරුවකිනි.
  - එම්. සාර්ලිස්ගේ රාමු කළ බෞද්ධ සිතුවම් පිටපත් 20 වන සියවසෙහි මුල් භාගයේ දී බොහෝ නිවාසවල අලංකාරය සඳහා එල්ලා තැබිණි.
  - මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනෙහි බුදු මැඳුර, පොතුපිටිය පූජාරාමය, කොළඹ අශෝකාරාමය ආදී ස්ථානවල සාර්ලිස්ගේ නිර්මාණ දක ගත හැකි ය.

(I) **මහාමායා දේවියගේ සිහිනය** -

- සතරවරම් දෙවිවරුන් විසින් පිරිවරන ලද මහාමායා දේවිය දැක්වෙන දර්ශනයකි.
- සුදු පැහැති වස්ත්‍රයකින් සැරසුණු මහමායා දේවිය සයනයේ දකුණු ඇලයෙන් සැතපී සිටී. ඇය ඉදිරිපසින් නෙළුමක් හොඬින් ගත් සුදු ඇත් පැටවෙක් දැක්වේ.
- දේවරූප සමූහය හා ඇත් පැටවා ඡායා මාත්‍රික ව සුදු රේඛාවෙන් මතු කර තිබේ.
- පර්යාවලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, එළිය - අඳුර ආදි ලක්ෂණ සහිත ව ඇඳ ඇත.

(II) **සරණ මංගල්‍යය** -

- සිදුහත් කුමරුන්ගේ හා යශෝධරාවගේ විවාහෝත්සවය දැක්වෙන අවස්ථාව මින් නිරූපිත ය.
- අලංකාර වස්ත්‍රාභරණයෙන් සැරසුණු රාජකීය රූප සමූහයක් සහිත සංරචනයකි.
- යුරෝපීය ක්‍රමවේද අනුගමනය කර ඇති අතර ඇඳුම් පැලඳුම් ආදිය ඉන්දීය සංස්කෘතික ලක්ෂණ පළ කරයි.
- ප්‍රධාන දෘශ්‍ය අරමුණු වන්නේ සිදුහත් කුමරුන්ගේ, යශෝධරා කුමරියගේ හා අතපැන් වත් කරන බ්‍රාහ්මණයාගේ රූප වේ.

- **සෝලියස් මැන්දිස් (1897-1975)** -
  - 20 වන සියවසේහි ශ්‍රී ලාංකේය නූතන බෞද්ධ බිතු සිතුවම් කලාව පෙරදිග කලා මූලයන් ගුරුකොට ගත් සම්ප්‍රදායයක් බවට පත් කිරීමට පූරෝගාමී වූ සිත්තරා වේ. මුලින් සාර්ලිස් අනුගමනය කළ යුරෝපීය ස්වාභාවිකවාදී ලක්ෂණ ගුරු කොටගත් ශෛලියක් අනුගමනය කළ සෝලියස් මැන්දිස් විසින් පසු ව එම ශෛලිය බැහැර කරන ලදි.
  - කැලණිය නව විහාරයේ ඇති බිතුසිතුවම් ඔහුගේ විශිෂ්ටතම නිර්මාණ ලෙස සැලකේ.
  - අජන්තා, භාග්, තිවංක පිළිම ගෙය, නන්ද ලාල් බෝස්ගේ නිර්මාණ ආදි පෙරදිග රීතීන් ගුරුකොට ගත් කලා නිර්මාණ හා මූලාශ්‍රය ගණනාවකින් ආභාසය ලබා ඇත. එහෙත් ඒ කිසිවක අනුකාරකයකු නොවී නව කලා ශෛලියක් කැලණියෙහි සිතුවම් සඳහා ඔහු භාවිතයට ගෙන ඇත.
  - රේඛාව මූලික කොට ගෙන සිතුවම ගොඩ නැගීම, ලාලිත්‍යමය ශරීර විලාස, දුඹුරු පැහැය ගුරු කොටගත් ඇසට ප්‍රිය වර්ණ මාලාව, සෝලියස් මැන්දිස්ගේ සිතුවම්වල කැපී පෙනෙන ලක්ෂණ වේ.
  - චිත්‍ර මෙන් ම මූර්ති කලාවෙහි ද දක්ෂයෙකි.

(I) **බුදු රජාණන් වහන්සේ මහියංගණයට වැඩම කිරීම** -

- කැලණි විහාරයේ ඇති සිතුවම් අතර මානව රූප විශාල ප්‍රමාණයක් සහිත සංරචනයකි.
- ප්‍රධාන රූප ආලෝකවත් ව දක්වා පසු බිම හා පාර්ශ්වික රූප අඳුරු පැහැයෙන් දක්වා ඇත.
- මුහුණුවල භාවමය තත්ත්ව හා ශරීර ඉරියව් නිරූපණය විශිෂ්ට ය.
- මෙම නිර්මාණයෙහි කේන්ද්‍රීය රූපය වන්නේ බුදු රාජාණන් වහන්සේ වන අතර උන් වහන්සේ ගිනි ජාලාවක් පරිවාර කොට දක්වා ඇත.

(II) **ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීම** -

- සෝලියස් මැන්දිස් තම සිතුවම් අතර වැඩි ප්‍රමුඛත්වයක් දී ඇත්තේ ශ්‍රී ලංකාව හා සම්බන්ධ බුද්ධ චරිතයේ අවස්ථා සඳහා වන අතර මෙය ද එයට එක් නිදර්ශනයකි.
- විශාල පරිවාර පිරිසක් මධ්‍යයේ බුදු රජාණන් වහන්සේ ස්වකීය ශ්‍රී පාදය සමනොළ ගිර මත පිහිටුවන අවස්ථාව දක්වා ඇත.
- ප්‍රධාන රූප ආලෝකවත් ව සහ සෙසු රූප අඳුරු පැහැයෙන් දක්වා ඇත.
- මානව රූප බෙහෙවින් ලාලිත්‍යමය වන අතර ආභරණ හා වස්ත්‍ර ලාලිත්‍යමය රැළිවලින් සහ සැරසිලිවලින් විසිතුරු කර ඇත.

- **සෝමබන්ද්‍ු විද්‍යාපති (1923-2006)** -
  - ශාන්ති නිකේතනයෙන් අධ්‍යාපනය හැදෑරූ සෝමබන්දු විද්‍යාපති ශ්‍රී ලාංකේය නූතන බෞද්ධ කලාව සම්බන්ධයෙන් ඉතා වැදගත් සිත්තරෙකි.
  - නන්ද ලාල් බෝස් යටතේ අධ්‍යාපනය හදාරා ඇත. චිත්‍ර මෙන් ම නර්තන පසු බිමක් සහිත පවුලකින් පැවත එන සෝමබන්දු විද්‍යාපති රංගවස්ත්‍ර, වේදිකා සැරසිලි, වේෂභූෂණ නිර්මාණ ශිල්පියෙක් ද වේ.
  - රේඛාව සහ වර්ණ කෙන්ද්‍රීය ව රූප ගොඩනැඟීම, ලාලිත්‍යමය මානව ඉරියව්, බෙහෙවින් පුළුල් විචිත්‍රවත් වර්ණමාලාව මොහුගේ සිතුවම්වල කැපී පෙනේ.

(I) **සරණ මංගල්‍යය** -
  - සිදුහත් කුමරුන්ගේ සහ යශෝධරාවන්ගේ විවාහ මංගල්‍යය මෙයට විෂය වී ඇත. ප්‍රධාන රූප යුගලය ශ්වේත වර්ණ වස්ත්‍රාභරණයෙන් සරසා තිබෙන අතර එය අදාළ චරිතවල පාරිශුද්ධත්වය පිළිබඳ ඇඟවුමක් ද වේ.
  - රේඛාව කේන්ද්‍රීය ව ගොඩනඟා ඇත. උණුසුම් වර්ණ මාලාවකින් පරිවාර රූප ඇඳ ඇත. ඔවුහු නව යුවළට ආශීර්වාද කරති.
  - සිදුහත් කුමරුන් යශෝධරාවන් අත මුදුවක් තබන අයුරු මෙහි නිරූපිත ය.

(II) **මාර පරාජය** -
  - බෞද්ධ කලාවේ ප්‍රකට තේමාවක් වුව ද නව්‍ය ආකාරයකින් ගොඩනඟා තිබේ.
  - ජයග්‍රාහී විලාසයෙන් සිටින බුදු රජාණන් වහන්සේගේ ශරීර රශ්මිමාලා සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා තරංගාකාර ව දීර්ඝ කොට ඇඳ ඇත.
  - බුද්ධ තේජසින් මැඩුණු මාර පිරිස පරාජිත ලීලාවෙන් හා වේදනාවෙන් තෙරපුණු ඉරියව් මාලාවකින් සංරචනය කර ඇත.

**ඇගයීම** :
- එම්. සාර්ලිස්ගේ සිතුවම් පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- සෝලියස් මැන්දිස්ගේ කැලණි විහාර සිතුවම් සඳහා බලපෑ සම්ප්‍රදායවල, තේමාවල විශේෂතා , ශෛලිය හා ශිල්ප ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- බෙල්ලන්විල විහාර සිතුවම් පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- 20 වැනි සියවසෙහි ශ්‍රී ලංකේය විහාර සිත්තරුන් අපරදිග හා පෙරදිග කලා මූල බෞද්ධ චිත්‍ර කලාවෙහි දී භාවිත කර ඇති ආකාරය සංසන්දනාත්මක ව විමසන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 6.0** | : | **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 6.2** | : | **තෝරාගත් දේශීය කලාකරුවන්ගේ නිර්මාණ අගය කරයි.** |
| **ක්‍රියාකාරකම 6.2.3** | : | **නාරායණ ස්වාමිගේ නිර්මාණ අගයමු.** |
| **කාලච්ඡේද** | : | 01 යි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර |
| **ඉගෙනුම් පල** | : | • ශ්‍රී ලාංකේය කලාව පෝෂණයෙහි ලා දමිළ සිත්තරුන්ගේ දායකත්වය විස්තර කරයි.<br>• නාරායණ ස්වාමි ශිල්පියාගේ නිර්මාණ නම් කරයි.<br>• නාරායණ ස්වාමි ශිල්පියාගේ නිර්මාණ පිළිබඳ ව කලාත්මක ඇගයීමක් කරන්න. |
| **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** | : | සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න. |

- **නාරායණ ස්වාමි** -
    - යාපනයේ කෝවිල් සිතුවම් කලාවේ පුරෝගාමී චරිතයක් වන නාරායණ ස්වාමි දකුණු ඉන්දියානු නිර්මාණකරුවකු වශයෙන් ද සැලකේ.
    - ඔහුගේ ජීවන කාලය පිළිබඳ බොහෝ තොරතුරු හමු නොවන මුත්, ඔහුගේ නිර්මාණ වැල්වෙට්තුරෛ නගරයේ මුත්තු අම්මාන් කෝවිලේ දැකිය හැකි වේ.
      එම නිර්මාණ 1966-1967 කාලයට අයත් ය.
    - මෙම සිතුවම් ටෙම්පෙරා වර්ගයට අයත් වේ.
    - සිතුවම් ඇඳීමට අමතර ව ඔහු කෝවිලේ ගෝපුර නිර්මාණ කටයුතු සඳහා ද දායක වී ඇති බව සැලකේ.
    - ඔහු විසින් කෝවිලේ අඳින ලද සිතුවම් අතර විනයාගර් පුරාණය හා මුරුගන් පිළිබඳ සිතුවම් ද දක්නට ලැබේ. එසේ ම මෙම කෝවිලට අදාළ ඉතිහාස කතාව ද සිතුවම් අතර වේ.

(I) **සුර සම්හාරම්** -
- බටහිර කලා ලක්ෂණ අනුව වර්ණ මගින් ත්‍රිමාණ ලක්ෂණ හා ගැඹුර නිරූපණය කර ඇති ආකාරයත්, පෙරදිග කලා සම්ප්‍රදායය අනුව කතා කීමේ ලක්ෂණයත් මෙම සිතුවම තුළ ගළපා ඇති ආකාරය දැකිය හැකි වේ.
- මෙහි රේඛාවට වඩා වැඩි වැදගත්කමක් වර්ණවලට දෙමින් ත්‍රිමාණ ලක්ෂණ පෙන්නුම් කර ඇත. එසේ ම සිතුවමේ පර්යාවලෝක ලක්ෂණ සහිත ගැඹුර දැක්වීමට ගෙන ඇති උත්සාහය ද දැකිය හැකි ය.

(II) **අසංකාසුර සම්හාරම්** -
- විනයාගර් මෙහි සර්ප ස්වරූපයෙන් සිටින අසුරයා දෙපලු කරගෙන මතුවන දර්ශනය දක්වා තිබේ. මෙහි විනයාගර්ගේ ක්‍රියාව හා එහි පසුබිම ඉතා විශේෂ වේ.

- දකුණු ඉන්දීය චිත්‍ර ශිල්පී රාජා රවි වර්මාගේ කලා ලක්ෂණ ආභාස කරගෙන ඇති මෙම නිර්මාණයේ මනඃකල්පිත රූප හා දර්ශන, එම රූප ත්‍රිමාණ හා පර්යාවලෝක ලක්ෂණ සහිත ව තලය මත භාවිතය හඳුනා ගත හැකි ය.

**ඇගයීම** :

- නාරායණ ස්වාමිගේ නිර්මාණ කෙරෙහි බලපෑ හින්දු සාහිත්‍ය කථා ප්‍රවෘත්ති පැහැදිලි කර ශිල්පියා එකී වස්තු විෂය දෘශ්‍යමය වශයෙන් ගොඩ නංවා ඇත්තේ කෙසේ දැයි විමසන්න.
- නාරායණ ස්වාමිගේ නිර්මාණවල ශෛලිය, ශිල්ප ක්‍රම හා ප්‍රකාශන විලාසය පිළිබඳ සාකච්ඡා කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** : **ඉන්දීය කලාකරුවන්ගේ සිතුවම් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.3.1** : **ඉන්දීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගයමු.**
**- රාජා රවි වර්මා**

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- රාජා රවි වර්මාගේ නිර්මාණ නම් කරයි.
- රාජා රවි වර්මාගේ සිතුවම්වල භාවිත යුරෝපීය ක්‍රමවේද පිළිබඳ ව විස්තර කරයි.
- රාජා රවිවර්මාගේ සිතුවම්වල තේමා සහ එම තේමා කෙරෙහි හින්දු පුරාණෝක්තිවල බලපෑම පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **රාජා රවි වර්මා (1848 - 1906) -**
  - යුරෝපීය ක්‍රමවේද (යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාව) බහුල ව භාවිත කරමින් ඉන්දීය වස්තු විෂය නිරූපණයට නැඹුරු වූ සිත්තරෙකි.
  - යුරෝපීය ශාස්ත්‍රාලයීය කලාවේ විධික්‍රම භාවිත කරමින් ඉන්දීය වස්තු විෂය නිරූපණයට රවි වර්මා භාවිත කළ දෘශ්‍ය භාෂාව ඇන්ග්ලෝ -ඉන්දියානු සම්ප්‍රදායය ලෙස විචාරකයෝ හඳුන්වති.
  - ප්‍රභූ පවුලකින් පැවත එන්නකු වූ රවි වර්මාගේ ප්‍රධාන මාධ්‍යය වූයේ තෙල් සායම් ය. රවි වර්මා විසින් අඳින ලද පුරාණෝක්ති හා දේව කථා බෙහෙවින් ජනප්‍රිය වූ අතර ඒවායේ ඇතැම් නිර්මාණ ලිතෝග්‍රාෆ් මුද්‍රණ ලෙස ඉන්දියාව පුරා ව්‍යාප්ත විය.
  - මෙයට අමතර ව ආලේඛ්‍ය චිත්‍ර ද විශාල ප්‍රමාණයක් රවි වර්මා විසින් අඳිනු ලැබ ඇත.

(I) **සරස්වතී** -
  - යුරෝපීය ස්වාභාවිකවාදී ලක්ෂණ සහිත කලා සම්ප්‍රදායය අනුගමනය කරමින් අඳින ලද මෙම සරස්වතී දෙවඟනගේ චිත්‍රය ඉන්දියාව පුරා බෙහෙවින් ජනප්‍රිය විය.
  - මෙය ඉන්දීය කාන්තාවකගේ ජීවාදර්ශයක් ඇසුරෙන් කරන ලද්දකි. වීණාවක් අතැති ව සාරියකින් සැරසී ඇය ඉදිරිය බලා හිඳියි. පසු බිමෙහි ගංගාවක් සහ ගස් සහිත පරිසරයකි.

(II) **ඉන්ද්‍රජිත්ගේ ජයග්‍රහණය** -

- ඉන්ද්‍රජිත් හෙවත් මේඝනාද නමැති රාවණගේ පුත්‍රයා විෂය කොට ගත් නිර්මාණයකි. අතිදක්ෂ රණශූරයකු වූ මොහු ධනුර්ධරයකුගේ විලාසයෙන් දක්වා ඇත.
- එළිය - අඳුර, පර්යාවලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, වර්ණ ප්‍රභේද කර යෙදීම මෙහි භාවිත වී ඇත.
- චිත්‍රයේ මධ්‍යයේ රාවණගේ රුව ද දැකිය හැකි ය.

**ඇගයීම** :

- රවි වර්මාගේ සිතුවම් පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- රවි වර්මාගේ සිතුවම්වල දක්නට ලැබෙන යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ලක්ෂණ මොනවා දැයි සාකච්ඡා කරන්න.
- ඉන්දීය පුරාණෝක්ති හා මිථ්‍යා කථා රවි වර්මාගේ සිතුවම්වල නිරූපණය වී ඇති ආකාරය පිළිබඳ ව විමසීමක් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** : **ඉන්දීය කලාකරුවන්ගේ කලා කෘති අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.3.2** : **ඉන්දීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගයමු.**
- **අබනින්ද්‍රනාත් තාගෝර්**
- **නන්දලාල් බෝස්**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ඉන්දීය නවජීවන ව්‍යාපාරය බිහි වූ පසු බිම, අරමුණු හා පොදු ලක්ෂණ පැහැදිලි කරයි.
- යුරෝපීය කලා ව්‍යාපාරවලට එදිරි ව පැන නැඟුණු නව කලා ව්‍යාපාර පිළිබඳ ව විස්තර කරයි.
- අබනින්ද්‍රනාත් තාගෝර්ගේ සිතුවම් ඇගයීමට ලක් කරයි.
- නන්දලාල් බෝස්ගේ සිතුවම් ඇගයීමට ලක් කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **ඉන්දීය නවජීවන ව්‍යාපාරය** -
  - යුරෝපීය ශස්ත්‍රාලයීය යථාර්ථවාදී රීතීන්ට එරෙහි ව ඉන්දීය හා පෙරදිග කලා රීති අනුගමනය කරමින් බිහි වූ කලා ව්‍යාපාරයක් ලෙස ඉන්දීය නවජීවන ව්‍යාපාරය හැඳින්විය හැකි ය.
  - මෙම ව්‍යාපාරය නියෝජනය කළ සිත්තරු, අජන්තා, එල්ලෝරා, මෝගල්, රාජ්පුත්, කලිගාර්ට් ආදි ඉන්දීය සම්ප්‍රදායවල මෙන් ම චීන හා ජපන් වැනි ආසියාතික කලා සම්ප්‍රදායවල රීති ගුරු කොට ගනිමින් ස්වකීය නිර්මාණ ක්‍රියාවලියෙහි නිරත වූහ.

- **අබනින්ද්‍රනාත් තාගෝර් (1871-1951)** -
  - බෙංගාලි ගුරු කුලයේ පුරෝගාමී සිත්තරෙකි.
  - බටහිර ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ලක්ෂණ බැහැර කර සනිකවාදී කලා භාෂාවේ ප්‍රයෝග හා මෝගල්, රාජ්පුත් කලාවේ ලක්ෂණ ග්‍රහණය කර ගනිමින් නිර්මාණකරණයේ නිරත විය.
  - පසු කාලීන ව ජපන් හා චීන කලා ලක්ෂණ ද ස්වකීය නිර්මාණ සඳහා උපයෝගි කරගන්නා ලදි.

(I) භාරත මාතා -
  - රක්ත වර්ණයෙන් සැරසුණු කාන්තා රුවක් ලෙස භාරත මාතා නිරූපිත ය.
  - ඇය ඉතා තේජවන්ත ඉරියව්වකින් නැඟී සිටින අතර හිස වටා ප්‍රභා මණ්ඩලයකි.
  - ඉන්දීය දෙවඟනක මෙන් දෑත් හතරකින් දක්වා තිබේ.

- උණුසුම් වර්ණ මාලාවකින් යුක්ත සිතුවමක් හෙයින් ප්‍රේක්ෂකයාගේ ඇස වහා ග්‍රහණය කර ගනියි.
- ඉන්දීය මෝගල් චිත්‍රවල මෙන් සැරසිලි සහිත වාටි මෝස්තරයක් චිත්‍රය වටා ඇත.

(II) **අශෝක දේවිය සහ බෝධිය** -

- දුඹුරු පැහැය ගුරු කොට ගනිමින් ඒක-වර්ණ චිත්‍රයකට සමාන අයුරින් නිර්මාණය කරන ලද්දකි.
- ප්‍රධාන රූපය ලෙස අශෝක රජුගේ බිසව චිත්‍රය මධ්‍යයේ යොදා ඇති අතර ඇය ඉතා තීක්ෂ්ණ කල්පනාකාරී ඉරියව්වකින් බෝධි වෘක්ෂය දෙස බලා හිඳියි.
- පසුබිමෙහි ගරාදී වැටේ ගල් කණු කිහිපයක් සහ බිසවගේ එක් අතකට පහළින් නාග සලකුණක් දක්නට ලැබේ.
- රත් පැහැති කඳින් යුතු බෝධි වෘක්ෂයේ පත්‍ර පහළට හැරී ඇති අයුරින් දක්වා ඇත.

- **නන්දලාල් බෝස්** - (1882-1966) -
  - ඉන්දීය නවජීවන ව්‍යාපාරයේ පුරෝගාමී සිත්තරුන්ගෙන් අයෙකි.
  - කල්කටා කලායතනයෙන් 1905-1910 තෙක් අධ්‍යාපනය ලැබී ය.
  - නූතන ඉන්දීය කලාවට පදනම සැලසූ ප්‍රධානතම සිත්තරෙකි.

(I) **ශිව වස බීම** -

- අජන්තා, එල්ලෝරා ආදි ඉන්දීය ස්වදේශීය සම්ප්‍රදායවල ආභාසය ඇසුරු කර ගනිමින් නිර්මාණය කරන ලද්දකි. බෙහෙවින් සෞම්‍ය වර්ණමාලාවක් භාවිත කර ඇත.
- ශිව දෙපතුල් එකිනෙක හා ගැටෙන සේ හිඳගෙන දකුණතින් වස බඳුන අල්ලාගෙන සිටියි.
- අළු පැහැති රැස් වළල්ලකින් සරසන ලද ශිව ශාන්ත ඉරියව්වකින් දක්වා ඇත. ඔහුගේ උඩුකය නිරුවත් නමුත් අලංකාර මාලයක් පැළඳගෙන ඇත.

(II) **රාධාගේ විරහව** -

- බෙහෙවින් ජ්‍යාමිතික රූපී ව්‍යුහයක් සහිත ආකෘතියක් අනුගමනය කරමින් අඳින ලද්දකි.
- රාධා ඇඳක දිගා වී සිටින අතර දෙපසින් මිතුරියෝ දෙදෙනෙක් ඇය සැනසීමට තැත් කරති.
- ශීත මෙන් ම උණුසුම් වර්ණ එකිනෙකට ඒදිරි ව භාවිත කර ඇත.
- ප්‍රචලිත තේමාවක් වුව ද නන්දලාල් බෝස් මෙය නව්‍ය ආකෘතියකින් ප්‍රතිනිර්මාණය කර ඇත.

**ඇගයීම** :

- ඉන්දීය නවජීවන ව්‍යාපාරය සහ එහි කලාකරුවන් හඳුන්වන්න.
- අබනින්ද්‍රනාත් තාගෝර්ගේ නිර්මාණ පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- නන්දලාල් බෝස්ගේ නිර්මාණ පිළිබඳ ව ඇගයීමක් කරන්න.
- ඉන්දීය නවජීවන ව්‍යාපාරයේ කලාකරුවන්ගේ නිර්මාණවල පොදු ලක්ෂණ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.4** : **යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන් ගැන අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.4.1** : **යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන්ගේ නිර්මාණ අගයමු**
**- ලියොනාඩෝ ඩාවින්චි (Leonardo da Vinci)**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- පුනර්ජීවන කලාවට තුඩු දුන් සමාජ පසුබිම සහ පුනරුදයේ වැදගත්කම විස්තර කරයි.
- පුනරුද කලාකරුවන්ගේ නිර්මාණවල භාවිත වූ රීති පැහැදිලි කරයි.
- ලියොනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ නම් කරයි.
- ඩාවින්චිගේ නිර්මාණවල තේමා, ශෛලිය, ශිල්ප ක්‍රම පිළිබඳ ව අවධානය යොමු කරමින් කලා කෘති රසවින්දනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- පුනරුදය -
  - ක්‍රි. ව. 14 - 16 වන සියවස්වල දී යුරෝපයේ සාමාජීය, විද්‍යාත්මක, කලාත්මක, තාක්ෂණික ආදි විවිධ අංශයන්හි ඇති වූ පිබිදීම මෙ නමින් හැඳින්වේ.
  - දෘශ්‍ය කලාව සම්බන්ධයෙන් සැලකීමේ දී පල්ලියේ බල අධිකාරියෙන් මිදී පැරණි ග්‍රීක-රෝම සම්භාව්‍ය කලාවේ රීතීන් කෙරෙහි කලාකරුවා යොමු විය.
  - මෙම ව්‍යාපාරය ඉතාලියෙන් ඇරඹී පසු ව යුරෝපය පුරා ව්‍යාප්ත විය.

- **පුනරුද කලාවේ පොදු ලක්ෂණ** -
  - මානුෂීයවාදය (Humanism), පුද්ගලවාදය (Individualism), පරමාදර්ශවාදය (Idealism), ස්වාභාවිකවාදය (Naturalism) යන ප්‍රවේශ ප්‍රමුඛත්වයට පත් වීම.
  - පැරණි ග්‍රීක-රෝම සම්භාව්‍ය කලාවේ රීති යළි භාවිතයට ගැනීම.
  - භූමි දර්ශන කලාව දියුණු වීම.
  - ඇසට පෙනෙන දෙය ඒ අයුරින් ම ඇඳීම හෙවත් ස්වාභාවික ලෝකය හැකි තාක් තථ්‍ය ස්වරූපයෙන් ගොඩනැඟීම. මෙහි ප්‍රතිඵලයක් ලෙස පර්යාවලෝක මූලධර්මය වැනි උපක්‍රම දියුණු විය.
  - කායව්‍යූහ ලක්ෂණ (anatomy) හා පරිමාණ ලක්ෂණ (propotions) අධ්‍යයනය කිරීම.
  - ග්‍රීක-රෝම තේමා හා සංකේත නැවත ජනප්‍රිය වීම.
  - ආලේඛ්‍ය චිත්‍ර කලාව ප්‍රචලිත වීම.

- **ලියොනාඩෝ ඩාවින්චි (Leonardo da Vinci - 1452-1519) -**
  - පුනරුද කලාවේ පුරෝගාමී චරිතයක් වන ඩාවින්චි ඉතාලියානු සිත්තරෙකි. ඔහු මූර්ති කලාව, ගෘහනිර්මාණ කලාව, සංගීතය, ඉංජිනේරු විද්‍යාව, ගණිතය ආදි විෂය රැසක විශේෂඥයෙකි.
  - ඩාවින්චිගේ නිර්මාණවල දෘශ්‍ය අරමුණු පිහිටුවීම බෙහෙවින් සැලසුම් සහගත වන අතර ගණිතමය අනුපාත භාවිතය සුලභ ය. ත්‍රිකෝණාකාර ව්‍යූහ තුළ මානව රූප සම්පිණ්ඩනය මෙයට එක් නිදසුනකි.
  - මානව රූප ඇඳීමේ දී ඩාවින්චි ජීවාදර්ශ භාවිත කළ අතර මානව කායව්‍යවච්ඡේද ලක්ෂණ සහ පරිමාණ නිවැරදි ව භාවිත කර ඇත.
  - පුනරුද සිත්තරුන් අතර මානව භාව නිරූපණයෙහි දක්ෂතම සිත්තරා ඩාවින්චි සේ සැලකේ.

(I) **මොනාලිසා (Mona Lisa) -**
- ඩාවින්චි විසින් අඳින ලද ඉතා ප්‍රකට කාන්තා ආලේඛ්‍ය සිතුවමකි. තෙල් සායමින් දැව ඵලකයක් මත මෙම සිතුවම ඇඳ තිබේ.
- මොනාලිසා සංරචනය කර ඇත්තේ ත්‍රිකෝණාකාර ව්‍යූහයක් තුළ ය. ප්‍රේක්ෂකයා වෙත යොමු වූ මොනාලිසාගේ බැල්ම (gaze) ඉතා වැදගත් වන අතර එය හැඟීම් ගණනාවක සම්මිශ්‍රිත නිරූපණයක් ලෙස විචාරකයෝ අරුත් ගන්වති.
- ගිරිදුර්ගවලින් ගහන හුදෙකලා බවින් යුතු ගුප්ත පරිසරයක් චිත්‍රයේ පසුබිමට යොදා තිබෙන අතර එය මොනාලිසාගේ භාවමය තත්ත්වය වඩාත් සංකීර්ණත්වයට පත් කර තිබේ.
- චිත්‍රය පුරා අඳුරු වර්ණ මාලාවක් බහුල ව භාවිත කර තිබුණ ද ඉදිරිපසින් වැටෙන ආලෝක ධාරාවකින් මොනාලිසාගේ මුහුණ සහ දෑත් ආලෝකවත් වී තිබේ. ඇය ආභරණ රහිත ව ඉතා චාම් විලාසයකින් ඉදිරිපත් කර ඇත.
- ඩාවින්චි මෙහි භාවිත කර ඇති සධූගමන (sfumato) උපක්‍රමය විශේෂ ලක්ෂණයකි. (සධූගමනය වනාහි වර්ණ තැවරීමේ දී එම වර්ණ සියුම් දුමක් වැනි (haze) බොඳ වූ ස්වරූපයකින් ප්‍රභේද කර ආලේපනය කරන උපක්‍රමයකි).

(II) **අවසාන භෝජන සංග්‍රහය (The Last Supper) -**
- ක්‍රිස්තු චරිතයේ අවස්ථාවක් විෂය කරගත් මෙම සිතුවමින් දැක්වෙන්නේ ජේසුතුමා ස්වකීය ගෝලයන් අතුරින් එක් තැනැත්තෙකු විසින් තමා පාවා දෙනු ලබන බව අනාවරණය කළ අවස්ථාවේ ඇති වූ කැලඹිලි සහගත පසුබිම යි.
- ගෝල පිරිස, 'පාවා දීම කරන්නා' කවරෙක් දැ යි දැන ගැනීමට මහත් කලබලයෙන් හා කැලඹීමෙන් ජේසු තුමා දෙසට නැඹුරු ව සිටිති. ගෝල පිරිසේ කැලඹිලි සහිත භාවමය තත්ත්වයට ප්‍රතිපක්ෂ ව ජේසු තුමාගේ රුව ඉතා නිශ්චල හා ශාන්ත ඉරියව්වකින් චිත්‍රයේ මධ්‍යයේ පිහිටුවා තිබේ.
- ජේසුතුමාගේ හිස චිත්‍රයේ සංහත ලක්ෂයෙහි (vanishing point) පිහිටුවා ඇත.
- අඩි 25 x 19 ප්‍රමාණයෙන් යුතු මෙය ශාන්ත මරියා දෙලාග්‍රෙසි නම් තාපසාරාමයේ භෝජනාගාරයේ බිත්තියක ඇඳ තිබෙන අතර අදාළ සිදුවීම බෙහෙවින් නාටකීය ඇසුරින් සිත්තමට නැඟීමට ඩාවින්චි සමත් ව ඇත.
- මෙහි ගෝල පිරිස තිදෙනා බැගින් කණ්ඩායම් හතරකට බෙදා ජේසු තුමා දෙපසින් දක්වා ඇත.

(III) **පර්වත මස්තකයේ දේව මෑණියෝ/ගිරි අරණෙහි කන්‍යා මරිය තුමිය (Vergin of the Rocks)-**
- ඩාවින්චි විසින් අඳින ලද මෙම තේමාවෙන් යුතු චිත්‍ර 02ක් තිබෙන අතර ඉන් එකක් වර්තමානයේ දී ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ද, අනෙක ලන්ඩන් ජාතික කෞතුකාගාරයේ ද ඇත.
- මෙම සිතුවම මරියතුමිය, ජේසු බිළිඳා, ශාන්ත ජෝන් සහ දේව දූතයකු දැක්වෙන මානව රූප හතරකින් සමන්විත සංරචනයකි. කරුණාව, දයාව සහ මාතෘත්වය පිළිබඳ ව ප්‍රකාශනයකි.

- පිටුපසින් ඇති ශිඛර සහිත පසු බිම නිසා මෙම චිත්‍රයට ඉහත නම ලැබී තිබේ. මානව රූප පිහිටුවා ඇත්තේ ත්‍රිකෝණාකාර ව්‍යූහයක් තුළ ය.
- ඩාවින්චි භාවිත කළ සධූගමන (sfumato) උපක්‍රමය මෙහි ද දැකිය හැකි වේ. මීදුමක් අතරින් රූප මතුවී පෙනෙන ආකාරයක් මෙයින් දැක්වෙන අතර රූප මත ඉහළින් දීප්තිමත් ආලෝකයක් පතිත වී තිබේ. එය දිව්‍යමය ආලෝකය පිළිබඳ සංකේතාත්මක අදහසක් දනවයි.

**ඇගයීම** :

- පුනරුද සමාජ පසු බිම විස්තර කර පුනරුද කලාකරුවන් අවධානය යොමු කළ පොදු ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ලියොනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ පිළිබඳ ව ලැයිස්තුවක් සකස් කරන්න.
- ලියොනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ පිළිබඳ ව විචාරාත්මක ඇගයීමක් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.4** : **යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන් ගැන අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.4.2** : **යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන්ගේ නිර්මාණ අගයමු**
- **මයිකල්/මීකෙල් ආන්ජිලෝ** (Michelangilo)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- මයිකල් ආන්ජිලෝගේ සිතුවම් හා මූර්ති නම් කරයි.
- මයිකල් ආන්ජිලෝගේ තෝරාගත් ප්‍රෙස්කෝ සිතුවම් නියැදියක් රසවින්දනය කරයි, අගයයි.
- මයිකල් ආන්ජිලෝගේ මූර්තිවල තේමා, ශෛලීය ලක්ෂණ, සංරචනය හා ග්‍රීක සම්භාව්‍ය කලාවේ ආභාස විස්තර කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **මයිකල් ආන්ජිලෝ (Michelangilo -** 1475-1564**)** -
  - ඉතාලියානු පුනරුද කලාවේ විශිෂ්ට මූර්ති ශිල්පියකු මෙන් ම සිත්තරෙක් ද වේ.
  - සිස්ටයින් දේවස්ථානයේ ඇති මයිකල් ආන්ජිලෝගේ නිර්මාණ ඔහුගේ සිතුවම් කලාවේ නිපුණත්වයට නිදසුනකි. එහෙත් මයිකල් ආන්ජිලෝ තමා හඳුන්වා දුන්නේ සිත්තරකු ලෙස නොව මූර්ති ශිල්පියකු ලෙසිනි. ඔහු දෘශ්‍ය කලාවේ මූලික කේන්ද්‍රය මූර්ති කලාව ලෙස සැලකී ය.
  - මයිකල් ආන්ජිලෝ ග්‍රීක රෝම කලා මූලයන්ගෙන් බෙහෙවින් ම ආභාසය ලැබූ නිර්මාණකරුවෙකි.
  - මානව ශරීරය මොහුගේ නිර්මාණවල ප්‍රධාන ප්‍රකාශන වාහකය විය. මානව කායව්‍යවච්ඡේදක ලක්ෂණ අතිශයෝක්තියෙන් අවධාරණය මොහුගේ නිර්මාණවල විශේෂ ලක්ෂණයකි.

- **සිස්ටයින් දෙව්මැඳුරේ චිත්‍ර (Paintings in the Sistine Chapel)** -

  (I) අවසාන විනිශ්චය **(Last Judgement)** -
  - කිතුණු ආගමික තේමාවක් විෂය කොටගත් විශාල ප්‍රමාණයේ ප්‍රෙස්කෝ සිතුවමකි.
  - ජේසුතුමාගේ රුව කේන්ද්‍රීය දෘශ්‍ය අරමුණ වශයෙන් පිහිටුවා ඇති මෙම නිර්මාණයේ පරිවාර රූප 300ක් පමණ ප්‍රමාණයක් ඇත. ජේසු තුමාගේ ඉහළට එසවූ දකුණු හස්තය මධ්‍යයේ කුරුසයේ ඇණ ගැසීම නිසා ඇති වූ තුවාල කැළල දක්වා ඇත.

- ජේසුතුමා ආසන්නයේ අපෝස්තුලුවරුන්, දේවදූතයන්, ශාන්තුවරයන්, ආගම වෙනුවෙන් දිවි පිදුවන් දක්වා තිබෙන අතර චිත්‍රයේ පහළ කොටසේ වේදනාවෙන් පෙළෙන පාපී පිරිස් නිරූපිත ය.
- චිත්‍රයේ වම් පස ස්වර්ගය කරා ඇදෙන්නන් සහ දකුණු පස ස්වර්ගයෙන් පහතට වැටෙන්නන් දක්වා තිබේ.
- මෙම චිත්‍රය ඇඳි අවධියේ බටහිර සමාජයේ මෙන් ම පල්ලිය තුළ ද විවිධ ප්‍රතිසංස්කරණවලට පදනම සැකසෙමින් තිබූ අර්බුදකාරී වටපිටාවක් පැවතිණි. එය චිත්‍රයේ අන්තර්ගතයට බලපා තිබේ.
- මයිකල් ආන්ජිලෝ මෙම චිත්‍රයෙහි ජේසු තුමා නිරූපණය කර ඇත්තේ ඇපලෝ දේව සංකල්පයට ආදේශ කිරීමෙන් යැයි සැලකේ.
- මානව රූපවල මාංසපේශී හා ස්කන්ධය අවධාරණය කර දැක්වීම මයිකල් ආන්ජිලෝගේ සිතුවම්වල සුවිශේෂ ලක්‍ෂණයක් වන අතර එම ලක්ෂණය මෙම සිතුවමෙහි පැහැදිලි ව දැකිය හැකි ය.

(II) ආදම් මැවීම **(Creation of Adam)** -

- මෙය සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ ඇඳ ඇති ලෝකෝත්පත්ති කථා මාලාවේ එක් චිත්‍රයකි. දෙවියන් වහන්සේ ආදම් මවා ඔහුට ජීවය ලබාදීම මෙම ෆ්‍රෙස්කෝ සිතුවමෙන් දැක්වේ.
- වයෝවෘද්ධ, පාණ්ඩිත්‍යයෙන් යුතු මුහුණකින් හා ශක්තිමත් ශරීරයකින් යුතු ව දෙවියන් වහන්සේ මානව රූපී විලාසයකින් ගොඩනගා තිබීම මෙහි විශේෂත්වයකි.
- දෙවියන් වහන්සේගේ රූපය බෙහෙවින් ජීවී හා චලනමය ගුණයෙන් යුක්ත වන අතර ආදම් අප්‍රාණික ව ගල්තලාවක් මත වැතිර සිටියි.
- ජීවය ලබාදීම නමැති ක්‍රියාවලිය මෙහි දක්වා ඇත්තේ දෙවියන්ගේ ප්‍රාණ පූර්ණ දකුණත හා ආදම්ගේ අප්‍රාණික වම් අත ඇසුරෙන් සංකේතාත්මක ව ය.
- මානව කාය ව්‍යූහ ලක්‍ෂණ පිළිබඳ ව මනා අධ්‍යයනයකින් හා අවබෝධයකින් යුක්ත ව කරන ලද නිර්මාණයකි. ආගමික තේමාවක් වුව ද මානුෂීයවාදී (Humanism) ලක්‍ෂණ සහිත ප්‍රකාශනයකි.

(III) පියෙටා **(Pieta)** -

- මයිකල් ආන්ජිලෝ පියෙටා කෘති කිහිපයක් නිර්මාණය කර තිබෙන අතර එයින් වඩාත් ප්‍රකට "මැඩෝනා ඩෙලා පියෙටා" නම් කෘතිය යි.
- 'පියෙටා' යන්නෙහි අර්ථය 'වැලපීම' යන්න වන අතර, මෙම මූර්තියෙන් දැක්වෙන්නේ කුරුසයෙන් බාන ලද ජේසු තුමාගේ මෘත ශරීරය උකුළ මත තබාගෙන සිටින මරිය තුමියගේ රුව යි.
- කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද මෙහි, රූප ද්විත්වය සංරචනය කර ඇත්තේ පිරමීඩාකාර ආකෘතියක් තුළ ය.
- ජේසු තුමාගේ ශරීරයේ අප්‍රාණික ස්වරූපය, ඇණවලින් සිදුරු වූ තුවාල කැළැල් , මරිය තුමිගේ අතට තෙරපෙන දකුණු බාහුව ආදි මානව ඉරියව් ඉතා දක්ෂ ලෙස නිර්මාණය කර තිබේ.
- මරිය තුමියගේ මුහුණේ ඇත්තේ වැලපීමකට වඩා භාවනාත්මක අවධානයකින් යුතු හැඟීම් ප්‍රකාශනයකි.

(IV) ඩේවිඩ් ප්‍රතිමාව **(David)** -

- ගොලායත් නම් යෝධයකුගෙන් මිනිසුන් බේරාගත් යොවුන් වීරයකු දැක්වෙන කිරිගරුඬ මූර්තියකි.
- ග්‍රීක සම්භාව්‍ය මූර්ති කලාවේ ඉතා ප්‍රකට ඉරියව්වක් වන එක් පාදයකට බර දී සිටගත් ඉරියව්ව මයිකල් ආන්ජිලෝ විසින් ඉතා සාර්ථක ව භාවිතයට ගනු ලැබ තිබේ.
- මූර්තිය බිඳීයාම වැළැක්වීමට තාක්‍ෂණික ප්‍රයෝගයක් ලෙස දකුණු පයට සම්බන්ධ වූ ආධාරක කොටසකි.

- අඩි 17ක් පමණ උස නග්න රූපයක් වන මෙය මානව කාය ව්‍යුහ ලක්‍ෂණ පිළිබඳ ශිල්පියා සතු විශාරදත්වය මනා ව ප්‍රකට කරන නිර්මාණයකි.
- ඩේවිඩ් සිටින ඉරියව්වට අනුරූප ව ඔහුගේ ශරීරයේ අස්ථි, මාංසපේශී, නහර ආදි සෑම සියුම් අංග - ප්‍රත්‍යංගයක ම වෙනස්කම් පිළිබඳ අවබෝධයෙන් මූර්තිය ගොඩනගා ඇත.
- ඩේවිඩ් වමතින් ගල් දුන්න අල්වාගෙන සැහැල්ලු ඉරියව්වකින් සිටියි. එහෙත් ඔහුගේ මුහුණෙහි ඇත්තේ ඉතා තීක්‍ෂණ, දූරදර්ශී බැල්මකින් අභියෝගය දෙස කල්පනාකාරී ව බලා සිටින භාව ප්‍රකාශනයකි.

(V) **මෝසස් ප්‍රතිමාව (Moses)** -

- දස පනත හා සම්බන්ධ මෝසස් තුමාගේ රුව මෙයින් දැක්වේ. දස පනත සංකේතවත් කිරීමට දකුණතෙහි ගල් පුවරුවක් දක්වා තිබේ.
- මෙම මූර්තිය ප්‍රඥාවේ මෙන් ම බලයේ ද සංකේතයක් ලෙස නිරූපණය වී ඇත.
- ගැඹුරු පාණ්ඩිත්‍යයෙන් යුතු වයෝවෘද්ධ මුහුණක් මෝසස්ට යොදා තිබුණ ද ඔහුගේ ශරීරය මනා කාය බලයෙන් හා ශක්තියෙන් ද යුතු බව පෙනෙන්නට තිබේ.
- ඔහු තේජාන්විත ඉරියව්වකින් හිඳ වාමාවර්ත ව හිස හරවා විමසුම් සහගත දිගු බැල්මක් බලා හිඳියි.
- II වන ජුලියස් පාප්තුමාගේ සොහොන් ගැබ වෙනුවෙන් කරන ලද්දකි.

**ඇගයීම** :

- මයිකල් ආන්ජිලෝගේ කලා නිර්මාණ පිළිබඳ ලැයිතුවක් සකස් කරන්න.
- මයිකල් ආන්ජිලෝගේ මූර්ති පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න.
- ලියොනාඩෝ ඩාවින්චිගේ හා මයිකල් ආන්ජිලෝගේ සිතුවම්වල දක්නට ලැබෙන සමානකම් සහ අසමානකම් සාකච්ඡා කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.4** : **යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන් ගැන අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.4.3** : **යුරෝපීය පුනර්ජීවන සමයේ කලාකරුවන්ගේ නිර්මාණ අගයමු.**
- රෆායල් සන්සියෝ (Raphael Sanzio)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- රෆායල් සන්සියෝගේ නිර්මාණ නම් කරයි.
- රෆායල් සන්සියෝගේ නිර්මාණ රසවිඳියි, අගය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- රෆායල් සන්සියෝ (**Raphael Sanzio** -1483-1520) -
  - පුනරුද කලාවේ විශිෂ්ට නිර්මාණකරුවකු වූ රෆායල් ජීවත් වූයේ වසර 37ක් පමණි. මුලින් ඔහු පෙරුජිනෝ නම් ශිල්පියා යටතේ පුහුණුව ලැබී ය. ආරම්භක අවධියේ රෆායල් පෙරුජිනෝගේ ශෛලි අනුගමනය කළ ද පසු ව ඔහුට ම අනන්‍ය වූ නිර්මාණවිලාසයක් ගොඩ නඟා ගනී.
  - රෆායල් විසින් අඳින ලද මැඩෝනා සිතුවම් මාලාව බොහෙවින් ඇගයුමට ලක් විය. පුනරුද සිත්තරුන් අතරෙන් වඩාත් සුකොමළ ළදරු රූප හමුවන්නේ රෆායල්ගේ නිර්මාණවලිනි.
  - ඇතන්ස්හි ශාස්ත්‍රාලය රෆායල්ගේ නිර්මාණ පරිචය වඩාත් හොඳින් ම ප්‍රකට කළ සිතුවම වේ.
  - රෆායල්, ජේසු තුමා මළවුන්ගෙන් උත්ථානවීම අඳිමින් සිටිය දී හදිසියේ ම මරණයට පත් විය.

(I) ඇතන්ස්හි ශාස්ත්‍රාලය/ඇතන්ස් ගුරුකුලය **(School of Athens)** -
- ග්‍රීක දාර්ශනික ගුරුකුලය විෂය කොටගත් මෙම ප්‍රෙස්කෝ සිතුවම රෆායල්ගේ වඩාත් ප්‍රකට සිතුවම් අතුරින් එකකි.
- මෙහි කේන්ද්‍රීය චරිත 02ක් වන ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් චිත්‍රය මධ්‍යයේ පිහිටුවා ඇත. ඇරිස්ටෝටල්ගේ ගුරුවරයා ප්ලේටෝ වන අතර ඔවුන් දෙදෙනා දැරූ එකිනෙකට විරුද්ධ මතවාද ඔවුන්ගේ දෑත් යොමු වී ඇති දිශාවන්ගෙන් සංකේතවත් කෙරේ.
- ඉතා නිවැරදි ව පර්යාවලෝක මූලධර්ම භාවිත කරමින් අඳින ලද සංකීර්ණ වාස්තු විද්‍යාත්මක ආකෘතියක් පසුබිමෙහි දක්නට ලැබේ. එහි මධ්‍යයේ ඇති ආරුක්කුව ප්ලේටෝගේ සහ ඇරිස්ටෝටල්ගේ හිස වටා පැලඳි ප්‍රභා මණ්ඩල මෙන් දෘශ්‍ය වේ.
- දැවැන්ත හා තේජවන්ත ගෘහ නිර්මාණ ආකෘතියෙන් එහි සිටින ප්‍රාඥයන්ගේ දැනුම හා ගම්භීරත්වය අවධාරණයට ආධාරක බලපෑමක් ලැබී තිබේ.
- මානව රූප විශාල ප්‍රමාණයක් තිබුණ ද ඒවා කණ්ඩායම් ලෙස ගොනු කර තැබීම විශේෂ ලක්ෂණයකි.

- පසුබිම් ගොඩනැඟිල්ලේ දෙපස ඇතීනා දෙවඟනගේ සහ ඇපලෝ දෙවියන්ගේ ප්‍රතිමා දෙකක් දක්වා ඇත. රෆායල් ස්වකීය ආලේඛ්‍ය රුව ද මෙම සිතුවමට අන්තර්ගත කොට තිබේ.

(II) **පර්නාසස් (Parnassus)** -

- මෙය **"කාව්‍ය ශාස්ත්‍රය"** නිරූපණය කරන්නා වූ තේමාවකි. පර්නාසස් කඳු මුදුනේ රැස් ව සිටින කාව්‍යකරණයට සම්බන්ධ, විවිධ කාල පරාසයන්ට අයත් චරිත සමූහයක් සිතුවම තුළ ගොනු කර තිබේ.
- **පර්නාසස්** යනු කාල්පනික කන්දක් වන අතර එම කඳු මුදුනෙහි වැඩ වසන ඇපලෝ දෙවියෝ චිත්‍රය මධ්‍යයේ දැක් වෙති. ඔහු සංගීත භාණ්ඩයක් වාදනය කරන අතර සෙසු කවීන් කණ්ඩායම් ලෙස ගොනු කර ඇත.
- මෙහි වම් කෙළවරේ තද නිල් පැහැයෙන් යුතු කබායකින් සැරසුණු රූපයේ මුහුණ සඳහා රෆායල් යොදා ගෙන ඇත්තේ ලැඕකූන් ප්‍රතිමාවේ පූජකයාගේ මුහුණ ය. එය ග්‍රීක-රෝම කලා මූලයන් පුනරුද ශිල්පියා විසින් භාවිතයට ගනු ලැබීම පිළිබඳ නිදර්ශනයකි.

(III) ඇල්බා මැඩෝනා **(Alba Madona)** -

- ජේසු බිලිඳා, මරියතුමිය, සහ ශාන්ත ජෝන් යන තිදෙනා දැක්වෙන සිතුවමකි.
- අතිශයෝක්තිගත ප්‍රභාමණ්ඩලය හා දේවදූතයන් වැනි ලක්ෂණ බැහැර කොට ඔවුන් ප්‍රකෘති ලෝකයේ මිනිසුන් ලෙස මානවවාදී ලක්ෂණ අවධාරණය වන පරිදි නිරූපණය කර ඇත.
- ජේසු බිලිඳා ඇතුළු පිරිස සිටිනුයේ ඉතාලියානු ගම්බද පරිසරයක ය.
- චිත්‍රය ගොඩනගා ඇත්තේ ඇසට ප්‍රිය සෞම්‍ය වර්ණ භාවිතයෙනි.
- බිලිඳු රූප චිත්‍රණය කිරීමට රෆායල් සතු සමත්කම පිළිබඳ මෙම සිතුවම ද නිදර්ශනයකි.
- මෙහි සිටින රූප තුනෙහි අවධානය යොමු ව ඇත්තේ ශාන්ත ජෝන් සහ ජේසු බිලිඳා අල්ලාගෙන සිටින කුරුසය වෙත ය.

**ඇගයීම** :

- රෆායල්ගේ නිර්මාණ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.
- රෆායල්ගේ සිතුවම් පිළිබඳ ඇගයීමක් කරන්න.
- රෆායල්ගේ නිර්මාණ කෙරෙහි පැරණි ග්‍රීක - රෝම සම්භාව්‍ය කලාවේ තේමා හා දෘශ්‍ය මූලයන් බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.5** : **යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්වාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.5.1.** : උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.
- ක්ලෝඩ් මොනේ (Claude Monet)

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- උපස්ථිතිවාදී කලාවට පදනම් වූ පසු බිම හා උපස්ථිතිවාදී කලාවේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- උපස්ථිතිවාදී කලාකරුවන් නම් කරයි.
- ක්ලෝඩ් මොනේගේ සිතුවම්වල වස්තු විෂය, ශිල්ප ක්‍රම හා ශෛලිය ලක්ෂණ විස්තර කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **උපස්ථිතිවාදය (Impressionism)** -
  - උපස්ථිතිවාදය 19 වැනි සියවසේ දී පැරීසිය මුල් කර ගත් නිදහස් කලාකරුවන් පිරිසකගේ අත්හදා බැලීම් ඔස්සේ දියුණු වූ කලා ව්‍යාපාරයකි.
  - මොවුහු ප්‍රංශ සැලෝනයේ සම්මත රීතිවලට ප්‍රතිපක්ෂ ව කටයුතු කළ පිරිසක් වූහ.
  - පැහැදිලි ව හඳුනා ගත හැකි වේගවත් පින්සල් පහරවල්, ස්වාභාවික ආලෝකය හා ස්වාභාවික ලෝකය විෂය වීම, වස්තු ආලෝකයට දක්වන ප්‍රතික්‍රියා අධ්‍යයනය, එක ම තේමාව පුන පුනා ඇඳීම, වර්ණ පිළිබඳ විවිධ අත්හදා බැලීම්, බහු වර්ණයෙන් යුක්ත සෙවණැලි දැක්වීම, සම්මත ශාස්ත්‍රාලයීය පර්යාවලෝකය බැහැර කිරීම, දෛනික ජීවිතයේ වස්තු විෂය තෝරා ගැනීම මෙම කලා ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණවලින් කිහිපයකි.
  - දූරස්ථ නිරීක්ෂණය සහ ගෘහස්ථ ජීවිතය මෙම ව්‍යාපාරයේ ශිල්පීන්ගේ සුලභ මාතෘකා විය. එසේ ම ස්වාභාවිකත්වය ඒ අයුරින් ම හෝ වඩාත් ප්‍රශස්තකරණය කොට හෝ ඉදිරිපත් කිරීමෙන් උපස්ථිතිවාදීහු ඇත් වූහ.

- **ක්ලෝඩ් මොනේ (Claude Monet - 1840-1926)** -
  - ක්ලෝඩ් මොනේ උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයේ පුරෝගාමී ප්‍රංශ සිත්තරෙකි. මෙම ව්‍යාපාරයට එකී නම ලැබුණේ මොහු විසින් අඳින ලද 'හිරු උදාවː උපස්ථිතියක්' නමැති සිතුවම මඟිනි.
  - මොනේගේ මූලික ගවේෂණ ක්ෂේත්‍රය වූයේ ස්වාභාවික පරිසරය සහ ආලෝකය පරිසරයේ වස්තූන් සමඟ දක්වන අන්තර් සම්බන්ධතා වේ. මේ නිසා ඔහු එක ම අරමුණ විවිධ ආලෝක තත්ත්ව යටතේ පුන පුනා සිතුවමට නඟා ඇත.

(I) **හිරු උදාව: උපස්ථිතියක් (Sunrise;Impression)** -

- ක්ලෝඩ් මොනේ විසින් අඳින ලද උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයේ පුරෝගාමී සිතුවමකි.
- හිරු උදාවත් සමග පරිසරයේ ඇති වන වෙනස් වීම්, වේගවත් පින්සල් පහර සමූහයක් ඇසුරින් ග්‍රහණය කොට ගෙන තිබේ. නිල් පැහැය මිශ්‍ර මීදුමින් පිරුණු පරිසරයක් තුළ උදා වන හිරු රත් පැහැ ගෝලයක් මෙන් අවකාශයෙහි දෘශ්‍ය වේ.
- මෙම චිත්‍රයේ ප්‍රධාන නාභීය කේන්ද්‍රය සූර්යයා වේ. එහි ප්‍රතිබිම්බය ජල තලයක් මත පතිත වී තිබේ.
- චිත්‍රයේ පෙර බිමෙහි වේගවත් රේඛා කිහිපයකින් අඳින ලද බෝට්ටු කිහිපයකි. උපස්ථිතිවාදී සිත්තරුන්ගේ බොහෝ සිතුවම්වල දක්නට ලැබෙන **"නිමාවක් නැති ස්වභාවය"** (unfinished quailty) කලාත්මක භාවිතයක් ලෙස මෙම චිත්‍රයෙහි දක්ෂ ලෙස භාවිත කර ඇත.
- 1972 දී අඳින ලද මෙහි ශීත වර්ණ මාලාවකට එදිරි ව තබන ලද උෂ්ණ වර්ණ ඇසුරෙන් අදාළ පරිසරයේ භාවාත්මක හැඟීම අපූර්ව ලෙස ප්‍රතිනිර්මාණයට සිත්තරා සමත් ව ඇත.

(II) **වෝටර් ලිලී සහ ජපන් පාලම (Water Lilies and the Japanese Bridge)** -

- 1899 දී කැන්වසය මත තෙල් සායමින් නිර්මාණය කරන ලද සිතුවමකි. ස්වාභාවික පරිසරය සූර්යාලෝකයට දක්වන ප්‍රතිචාර සමූහයක් සියුම් නිරීක්ෂණයට ලක් කර කැන්වසය මත ප්‍රතිනිර්මාණය කර ඇත.
- කොළ පැහැය සහ එහි ප්‍රභේදිත වර්ණ මාලාවක් චිත්‍රයේ වඩාත් අවධාරණය වී පෙනෙයි.
- චිත්‍රය මධ්‍යයේ පාලම ද ඉහළ කොටසේ ගොඩ බිමේ ඇති ගස් හා සෙවනැලි ද පහළ කොටසේ ජලය සහ එහි පිපි නෙළුම් මල් ද දක්වා ඇත. මෙම රූපක එකිනෙකෙහි පවතින අන්තර් සම්බන්ධතාව වර්ණවලින් දක්වා ඇත.

(III) **රොවුන් දේවස්ථානය ; පූර්ණ හිරු එළිය (Rouen Cathedral; Full Sunlight)** -

- විවිධ ආලෝක තත්ත්වයන්ට එක ම වස්තුව දක්වන එකිනෙකට වෙනස් ප්‍රතිචාර සමූහය විෂය කරගත් චිත්‍රයකි.
- රොවුන් දේවස්ථානය ඇසුරින් චිත්‍ර මාලාවක් ඇඳ තිබෙන අතර මෙහි තෝරාගෙන ඇති චිත්‍රය 1894 දී ඇඳ තිබේ. ගොතික් සම්ප්‍රදායයට තනන ලද දැවැන්ත ආගමික ගොඩනැගිල්ලේ ද්වාරය ස්වාභාවික සූර්යාලෝකයට දක්වන ලද ප්‍රතිචාරය සිත්තරා මනා නිරීක්ෂණයෙන් ගොඩ නගා තිබේ.
- සෙවණැල්ලට වර්ණ ගණනාවක් ඇතැයි යන ප්‍රකට උපස්ථිතිවාදී මතවාදය තහවුරු කෙරෙන නිර්මාණයකි.
- තද හිරු රැස් මඟින් ගොඩනැගිල්ලේ අවධාරණ කෙරෙන කොටස් මෙන් ම එහි සෙවනණැලි මාලාවත් එම සෙවණැලිවල වර්ණයන්හි ඇති සූක්ෂ්ම වෙනස්කම් සමූහයත් තියුණු නිරීක්ෂණයකින් සිත්තරා ග්‍රහණය කොටගෙන වේගවත් පින්සල් පහරින් කැන්වසය මත ප්‍රතිනිර්මාණය කර ඇත.

**ඇගයීම** :

- උපස්ථිතිවාදය යන්න හඳුන්වා දී එම කලා ව්‍යාපාරය බිහි වීමට තුඩු දුන් පසුබිම සාකච්ඡා කරන්න.
- උපස්ථිතිවාදී කලාවේ පොදු ලක්ෂණ දැක්වෙන වගුවක් සකස් කරන්න.
- ක්ලෝඩ් මොනේගේ නිර්මාණය නම් කරන්න.
- තේමා හා ශිල්ප ක්‍රම පිළිබඳ අවධානය යොමු කරමින් ක්ලෝඩ් මොනේගේ සිතුවම් පිළිබඳ ඇගයීමක් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.5** : **යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.5.2** : **උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.**
- **එඩ්ගා ඩෙගා** (Edgar Degas)

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- එඩ්ගා ඩෙගාගේ නිර්මාණ නම් කරයි.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවෙන් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය වෙනස් වන ආකාරය එඩ්ගා ඩෙගාගේ නිර්මාණ ඇසුරෙන් විමර්ශනය කරයි.
- එඩ්ගා ඩෙගාගේ නිර්මාණ රසවින්දනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- එඩ්ගා ඩෙගා (**Edgar Degas** - 1834-1917) -
  - ඇඳීමෙහි මෙන් ම ඇඹීමෙහි ද සමත් ප්‍රංශ සිත්තරෙකි.
  - නර්තනය මුල් කර ගත් තේමා එඩ්ගා ඩෙගාගේ සිතුවම්වල සුවිශේෂ වස්තු විෂයකි. බැලේ නාට්‍යාංගනාවන් දැක්වෙන චිත්‍ර රැසක් ඩෙගා විසින් අඳිනු ලැබ ඇත. විශේෂයෙන් ම මොහු උපස්ථිතිවාදී කලාකරුවන් අතර චලනය සහිත අවස්ථා නිරූපණයේ දක්ෂයෙකි.
  - ඩෙගා විසින් කාන්තා ආලේඛ්‍ය රූ ගණනාවක් ද ඇඳ තිබෙන අතර මේවායින් බොහෝ විට නිරූපණය වන්නේ හුදෙකලා හා විවිධ මානසික ව්‍යාකුලතා පදනම් වූ භාව ප්‍රකාශන වේ.

(I) නැටුම් පන්තිය (**The Dance Class**) -
- බැලේ නාට්‍යාංගනාවන් ඩෙගාගේ තේමා අතර ඉතා ජනප්‍රිය වූවක් වන අතර මෙම චිත්‍රයේ දැක්වෙන්නේ බැලේ ආචාර්යවරයකු වටා සිටින යොවුන් නාට්‍යාංගනාවෝ කණ්ඩායමකි. ඔවුන් සිය ගුරුවරයා දෙසට හැරී සිටිය ද එකිනෙකා සිටිනුයේ පෞද්ගලික ක්‍රියාකාරකම් සමූහයක් කරමිනි.
- වේගවත් පින්සල් පහරවල් අවධාරණය වන ශෛලියකින් ඇඳ තිබේ.
- පර්යාවලෝකය ඇසුරෙන් පන්ති කාමරයේ ගැඹුර දක්වා තිබේ. ප්‍රංශ සැලෝනයේ සම්මත චිත්‍රවල වූ ආදර්ශ රූපවල පාලනය කළ ඉරියවු වෙනුවට නාට්‍යාංගනාවන්ගේ නිදහස් ඉරියවු සමූහයක් ග්‍රහණය කර ගෙන ඇත.
- ඩෙගා විසින් 1873-1876 අතර කාලයේ දී නිම කරන ලද නිර්මාණයක් සේ සැලකේ.

- සිතුවමෙහි ප්‍රධාන රූපයක් නැති අතර අවධානය සමස්ත කණ්ඩායමම අතර බෙදී යයි. දූරස්ථ නිරීක්ෂණය මඟින් චිත්‍රය ගොඩ නඟා තිබේ.

(II) **නාන බේසම (The Tub)** -

- මෙයට විෂය වී ඇත්තේ නාන බේසමක් තුළ හිඳගෙන සිටින ස්ත්‍රියකි. ඇය උක්කුටියෙන් හිඳගෙන සිටින අතර සිත්තරා ඇයට පිටු පා ඉහළ කෝණයක සිට පෙනෙන අයුරින් සිතුවමට නඟා ඇත.
- කාන්තාවගේ මුහුණ නොපෙනෙන හෙයින් ඇගේ පෞද්ගලිකත්වය නොහැඟවෙයි. එබැවින් චිත්‍රය තුළ අවධාරණයට ලක් වන්නේ කාන්තාවගේ ශරීරය සහ ඇගේ ශරීරය ආලෝකයට දක්වන ප්‍රතික්‍රියා සමූහය වේ.
- කාන්තා සිරුර උණුසුම් වර්ණ මාලාවක සුසංයෝගයක් ලෙස නිරූපණය කර ඇත. මානව ශරීරයේ උණුසුම් වර්ණ මාලාව චිත්‍රයේ නාභිගත කේන්ද්‍රය බවට එය පත් කර තිබේ.
- මෙහි සංරචනය තරමක් විප්ලවීය ස්වභාවයක් දරයි. නාන බේසම සහ නැමුණු කාන්තා ශරීරය කවාකාර ව්‍යුහයක් අවධාරණය කරන අතර, එයට එදිරි ව සරල රේඛීය ආනත ව්‍යුහයකින් පිහිටවූ මේසයක් දකුණු කෙළවරේ ඇත.

(III) **හිස පීරන ස්ත්‍රිය (Women Combing Her Hair)**-

- පැස්ටල් මාධ්‍යයෙන් කඩදාසි මත අඳින ලද සිතුවමකි. උපස්ථිතිවාදීන් අතුරින් එඩ්ගා ඩෙගා පැස්ටල් මාධ්‍යය බෙහෙවින් ස්වකීය සිතුවම් සඳහා භාවිත කළ සිත්තරෙකි.
- හිස පීරමින් සිටින නග්න කාන්තාවක පිටු පස සිට නිරීක්ෂණය කරමින් සිත්තරා කැන්වසය මත කාන්තා රුව ප්‍රතිනිර්මාණය කර ඇත. මුහුණ නොපෙනෙන හෙයින් ඇගේ පෞද්ගලික අනන්‍යතාව සැඟවී, ඇය කරමින් සිටින ක්‍රියාව සහ ඉරියවුව අවධාරණයට පත් වී ඇත.
- ඩෙගාගේ වේගවත් සහ නිදහස් පින්තාරු ශෛලිය මෙහි ද දැකිය හැකි ය.
- ශරීරයේ ආකෘතිය සහ එහි විවිධ කොටස් ආලෝකයට දක්වෙන ප්‍රතික්‍රියා සැලකිල්ලෙන් නිරීක්ෂණය කර අඳින ලද්දකි.

**ඇගයීම** :

- එඩ්ගා ඩෙගා විසින් නිර්මාණය කරන ලද දෘශ්‍ය නිර්මාණ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.
- එඩ්ගා ඩෙගාගේ සිතුවම් පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවෙන් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය වෙනස් වන ආකාරය එඩ්ගා ඩෙගාගේ නිර්මාණ ඇසුරෙන් විමර්ශනය කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.5** : යුරෝපීය උපසරීතිවාදී සහ පශ්චාත් උපස්රීතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 6.5.3** : උපස්රීතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු - මේරි කසාට් (Mary Cassat)

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- මේරි කසාට්ගේ නිර්මාණ නම් කරයි.
- චිත්‍රයේ වස්තුවිෂය හා ශිල්පක්‍රම සම්බන්ධයෙන් මේරි කසාට් උපස්රීතිවාදී කලාවට සැපයූ දායකත්වය සාකච්ඡා කරයි.
- මේරි කසාට්ගේ නිර්මාණ රසවින්දනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **මේරි කසාට් (Mary Cassat - 1844-1926)** -
  - උපස්රීතිවාදී කලා ව්‍යාපාරයේ සිටි කාන්තා චිත්‍ර ශිල්පිනියකි.
  - චිත්‍ර සහ මුද්‍රණ ශිල්පිනියක වූ මේරි කසාට් උපතින් ඇමරිකානු ජාතිකයෙකි.
  - වර්ෂ 1844 උපත ලබන ඇය 1877 සිට 1886 දශකවල උපස්රීතිවාදී කලා ප්‍රවණතාව තුළ සක්‍රීය ව සිටි ස්ත්‍රීවාදී ශිල්පිනියකි.
  - ඇය චිත්‍ර ශිල්පී එඩ්ගා ඩෙගාගේ මිතුරියක වූ අතර ඩෙගාගේ නිර්මාණවලින් අභාසය ලදැයි සැලකේ.
  - මේරි කසාට්ගේ ප්‍රධාන චිත්‍ර මාතෘකා වූයේ මාතෘත්වය සහ ධනවත් ප්‍රභූ පාන්තික පරිසරයන්හි හැසිරෙන ළමුන්, කාන්තාවන් සහ මෙහෙකරුවන් ය.
  - වර්ණ පදාස භාවිතය, හිතුවක්කාරී ලෙස හැඩ ගැලපීම, චිත්‍රයට පාදකවන වස්තු අතර පැහැදිලි වෙනස අපැහැදිලි කිරීම සහ පසමිතුරු වර්ණවල එකගත්වයක් ගොඩ නැඟීම, මේරි කසාට්ගේ චිත්‍ර කලා භාවිතය තුළ දැකිය හැකි ලක්ෂණ කිහිපයක් වේ.

(I) **නිල් කාමරය (The Blue Room)** -
- මේරි කසාට් විසින් අඳින ලද ඉතාමත් ආන්දෝලනාත්මක සහ පෙරටුගාමී චිත්‍රයකි.
- කුඩා ගැහැනු ළමයයෙක් නිල් පුටුවක් මත හිඳගෙන සිටියි. චිත්‍රයේ තල ගැලපීම අනුව, සිතුවමේ ප්‍රධාන චරිතය වන ළමයා වෙතින් අවධානය උදුරා ගන්නා අතර එය දාර කැපී යන සේ ඇඳ ඇති ආසන සහිත පසුබිම් අවකාශය වෙත රැගෙන යයි.

- සුවිශේෂී නොවන සිද්ධියක් සුවිශේෂී ව දැක්වීම මෙම චිත්‍රයේ ඇති තවත් විශේෂත්වයකි.
- චිත්‍රයේ මධ්‍යගත ව ප්‍රධාන රූපයක් නොමැති බැවින් චිත්‍රයේ සමස්ත සංරචනය ම ප්‍රධාන කර ඇත.
- එකිනෙකට වෙනස් වර්ණමාලාවල සුසංයෝගයක් මෙම සිතුවමේ දැක ගත හැකි ය.

(II) **හිසකෙස් සකසන ගැහැනු ළමයා (Girl Arranging Her Hair)** -

- චිත්‍රයේ වස්තු විෂය ලෙස පුද්ගලික සිද්ධියක් නිරූපණය කර ඇත.
- රාත්‍රී ඇඳුමින් සැරසුණු ගැහැනු ළමයකු හිස සකසන ආකාරය සිතුවමෙන් දැක්වේ.
- එකිනෙකට වෙනස් නුමුහුන් වර්ණ භාවිත කර ඇත.
- සිතුවමේ වර්ණ ගලපා ඇති ආකාරය හා තේමාව අනුව එඩ්ගා ඩෙගාගේ ආභාසය හඳුනා ගත හැකි ය.
- සම්භාව්‍ය සංරචන ක්‍රමවේදවලින් බැහැර ව නිර්මාණය කරන ලද මෙම සිතුවමේ ප්‍රධාන රූපය වන ගැහැනු ළමයා සමීප රූපයක් ලෙස සමස්ත සිතුවම පිරීයන සේ නිරූපණය කර ඇත.
- සිතුවමේ පසුබිම අත්‍යාවශ්‍ය අංගයක් සේ නිරූපණය කර නැත.

(III) **ස්නානය (The Bath)** -

- මෙම චිත්‍රයෙන් මේරි කසාට්ගේ ඉතා ජනප්‍රිය තේමාවක් වන මාතෘත්වය ඉදිරිපත් කර ඇත.
- මවක් විසින් ස්නානය කරවන කුඩා දරුවකු දක්වන මෙම චිත්‍රයෙන් ප්‍රකාශ වන්නේ දරුවාගේ සොම්නස් සහගත ස්වභාවයත්, මාතෘ සෙනෙහසත් ය.
- ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාවේ වූ ලක්ෂණ දැක ගත හැකි ය. එනම්, මධ්‍යගත සංරචනය හා සමස්ත චිත්‍රයෙන් හරි අඩක් පමණ ප්‍රධාන රූපක ඇඳීම සඳහා භාවිත කිරීම යි.
- පසුබිම් අවකාශය නිරූපණයට අඩු ඉඩක් වෙන් කර අදාළ සිද්ධියට පුමුඛ තැනක් ලබා දෙමින් චිත්‍රය සම්පිණ්ඩනය කර ඇත.
- බොහෝ උපස්ථිතිවාදී චිත්‍ර මෙන් මෙම චිත්‍රයෙන් එළිමහන් දර්ශනයක් නිරූපණය නොවේ. ගෘහ අභ්‍යන්තරයේ පුද්ගලික සිදුවීමත් ඉදිරිපත් කරයි.

**ඇගයීම** :

- මේරි කසාට්ගේ සිතුවම් නම් කරන්න.
- මේරි කසාට් වස්තුවිෂය හා ශිල්පක්‍රම සම්බන්ධයෙන් උපස්ථිතිවාදී කලාවට සැපයූ දායකත්වය සාකච්ඡා කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.5** : **යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.5.4** : **පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.**
- වින්සන්ට් වැන්ගෝ (Vincent Van Gogh)

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- පශ්චාත් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය බිහි වීමට පදනම් වූ පසු බිම විස්තර කරයි.
- වින්සන්ට් වැන්ගෝගේ නිර්මාණ නම් කරයි.
- වින්සන්ට් වැන්ගෝගේ සිතුවම්වල වස්තු විෂය, ශිල්ප ක්‍රම හා ශෛලිය විස්තර කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **පශ්චාත් උපස්ථිතිවාදය (Post-Impressionism)** -
  - කාලයත් සමග උපස්ථිතිවාදී තේමා හා ශිල්ප ක්‍රම ඒකාකාරීත්වයට පත් වෙමින් තිබූ අතර එයට එදිරි ප්‍රතික්‍රියාවක් ලෙස පශ්චාත්-උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය බිහි විය.
  - උපස්ථිතිවාදයේ තිබූ සීමා අතික්‍රමණය කිරීමේ අරමුණෙන් පැන නැඟුණු ව්‍යාපාරයක් ලෙස පශ්චාත් උපස්ථිතිවාදය සැලකිය හැකි ය.
  - වර්ණ (Colour), ආකෘතිය (Form), රටාව (Pattern) සහ රේඛා (Line) යන අංශවල නව අත්හදා බැලීම් හා ගැඹුරු භාව ප්‍රකාශන සහිත වස්තු විෂය ගවේෂණයට මෙම ව්‍යාපාරයට සම්බන්ධ සිත්තරු යොමු වූහ.
  - නූතනවාදී කලාකරුවන්ගේ ආරම්භය සටහන් කළ කලා ව්‍යාපාරය ලෙස මෙය හඳුනාගත හැකි ය.
  - යම් කිසි දෘශ්‍ය අරමුණක සැබෑ ස්වරූපය විකෘත කිරීමෙන් එහි ප්‍රකාශනය තීව්‍ර කිරීම පශ්චාත් උපස්ථිතිවාදී කලාවේ වැදගත් ලක්ෂණයකි.

- **වින්සන්ට් වැන්ගෝ (Vincent Van Gogh** - 1853-1890) -
  - ඕලන්ද ප්‍රභවයක් සහිත පශ්චාත් උපස්ථිතිවාදී සිත්තරෙකි.
  - ස්ව-ආලේඛ්‍ය, ආලේඛ්‍ය, භූ දර්ශන, නිසල ද්‍රව්‍ය සම්පිණ්ඩන, කෙත්වතු, සයිප්‍රස් ගස්, මල් ආදිය වැන්ගෝගේ තේමා අතර ප්‍රමුඛ ය.

- මොහුගේ නිර්මාණ භාෂාව ගොඩනැගී ඇත්තේ වස්තූන්ගේ ප්‍රකෘති ස්වරූපයෙන් නො ව ශිල්පියාගේ භාවාත්මක ආවේගයන්ගෙන් පැන නැගුණු අඛණ්ඩ චලිත මාලාවකිනි.
- විචිත්‍ර වර්ණ මාලාව, ප්‍රබල-රළු බුරුසු පහරවල්, ආවේගාත්මක වස්තු විෂය මොහුගේ සිතුවම්වල පොදු ලක්ෂණ වේ.

(I) අර්තාපල් බුදින්නෝ (**The Potato Eaters**) -

- අඳුරු වර්ණ මාලාවකින් ගොඩනගන ලද ගොවි ජීවිතයේ දුක්ඛිත භාවය පිළිබඳ නිරූපණය කෙරෙන චිත්‍රයකි.
- කාර්මිකකරණයේ ප්‍රතිඵලයක් ලෙස දැඩි දුෂ්කර ජීවිතයක් ගත කළ ගොවි පවුලක් විෂය කරගෙන ඇත.
- ඔවුන්ගේ රාත්‍රී ආහාරය ලෙස අර්තාපල් අල ආහාරයට ගන්නා අතර පසු බිම අන්ධකාරයෙන් පිරී තිබේ. ඉහළින් එල්ලා ඇති පහනින් නික්මෙන්නේ කනාමැඳිරි එළියකි. මෙම අන්ධකාර පරිසරය ඔවුන්ගේ දුක්ඛිත භාවය පිළිබඳ සංකේතයකි.
- අඳුරු අවතාර රැසක් මෙන් පවුලේ සාමාජිකයන් කෑම මේසය වටා රැස් ව සිටියි. ඔවුන්ගේ විරූපී වූ මුහුණු දිගු කලක් ජීවන අරගලයේ යෙදීමෙන් ශේෂ වූ සංඥා මාත්‍රා බඳු ය.
- මානව ජීවිතය දෙස සානුකම්පිත දෘෂ්ටියකින් බලා නිර්මාණය කරන ලද සිතුවමකි.

(II) තරු පිරි රැය (**The Starry Night**) -

- නාටකීය රිද්මයකින් චලනය වන රාත්‍රී අහසක් සහ පරිසරයක් සහිත චිත්‍රයකි. සඳ, තරු, වලාකුළු සහිත සමස්ත ආකාශය සුළියක් මෙන් කැරකැවෙයි. 'නිල්' සහ 'කහ' යන එකිනෙකට ප්‍රතිවිරුද්ධ වර්ණ මූලික කොටගෙන අහස ගොඩනගා ඇත.
- වැන්ගෝගේ චිත්‍රවල සුලභ වේගවත්, කෙටි පින්සල් පහරවල් මෙම චිත්‍රය පුරා ම දැකිය හැකි ය. මෙය සත්‍ය වශයෙන් ම පැවති ප්‍රකෘති පරිසරය නොව, සිත්තරාගේ භාවමය ආවේගයන්ට අනුරූප ව කැන්වසය මත සටහන් වූ වින්සන්ට් වැන්ගෝගේ පෞද්ගලික අත්දැකීමකි.
- 1889 දී අඳින ලදි. චිත්‍රයේ විශාල කොටසක් අහස වෙනුවෙන් වෙන් වී තිබෙන අතර ඈතින් නිඳි ගත් නගරයක දර්ශනයකි.

(III) පුටුව (**Vincent's Chair**)-

- ශාස්ත්‍රාලයීය කලාවේ පැවැති සම්ප්‍රදායික නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩයෙන් මිදී දෛනික ලෝකයේ වස්තු විෂයක් කැන්වස මත චිත්‍රණය කර ඇත.
- සාමාන්‍ය ජීවිතයේ හමු වන නොවැදගත් පුටුවක් වැන්ගෝ සුවිශේෂ වස්තුවක් බවට පත් කර ඇත. කහ පැහැය මූලික කර ගත් වර්ණමාලාවෙන් යුතු පුටුව මත ලේන්සුවක් හා දුම් පයිප්පයකි. හුදෙක් පුටුව පිළිබඳ පමණක් නො ව පුටුව පරිහරණය කරන්නා පිළිබඳ ව ද ඇඟවුමක් එයින් සැපයේ.
- පුටුව තබා ඇත්තේ සුව පහසු විසිත්ත කාමරයක නොව ග්‍රාමීය - රළු අවකාශයක ය. වැන්ගෝ විසින් පසුබිම් අවකාශයේ පර්යාවලෝකය අතිශයෝක්තිමය ස්වරූපයකින් නිරූපණය කරනු ලැබ ඇත.

ඇගයීම :

- පශ්චාත් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයේ ශිල්පීන්ගේ අත්හදා බැලීම් හා අවධානය යොමු කළ දිශානති මොනවා ද?
- වින්සන් වැන්ගෝගේ නිර්මාණ නම් කරන්න.
- වින්සන් වැන්ගෝගේ නිර්මාණ පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.5** : **යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.5.5** : **පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.**
- **පෝල් ගොගැන්** (Paul Gauguin)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- පෝල් ගොගැන්ගේ නිර්මාණ නම් කරන්න.
- පෝල් ගොගැන්ගේ නිර්මාණවල සංකේත භාවය සහ වියුක්තකරණය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- පෝල් ගොගැන්ගේ නිර්මාණ රස වින්දනය කරයි. අගයයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **පෝල් ගොගැන් (Paul Gauguin** - 1848-1903) -
  - යුරෝපීය ශාස්ත්‍රාලයීය කලාවේ මූලයන් බැහැර කර ප්‍රාකෘතික කලා (primitive art), ජනකලා (folk art) සහ මධ්‍යකාලීන වර්ණ ගැන් වූ වීදුරු සිතුවම් ආදි මූලාශ්‍රය ඇසුරෙන් ස්වකීය දෘශ්‍ය භාෂාව ගොඩනඟා ගත් ප්‍රංශ සිත්තරෙකි.
  - ගොගැන් යුරෝපීය නාගරික ශිෂ්ටාචාරය අතහැර තහිටි දූපත් කරා යාමෙන් පසු කරන ලද නිර්මාණ මාලාව ඔහුගේ සිතුවම් අතර බෙහෙවින් වැදගත් ය. එසේ ම ගොගැන් සංකේතවාදී ව්‍යාපාරයකට (Symbolist movement) ද පදනම සැපයූ සිත්තරෙක් ද වේ.
  - ගොගැන් තම නිර්මාණ සඳහා පිරිසිදු හා පැතලි වර්ණ භාවිත කරන ලදි. ඔහුගේ මෙම වර්ණමය අත්හදා බැලීම් අනාගත සිත්තරුන්ගේ නිර්මාණ සඳහා ප්‍රබල බලපෑමක් ඇති කරන ලදි.

(I) **කහ පැහැති ක්‍රිස්තුන් වහන්සේ (The Yellow Christ)** -
- බෙහෙවින් සංකේතාත්මක අදහසක් දනවන චිත්‍රයකි. මෙහි කේන්ද්‍රීය රූපය වී ඇත්තේ කුරුසයේ ඇණ ගසා ඇති ජේසු තුමා දැක්වෙන කහ පැහැති රුව යි. එය ග්‍රාමීය ජන කලාවන්හි සංරචන ව්‍යුහවලට සමානකම් දක්වයි.
- ප්‍රතිමාව පාමුල යාච්ඤාවේ යෙදී සිටින කාන්තා රූප සමූහයකි. ජේසු තුමාගේ රුවත්, සමස්ත පරිසරයත් කහ පැහැයෙන් සරසා තිබේ. ශාස්ත්‍රාලයීය කලාවේ ත්‍රිමාණ ලක්ෂණ බැහැර කර පැතලි වර්ණාලේප ක්‍රමයක් භාවිතයට ගෙන ඇත.
- තද කළු බාහිර රේඛාවකින් රූපවල ව්‍යුහයන් ඉස්මතු කර දැක්වීම මෙහි තවත් විශේෂ ලක්ෂණයකි.
- ප්‍රකෘති ලෝකයේ දෘශ්‍ය අරමුණු වියුක්තකරණ කොට කැන්වසය මත පිහිටුවා තිබේ.

(II) දෙවියන්ගේ දිනය (**The Day of the God**)-

- ගොගැන් විසින් තහිටියානු වස්තු විෂයයක් මුල් කර ගෙන 1894 දී අඳින ලද සිතුවමකි. කැන්වසය මත තෙල් සායමින් ඇඳ තිබේ.
- බෙහෙවින් ම කලාත්මක ස්වරූපයක් දරන මෙම සිතුවම කාන්තා රූප මූලික ව ගොඩ නඟා ඇත. චිත්‍රය මධ්‍යයේ කාන්තා රූප තුනක් තිබෙන අතර එයින් මැද සිටින තැනැත්තිය ස්නානය පිණිස සැරසෙයි. ඇයට දෙපසින් පොළොවේ වැතිර සිටින අයුරින් සෙසු කාන්තාවෝ නිරූපණය කර ඇත.
- මෙම කාන්තා රූපවල ඉරියවු අනුව ඔවුන් 'උපත', 'ජීවිතය' සහ 'මරණය' නියෝජනය කරන බව පෙනේ. ඔවුන් තිදෙනා ම සිටින්නේ රෝස පැහැති වැලි තලාවක ය. ඉදිරිපස ඇති සෙවණැලි සහිත ජලය ව්‍යුක්ත රූපී හැඩතලවලින් ගොඩ නඟා ඇත.
- කාන්තා රූපවලට පිටු පසින් කාල වර්ණ දෙවඟනකගේ මූර්තියකි. එයට පසෙකින් තහිටියානු නැටුමක යෙදෙන කාන්තා රූප දෙකකි.
- චිත්‍රයේ පසු බිමෙහි ඇත්තේ මුහුදු වෙරළක දර්ශනයකි.
- බෙහෙවින් දීප්තිමත් වර්ණ මාලාවකින් චිත්‍රය ගොඩ නඟා තිබේ.
- ප්‍රකාශනවාදී ලක්ෂණ, වියුක්තකරණය, ෆැන්ටසිමය ස්වභාවය මෙන් ම අධිතාත්විකවාදී ලක්ෂණ ද සම්මිශ්‍රිත නිර්මාණයකි.

(III) අප එන්නේ කොහි සිට ද? අප කවුරු ද? අප යන්නේ කොහාට ද?
(**Where do we come from? What are we? Where are we going?**) -

- දාර්ශනික මෙන් ම සංකේතාත්මක අර්ථයක් ද දනවන සිතුවමක් වන මෙය ගොගැන් තහිටි දූපත්වල ගත කළ කාල පරිච්ඡේදයේ දී හමු වූ දෘශ්‍ය අරමුණුවලින් ගොඩ නැගුවකි.
- ගොගැන් දක්වන පරිදි මෙම චිත්‍රය දකුණේ සිට වමට කියවිය යුත්තකි. උපත, මරණය හා ඒ දෙකට ඔබ්බෙහි පැවැත්ම පිළිබඳ කතිකාවක් සිතුවමෙන් කියවේ. දිගින් අඟල් 148ක් සහ උසින් අඟල් 55ක ප්‍රමාණයෙන් යුක්ත ය.
- චිත්‍රය තුළ කණ්ඩායම් වශයෙන් ගොනු කළ රූප සමූහයක් තිබෙන අතර ඒවා තහිටි වාසීන්ගේ දේහ විලාසයන්ගෙන් ගොඩනඟා ඇත.
- උපත පිළිබඳ ඇඟවෙන දකුණු කෙළවරේ බිළිඳකු සමඟ සිටින ස්ත්‍රී රූප තුනකි. වම් කෙළවර එහි ප්‍රතිපක්ෂය වූ  මරණයට ආසන්න වූ ස්ත්‍රියකි.
- චිත්‍රයේ මධ්‍යය  තරුණ  විය  හා මැදි විය සම්බන්ධ සිදුවීම් මාලාවකි.
- පැතලි  වර්ණලේපය හා රේඛාව කේන්ද්‍රීය  ගොඩනැගීම මෙහි දී  ද දැකිය  හැකි ය.
- නීලවර්ණ දේව රූපය පැවැත්මෙන් ඔබ්බෙහි පවතින තත්ත්වය පිළිබඳ සංකේතාත්මක ඇඟවුමක් මෙන් ම ප්‍රශ්න කිරීමක් ද වේ.

ඇගයීම :

- පෝල් ගොගැන්ගේ නිර්මාණ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.
- පෝල් ගොගැන්ගේ නිර්මාණ සඳහා බල පෑ මූලාශ්‍රය පිළිබඳ අවධානය යොමු කරමින් ඇගයීමට ලක් කරන්න.
- පෝල් ගොගැන්ගේ නිර්මාණවල සංකේත භාවය සහ වියුක්තකරණය පිළිබඳ සාකච්ඡා කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 6.0** | : | **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 6.5** | : | **යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.** |
| **ක්‍රියාකාරකම 6.5.6** | : | **පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.**<br>- පෝල් සෙසාන් (Paul Cezanne) |
| **කාලච්ඡේද** | : | 02 යි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර |
| **ඉගෙනුම් පල** | : | • පොල් සෙසාන් පශ්චාත් - උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය කෙරෙහි දැක් වූ දායකත්වය විස්තර කරයි.<br>• පොල් සෙසාන්ගේ කලා නිර්මාණ විචාරාත්මක ව රසවිඳියි. |
| **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** | : | සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න. |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **පෝල් සෙසාන්** (**Paul Cezanne** - 1839-1906) -
  - පශ්චාත් උපස්ථිතිවාදී සිත්තරකු වන සෙසාන් 20 වන සියවසේ නූතනවාදී ප්‍රවණතා රැසකට පදනම සැපයූ සිත්තරෙකි.
  - චිත්‍ර කලාවේ සෙසාන් කළ වෙනස්කම් ශාස්ත්‍රාලයීය රීතිවලින් සිතුවම මුදවා ගැනීමට පමණක් නොව, නව ප්‍රවණතා රැසක් පැන නැඟීමට ද ප්‍රබල ව දායක විය. මේ නිසා පිකාසෝ මෙන් ම මතිස් ද ''අප සියල්ලන්ගේ ම පිතෘවරයා සෙසාන් '' යැයි ප්‍රකාශ කළේ ය.
  - ස්වාභාවික ලෝකය ඒ අයුරින් ම පිටපත් කිරීම බැහැර කර එය විවිධ භාවමය ආවේශයන්ට අනුව විකෘත කිරීම්, වෙනස් කිරීම්, අතිශයෝක්තියට නැගීම්, මායිම් බොඳ කිරීම් සහ ජ්‍යාමිතික රූපී ව්‍යුහයන් අවධාරණය කිරීම් සහිත ව ඇඳ තිබේ.

(I) **කාඩ් සෙල්ලම් කරන්නෝ (The Card Players)** -

- එකිනෙකාට මුහුණ ලා කාඩ් සෙල්ලම් කරන පුරුෂයෝ දෙදෙනෙකු චිත්‍රයෙන් නිරූපිත ය. දෙදෙනා ම මහත් අවධානයෙන් යුතු ව ක්‍රීඩාවේ නිමග්න ව සිටින අතර එක් අයකුගේ මුවෙහි පයිප්පයකි.
- චිත්‍රයේ පසු බිම පැතලි ස්වරූපය අවධාරණය වන වර්ණ පදාස සමූහයක් බවට පත් කර ඇත. සෙසාන් විසින් භාවිත කළ ප්‍රකට උපක්‍රමයක් වූ පින්සල් පහරවල් අවධාරණය වන පරිදි කළ වර්ණාලේපය මෙහි ද දැකිය හැකි ය.
- චිත්‍රයේ ඇතැම් කොටස් නාභිගත වූ අයුරින් ද තවත් කොටස් නාභිගත නොවූ ආකාරයෙන් ද එකිනෙක හා අමුණා තිබේ. එහෙත් එයින් චිත්‍රයේ සමබරතාව බිඳී නැත.
- උණුසුම් හා අඳුරු වර්ණ එකිනෙක හා ගැටෙන පරිදි ආසන්න ව යොදා තිබේ. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී පර්යාවලෝකය බිඳිමින් අඳින ලද චිත්‍රයකි.

(II) **ඇපල් වට්ටිය (The Basket of Apple)** -

- සෙසාන් විසින් අඳින ලද ඇපල් බඳුන් සහිත චිත්‍ර රැසක් ඇති අතර, මෙහි තෝරා ගෙන ඇති සිතුවම 1895 දී අඳින ලද්දකි.
- ඇලවුණු කූඩයක්, බෝතලයක් හා රෙදි කඩක් මත විසිරී ගිය ඇපල් මෙහි මූලික දෘශ්‍ය අරමුණු වේ.
- වස්තූන්ගේ පැතලි හා ජ්‍යාමිතික හැඩ සහ තල අවධාරණය වන පරිදි පින්සල් පහරවල් පෙනෙන සේ වර්ණ ගන්වා ඇත. රෙදි කැබැල්ල පවා ඇඳ ඇත්තේ එහි කෝණික නැවුම් ඉස්මතු වී පෙනෙන පරිදි ය.
- මෙම චිත්‍රයේ පර්යාවලෝකය සුවිශේෂ වන අතර එහි ඇතැම් කොටස් හිතා මතා ම ආනත කරමින් දෘශ්‍ය අරමුණු එකිනෙක පුරුද්දා තිබේ. මේසයේ දාරය ඇත්තේ මට්ටම් දෙකකිනි. මෙයට හේතුව සෙසාන් එක් ඇසකින් වස්තුව නිරීක්ෂණ කර තැනෙන පර්යාවලෝක නොව ඇස් දෙකෙන් ම වස්තු නිරීක්ෂණයේ දී ගෝචර වන ද්විගුණ - දෘෂ්ටියට අනුව පර්යාවලෝකය ගොඩ නැගීම යි.
- චිත්‍රය ස්වාභාවිකවාදී තර්කවලින් මුදවා ගැනීමට දායකත්වය සැපයූ නිර්මාණයකි.

(III) **ඉරිතැළුණු බිත්ති සහිත නිවස (The House with the Cracked Walls)** -

- කඳු බැවුමක පිහිටි හුදෙකලා, පාළු නිවසක් විෂය කර ගෙන අඳින ලද චිත්‍රයකි. පරිස්සමින් හා නිශ්චිත අරමුණක් සහිත ව තැබූ කෙටි බුරුසු පහරවල් සමූහයකින් සිත්තම ගොඩනැගී ඇත.
- නිවස පැති පෙනුමෙන් ග්‍රහණය කොටගෙන තිබෙන අතර එහි බිත්තිවල විශාල දෙදරුමක් ඇත. ශීත වර්ණ හා උෂ්ණ වර්ණ එකිනෙකා හා ගැටෙන පරිදි යෙදීම මෙහි ද දැකිය හැකි ය.
- වහලයේ රත් පැහැ දාර චිත්‍රයේ ඇස ඇද ගන්නා වඩාත් ප්‍රබල සීමාවක් වන අතර ත්‍රිමාණාත්වය අතහැර ද්විමානී ස්වරූපයෙන් අරමුණු ග්‍රහණය කරගෙන තිබේ.
- රූපවල ආකෘතිය සහ වර්ණ කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා ඇඳ තිබේ.

**ඇගයීම** :

- පෝල් සෙසාන් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයෙහි ඇති කළ නව පරිවර්තන මොනවා දැයි ලයිස්තුවක් සකසන්න.
- පෝල් සෙසාන්ගේ සිතුවම් පිළිබඳ ඇගයීමක් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.6** : **යුරෝපීය ඝනිකවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.6.1** : **ඝනිකවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.**
- **පැබ්ලෝ පිකාසෝ** (Pablo Picasso)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ඝනිකවාදි කලාවේ ලක්‍ෂණ විස්තර කරයි.
- ඝනිකවාදී කලාකරුවන් නම් කරයි.
- පැබ්ලෝ පිකාසෝගේ නිර්මාණ නම් කරයි.
- පැබ්ලෝ පිකාසෝගේ නිර්මාණ විචාරාත්මක ව රසවින්දනය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්‍ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **ඝනිකවාදය (Cubism)** -
  - 20 වන සියවස මුල දී බිහි වූ පෙරටුගාමී කලා ව්‍යාපාරයකි. 'ආකෘතිය' (form) සම්බන්ධයෙන් සෙසාන් කරන ලද අත්හදා බැලීම් මේ සඳහා බලපා තිබේ. බ්‍රාක් සහ පැබ්ලෝ පිකාසෝ මෙම කලාව්‍යාපාරය දියුණු කිරීමට පුරෝගාමී වූ කලාකරුවෝ වෙති.
  - ප්‍රකෘති ලෝකයේ ඇති වස්තු ඝනික හැඩ (Cubes) කේන්ද්‍රීය ව බිඳහෙළීමට මෙමඟින් වැඩි අවධානයක් සැපයිණි.
  - ඝනිකවාදයේ දී වස්තුවක් එක් කෝණයකින් නොව බහුවිධ මානයන්ගෙන් නිරීක්‍ෂණය කොට කැන්වසය මත ජ්‍යාමිතික ව්‍යූහ අවධාරණය කොට ප්‍රතිනිර්මාණය කෙරිණි. මේ නිසා බොහෝ චිත්‍ර ආකෘතිකමය වශයෙන් සංකීර්ණ ස්වරූපයක් පළ කරයි.
  - ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාත්මක රීතීන්ගෙන් වෙනස් වූවකි.
  - දෘශ්‍ය අරමුණුවල ස්වභාවය ඒ අයුරින් ම අනුකරණය කිරීම වෙනුවට ජ්‍යාමිතික රූපී විරූපණය (deform) මඟින් ප්‍රකාශනය ප්‍රබලත්වයට පත් කිරීම මෙම ව්‍යාපාරයේ වැදගත් ලක්ෂණයකි.

- **පැබ්ලෝ පිකාසෝ (Pablo Picasso -** 1881-1973) -
  - සිත්තරකු මෙන් ම මූර්ති, මුද්‍රණකලා, සෙරමික්, වේදිකා සැලසුම් ආදි ක්ෂේත්‍ර රැසක දස්කම් පෑ කලාකරුවෙකි. ස්පාඤ්ඤයේ උපත ලබා පසු කාලයේ දී ප්‍රංශයේ වාසයට පැමිණ ඇත. 20 වන සියවසේ දෘශ්‍ය කලාවට වැඩි ම බලපෑමක් කළ සිත්තරුන් අතරින් අයෙකි.
  - පිකාසෝගේ කලා ජීවිතය නිල් යුගය, රෝස යුගය, අප්‍රිකානු බලපෑම සහිත යුගය, විශ්ලේෂණාත්මක ඝනිකවාදී (Analytic Cubism) යුගය, සංස්ලේෂණාත්මක ඝනිකවාදී (Synthesis Cubism) යුගය ආදි වශයෙන් අවධි සමූහයකින් යුක්ත ය.

(I) අවිග්නොන්හි යුවතියෝ (**The Maids of Avignon /Les Demoiselles d' Avignon**) -

- 1907 දී පිකාසෝ විසින් අඳින ලද මෙම සිතුවම ඉතා වැදගත් කලා කෘතියකි.
- නග්න ස්ත්‍රීන් පස් දෙනෙකු දැක්වෙන සංරචනයකි. ශාස්ත්‍රාලයීය කලාවේ ස්ත්‍රී ලාලිත්‍යයට ඒදිරි ව මෙම සිතුවමේ කාන්තා රූප ජ්‍යාමිතික හැඩවලට බිඳ නිරූපණය කර තිබේ.
- අවිග්නොන් වීදියේ වීදි කාන්තාවන් පිරිසක් විෂය වූ මෙහි බාහිර සුන්දරත්වයට වඩා අභ්‍යන්තර බේදාන්ත අවධාරණය කිරීම අරමුණු කොට ඇත.
- ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලාවේ පර්යාවලෝකය හා ත්‍රිමාණ ලක්ෂණ බැහැර කර විෂයානුබද්ධ ව නිරූපිත පර්යාවලෝක හා ත්‍රිමාණ ලක්ෂණ දක්වා ඇත.
- ස්ත්‍රී ඉරියවු සහ භාවමය ස්වරූප මෙම නිර්මාණයේ වැදගත් ලක්ෂණ අතර වේ.
- අප්‍රිකානු වෙස් මුහුණුවල දක්වෙන ගැඹුරු කැපීම් සහිත ලක්ෂණ ස්ත්‍රීන්ගේ මුහුණුවලින් දක්වෙන මානසික ප්‍රතිවිරෝධී තත්ත්ව නිරූපණයට භාවිත කර ඇත.

(II) ගුවර්නිකා (**Guernica**)-

- උතුරු ස්පාඤ්ඤයේ බාස්ක්හි ගුවර්නිකා නගරයේ බෝම්බ දැමීම පසුබිම් කරගත් චිත්‍රයකි. යුද්ධයේ කෲරත්වයට එරෙහි දෘශ්‍ය නිර්මාණයක් ලෙස පිළිගැනේ.
- උස අඩි 11ක් වන අතර දිග අඩි 25 1/2කි. ඒක වර්ණ ස්වරූපයක් පළ කරයි. කළු, සුදු, අළු පැහැ කේන්ද්‍රීය ව චිත්‍රය ගොඩනඟා තිබේ.
- මෙම සංරචනය තුළ මළ දරුවකුගේ ශරීරය දරාගෙන වැලපෙන ස්ත්‍රියක්, ගව රූපයක්, අශ්ව රූපයක්, වැටුණු සොල්දාදුවකුගේ පිළිරුවක්, පහනක් අතින් ගත් රුවක්, දුවන රුවක්, සහ පහළට වැටෙන රුවක් ආදිය හඳුනා ගත හැකි ය.
- අශ්ව රූපය කේන්ද්‍රීය ව වියුක්ත රූපී හිස් කබලක හැඩයක් ඇත. සොල්දාදුවාගේ එක් අතක කැඩුණු කඩුවක් ඇති අතර අනෙක් අතෙහි මලක් ලියලමින් තිබේ.
- චිත්‍රයේ ඉහළ කොටසේ තාක්ෂණික දියුණුව විසින් ඇති කරන ලද විනාශකාරී බලය අඟවන වියරු ඇසක් තුළ දැල්වෙන බල්බයකි.
- ජනේලයකින් හිස පොවා ආලෝකවත් පහනක් සහිත ව සිටින ස්ත්‍රී රූපයක් චිත්‍රයේ ඇත. මෙම පහන 'බලාපොරොත්තුව' පිළිබඳ සංකේතයක් ලෙස විචාරකයෝ අර්ථකථනය කරති.

(III) වැලපෙන කත/හඬන ස්ත්‍රිය (**The Weeping Woman**)-

- පිකාසෝ විසින් 1937 දී අඳින ලද කාන්තා උඩුකය චිත්‍රයකි. තෙල් සායමින් කර ඇති මෙම චිත්‍රයට විෂය වී ඇත්තේ 'ඩෝරා-මා' නම් කාන්තාව ය. ඇය කඳුළු පිසිමින් ඉකි ගසමින් හඬන ආකාරය මෙයින් නිරූපණය කර ඇත.
- පැතලි ලෙස වර්ණ ගන්වා ඇති අතර ශරීරයේ ප්‍රකෘති වර්ණ නොව භාවමය තත්ත්වයට උචිත උණුසුම් හා ශීත වර්ණ සමූහයක් එකිනෙක ගැටෙන පරිදි ආසන්න ව යොදා තිබේ. ගනකම් කළු රේඛාවෙන් මෙහි බාහිර සීමාවන් අවධාරණයට ලක් කර ඇත.
- කාන්තාවගේ වේදනාත්මකභාවය දක්වීමට විරූපණය කරන ලද මුහුණ සඳහා ජ්‍යාමිතික හැඩ සංකීර්ණ ව දක්වා ඇත.

**ඇගයීම** :

- ඝනිකවාදී කලාවේ ලක්ෂණ ලැයිස්තු ගත කරන්න.
- පැබ්ලෝ පිකාසෝගේ නිර්මාණවල තේමා පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
- පැබ්ලෝ පිකාසෝගේ නිර්මාණ පිළිබඳ ව කලාත්මක ඇගයීමක් කරන්න.

**නිපුණතාව 6.0** : **ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 6.6** : **යුරෝපීය ඝනිකවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 6.6.2** : **ඝනිකවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු.**
- **ජෝජස් බ්‍රාක්** (Georges Braque)

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ජෝජස් බ්‍රාක්ගේ නිර්මාණ නම් කරයි.
- ජෝජස් බ්‍රාක්ගේ නිර්මාණ විවරාත්මක ව රසවින්දනය කරයි.
- ඝනිකවාදී ප්‍රවණතාවේ කලා ශිල්පීන්ගේ කලාත්මක ප්‍රයෝග පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **ජෝර්ජස් බ්‍රාක් (Georges Braque -** 1882-1963) -
  - ප්‍රංශ සිත්තරකු වූ මොහු ඝනිකවාදී කලාවේ දියුණුවට මහත් සේවයක් කළ අයෙකි. 1908-1912 කාලය අතරතුර පිකාසෝ සමඟ එක් ව නිර්මාණ කටයුතුවල නිරත විය.
  - මුල් කාලීන නිර්මාණ ෆෝවිසම් කලා ව්‍යාපාරයේ (Fauvism) ලක්ෂණ පළ කරයි.
  - සොබාදහම, නිසල ද්‍රව්‍ය සම්පිණ්ඩන, ගිටාර් වාදකයන් ආදිය මොහුගේ සිතුවම්වල සුලභ ය.

(I) **නිවාස සහ ගස් (Houses and Trees)** -
- 1908 දී අඳින ලද සිතුවමක් වන මෙහි ගස් අතරින් පෙනෙන නිවාස සමූහයක් දැක්වේ. තෙල් සායමින් කැන්වසය මත ඇඳ තිබේ. සරල ජ්‍යාමිතික හැඩ සමූහයකින් නිවාස සහ ගස් ගොඩනගා තිබේ. නිවාසවල වහල - බිත්ති සියල්ල ළා දුඹුරු පැහැ ඝනිකමය හැඩ සමූහයක් ලෙස ප්‍රතිනිර්මාණය කර තිබෙන අතර වර්ණ මාලාව සීමිත ය.
- කෝණික හා ආනත හැඩ අවධාරණය කෙරෙන සංරචනයක් වන මෙහි ස්වාභාවිකත්වය බැහැර කර තිබේ.
- ඝනිකවාදී චිත්‍ර කලා ප්‍රයෝග විසින් ශාස්ත්‍රාලයීය කලාවේ අක්ෂිගෝචර අපේක්ෂා බැහැර කර තිබේ. විෂයානුබද්ධ ව නිරූපණය කරන පර්යාවලෝක ලක්ෂණ හා ත්‍රිමාණ ලක්ෂණ මෙම සිතුවම සඳහා භාවිත කර නැත.

(II) **ගිටාරයක් සහිත මිනිසා (Man with a Guitar)**-

- ගිටාරයක් වාදනය කරන මිනිසෙකුගේ චලන මාලාවක් ග්‍රහණය කොට එකී චලන එකිනෙක මත පිහිටුවීමෙන්, කරන ලද චිත්‍රයකි. හැඩතල සමූහයක සංකීර්ණ සංරචනයක් ලෙස සිතුවම ගොඩනගා තිබේ.
- දුඹුරු - කළු - සුදු පැහැ මූලික කර ගනිමින් ඒක වර්ණ ස්වභාවය අවධාරණය කර ඇත. චිත්‍රයේ කේන්ද්‍රීය අවධාරණය සිත්තරා යොමු කර ඇත්තේ ආකෘති කෙරෙහි ය.
- වාදකයාගේ සහ ගිටාරයේ ප්‍රකෘති හැඩතල ජ්‍යාමිතික රූපී ව්‍යූහයන්ට බිඳ දමා කැන්වසය මත ප්‍රතිනිර්මාණය කර තිබේ.

(III) **පාදම සහිත මේසය (Pedestal Table)** -

- ඝනිකවාදී ව ගොඩ නැගූ නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනයකි. දුඹුරු - කළු - සුදු මිශ්‍ර ඒක වර්ණ ස්වභාවය අවධාරණය වන පරිදි වර්ණ ගළපා තිබේ.
- මේසය මත අපිළිවෙළට විසිරුණු භාණ්ඩ සමූහයක් ඇති අතර චිත්‍රයේ ඇත්තේ කල්පිත පර්යාවලෝකයකි. එකිනෙක මත ඡේදනය වන රේඛා, කෝණික නැමුම් හා පැතලි රූපී වර්ණාලේපය චිත්‍රයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.

**ඇගයීම** :

- ජෝර්ජස් බ්‍රාක් විසින් අඳින ලද සිතුවම් නම් කරන්න.
- ජෝර්ජස් බ්‍රාක්ගේ ඝනිකවාදී කලා භාවිතය පිළිබඳ ව ඔහුගේ නිර්මාණ ඇසුරෙන් රචනයක් ලියන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.1** : **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් (Pre-historic art) අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.1.1** : **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අධ්‍යයනය කරමු.**

- **තන්තිරිමලේ**
- **බිල්ලෑව**
- **දොරවක්කන්ද**
- **වෙට්ටම්බුගල**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම්වල රූප සටහන්, සංයුක්ත තැටි, ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල**

- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් දක්නට ලැබෙන ස්ථාන හා ඒවා අයත් වන කාල වකවනු නම් කරයි.
- මෙම සිතුවම්වල දැකිය හැකි සුවිශේෂ ලක්‍ෂණ විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිත්තම්වල වස්තු විෂය, වර්ණ භාවිතය සංකේත හා ඒ මඟින් නිරූපණය වන අදහස් සාකච්ඡා කරයි.
- සිතුවම් නිර්මාණය කිරීම සඳහා භාවිත කර ඇති ශිල්ප ක්‍රම, වර්ණ භාවිතයේ විශේෂතා සහ ප්‍රකාශන ස්වරූප සාකච්ඡා කරයි.
- සිතුවම් පිළිබඳ ව ඇති විචාරාත්මක මත විමසා බලයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

- **විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

    - ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල පිහිටා තිබෙන ස්වාභාවික ගල් ගුහාවල සහ ආනත ගල් පර්වතවල (Crock shelters) සිතුවම් කිරීමේ හෝ කුරුටු ගෑමේ හෝ රූප සම්ප්‍රදායයක් දැකිය හැකි ය. මේවා පර්වත චිත්‍ර/ සෙල් සිතුවම් (Rock art) ලෙස හැඳින්වේ. මෙම සිතුවම් ප්‍රාග් ඓතිහාසික (Pre-historic art) කලා සහ ප්‍රාකෘතික කලා (Primitive art) යන කොටස් දෙකට ම අයත් වේ.

    - දැනට කර තිබෙන සොයා ගැනීම අනුව මෙබඳු චිත්‍ර සහිත ස්ථාන 54ක් ශ්‍රී ලංකාවේ පළාත් කිහිපයකින් සොයා ගෙන තිබේ. මේ අතරින් වැඩි ම ස්ථාන සංඛ්‍යාවක් දක්නට තිබෙන්නේ අම්පාර සහ මොනරාගල දිස්ත්‍රික්කවල ය. ඒ හැරුණු විට අනුරාධපුර, පොලොන්නරුව, රත්නපුර, හම්බන්තොට සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල ද මෙම ප්‍රවර්ගයට අයත් සිතුවම් දක්නට ලැබේ.

    - තන්තිරිමලේ, බිල්ලෑව, ආඬියාගල, දිඹුලාගල, කදුරු පොකුණ, අරන්ගොඩ ගල්ගේ, රජගල කන්ද, ගොනාගොල්ල, දොරවක, පිහිල්ලේගොඩ, අළු ගල්ගේ, බුදු ගල්ගේ, කුඩිම්බිගල, ලිහිණියාගල, මඟුල් මහා විහාරය, හක්බෙලිකන්ද, වෙට්ටම්බුගල, පියන්ගල යන ස්ථාන ඉන් කිහිපයකි.

- **ආකෘතිය හා ශෛලීය ලක්ෂණ** -

  - මෙම සිතුවම් සහ කුරුටු රූප නිර්මාණය සඳහා ස්වාභාවික ගල්ගුහාවල ඇතුළත බිත්තියේ (කපරාරු රහිත) මුහුණත භාවිතයට ගෙන තිබේ. ඇඟිල්ලෙන් හෝ අග තළා සකස් කර ගත් රළු කෝටු කැබැල්ලකින් හෝ රූපවල පිටත රේඛා ඇඳ තිබේ. ඇතැම් සිතුවම් වර්ණ පදාසවලින් පුරවා ඇත. සුදු, අළු, රතු, කහ යන වර්ණ භාවිත කර තිබේ. බහුල ව දක්නට තිබෙන්නේ සුදු සහ අළු පැහැයෙන් අඳින ලද රූප යි. රේඛාව කේන්ද්‍රීය ව සිතුවම් ගොඩ නගා තිබීම විශේෂ ලක්ෂණයකි.

  - පර්වත චිත්‍රවල අන්තර්ගතය කොටස් දෙකකට බෙදිය හැකි ය. ඉන් පළමු වැන්න ස්වභාවිකත්වය පදනම් වූ රූප වේ. මෙම රූප අතර අලියා, පක්ෂීන්, කිඹුලා ආදි සතුන් හඳුනා ගත හැකි ය. ඊට අමතර වශයෙන් මිනිස් රූප ද ඇඳ තිබේ. දෙවැන්න වියුක්ත රූපී හැඩතලයි.

  - දොරවකකන්ද ගල්ගුහාවේ කරන ලද කැණීමෙන් අනාවරණය වී තිබෙන සාධක අනුව එහි තිබෙන කුරුටු රූප ක්‍රි. පූ. 6000-4000ත් අතර කාලයකට අයත් බව සැලකේ. අලව්වේ හක්බෙලිකන්ද ගල්ගුහාවේ කුරුටු ගා තිබෙන ඉරි කැබලි ඊටත් වඩා පැරණි යුගයකට අයත් වීමට ඉඩ තිබේ.

- **සිතුවම් ඇඳීම සඳහා යොදාගත් ශිල්ප ක්‍රම** -

  - රේඛාමය චිත්‍ර (Line drawing) / වර්ණ සිතුවම් (පින්තාරුකරණය) (Painting)
  - ගල් බිත්තිය සූරා නිර්මාණය කරන රූප/උත්කීරණ (Engraving)
  - මුද්‍රා තබන ලද අත් සලකුණු (Hand printing)

  - ඉහත ක්‍රම අතරින් රේඛාමය ක්‍රමයට රූප ඇඳ දක්වා තිබීම බහුල ව ම දක්නට ඇති ක්‍රමය යි. මේ සඳහා වැඩි වශයෙන් කළු, සුදු සහ දුඹුරු යන වර්ණ භාවිත කර තිබේ. ආඬියාගල, පියන්ගල, රජගල, අළුගල්ගේ යන ගුහාවල මෙම ක්‍රමයට අඳින ලද සිතුවම් දක්නට ලැබේ.

  - එමෙන් ම සායම් තවරා නිර්මාණය කරන ලද චිත්‍ර රැසක් ද හමු වී තිබේ. මෙහි දී ඇඟිල්ලෙන් හෝ අග තළා සකස් කර ගත් රළු කෝටු කැබැල්ලකින් හෝ රූපවල පිටත රේඛා ඇඳ තිබේ. පළමු ව රේඛාවෙන් ඇඳගනු ලබන චිත්‍රය මධ්‍යයේ ලී කැබැල්ලකින් හෝ ඇඟිල්ලෙන් සායම් තවරා තිබේ. තන්තිරිමලේ, බිල්ලෑව, අළුගල්ගේ යන ස්ථානවලින් හමුවන චිත්‍ර එයට නිදසුන් සපයයි.

  - ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් නිර්මාණයේ දී භාවිත කර ඇති තවත් ජනප්‍රිය ක්‍රමයක් ලෙස ගල් තලය ගැඹුරු ලෙස සීරීමෙන් රූප මතු කිරීමේ ක්‍රමය (Engraving) හැඳින්විය හැකි ය. සතුන්ගේ අං කැබලි හා ඇට කැබලි මෙන් ම ශක්තිමත් ගල් පතුරු උපයෝගී කොටගෙන අවශ්‍ය රූපයේ වට රේඛාව සූරා ඉවත් කිරීම මෙහි දී සිදු කර තිබේ. මෙම ක්‍රමයට නිර්මාණය කරන ලද චිත්‍ර දොරවක්කන්ද, ඌරාකන්ද යන ස්ථානවලින් හමු වේ.

  - හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් යාල, මඟුල් මහා විහාර පරිශ්‍රයේ පිහිටා තිබෙන ගල් ගුහාවක ඇතුළත බිත්තියේ කහ සහ රතු පැහැයෙන් යුත් අත්ල සටහන් කිහිපයක් දක්නට තිබේ,

  - සිතුවම් සඳහා සුදු, අළු, අඳුරු රතු, කහ, සහ කළු යන වර්ණ භාවිත කර ඇති අතර ඒවා පස්, අළු, අඟුරු සහ ගුරු ගල් ආදියෙන් සකස් කොට ගෙන ඇත.

- **තන්තිරිමලේ** -

  - අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රදේශයේ තන්තිරිමලේ ග්‍රාමයේ පිහිටා ඇති එක ළඟ පිහිටි ස්වාභාවික ගුහා දෙකක සිතුවම් දක්නට ලැබේ.

**I** වන ගුහාව -

- I වන ගුහාවේ ඇතුළත බිත්ති මත සත්ත්ව රූප, මානව රූප 07ක් සහ ජ්‍යාමිතික හැඩ රැසක් සිතුවම් කර තිබේ. මෙහි සත්ත්වයකු පිටුපස සිටිනා මිනිස් රුව වැඩි අවධානයට ලක් වේ. දෑත් දෙපසට තබා සිටින මෙම රූපයේ මුහුණ වම්පසට හරවා සිටියි.
- මෙම ගුහාවේ ම මුවකු යැයි අනුමාන කරන සත්ත්ව රූපයක් සමඟ සිටින තවත් මානව රූපයක් හමු වේ. එම සත්ත්ව රූපය අළු පැහැයෙන් වට රේඛාව ඇඳ, එහි මධ්‍යයේ රතු පැහැයෙන් තිත් තබා තිබේ.
- සුදු පැහැති රේඛාවෙන් අඳින ලද දුවන ඉරියව්වකින් යුක්ත මිනිස් රූපයක් ද I වන ගුහාවේ ඇත. එසේ ම අතේ දුන්නක් සහිත ව වම්පසට හැරී සිටින සුදු පැහැති රේඛාවෙන් අඳින ලද මිනිස් රූපයක් ද දක්නට ලැබේ. අළු පැහැති රේඛාවෙන් අඳින ලද සතුන් දෙදෙනකු පිටුපස සිටින තවත් මිනිස් රූප දෙකක් ද වේ.

**II** වන ගුහාව -

- II වන ගුහාව නමින් නම් කර ඇති ගුහාවේ බිත්තිය පුරා විවිධ සංකේත ඇඳ තිබේ. එකා පිටුපසින් එකා සිටින සේ අඳින ලද සත්ත්ව රූප කිහිපයක් ද, වෙන් වශයෙන් අඳින ලද සත්ත්ව රූප කිහිපයක් ද එහි දැකිය හැකි ය.

- **බිල්ලෑව (බිලව)** -
  - මෙම ගුහාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රදේශයේ බිල්ලෑව ගමේ පිහිටා ඇත.
  - ඇතුළත බිත්තියේ රේඛා චිත්‍ර සහ සුදු පැහැයෙන් වර්ණ කරන ලද සිතුවම් කිහිපයක් දැකිය හැකි ය.
  - මෙහි ඇති සිතුවම් අතර මානව රූප, සත්ත්ව රූප සහ ජ්‍යාමිතික හැඩතල ද වේ.
  - ජෝන් ස්ටීල් විසින් 1910 වසරේ දී මෙහි ඇති සිතුවම් හඳුනා ගෙන වර්ග කර තිබේ. ඒ අනුව මෙම ලෙනෙහි නිවසක් තුළ සිටින මිනිසුන් දෙදෙනකු, තනි ව සිටින මානව රූප දෙකක්, ගෝනකුගේ රූපයක්, මොනරකුගේ යැයි සැලකෙන රූපයක් සහ හඳුනා නොගත් සංකේතයක් ද වේ.
  - මෙම රූප අතරින් ඇතැම් රූප වර්ණ ගන්වා ඇත. නිදසුනක් ලෙස ගෝනාගේ රූපය සුදු පැහැයෙන් වර්ණ කර තිබීම දැක්විය හැකි ය.

- **දොරවක්කන්ද (දොරවක)** -
  - කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළයේ දොරවක ගමේ දොරවක්කන්ද ගල්ලෙන පිහිටා ඇත.
  - මෙය ක්‍රිස්තු වර්ෂ 1919 වසරේ දී බ්‍රවුනින් (Browning ) විසින් සොයා ගන්නා ලදි.
  - අඩි 150ක් පමණ උස ගල් පර්වතයක පිහිටි ගල් ලෙනක් වන අතර, එහි ඇතුළත බිත්තිවල කැටයම් කරන ලද ජ්‍යාමිතික හැඩතල සහ සත්ත්ව රූප දක්නට ලැබේ. මෙම රූප උත්කීරණ ක්‍රමයට (Engraving) නිර්මාණය කර ඇත.
  - එමෙන් ම විවිධ ජ්‍යාමිතික හැඩතල 57ක් හමු වී තිබේ. ඒ අතරින් එක් මානව රූපයක් යැයි අනුමාන කරන හැඩයක් වඩාත් අවධානයට ලක් වේ. මෙම මානව රූපයේ හැඩය ශෛලිගත ස්වරූපයක් ප්‍රකට කරයි.
  - මෙහි ඇති සත්ත්ව රූප අතර ඇතා සහ පැටවා දැක්වෙන රූපය වැදගත් වේ.

- **වෙට්ටම්බුගල** -
    - අම්පාර දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ කිවුලේයාය ගමේ මෙම ගුහාව පිහිටා තිබේ.
    - මීටර 40ක් පමණ දිගකින් යුත් ගුහාවේ අභ්‍යන්තර බිත්තිය පුරා ම විවිධ හැඩයෙන් යුක්ත මානව රූප, සත්ත්ව රූප සහ ජ්‍යාමිතික හැඩ රාශියක් ඇඳ තිබේ. ඒ අතර අලින්ගේ රූප බහුල ව දක්නට ලැබේ.
    - සියලු ම අලි සහ ඇත් රූප සුදු, අළු, කහ, සහ රතට හුරු කහ (Reddish yellow ) යන වර්ණවලින් වර්ණ ගන්වා තිබේ. මෙම වර්ණ ගනකම් ලෙසට යොදා තිබීමත්, ඇතැම් වර්ණ තවත් වර්ණයකට මිශ්‍ර වී තිබීමත්, විශේෂ ලක්ෂණයකි. මෙසේ වර්ණ ගන්වා ඇති රූපවල බාහිර රේඛාවක් දක්නට නැත.
    - දළ දෙකක් සහිත ඇත් රූපය විශේෂ ය. එම රූපය රතට හුරු කහ (Reddish yellow) වර්ණයෙන් සිත්තම් කර ඇත.
    - එක් අලි රූපයක කකුල්වල පතුල විස්තරාත්මක ව ඇඳ ඇත (රවුම් කර ඇත). මෙම රූපය සුදු පැහැයෙන් යුක්ත ය.
    - ජ්‍යාමිතික රූප අතර පැහැදිලි ලෙස හඳුනා ගත හැකි ප්‍රකාශනයක් වන්නේ ස්වභාවික ව ජලය පිරුණු තැන් ඇඳ තිබෙන ආකාරය යි. ජලය සංකේතවත් කිරීමට අළු පැහැති තිත් යොදා ගෙන තිබේ. වනාන්තරයේ ස්වාභාවික ව ජලය රැඳී තිබෙන තැන්, වනයේ ජීවත් වන කණ්ඩායම් අතර සන්නිවේදනය කිරීම එහි අරමුණ වන්නට ඇත. රේඛාවලින් ඇඳ තිබෙන එම රූප සඳහා භාවිත කර තිබෙන්නේ සුදු සහ අළු පැහැය යි. රේඛාවල ඝනකම අනුව නිර්ණය කළ හැකි වන්නේ, ඇතැම් විට ඇඟිලි සහ තරමක ඝනකමකින් යුත් ලී කෑබලි වැනි යමක් සිතුවම් කිරීමට යොදා ගෙන ඇති බව යි.
    - එමෙන් ම දුන්න සහ ඊතලය පමණක් සුදු පැහැ රේඛාවෙන් ඇඳ තිබෙන සිතුවමක් ද වේ.
    - මුවකුගේ යැයි සැලකෙන රූපයක් ද දැකිය හැකි අතර, එහි අං යුවළ පැහැදිලි ව ඇඳ තිබේ. එය රතට හුරු කහ පැහැය (Reddish yellow) සහිත ව වර්ණ කොට ඇත.

**ඇගයීම** :
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් දක්නට ඇති ස්ථාන නම් කරන්න.
- ප්‍රාග් ඓතිහාසික සිතුවම් නිර්මාණය සඳහා යොදා ගෙන ඇති වස්තු විෂය සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් ඇඳීමට උපයෝගී කරගත් ශිල්ප ක්‍රම, වර්ණ භාවිතය සහ ප්‍රකාශන ස්වරූප පිළිබඳ ව විමර්ශනය කරන්න.
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් පිළිබඳ ව ඇති විචාරාත්මක මත සාකච්ඡා කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : **යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.2.1** : **යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අධ්‍යයනය කරමු.**
- **ලැස්කෝ**
- **අල්ටමීරා**
- **චෝවේ / ෂෝවේ**
- **ෆොන්ඩි ගෝම්**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍රවල රූප සටහන්, ඡායාරූප, ගුහා සිත්තම්වල වීඩියෝ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් ඇති ස්ථාන නම් කරයි.
- එම සිතුවම්වල වස්තු විෂය සහ සංකල්ප භාවිතය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම්වල මාධ්‍ය, තාක්ෂණය, ශිල්ප ක්‍රම විස්තර කරයි.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම්වල ප්‍රකාශන ස්වරූප සහ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ක්‍රි.පූ 40,000 - 10,000 අතර කාල වකවානුවට අයත් වේ (ඉහළ පැලියෝලිතික යුගය)
- යුරෝපීය ප්‍රාග් ඓතිහාසික සිතුවම් සඳහා සමස්තයක් ලෙස සත්ත්ව රූප, මානව රූප සහ විවිධ සංකේත විෂය වී තිබේ.
- මෙම සිතුවම් ඇඳීම සඳහා පාදක වූ කරුණු ලෙස දඩයම් අවස්ථා සුලභ කර ගැනීම, භූතාත්ම පිදීම, විවේකය ගත කිරීම, දඩයම් පහසු කර ගැනීම වැනි කරුණු හඳුනාගත හැකි ය.
- වර්ණ සකස් කර ගැනීම සඳහා සත්ත්ව ලේ, සත්ත්ව තෙල්, අළු, අඟුරු, පස්, ශාක කොටස් භාවිත කර ඇත.
- සිතුවම් නිර්මාණයේ දී පහත සඳහන් ශිල්ප ක්‍රම භාවිත කර ඇත.
  - ඇඳීම - රේඛා චිත්‍ර (Line drawing)/ වර්ණ සිතුවම්/පින්තාරුකරණය (Painting)
  - ගල් පෘෂ්ඨය සූරා නිර්මාණය කරන රූප/උත්කීරණ (Engraving)
  - මුද්‍රා තබන ලද අත් හා පා සලකුණු (Hand and foot printing)

- **යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ඇඳ ඇති ස්ථාන** -

  - ලැස්කෝ (Lascaux -France) -
    - ප්‍රංශයේ මෙන්ටිනැක් නුවර ආසන්නයේ මෙම ගුහාව පිහිටා ඇත.
    - ලැස්කෝ සිතුවම් ක්‍රි. පූ. 17000 පමණ කාලයට අයත් යැයි සැලකේ.
    - ගුහා අභ්‍යන්තර තුළ සිවිලිමේ සහ ගුහා බිත්ති මත සත්ත්ව රූප, මානව රූප, ජ්‍යාමිතික හැඩතල සහ විවිධ සංකේත ඇඳ තිබේ. මානව රූප ඉතා විරල අතර සත්ත්ව රූපබහුල ව දැක ගත හැකි ය. බයිසන් ගව රූප, පිනි මුවන්ගේ, කැලෑ අශ්වයන්ගේ සහ දඩයක්කරුවන් ගේ රූප සිතුවම් අතර වේ.
    - වර්ණ සිතුවම්, රේඛා චිත්‍ර, බිත්තිය සූරා නිර්මාණය කර ඇති රූප, මුද්‍රිත අත් සටහන් සමස්ත සිතුවම් එකතුවට අයත් ය. බිත්තිය සූරා සකස් කළ රූප 1500ක් සහ සිතුවම් 600ක් පමණ ඇති බව සැලකේ.
    - ලැස්කෝ සිතුවම් අතර ඇති අඩි 17ක් දිග ගව රුව සහ මළ මිනිසාගේ දර්ශනය (කුරුලු වෙස් මුහුණක් පැලඳි මිනිසා) වඩාත් වැදගත් සිතුවම් ලෙස පිළිගැනේ.
    - මෙම සිතුවම් රතු, කළු, දුඹුරු, කහ, සහ සුදු වර්ණ භාවිතයෙන් නිර්මාණය කර ඇත. රූප වටා දැක ගත හැකි කළු බාහිර රේඛාකරණය විශේෂ ලක්ෂණයකි.

  - අල්ටමීරා (Altamira-Spain)-
    - උතුරු ස්පාඤ්ඤයේ පිහිටි මෙම ගුහා සිතුවම් ක්‍රි. පූ. 15000 ට පමණ අයත් යැයි සැලකේ.
    - සමස්ත ගුහාවේ සිවිලිම සහ බිත්ති ආවරණය වන සේ සිතුවම් ඇඳ ඇත. සත්ත්ව රූප, ජ්‍යාමිතික හැඩතල, විවිධ සංකේත සහ මුද්‍රිත අත් සලකුණු සිතුවම් අතර වේ.
    - බයිසන් ගව රුව මෙහි වඩාත් ව්‍යාප්ත තේමාව යි. ලගින, දුවන, පනින, ගමන් කරන, සිටගෙන සිටින ඉරියව්වලින් බොහෝ බයිසන් ගව රූප ඇඳ ඇත.

  - චෝවේ/ ෂෝවේ (Chauvet -France) -
    - මෙම ගුහා පරිශ්‍රය දකුණු දිග ප්‍රංශයේ පිහිටා ඇත.
    - චෝවේ ගුහා සිතුවම් ක්‍රි. පූ. 32000 පමණ කාල වකවානුවට අයත් යැයි සැලකේ.
    - සිතුවම්වල ප්‍රධාන වස්තු විෂය සත්ත්ව රූප වේ. මැමත්, බයිසන්, අශ්වයන්, සිංහයන්, පිනිමුවන්, රයිනෝ, වලසුන් හා හයිනා ආදි රූප ඒ අතර දැක ගත හැකි ය.
    - සත්ත්ව රූප සමූහ වශයෙන් ඇඳීම කැපී පෙනෙන ලක්ෂණයකි.
    - මෙම සිතුවම් වර්ණ චිත්‍ර, රේඛා චිත්‍ර, ගල් තලය සූරා සකස් කළ නිර්මාණ සහ අත්, පාවල මුද්‍රිත චිත්‍ර සටහන් ලෙස හඳුනාගත හැකි ය.
    - සූරා සකස් කර ගත් ගල් තලය මත චිත්‍ර වර්ණ කිරීමේ දී රතු හෝ කළු හෝ පැහැයෙන් බාහිර රේඛාව ඇඳ වර්ණ පූරණය කර ඇත. ඒ සඳහා කහ, දුඹුරු, අළු, කළු සහ සුදු වැනි වර්ණ භාවිත කර තිබේ. චිත්‍ර වටා ඒකාකාරී බාහිර රේඛාකරණය කැපී පෙනෙන ලක්ෂණයකි.
    - චෝවේ ගුහා සිත්තම් අතර වඩාත් අවධානයට ලක් වී ඇති සිතුවම්,
      - අශ්ව පෙළ - අශ්වයන්ගේ බෙල්ල පෙදෙස පමණක් දැක්වෙන එකා පසුපස එකා සිටින සේ ඇඳ ඇති රූප පෙළකි.
      - සිංහ රූප සමූහය - අට දෙනෙකුගෙන් පමණ සමන්විත විවිධ ඉරියව්වලින් යුත් සිංහ රූප සමූහයකි.
      - කුඩා දරුවකුගේ මුද්‍රිත පා සලකුණු - කුඩා දරුවකුගේ මුද්‍රිත පා සටහන් දැක්වෙන අතර ඒවා ලෝකයේ පැරණි ම මුද්‍රිත පා සටහන් සේ සැලකේ.
      - රයිනෝ සමූහය - තැන් තැන්වලට විසිරී යාමට සූදානමින් සිටින විවිධ ඉරියව්වලින් යුත් රයිනෝ රූප සමූහයකි.

- **ෆොන්ඩ් ගෝම්** (Font de Gaume - France) -
    - ප්‍රංශයේ පිහිටා ඇති මෙම ගුහාව ක්‍රි. පූ. 17000ට පමණ අයත් යැයි සැලකේ.
    - බයිසන්, මැමත්, අශ්වයා, රයිනෝ, මුවා, සිංහයා සහ එළුවා වැනි සතුන්ගේ රූප මෙන් ම ජ්‍යාමිතික හැඩතල ද මෙම සිතුවම් අතර දැක ගත හැකි ය.
    - බොහෝ චිත්‍ර සඳහා රතු, කහ, සුදු, කළු සහ අළු වර්ණ භාවිත කර ඇති අතර රූප වටා බාහිර රේඛාවක් යොදා ඇත. වර්ණ මිශ්‍ර කර භාවිත කර තිබීම විශේෂත්වයකි.
    ෆොන්ඩ් ගොම් ගුහා සිත්තම් අතර ඇති,
        - බයිසන් සමූහය
        - පිනි මුව යුවළ
        - බයිසන් සහ මුවා, වැනි සිත්තම් වඩාත් අවධානයට යොමු වී ඇති නිර්මාණ වේ.

**ඇගයීම** :

- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර හමුවන ස්ථාන හා ඒවායේ ඇති සිතුවම් නම් කරන්න.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිත්තම් නිර්මාණයේ දී භාවිත කර ඇති වර්ණ, ශිල්ප ක්‍රම හා සංරචන ක්‍රමවේද විස්තර කරන්න.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල ප්‍රකාශන ස්වරූප හා කලාත්මක ලක්ෂණ සාකච්ඡා කරන්න.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර සහ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිත්තම්වල විශේෂතා පිළිබඳ සංසන්දනාත්මක ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.3** : **ශ්‍රී ලංකාවේ ස්තූපය හා ඒ ආශ්‍රිත වාස්තු විද්‍යාත්මක අංග අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.3.1** : **ශ්‍රී ලංකාවේ ස්තූප අධ්‍යයනය කරමු.**

- **ථූපාරාමය**
- **රුවන්වැලි මහා සෑය**
- **අභයගිරිය**
- **ජේතවනාරාමය**
- **රන්කොත් වෙහෙර**
- **කිරි වෙහෙර**
- **හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ ස්තූපය**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : ස්තූපයේ ආකෘති හා ප්‍රධාන අංග දැක්වෙන රූප සටහන්, වීඩියෝ දර්ශන හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ස්තූපයේ ප්‍රභවය හා එහි විකාශය විශ්ලේෂණය කරයි.
- ස්තූපයක අංග නම් කරයි.
- ස්තූපවල හැඩ උදාහරණ සහිත ව වගු ගත කරයි.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්තූප නම් කර විස්තර කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේද එකක් හෝ කිහිපයක් හෝ ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **ස්තූපයේ ප්‍රභවය හා විකාශය** -
  වෙහෙර, ථූපය, චෛත්‍ය යන නම්වලින් ද හැඳින්වෙන ස්තූපය බුදු රජාණන් වහන්සේගේ හා රහතන් වහන්සේලාගේ ශාරීරික හා පාරිභෝගික ධාතූන් වහන්සේලා තැන්පත් කර නිමවා ඇති පූජනීය ස්මාරකයක් ලෙස හැඳින්විය හැකි ය.
- ශ්‍රී ලංකාවේ ස්තූප නිර්මාණය සඳහා ඉන්දියාවේ සාංචි ස්තූපයේ ආභාසය ලැබී ඇත.
- මහින්දාගමනයෙන් පසු ව ශ්‍රී ලංකාවේ ඉදි වූ ප්‍රථම ස්තූපය ථූපාරාමය ලෙස සැලකේ.

- **ස්තූප ආකෘති** -
  ඝණ්ටාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර, පද්මාකාර, ඝටාකාර, ආමලකාකාර, පාත්‍රාකාර, පලණ්ඩවාකාර සහ මන්දිරාකාර ලෙස ස්තූප හැඩය අනුව ආකෘති රැසක් දක්නට ලැබේ.
- **ස්තූපයේ අංග** -

| | |
|---|---|
| 1. ගජන් මළුව | 7. පේසා වළලු |
| 2. වැලි මළුව | 8. ගර්භය |
| 3. ඇත් පවුර | 9. සතරැස් කොටුව |

4. සලපතළ මළුව 10. දේවතා කොටුව
5. පාදම 11. කොත් කැරැල්ල
6. වාහල්කඩ 12. කොත

- **ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්තූප** -
  - ථූපාරාමය
  - රුවන්වැලි මහා සෑය
  - අභයගිරිය
  - ජේතවනාරාමය
  - රන්කොත් වෙහෙර
  - කිරි වෙහෙර
  - හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ ස්තූපය

- **ථූපාරාමය** -
  මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදි කළ ප්‍රථම ස්තූපය යි. මෙය ඉදි කරන ලද්දේ දේවානම්පියතිස්ස රජු විසිනි. ආරම්භයේ දී ධාන්‍යාකාර හැඩයෙන් යුක්ත බවට සැලකෙන මෙහි වර්තමාන හැඩය ඝණ්ටාකාර වේ. උසින් අඩි 63ක් වේ. මෙය වට දා ගෙයක් සහිත ස්තූපයකි.

- **රුවන්වැලි මහා සෑය** -
  අනුරාධපුර පිහිටි මෙම ස්තූපය දුටුගැමුණු රජතුමා විසින් කරනු ලැබ ඇත. බුබ්බුලාකාර හැඩය ගනී. මහාථූපය, ස්වර්ණමාලි ස්තූපය යනුවෙන් ද හැඳින්වේ. වර්තමාන උස අඩි 350කි. විෂ්කම්භය අඩි 300කි. දිසා හතරකට මුහුණ ලා වාහල්කඩ හතරකි.

- **අභයගිරිය** -
  අභයගිරි, බයාගිරි හා උතුරු චෛත්‍යය යන නම්වලින් ද හැඳින්වේ. අනුරාධපුරයේ පිහිටි මෙම ස්තූපය ක්‍රි. පූ පළමු වන සියවසේ වට්ටගාමණී අභය (වළගම්බා) රජතුමා විසින් කරවනු ලැබ ඇත. වර්තමාන දාගැබේ උස අඩි 235 ක් පමණ වේ. විශ්කම්භය අඩි 310 කි. ගිරි නම් නිගණ්ඨයාගේ ආරාමය තිබූ තැන මෙම දාගැබ ඉදි කර තිස්ස නම් භික්ෂුවක් සඳහා පූජා කළ බව කියැවේ.

- **ජේතවනාරාමය** -
  අනුරාධපුරයේ පිහිටි මෙම ස්තූපය මහසෙන් රජු විසින් කරන ලද්දකි. වර්තමාන උස අඩි 232ක් වන අතර, ස්තූපයේ හතර දිශාවේ වාහල්කඩ හතරක් දැකගත හැකි ය.

- **රන්කොත් වෙහෙර** -
  පොලොන්නරුවේ පිහිටි මෙම ස්තූපය නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවනු ලැබ ඇත. දාගැබේ හතරැස් කොටුවේ සෑම මුහුණතක ම සූර්යයා සංකේතවත් කරමින් චක්‍ර කිහිපයකි. දාගැබේ උස අඩි 200කි. පාදමේ වට ප්‍රමාණය අඩි 186කි. බුබ්බුලාකාර ය.

- **කිරි වෙහෙර** -
  පොලොන්නරුවේ පිහිටි මෙම දාගැබ පරාක්‍රමබාහු රජුගේ බිසවක වූ සුභද්‍රාවති බිසව විසින් කරවනු ලැබ ඇත. බුබ්බුලාකාර ය. වට ප්‍රමාණය අඩි 264කි. විෂ්කම්භය අඩි 88කි. වර්තමාන උස අඩි 80කි. සතර දිශාවට මුහුණලා ප්‍රතිමා ගෘහ හතරක් වේ.

- **හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ ස්තූපය** -
  - මහනුවර යුගයට අයත් නිර්මාණයක් වන මෙම ස්තූපය හඟුරන්කෙත විහාරයේ බුද්ධ මන්දිරය තුළ ඉදි කර ඇත.
  - කුඩා ප්‍රමාණයේ ස්තූපයක් වන මෙහි උස අඩි 14යි අඟල් 10ක් සහ විෂ්කම්භය අඩි 24යි අඟල් 5ක් පමණ වේ.

- විහාර මන්දිරය තුළ උස් ව තනන ලද සතරැස් වේදිකාවක් මත වූ වෘත්තාකාර මළුවක් මත ස්තූපය ගොඩනඟා ඇත.
- මෙහි විශේෂත්වය වන්නේ, සමස්ත ස්තූපයේ මතුපිට අලංකාර මෝස්තර රටා ඇඳ තිබීම යි.
- රතු, තැඹිලි සහ කහ වර්ණ බහුල ලෙස භාවිත කර රේඛාමය සටහන් ලෙස ස්තූපයේ පේසා වළලු මත පළාපෙති මෝස්තරවලින් අලංකාර කර ඇත.
- ස්තූපයේ ගර්භය වලාකුළු නොහොත් බෝපත් වැනි රටාවන්ගෙන් ද සතරැස් කොටුව, දේවතා කොටුව සහ කොත ලියවැලින් හා මල් මෝස්තරවලින් ද සැරසිලි කර ඇත.

**ඇගයීම** :

- ශ්‍රී ලංකාවේ ස්තූපයේ ප්‍රභවය හා විකාශය සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ ස්තූපවල ආකෘති හා අංග විස්තර කරන්න.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්තූප නම් කරන්න.
- ස්තූපවල ඇති ගෘහ නිර්මාණ ලක්ෂණ සාකච්ඡා කරන්න.
- මෙම ස්තූප ඉදි කිරීම සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය හා කාල වකවනු ඇතුළත් කර වගුවක් සකස් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.4** : **ශ්‍රී ලංකාවේ තෝරාගත් ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.4.1** : **ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරමු.**

- **ආසනඝර**
- **බෝධිඝර**
- **පධානඝර**
- **උපෝසථඝර**
- **ජන්තාඝර**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ දැක්වන ඡායාරූප, සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර.

**ඉගෙනුම් පල** :

- ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ ඉදි කිරීමට හේතු වූ සාධක සාකච්ඡා කරයි.
- එම නිර්මාණවල දැකිය හැකි වාස්තු විද්‍යාත්මක අංග සහ කලා ලක්ෂණ විස්තර කරයි.
- එම නිර්මාණවල මාධ්‍ය භාවිතය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- එම නිර්මාණවලට විදේශීය වාස්තු විද්‍යා අංග බලපා ඇති ආකාරය පිළිබඳ ව විමර්ශනය කරයි.
- නිර්මාණ අගයයි, රසවිඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇඟයීම/ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේද එකක් හෝ කිහිපයක් හෝ ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- ආසනඝර -
  - බුදු රජාණන් වහන්සේ බුදු වන විට වැඩ සිටි වජ්‍රාසනය සංකේතවත් කරවන ශෛලමය ආසනයක් පිහිටුවා එය මැදි කොට නිර්මාණය කරන ගොඩනැඟිලි විශේෂයකි.
  - මඩකලපුව දිස්ත්‍රික්කයේ පුලුකුනාව නම් ස්ථානයෙන් හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලැවේ හල්මිල්ලවැටිය ගමෙන් ද අනුරාධපුර යුගයට අයත් පැරණි ආසනඝර හමු ව ඇත.
- බෝධිඝර -
  - බෝධිය වටා එහි ආරක්ෂාව සඳහා ඉදි කරන ලද වහලයක් සහිත සක්මන් මළුවකින් සහ ප්‍රාකාරයකින් සමන්විත ගොඩනැගිල්ලකි.
  - සතරැස් හා වෘත්තාකාර හැඩවලින් මෙන් ම වෙනත් හැඩවලින් යුක්ත බෝධිඝර ද දැක ගත හැකි ය.
  - බෝධියේ ආරක්ෂාව, වෘක්ෂයේ වැඩීම පාලනය කිරීම සහ බැතිමතුන්ට ආවරණයක් සැපයීම මෙමඟින් සිදු වේ.

- බෝධිසරවල පොදු වාස්තු විද්‍යා අංග ලෙස බෝධිය වටා ඇති ප්‍රාකාරය, ප්‍රදක්ෂිණා පථය, එය වටා ජලය බැසයාම සඳහා ඉදි කර ඇති කාණු පද්ධතිය , ප්‍රදක්ෂිණා පථයට ඉහළින් ගල් ටැම් මත ඉදි කළ පියස්ස හඳුනාගත හැකි ය.
- කුරුණෑගල නිල්ලක්ගම බෝධිසරය, පඬුවස්නුවර බෝධිසරය, හම්බන්තොට පඩිකෙම්ගල බෝධි සරය හා ලාහුගල මගුල් මහා විහාර බෝධිසරය ලංකාවේ වැදගත් බෝධිසර අතරින් කිහිපයකි.

- **පධානසර** -
  - භාවනායෝගි භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් තනන ලද ගෘහ නිර්මාණාත්මක ඉදි කිරීමකි.
  - සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ "පියන් ගල් "යනුවෙනි. "තපෝවන"යනුවෙන් ද හැඳින්වේ.
  - පධානසර පිහිටි භූමියෙහි, සක්මන් මළු, කුටි, ගලින් බඳින ලද පොකුණු ද වේ.
  - පධානසර වටා එහි ආරක්ෂාවට තනන ලද දිය අගලක් ද වේ. එය කපා ඔපමට්ටම් කළ ගල් පුවරු අල්ලා නිර්මාණය විය.
  - මෙම ගෘහ නිර්මාණ විශේෂය ආරණ්‍යගත භික්ෂූන්ට භාවනා කිරීම සඳහා ම තනන ලද්දකි.
  - ගල් පාලමකින් සම්බන්ධ කර ඇති ආවාස කුටිය හා ඉදිරියේ විවෘත මණ්ඩපය ප්‍රධාන අංගයකි. පශ්චිමාරාමය මේ සඳහා නිදසුනකි.

- **උපෝසථ සර** - භික්ෂූන් වහන්සේලා පොහෝය කර්ම කිරීම සඳහා රැස්වන ගොඩනැගිල්ල මේ නමින් හැඳින්වේ.
  - **ලෝවා මහා පාය** -
    - දුටුගැමුණු රජු විසින් කරන ලද අනුරාධපුර යුගයට අයත් විශිෂ්ට ගණයේ උපෝසථාගාරයකි.
    - නව මහල් ගොඩනැගිල්ලක් වන මෙය දිගින්, පළලින් සහ උසින් එක සමාන ය.
    - මෙහි පියස්ස ලෝහ (තඹ) උළුවලින් සෙවිලි කළ හෙයින් ලෝවාමහාපාය නම් විය.
    - දැනට මෙහි බිම් මහලෙහි යළි ස්ථාපනය කළ කුලුනු 1600ක් පමණ දැකගත හැකි ය.

- **ජන්තාඝර** -
  - ආරාමවාසී භික්ෂූන් ස්නානය සඳහා භාවිත කරන ලද ගොඩනැගිලි විශේෂයකි.
  - නීරෝග සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් උදෙසා ඖෂධ ගිල්වා උණුසුම් ජල වාෂ්ප උරාගැනීමට හා උණුසුම් ජලය ස්නානය කිරීමට පහසුකම් සහිත ව ගොඩනැගිල්ල නිර්මාණය කර ඇත.
  - සතරැස් හැඩයෙන් යුත් මෙම ගොඩනැගිල්ල මධ්‍යයේ සතරැස් කුටියක් සහ එහි මැද ජලය පිරවීම සඳහා වන තටාකයකි.
  - මෙම තටාකය සහිත කුටිය ගල් පුවරුවලින් සකස් කර ඇත.
  - අභයගිරිය, මහා විහාරය, මිහින්තලය, අරංකැලේ වැනි ස්ථානවල ජන්තාඝර දැක ගත හැකි වේ.

**ඇගයීම** :
- ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ ඉදි කිරීමට හේතු වූ කරුණු සාකච්ඡා කරන්න.
- මෙම නිර්මාණ සඳහා භාවිත මාධ්‍ය, ඒවායේ දැකිය හැකි වාස්තු විද්‍යාත්මක අංග සහ කලා ලක්ෂණ පිළිබඳ විමසන්න.
- මෙම ගෘහ නිර්මාණ සඳහා බලපෑ විදේශීය වාස්තු විද්‍යාත්මක අංග ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.5** : **ස්තූපය හා වෙනත් ඓතිහාසික ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.5.1** : **ස්තූපය හා වෙනත් ඓතිහාසික ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණ අගයමු.**

- **වාහල්කඩ**
- **සඳකඩපහණ**
- **මුරගල**
- **කොරවක්ගල**
- **පියගැට පෙළ**
- **පුන්කලස්**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : පැරණි ගොඩනැගිලි ආශ්‍රිත කැටයම් දැක්වෙන ඡායාරූප, වීඩියෝ දර්ශන හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- පැරණි ආගමික හා වෙනත් ඓතිහාසික ගොඩනැගිලි ආශ්‍රිත කලා නිර්මාණවල ආරම්භය හා විකාශය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- කලා ලක්ෂණ, මාධ්‍ය භාවිතය සහ ශිල්පක්‍රම විස්තර කරයි.
- එම කලා නිර්මාණ පිළිබඳ ව ඉදිරිපත් ව ඇති විවිධ මත සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- සඳකඩපහණ, මුරගල, කොරවක්ගල, පියගැටපෙළ නිර්මාණ පැරණි ආගමික හා ඓතිහාසික ගොඩනැගිලි පිවිසුම් ආශ්‍රිත ව දක ගත හැකි ය.
- මුල් කාලයේ දී එම නිර්මාණ සියල්ලක් ම වාගේ කැටයම් රහිත විය.
- යුග වශයෙන් සැලකීමේ දී බාහිර හැඩය හා සැරසිලි අතර වෙනස් කම් දක ගත හැකි ය.
- මේවා නෙළීමේ ශිල්ප ක්‍රමයට (Carving) නිර්මාණය කර ඇත.

- වාහල්කඩ -
  - දාගැබ ආශ්‍රිත කලා නිර්මාණයකි. වර්තමානයේ 'වාහල්කඩ' ලෙස හඳුන්වන නිර්මාණ අංගය සඳහා අතීතයේ දී ආදි මුඛ, ආයක, ආයික යන නම් භාවිත කර ඇත.
  - චෛත්‍යයට අලංකාරය මෙන් ම ආරක්ෂාව සලසන ආධාරකයක් ලෙස නිර්මාණය කර ඇත.
  - විශාල දාගැබ්හි ගර්භය හා සම්බන්ධ ව එහි පා මුල සතර දිසාවට මුහුණලා සිටින සේ, නිර්මාණය කර ඇත. වාහල්කඩ මුහුණත් පහකින් (05) යුක්ත ය.
  - වාහල්කඩවල පහළ කොටස පාෂාණයෙන් ද ඉහළ කොටස ගඩොළින් ද නිමකර තිබූ බවට සාධක වේ.

- වාහල්කඩක දෙකෙළවර විසිතුරු කැටයම් සහිත උස් වූ ගල් කණු දෙකකි. එම කණු මත සතර දිශාවන් නියෝජනය වන පරිදි ඇත් (නැගෙනහිර) , අස් (බස්නාහිර), ගව, (දකුණ), සිංහ (උතුර) රූප පිහිටුවා ඇත.
- වාහල්කඩ මුහුණත්වල තිරස් අතට විහිදෙන බොරදම් තීරු වේ. ඒවා වාමන, හංස, ඇත් රූපවලින් අලංකාර කර ඇත.
- දැනට ශේෂ ව පවත්නා පැරණි ම හා කලාත්මක යැයි පිළිගැනෙන වාහල්කඩ වන්නේ මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ නැගෙනහිර වාහල්කඩ ය.
    - කණ්ඨක චෛත්‍යයේ බොරදම් තීරු අතර ඇති වාමන රූප කලාත්මක ය. නැගෙනහිර වාහල්කඩෙහි දකුණු පස, වාමන රූප පෙළ මධ්‍යයේ ගණ දෙවි රූපයක් කැටයම් කර ඇත. ඒ රූපය දෙපස වාමන රූප ගණ දෙවි රූපයට නමස්කාර කරන ආකාරයෙන් නිර්මාණය කර ඇත.
    - වාමන රූප පෙළට පහළින් හංස රූප පේළියක් ද පහළින් ම හිස හා ඉදිරි පාද දෙක සහිත ඇත් රූප පෙළක් ද බොරදම් අතර වේ.
- මිරිසවැටි, අභයගිරි, ජේතවනාරාම දාගැබ් ආශ්‍රිත ව ද වාහල්කඩ නිර්මාණ දැකගත හැකි ය.

- **සඳකඩපහණ** -
    - ඉරහඳ ගල, ආරෝහ චන්‍ද, පද්මශිලා, චන්ද්‍රකාන්ත පාෂාණ ආදි නම් සඳකඩපහණ හැඳින්වීම සඳහා භාවිත කර ඇත.
    - සඳකඩපහණ යනු පැරණි ගොඩනැඟිලි ප්‍රවේශවල පියගැට පෙළ පාමුල ආරම්භක පඩිය ලෙස යෙදූ ගල් පුවරුවකින් විකාශය වූ කැටයම් සහිත නිර්මාණයකි.
    - අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය තෙක් කාල පරාසය තුළ දී සඳකඩපහණෙහි ආකෘතිය සහ සැරසිලි කාලානුරූප ව විවිධ වෙනස්කම්වලට ලක් ව තිබේ.

    - මුල් කාලීන සඳකඩපහණ නිර්මාණ හතරැස් හැඩති කැටයමින් තොර ගල්පුවරුවකි. ඉන් පසු ව එය ක්‍රමයෙන් අර්ධ වෘත්තාකාර හැඩයක් බවට පත් වූ අතර, එය ද කැටයම් රහිත විය.
    - අනුරාධපුර බිසෝ මාළිගය, රත්න ප්‍රාසාදය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහා සෑය වැනි ස්ථානවලින් කලාත්මක සඳකඩපහණ හමු වේ. මේවා නෙළීමේ ශිල්ප ක්‍රමයෙන් උන්නත ව නිර්මාණය වී ඇත.
    - අනුරාධපුර යුගයට අයත් කලාත්මක බවින් උසස් ම සඳකඩපහණ ලෙස සැලකෙන්නේ බිසෝ මාළිගයේ සඳකඩපහණ ය. එහි කලාත්මක බව හා දාර්ශනික ප්‍රකාශනය පිළිබඳ ව විද්වතුන් විවිධ මත පළ කර ඇත.

    - **පොළොන්නරු යුගයේ සඳකඩපහණ** -
    - මෙම යුගයේ දී සඳකඩපහණ විවිධ වෙනස්කම් රැසකට ලක් වී තිබේ.
    - බාහිර හැඩය අර්ධ වෘත්තාකාර ස්වරූපයට වඩා වැඩියෙන් දැක්වේ.
    - අනුරාධපුර යුගයේ සඳකඩපහණවල සත්ත්වාවලියේ සිටි ගවයා, හින්දු ආගමික බලපෑම් මත මේ යුගයේ සඳකඩපහණින් ඉවත් කරනු ලැබ ඇත.
    - දක්ෂිණාවෘත්ත ව එකා පසු පස එකා ගමන් කළ සතුන් සතර දෙනා, වෙන් වෙන් තීරුවල ගමන් කරන ආකාරයට කැටයම් කර ඇත.
    - අනුරාධපුරයේ බොහෝ සඳකඩපහණවල දැකිය හැකි ඇත්, අස්, ගව, සිංහ සම්මත සත්ත්ව රූපාවලිය පොළොන්නරු සමයේ දී වෙනස් වී ඇත.
    - මෙම යුගයේ කලාත්මක වටිනාකමින් ඉහළ නිර්මාණ වශයෙන් පොළොන්නරුව වටදාගේ, කිරිවෙහෙර, බද්ධ සීමා මාලකය වැනි තැන්වල දක්නට ඇති සඳකඩපහණ හඳුන්වා දිය හැකි ය.

- **මහනුවර යුගයේ සඳකඩපහණ** -
- මෙම යුගය වන විට සඳකඩපහණේ ආකෘතිය සහ කැටයම් පූර්ණ වෙනසකට ලක් ව තිබේ.
- අර්ධ වෘත්තාකාර හැඩය ත්‍රිකෝණාකාර හැඩයකට ආසන්න හැඩයක් ගෙන ඇත.
- සඳකඩපහණේ තීරු ඉවත් වූ අතර මධ්‍යයේ නෙළුම පූර්ණ නෙළුමක් ලෙස කැටයම් කර ඇති අතර සත්ත්ව රූප වෙනුවට ලියවැල් (උද්භිද) රටා බහුල ව යොදා ඇත.
- සඳකඩපහණ පියගැටපෙළට ආබද්ධ වන ස්ථානයේ අඩි එකහමාරක් පමණ පළල් තීරුවක් එක් කර තිබේ. මෙම කොටසින් ආරම්භ වන ලියවැල් මෝස්තරය මධ්‍යයේ ඇති පද්මය වටා ගමන් කරන ආකාරයට නිර්මාණය කර ඇත.
- අර්ථාන්විත බවෙහි අඩුවක් දිස්වුව ද, මහනුවර දළදා මාළිගයේ සහ හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ ඇති සඳකඩපහණ මෙම යුගයේ කලාත්මක වටිනාකමින් ඉහළ නිර්මාණ අතර වේ.

- **මුරගල** -
  - නාග ශිලා, අරක්ගල, ආරක්ෂාගල යන නම් මෙම නිර්මාණය සඳහා භාවිත වී ඇත.
  - මුරගල පඩි පෙළක දෙපස කොරවක් ගල ඉදිරියෙන් සිරස් ව සිටුවා ඇත.
  - මුල් ම අවධියේ මුරගල සඳහා භාවිත දිගටි හතරැස් ගල් පුවරු කැටයම් රහිත ව යෙදිණි.
  - ක්‍රමයෙන් දිගටි හතරැස් ගල්පුවරුවේ ඉහළ දෙකෙළවර වක්‍රාකාර ව ද, එහි මධ්‍යයේ ඉහළට නෙරූ හැඩයක් (කුඩුම්බි) සහිත ව ද මුරගල නිර්මාණය වී ඇත.
  - පුන්කලස, බහිරව රූප, නාග රූප (පෙණ පහ සහ හත සහිත), නා රාජ රූප (දිසාපාලකවරුන්) දිසාපාලකවරුන් සහ භාර්යාවන් දැක්වෙන කැටයම් සහිත ව මුරගලේ විකාශය සිදු වී ඇත.
    - පුන්කලස සහිත මුරගල් - කුට්ටම් පොකුණ, ඉසුරුමුණි විහාරය
    - නාග රූප සහිත මුරගල් - අවුකන විහාරය, මැදිරිගිරි වටදා ගෙය
    - බහිරව රූප සහිත මුරගල් - ඉසුරුමුණිය, අභයගිරි විහාරය, පළමු වන විජයබා රජවාසල (සංඛනිධි, පද්මනිධි මුරගල්)
    - නා රාජ රුව සහිත මුරගල් - රත්න ප්‍රාසාදය, කපාරාරාමය (දිසාපාලක රූප)
    - යුගල රූප සහිත මුරගල් - මහසෙන් මාළිගයේ නැගෙනහිර දිසාවෙ මුරගල් (දිසාපාලක සහ භාර්යාව), රුහුණේ දෙමටමල් විහාරය

- **කොරවක්ගල** -
  - මෙම නිර්මාණය හැඳින්වීම සඳහා කරවක්ගල, කරඅත්ගල, කයියෝරුගල, කෛයෝරුගල යන නම් භාවිත වී ඇත.
  - කොරවක්ගල ද මුල් යුගයේ දී කැටයම් රහිත වක් වූ අත්වැටක් ලෙස නිර්මාණය වූවකි.
  - පඩි පෙළක් විසිරී නොයා ස්ථාවර ව ශක්තිමත් ව තබා ගැනීම සඳහා මෙන් ම, පියගැටපෙළෙහි අත්වැලක් ලෙස කොරවක්ගල ප්‍රයෝජනවත් ය.
  - කොරවක්ගලෙහි බාහිර හැඩය සහ කැටයම් කාලානුරූප ව වෙනස් වී ඇත.
  - මකර කටින් විහිදෙන ලියවැල් මෝස්තර සහිත කොරවක්ගල් අනුරාධපුර සහ පොලොන්නරු යුගවල දක්‍ක ගත හැකි ය.
  - අනුරාධපුර යුගයේ දී ගලින් ද, පොලොන්නරු යුගයේ දී ගල්වලට අමතර ව හුනු බදාමයෙන් හා ගඩොළින් ද කොරවක්ගල් නිර්මාණය විය.
  - මුල් යුගයේ දී කොරවක් ගලේ අත්වැලට යටින් ඇති ගල් පුවරුවේ ඇතුළත හා පිටත කැටයම් රහිත වූ අතර පසු කලෙක දී එම කොටස්වලට ද කැටයම් එකතු විය.
  - එසේ ගල් පුවරුවේ කොටස් සැරසීමට පුන්කලස් යොදාගත් කොරවක් ගල් අභයගිරියෙන් ද ඇත් රූප යොදා ගත් කොරවක්ගල් ඉසුරුමුණියෙන් ද , සිංහ රූප යෙදූ කොරවක්ගල් පොලොන්නරු වටදා ගෙයින් ද හමු වේ.
  - කොරවක්ගලේ ලියවැලට පහළින් ඇතුළත කොටසේ දිසාපාලකගේ බිරිය හා වාමන කතුන් දෙදෙනා දැක්වෙන කොරවක්ගලක් පොලොන්නරුවේ ලංකාතිලක පිළිම ගෙයි දොරටුව අබියසින් හමු ව ඇත.
  - කලාත්මක බවින් උසස් ම කොරවක්ගල් අනුරාධපුර බිසෝ මාළිගයේ සහ රත්න ප්‍රාසාදයේ දක්‍ක ගත හැකි ය.

- පොලොන්නරු යුගයේ - වේළුවනාරාමය, කිරිවෙහෙර, ලංකාතිලකය, වටදා ගෙය, බද්ධ සීමා ප්‍රාසාදය, රාජවේශ්‍යා භුජංග මණ්ඩපය යන තැන්හි ද කොරවක්ගල් හමු වේ.
- මකර රුව වෙනුවට දඹදෙණි රජ මහා විහාරයේ ථූපසර දොරටුවේ කොරවක් ගලට ඇත් රූපය යොදා තිබේ.
- ගම්පොළ යුගයේ සිට ගජසිංහ රුව යෙදීම සිදු වී ඇත. ලංකාතිලක විහාරයේ සහ ගඩලාදෙණි විහාරයේ කොරවක්ගල් ඊට නිදසුන් වේ.
- මහනුවර යුගයේ දී මකර කටින් නික්මෙන ලියවැල වෙනුවට ඇත් සොඬ සහිත කොරවක්ගල් නිර්මාණය වී ඇත.

- **පියගැට පෙළ (සෝපාණ පන්තිය)** -
  - ගලින් නිම වූ පියගැට කැටයම් සහිත හා රහිත ලෙස වර්ග දෙකකි.
  - කැටයම් රහිත පියගැට යොදා ඇත්තේ පර්වතයක් හෝ කන්දක් හෝ නැගීම සඳහා ය.
  - කැටයම් සහිත පියගැට භාවිත කර ඇත්තේ පූජනීය හා වෙනත් ඓතිහාසික ගොඩනැගිලි සඳහා ය.
  - පියගැට පෙළක පය ස්පර්ශ වන තිරස් තලයේ කැටයම් යොදා ඇති අවස්ථා සීමිත ය.
  - සෝපාණ පන්තියක නගින්නාට දිස්වන සිරස් මුහුණතේ කැටයම් යෙදීම බහුල ව දැකිය හැකි ය.
  - පූජනීය ස්ථානයක පඩිපෙළ පඩි අටකින් යුක්ත නම් - එය ආර්ය අෂ්ටාංගික මාර්ගය සිහිගන්වන බව සෙනරත් පරණවිතාන පවසයි.
  - අනුරාධපුරයේ මහසෙන් මාළිගයේ හා බිසෝ මාළිගයේ පියගැට පෙළ ශෛලිගත වජ්‍ර හා වාමනරූප සහිත ය.
  - මහනුවර විෂ්ණු දේවාලයයේ පියගැට පෙළෙහි සිරස් මුහුණුවල එකිනෙකට වෙනස් අලංකාර ලියවැල් සෑම පියගැටයක ම මධ්‍යයේ සිට දෙපසට ව්‍යාප්ත වන පරිදි කැටයම් කර ඇත.

- **පුන්කලස්** -
  - පිරුණු කළය, පූර්ණ ඝටය, පුන්කලස ලෙස හැඳින්වේ.
  - සෞභාග්‍යය, ආඪ්‍ය බව, වාසනාව පුන්කලසින් සංකේතවත් වේ.
  - පූජනීය ස්ථාන හා මඟුල් පොකුණු ආශ්‍රිත ව පුන්කලස් දැකිය හැකි ය.
  - අනුරාධපුරයේ මුරගල්වල සහ වාහල්කඩ කුලුනු කැටයම්වල පුන්කලස් කැටයම් අර්ධ උන්නත ව හා අල්ප උන්නත ව නිර්මාණය කර ඇත.
  - සැරසිල්ලක් ලෙස පුන්කලස් යොදාගත් කොරවක්ගල් අභයගිරියෙන් හමු වී ඇත.
  - පූර්ණ උන්නත ලෙස නිර්මාණය කරන ලද විශාල පුන්කලස් අනුරාධපුර කුට්ටම් පොකුණෙහි දැක ගත හැකි ය.

**ඇගයීම** :

- සඳකඩපහණේ ආරම්භය සහ විකාශනය පිළිබඳ සාකච්ඡා කරන්න.
- මුරගලේ ආරම්භය සහ විකාශනය සාකච්ඡා කරන්න.
- වාහල්කඩ, සඳකඩපහණ, මුරගල, කොරවක්ගල, පියගැට පෙළ සහ පුන්කලස යන නිර්මාණවල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම, උපයෝගාත්මක අගය සහ කලා ලක්ෂණ පිළිබඳ ව විමර්ශනය කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.6** : **අනුරාධපුර සහ පොලොන්නරු යුගයේ වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.6.1** : **පිළිම ගේ (පඨිමාඝර) නිර්මාණ අගයමු.**

- **තිවංක පිළිම ගෙය**
- **ථූපාරාම පිළිම ගෙය**
- **ලංකාතිලක පිළිම ගෙය**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : පිළිම ගේ වාස්තු විද්‍යා නිර්මාණවල ඡායාරූප හා වීඩියෝ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර, ඡායාරූප පිටපත් හා රූප සටහන්

**ඉගෙනුම් පල** :

- පොලොන්නරු යුගයේ පිළිම ගෙවල් නම් කරයි.
- එම නිර්මාණ සඳහා පාදක වූ අරමුණු හා ආභාස සාකච්ඡා කරයි.
- එම නිර්මාණවල වාස්තු විද්‍යා ලක්ෂණ විස්තර කරයි.
- පිළිම ගෙවල් නිර්මාණය සඳහා භාවිත මාධ්‍යය සහ ශිල්ප ක්‍රම පැහැදිලි කරයි.
- එම වාස්තු විද්‍යා නිර්මාණවල කලාත්මක ලක්ෂණ ඇගයීමට කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : ව්‍යාපෘති ක්‍රමය/ සාකච්ඡා ක්‍රමය/පැවරුම් ක්‍රමය/ අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම ආදි එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගොඩ නගන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **පොලොන්නරු යුගයේ පිළිම ගෙවල් (පඨිමාඝර) -**
  - අනුරාධපුරයේ ප්‍රතිමාඝරවලට වඩා වෙනස් වූ පිළිම ගෙවල් පොලොන්නරුවේ දක්නට ලැබේ. මේවායෙහි විශේෂත්වය නම්, ගඩොල් මාධ්‍ය කරගෙන ගෙඩි ගේ සම්ප්‍රදායයට ඉදි කර තිබීමයි. පොලොන්නරුවේ ථූපාරාම පිළිම ගෙය, ලංකාතිලක පිළිම ගෙය සහ තිවංක පිළිම ගෙය එයට උදාහරණ වේ.
  - මෙම ගොඩනැගිලි ප්‍රධාන වශයෙන් ගඩොලින් හා හුනු බදාමයෙන් ගොඩනගා ඇත.
  - ඒවායේ පියස්ස ද ආරුක්කු ආකාරයෙන් ගඩොලින් ම නිමවා ඇත.
  - ථූපාරාමයේ ආරුක්කු වහල මැනවින් ආරක්ෂා වී ඇති අතර, ලංකාතිලකයේ හා තිවංක පිළිම ගෙයි ආරුක්කු වහල විනාශ වී ඇත.
  - සම්පූර්ණ පියස්ස සහිත ව හොඳින් ආරක්ෂා වී ඇති ගොඩනැගිල්ල, ථූපාරාම පිළිම ගෙය යි. මෙම පිළිම ගෙය පොලොන්නරුවේ ඇති අනෙක් පිළිම ගෙවලට වඩා කුඩා ය.
  - මෙම ගොඩනැගිලිවල බිත්ති අඩි හතක් පමණ ගනකමට යොදා ඇත්තේ පියස්සේ බර දරා සිටීම සඳහා ය.
  - පිළිම ගෙවල් තුනෙහි ම බාහිර හා අභ්‍යන්තර සැලැස්ම එක ම ආකෘතියකට අනුව ගොඩනගා ඇත.
  - පිටත බිත්තිවල විමාන හා කැටයම් දැකිය හැකි අතර, හුණු බදාමයෙන් කර වර්ණ ගන්වා තිබී ඇත.
  - ශිව දේවාලයවල ආභාසය ලැබී ඇත. දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ලක්ෂණවල බලපෑම පළ කරයි.

- **තිවංක පිළිම ගෙය** -
    - පොලොන්නරුවේ පිහිටි, තිවංක පිළිම ගෙය මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදි කරන ලද්දකි.
    - තිවංක හෙවත් ත්‍රිභංග හැඩයෙන් යුත් බුද්ධ ප්‍රතිමාවක් ගර්භ ගෘහය තුළ පිහිටුවා ඇති හෙයින් මෙය තිවංක පිළිම ගෙය ලෙස හැඳින්වේ.
    - ප්‍රතිමා ගෘහයේ පිට පැත්තේ හුනු බදාමයෙන් නිර්මිත සිංහ රූ, එයට පහළින් වාමන රූප පේළියක් සහ විමාන තුළ නිර්මාණය කළ රූප රැසක් ඇත.
    - බුද්ධ ප්‍රතිමාව, විමාන, කැටයම් ඇතුළු බිත්ති සියල්ල හුනු බදාමයෙන් නිමවා වර්ණ කර තිබී ඇත.
    - පිළිම ගෙයට ඇතුළු වත් ම අන්තරාලය දෙපස ආසංකවතී, සස, විදුර, චුල්ල පදුම, මෛත්‍රීබල, තේමිය, මහා සුදස්සන වැනි ජාතක කථා ද , ගර්භ ගෘහය තුළ බුදු රජාණන් වහන්සේ සංකස්ස නුවරට වඩින ආකාරය ද, අන්තරාලය කොටසේ දේව ආරාධනාව ද සිතුවම් කර ඇත.

- **ථූපාරාම පිළිම ගෙය** -
    - පොලොන්නරුවේ පිහිටි ථූපාරාම පිළිම ගෙය, ගඩොළින් නිමවන ලද ආරුක්කු හැඩයේ පියස්සක් සහිත ව හොඳින් ආරක්ෂා වී ඇත.
    - මහා පරාක්‍රමබාහු රජ සමයේ දී ඉදි කර ඇතැයි සැලකේ.
    - තිවංක පිළිම ගෙය හා ලංකාතිලක පිළිම ගෙයි හිටි පිළිම තිබුණ ද මෙහි දක්නට ලැබෙන වෙනස වන්නේ ගර්භ ගෘහය තුළ හිඳි පිළිමයක් දක්නට ලැබීම යි. මේ නිසා ප්‍රතිමා ගෘහය කුඩා වී ඇත.
    - ප්‍රතිමා ගෘහය වටා ඇති ගඩොළින් හා හුනුගලින් නිර්මිත රූකම් අතර සිංහ රූප, අලංකාර විමාන හා ඒ තුළ දේව රූප දැකිය හැකි ය.

- **ලංකාතිලක පිළිම ගෙය** -
    - මෙම ප්‍රතිමා ගෘහය අති විශාල හිටි බුද්ධ ප්‍රතිමාවක් සහිත ව මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ගොඩනගන ලද්දකි. බුද්ධ ප්‍රතිමාවේ හිසින් පහළ කොටස පමණක් වර්තමානයේ දී දැකගත හැකි ය.
    - මෙහි බිත්ති අඩි 55ක් පමණ උස් වන අතර ඉහළ මාලයට නැගීමට කුඩා පඩි පෙළක් ද දැක ගත හැකි ය.
    - හතරැස් පැතිකඩ සහිත හිසකින් යුත් ගල් කුලුනු පිළිම ගෙය මධ්‍යයේ ශේෂ ව ඇත. (එක් පසෙක කුලුනු 17කි). ඒ මත දැවයෙන් නිර්මිත ඉහළ මාලයක් තිබෙන්නට ඇතැයි සැලකේ.
    - ප්‍රතිමා ගෘහයේ තේජවන්ත පෙනුම ප්‍රධාන ප්‍රවේශය දෙපස ඇති බහුකෝණික කුලුනු දෙකෙන් මතු කර ඇත.
    - බාහිර බිත්ති 'ස්ටකෝ'(හුනු) බදාමයෙන් කරන ලද කැටයම්වලින් යුක්ත ය.

**ඇගයීම** :
- පොලොන්නරුවේ ලංකාතිලක පිළිම ගෙය, තිවංක පිළිම ගෙය, ථූපාරාම පිළිම ගෙය යන නිර්මාණවල ගෘහ නිර්මාණාත්මක ලක්ෂණ සාකච්ඡා කරන්න.
- එම වාස්තු විද්‍යා නිර්මාණ කෙරෙහි බලපෑ විදේශීය කලා අභාස සාකච්ඡා කරන්න.
- මෙම ගොඩනැගිලි අතර දක්නට ලැබෙන සමාන - අසමානතා විශ්ලේෂණය කරන්න.
- පිළිම ගෙවල් නිර්මාණකරණයෙහි කලාත්මක ලක්ෂණ අගයන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.6** : **පොලොන්නරු යුගයේ වාස්තු විද්‍යා නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.6.2** : **පොළොන්නරු යුගයේ ශිව දේවාලය අධ්‍යයනය කරමු.**
- **ශිව දේවාලය අංක 01**
- **ශිව දේවාලය අංක 02**

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : පොලොන්නරුවේ ශිව දේවාලය ඇතුළත් නිදර්ශන, ඡායාරූප, වීඩියෝ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ශිව දේවාලය නිර්මාණය කෙරෙහි බල පෑ දකුණු ඉන්දීය ආභාසය පැහැදිලි කරයි.
- පොලොන්නරුවේ ශිව දේවාලයවල ගෘහ නිර්මාණාත්මක ලක්‍ෂණ පැහැදිලි කරයි.
- ශිව දේවාලයය ගොඩනැඟීම සඳහා භාවිත මාධ්‍ය සහ ශිල්ප ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරයි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- පොලොන්නරු යුගයට අයත් ශිව දේවාලය සඳහා දකුණු ඉන්දීය ගෘහනිර්මාණ ලක්‍ෂණ බලපා ඇත.
- මෙම ගොඩනැගිලි කැපූ කළු ගලින් ගෙඩිගේ සම්ප්‍රදායයට අනුව නිර්මාණය කර ඇත.

- **ශිව දේවාලය අංක 01 -**
  - 13 වන සියවසේ දී පාණ්ඩ්‍ය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදි කරන ලද්දකි.
  - කැපූ කළු ගල් කුට්ටි සම්බන්ධ කොට නිර්මාණය කර ඇත.
  - මණ්ඩපය, අන්තරාලය, ගර්භගෘහය යන සම්මත හින්දු දේවාලය අංගවලින් සමන්විත ය.
  - පැතලි ගල් පුවරුවලින් කළ පියස්ස මත ගඩොළින් නිම කර තිබූ ශිඛරය විනාශ වී ගොස් ඇත.
  - අන්තරාලයත් ගර්භ ගෘහයත් සම්බන්ධ වන පියසි මට්ටමේ වූ පනේල ව්‍යාඝ්‍ර රූපයන්ගෙන් සරසා ඇත.
  - මෙහි සතරැස් ගර්භ ගෘහය මැද ශිව ලිංගය තැන්පත් කර ඇත.
  - සුවිශේෂ වාස්තු විද්‍යා ලක්‍ෂණ,
    - පිටත බිත්තිවල පැන්නුම් කුලුනු
    - විමාන
    - නෙළුම් මල් ආකාරයේ පේකඩ ලක්‍ෂණ
    - සත්ත්ව රූපවලින් සහ සිංහ මුඛවලින් අලංකාර කළ බොරදම් සහිත ගල් අඩිතාලම

- **ශිව දේවාලය අංක 02** -
  - පොලොන්නරු යුගයට අයත් පැරණිතම හින්දු ස්මාරකය යි.
  - ක්‍රි.ව. 11 දී රාජ රාජ නම් චෝල රජු සිය බිසව සිහි වීමට කරවා ඇත.
  - අදටත් නොනැසී ආරක්‍ෂා වී පවතින මෙම ගොඩනැඟිල්ල මුළුමනින් ම කැපූ කළු ගලින් නිමවා ඇති කුඩා දේවාලයයකි.
  - දකුණු ඉන්දීය චෝල ගෘහ නිර්මාණ ශෛලිය පෙන්නුම් කරයි.
  - සුවිශේෂ වාස්තු විද්‍යා ලක්‍ෂණ,
    - තුඩු හෙවත් මුදුන් සහිත කවුළු
    - පැන්නුම් කලුනු සහ දේව රූප සහිත විමාන
    - පද්ම බොරදම්
    - අටපට්ටම් ශිඛරය
    - ඉදිරි දොරටුවෙහි කැටයමින් යුතු අෂ්ටාස්‍ර ගල් කුලුනු
  - කුඩා ගල් උළුවස්ස සහිත ඉදිරි දොරටුව මිටි ය.
  - ගර්භ ගෘහය තුළ ශිව ලිංගය තැන්පත් කර ඇත.

**ඇගයීම** :

- පොලොන්නරු යුගයේ ශිව දේවාලයවල නිර්මාණ ආකෘතිය විස්තර කරන්න.
- ශිව දේවාලයවල දක්නට ලැබෙන ගෘහ නිර්මාණ ලක්‍ෂණ හා ඒ සඳහා බලපෑ කලා ආභාස පැහැදිලි කරන්න.
- ශිව දේවාලය නිර්මාණයේ දී භාවිත අමුද්‍රව්‍ය හා ශිල්ප ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 7.0** | : | **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 7.6** | : | **පොලොන්නරු යුගයේ වාස්තු විද්‍යා නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කරයි.** |
| **ක්‍රියාකාරකම 7.6.3** | : | **විජයොත්පාය සහ නිශ්ශංක ලතා මණ්ඩපය අධ්‍යයනය කරමු.** |
| **කාලච්ඡේද** | : | 01 යි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | විජයොත්පායේ සහ නිශ්ශංක ලතා මණ්ඩපයේ ඡායාරූප, වීඩියෝ දර්ශන හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර |
| **ඉගෙනුම් පල** | : | • විජයොත්පාය සහ නිශ්ශංක ලතා මණ්ඩපය යන නිර්මාණ සඳහා පදනම් වූ අරමුණු හා ආගමික හා විදේශීය බලපෑම් පිළිබඳ ව සාකච්ඡා කරයි.<br>• එම නිර්මාණවල ගෘහ නිර්මාණ ලක්ෂණ විස්තර කරයි.<br>• එම නිර්මාණ ගොඩනැඟීම සඳහා භාවිත මාධ්‍ය සහ ශිල්ප ක්‍රම ද කලාත්මක ලක්ෂණ ද පිළිබඳ ව සාකච්ඡා කරයි. |
| **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** | : | පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **විජයොත්පාය (වෛජයන්ත ප්‍රසාදය)** -
  - මහා පරාක්‍රමබාහු රජතුමා විසින් කරන ලද මෙම ගෘහ නිර්මාණය ඔහුගේ රජ මාළිගය ලෙස සැලකේ.
  - ගෘහ නිර්මාණ සැලැස්මට මහල් හතක් සහ කාමර දහසක් අඩංගු වූ බව චූලවංශයෙහි සඳහන් වේ.
  - බිත්ති සියල්ල ගඩොළින් නිර්මාණය කර ඇති අතර බිත්ති මධ්‍යයේ ශක්තිමත් භාවය පිණිස ගල් කණු යොදා තිබේ.
  - උඩු මහල දැව මාධ්‍යයෙන් තනා තිබූ බව අනුමාන කෙරේ.
  - මාළිගාවේ ප්‍රධාන ශාලාව හැර අනෙක් කාමර වටා කුඩා කුටි පේළි දෙකක් හෝ තුනක් හෝ බැගින් සාදා තිබූ බවට සාධක ඇත.
  - රජ මාළිගයේ උඩු මහලට නැඟීම සඳහා කළු ගලින් නිර්මාණය කරන ලද පළල් සෝපාණයකි.
  - මාළිගයේ බිත්ති අලංකාර කිරීම සඳහා සුදු පාට හුනු බදාමයක් යොදාගන්නට ඇති බවට සාධක දක්නට ලැබේ.
  - ඇත්, සිංහ, පුන්කලස් ආදී රූප මෙහි කැටයම් අතර වේ.

- **නිශ්ශංක ලතා මණ්ඩපය** -
  - නිශ්ශංක මල්ල රජු විසින් කරනු ලැබ ඇති මෙය පොළොන්නරුවේ දළදා මළුව ගොඩනැගිලි සංකීර්ණයට අයත් නිර්මාණයකි.
  - ධර්ම ශ්‍රවණයට හා දළදා වහන්සේට වන්දනාමාන කිරීමට මෙය යොදාගත් බව, නිශ්ශංක මල්ල රජු කරවා ඇති ගල්පොත සෙල් ලිපියේ සඳහන් වේ.
  - ආයත චතුරස්‍රාකාර වේදිකාවක් ලෙස නිමවා ඇති මණ්ඩපය වටා ගල් ගරාදි වැටකි.
  - මණ්ඩපය මධ්‍යයෙහි බුබ්බුලාකාර හැඩයෙන් යුත් කුඩා දාගැබකි. මණ්ඩපයට පිවිසීම සඳහා එක් දොරටුවක් පමණක් ඇත.

- ස්තූප පාදමේ අංජලී මුද්‍රාවෙන් යුතු මිනිස් රූප වළල්ලක් නිර්මාණය කොට ඇත.
- එක් පේළියක 04 බැගින් වූ නෙළුම් දණ්ඩක ස්වරූපයෙන් යුතු වූ රිද්මානුකූල ගල් කුලුනු අටක් මෙහි පියස්ස දරා සිටීමට යොදා ඇත. එක් කණුවක උස අඩි හතක් පමණ වේ.
- මෙම කුලුනු මත තැනින් තැන පේකඩ ස්වරූපයෙන් කැටයම් කළ නෙළුම් කොළ දැකිය හැකි අතර, සෑම කුලුනු ශීර්ෂයක් ම අඩක් පිපුණු නෙළුමක් ලෙසට කැටයම් කර ඇත.

**ඇගයීම** :

- පොලොන්නරු විජයොත්පායේ ගෘහ නිර්මාණාත්මක ලක්ෂණ විස්තර කරන්න.
- නිශ්ශංක ලතා මණ්ඩපයේ ආකෘතික ලක්ෂණ පැහැදිලි කරන්න.
- නිශ්ශංක ලතා මණ්ඩපයේ කුලුනුවල කලාත්මක ලක්ෂණ අගය කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.6** : **අනුරාධපුර සහ පොලොන්නරු යුගවල වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.6.4** : වටදා ගේ (ථූපඝර) නිර්මාණ අගයමු.
- **පොලොන්නරුව වටදා ගෙය**
- **තිරියාය වටදා ගෙය**
- **මැදිරිගිරිය වටදා ගෙය**

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : වටදා ගේ නිර්මාණ දැක්වෙන පින්තූර, වීඩියෝ දර්ශන හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- වටදා ගේ වාස්තු විද්‍යා නිර්මාණයේ සැලසුම්කරණය හා තාක්‍ෂණික ක්‍රමවේද පිළිබඳ සාකච්ඡා කරයි.
- එම කලා නිර්මාණවල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම විමර්ශනය කරයි.
- පොලොන්නරුව, තිරියාය සහ මැදිරිගිරිය වටදා ගේ නිර්මාණවල කලාත්මක ලක්‍ෂණ අගය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- වටදා ගෙය ස්තූපය වටා ගොඩනඟන ලද වාස්තු විද්‍යා නිර්මාණයකි.
- ස්වාභාවික අවු වැසි ආදියෙන් ස්තූපය ආරක්‍ෂා වීමට ආවරණයක් ලෙස නිර්මාණය කර ඇත.
- ථූපඝර, චෛත්‍යඝර, චේතියඝර යන නම්වලින් ද වටදා ගේ හැඳින්වේ.

- **පොලොන්නරු වටදා ගෙය** -
  - මහා පරාක්‍රමබාහු රජතුමා විසින් මෙය ඉදි කර ඇති බව චූලවංශයේ සඳහන් වේ.
  - පසු කාලීන ව නිශ්ශංකමල්ල රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බව ගල්පොත සෙල් ලිපියේ සඳහන් වේ.
  - පොලොන්නරු වටදා ගෙයි ඉහළ මණ්ඩපය ගලින් නිම වූ බොරදම් සහිත පනා බැම්මකින් දරා සිටියි.
  - වටදා ගෙයි ඉහළ මණ්ඩපය මධ්‍යයේ බුබ්බුලාකාර හැඩැති දාගැබකි. එය වටා සතර දිශාවට මුහුණ ලා ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ සිටින බුද්ධ ප්‍රතිමා හතරකි.
  - වටදාගෙයි දැකිය හැකි මෙම මහල් මාලක නමින් ද හඳුන්වන අතර මාලක දෙකෙහි ම බිම ගල් අතුරා ඇත.
  - පහළ මණ්ඩපයට පිවිසීමට එක් දොරටුවක් හා ඉහළ මණ්ඩපයට පිවිසීම සඳහා දොරටු හතරක් වන අතර, මෙම සෑම දොරටුවක් ම කොරවක්ගල්, සඳකඩපහණ, මුරගල් හා පියගැට පෙළ ආදියෙන් අලංකාර ය.
  - වටදා ගෙහි පියස්ස දරා සිටීමට ඒක කේන්ද්‍රීය ගල් කණු පේළි පහක් වන අතර ඉන් පේළි තුනක් ඉහළ වෘත්තාකාර ගෘහය වටා පිහිටා ඇත. මෙහි තෙවන ගල් කණු පේළිය පෙති සතරේ අලංකාර මල් රටාවෙන් යුත් ගල් පුවරු සහිත කෙටි ප්‍රාකාරයකට මැදි වන සේ පිහිටුවා ඇත. මෙම කුලුනු පේළියට ඇතුළතින් වටදා ගේ පියස්ස දරා සිටින ගඩොළු බිත්තියකි.

- වටදා ගෙයි පිටත ගල් කණු පේළි දෙක, පහළ වෘත්තාකාර ගෘහය වටා පිහිටා ඇත.
- පොලොන්නරු යුගයේ නිර්මාණය කළ කලාත්මක සඳකඩපහණ සහ මුරගල මෙහි ඉහළ මණ්ඩපයට පිවිසීමට ඇති උතුරු දොරටුවෙහි දැකිය හැකි ය.

- **තිරියාය වටදා ගෙය** -
  - මෙම වටදාගෙය මණ්ඩප දෙකකින් යුතු ය. වටදා ගෙයට පිවිසෙන පළමු මණ්ඩපයට පසු ව ඇති දෙවන මණ්ඩපය මධ්‍යයේ ස්තූපයකි. එය ගඩොළින් තනා ඇත.
  - පළමු මණ්ඩපයට පිවිසීමට සිවු දිශාවෙන් දොරටු සතරකි. ඒ සෑම දොරටුවක් ම, ගල් උළුවස්සක්, කොරවක්ගල්, මුරගල්, සඳකඩපහණ සහ පියගැට පෙළ ආදියෙන් යුක්ත ය.
  - මෙහි වහලය දරා සිටීමට ඒක කේන්ද්‍රීය ව ගල් කණු පේළි දෙකකි. මෙම කුලුනු කළු ගලින් තනා ඇති අතර බොහෝ ඒවා කැටයම් රහිත ය.
  - ඇතුළු වන ප්‍රධාන ද්වාර 04ට මුහුණ ලා සතර දිශාවෙන් ම මල් ආසන දැක ගත හැකි ය.
  - කළු ගල් පුවරුවලින් තැනූ පිටත ප්‍රාකාරයේ කොටසක් ශේෂ ව ඇත. ප්‍රාකාර පාදම කළු ගලින් නිම කර ඇත. මෙම ප්‍රාකාරයේ, වහලයට සම්බන්ධ ලී කණු ගිල්වීම සඳහා කරන ලද කුහර දක ගත හැකි ය.

- **මැදිරිගිරිය වටදා ගෙය** -
  - මැදිරිගිරිය වටදා ගෙය මණ්ඩප දෙකකින් යුතු ය. පළමු මණ්ඩපයට පසු ව ඇති දෙවන මණ්ඩපය මැද ගඩොළින් කළ චෛත්‍යයක නටබුන් දක ගත හැකි ය.
  - මෙම වටදා ගෙයෙහි වහලය දරා සිටීම පිණිස ඒක කේන්ද්‍රීය ව පිහිට වූ ගල් කණු පේළි දෙකකි. පිටත කුලුනු පේළිය උසින් අඩු වන අතර ප්‍රාකාරය හා සම්බන්ධ කර ගොඩනගා ඇත.
  - කුලුනු සහ කුලුනු හිස් කැටයමින් අලංකාර කර ඇති අතර එම කැටයම් එකිනෙකට වෙනස් ය.
  - සෝපාණ පන්තිය ආරම්භ වන තැන ප්‍රවේශ දොරටුව ද්වාර මණ්ඩපයකින් යුතු ය.

**ඇගයීම** :

- බෞද්ධ වාස්තු විද්‍යා අංගයක් වූ වටදා ගෙය නිර්මාණයෙහි ආකෘතික ලක්ෂණ පැහැදිලි කරන්න.
- නිර්මාණය සඳහා භාවිත මාධ්‍ය, තාක්ෂණික ක්‍රමවේද සහ ශිල්ප ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ගෘහ නිර්මාණ අංගයක් ලෙස වටදා ගේ නිර්මාණයේ කලාත්මක ලක්ෂණ අගයන්න.

**නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.6 : අනුරාධපුර සහ පොලොන්නරු යුගවල වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.6.5 : පොකුණු නිර්මාණ අගයමු.**
- **අනුරාධපුර කුට්ටම් පොකුණ**
- **ඉසුරුමුණි රන්මසු උයනේ පොකුණ**
- **පොලොන්නරුවේ කුමාර පොකුණ**
- **පොලොන්නරුවේ නෙළුම් පොකුණ**

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : පොකුණු නිර්මාණ දැක්වෙන පින්තූර, වීඩියෝ දර්ශන හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- පොකුණු සැලසුම්කරණය හා තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ සාකච්ඡා කරයි.
- එම කලා නිර්මාණවල මාධ්‍ය භාවිතය හා ශිල්ප ක්‍රම විමර්ශනය කරයි.
- අනුරාධපුර සහ පොලොන්නරු යුගවල නිර්මාණය වූ පොකුණු පිළිබඳ ව සංසන්දනාත්මක ඇගයීමක් කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **පොකුණු** -
  - **අනුරාධපුර කුට්ටම් පොකුණ** -
    - අභයගිරි විහාර භූමියේ පිහිටා ඇති විශිෂ්ට වාස්තු විද්‍යා නිර්මාණයකි.
    - භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය පිණිස ඉදි කරවා ඇත.
    - පොකුණු දෙකකින් සමන්විත වේ. ඒවා කාල පරිච්ඡේද 02කට අයත් ය.
    - ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුතු මෙම පොකුණු ඔපමට්ටම් කරන ලද ගල් පුවරුවලින් නිර්මාණය කර ඇත.
    - වඩා පැරණි උතුරු පොකුණ ය. එය දකුණු පොකුණට වඩා කුඩා ය.
    - උතුරු පොකුණට බැසීම සඳහා සෝපාණ පන්ති දෙකකි. මකර මුඛ මඟින් එයට ජලය ගලා ගෙන එන අතර එහි රැස් වූ ජලය පොළොව යටින් වූ කාණුවකින් වඩා විශාල දකුණු පොකුණට ගලා යයි.
    - දකුණු පොකුණට බැසීම සඳහා සෝපාණ පන්ති තුනකි.
    - සෝපාණ පන්ති දෙපස පූර්ණ උන්නත ව ගලින් කරන ලද කලාත්මක පුන්කලස් දැකිය හැකි ය.
    - කුඩා පොකුණේ උතුරු දිශාවේ නාග රුව සහිත මුරගලකි.
  - **ඉසුරුමුණි රන්මසු උයනේ පොකුණ** -
    - අක්කර 40ක පමණ භූමි ප්‍රදේශයක පැතිර ඇති රන්මසු උයන පැරණි ඉන්දියාවේ රාජකීය උද්‍යාන ලක්ෂණවලින් යුතු ය.

- ස්නානය කිරීමෙන් ගලා යන අතිරික්ත ජලය පහළින් ඇති මානෙල් මලින් යුතු පොකුණු කරා යන පරිදි සැලසුම් කර ඇත.
- රාජකීයන්ගේ ස්නානය වෙනුවෙන් නිර්මාණය කෙරුණු මඟුල් පොකුණකි.
- තාක්‍ෂණික ක්‍රමවේදවල මෙන් ම කලාත්මක සෞන්දර්යයේ ද සුසංයෝගයකි.
- පොකුණට යාබද ව ඇති ගල් තලාව මත දිය කෙළියේ යෙදී සිටින ඇත් පන්තීන් දැක්වෙන කැටයමකි.
- ස්වාභාවික පරිසරයට උචිත ව එයට අනුවර්තනය වන පරිදි පොකුණ ගොඩනගා තිබීම විශේෂත්වයකි.

- **පොලොන්නරුවේ කුමාර පොකුණ** -
  - මහා පරාක්‍රමබාහු රජුගේ මාළිගයේ මඟුල් උයනේ පිහිටි ශිලාමය පොකුණ යන අරුතින් වංශ කතාවල "ශිලා පොක්ඛරණී" යනුවෙන් හඳුන්වා ඇත.
  - ඇතුළු නුවර ප්‍රාකාරයේ සිට පොකුණට යාම පිණිස ඉහළ සිට පහළට ක්‍රමයෙන් කුඩා වන අයුරින් ශිලා මුහුණතකින් යුතු පියගැට පෙළකි.
  - බටහිර දිශාවෙන් ද පොකුණට බැසීම සඳහා පියගැට පෙළකි.
  - දොරටුව දෙපස සිංහ රූ දෙකකි.
  - බටහිර දිශාවෙන් මකර හැඩය ඇති ජල පිහිලි දෙකකි.
  - අන්තර් භෞමික නළ මාර්ගයෙන් ඇතුල් නුවර ප්‍රාකාර පාදමේ ඇති දිය අගලේ සිට මෙම පොකුණට ජලය ගෙන එනු ලැබේ. නැගෙනහිර දිශාවේ පහළට අභ්‍යන්තරයේ පිහිටි අගල තුළින් තටාකයේ ජලය බැහැර කරනු ලැබේ.
  - පොකුණට සමීප ව වස්ත්‍ර අඳින කාමරයක් පිහිටා ඇත.

- **පොලොන්නරුවේ නෙළුම් පොකුණ** -
  - නෙළුම් මලක හැඩැති සැලසුමකින් යුතු කුඩා ශිලා පොකුණකි.
  - මහා පරාක්‍රමබාහු රජු විසින් අසල පිහිටි ජේතවන විහාරයේ වැඩ විසූ භික්ෂූන් වහන්සේලා උදෙසා තනවන ලද පොකුණක් විය යුතු ය. (වංශ කථාවේ මහා පරාක්‍රමබාහු රජු විසින් නිර්මාණය කළ නෙළුම් පොකුණක් පිළිබඳ සඳහන් වෙයි.)

**ඇගයීම** :
- අනුරාධපුර සහ පොලොන්නරු යුගවල පොකුණු නිර්මාණය සඳහා බලපෑ සාධක විමර්ශනය කරන්න.
- එම යුගවල පොකුණු නිර්මාණය සඳහා භාවිත මාධ්‍ය, ශිල්ප ක්‍රම හා තාක්ෂණික ක්‍රමවේද සාකච්ඡා කරන්න.
- අනුරාධපුර සහ පොලොන්නරු යුගවල පොකුණු නිර්මාණ හා ඒ ආශ්‍රිත කලා අංග පිළිබඳ ව කලාත්මක ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.7** : **ඉසුරුමුණි විහාරය ආශ්‍රිත කලා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.7.1** : **ඉසුරුමුණි කැටයම් අධ්‍යයනය කරමු.**

- **ඉසුරුමුණි පෙම් යුවළ**
- **මිනිසා සහ අශ්ව හිස**
- **රජ පවුල**
- **ජල ක්‍රීඩා කරන ඇත්තු**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : ඉසුරුමුටණියේ කැටයම් දැක්වෙන රූප සටහන්, වීඩියෝ දර්ශන හා වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ඉසුරුමුණි විහාරයේ ඓතිහාසික පසු බිම විස්තර කරයි.
- ඉසුරුමුණි කැටයම් නම් කරයි.
- මෙම කැටයම් නිර්මාණය කිරීම සඳහා බලපෑ විදේශීය කලා ආභාසය පැහැදිලි කරයි.
- ඉසුරුමුණි කැටයම්වල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම සහ කලාත්මක ලක්ෂණ විමර්ශනය කරයි.
- ඉසුරුමුණි කැටයම් පිළිබඳ විවිධ විචාර මත සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- ඉසුරුමුණි විහාරය අනුරාධපුර යුගයට අයත් පැරණි සංඝාරාම පහෙන් එකකි.
- මෙය දක්ඛිණ ථූපයත් රන්මසු උයනේ නැඟෙනහිර දොරටුව ත් අතර තිසා වැව සමීපයේ පිහිටා ඇත.
- අනුරාධපුර යුගයට අයත් මෙම විහාරය දෙවන පෑතිස් රජතුමා විසින් කරන ලදැයි සැලකේ.
- පෙම් යුවළ, මිනිසා සහ අශ්ව හිස, රජ පවුල, ඇත් රූප කැටයම් ඉසුරුමුණි කැටයම් සම්බන්ධයෙන් වැදගත් ය.
- මෙම කැටයම් සඳහා ඉන්දීය ගුප්ත හා පල්ලව කලා සම්ප්‍රදායවල ආභාසය ලැබී ඇත.

- **ඉසුරුමුණි පෙම් යුවළ** -
  - ක්‍රි.ව 4. 5 සියවස්වලට අයත් කැටයමක් යැයි සැලකේ.
  - සතරැස් ගල් පුවරුවක නෙළීමේ ශිල්ප ක්‍රමයට අර්ධ උන්නත ව නිර්මාණය කරන ලද මෙම කැටයමෙන් තරුණ කාන්තාවක හා පිරිමියකු, ආසනයක් මත ඉතා සමීප ව හිඳ සිටිනා ආකාරය නිරූපිත ය.
  - පිරිමි රුවේ යටිකයට පමණක් කෙටි ඇඳුමක් ඇත. කාන්තා රුවේ ඇඳුම දෙපා වළලුකර තෙක් දක්වා ඇත. රූප දෙකෙහි ම ගෙල, දෑත්, සහ දෙපා ආභරණවලින් සරසා ඇත. හිස් පලඳනා ද දක්නට ලැබේ.

- මෙම කැටයමේ කාන්තාවගේ හිසෙන් නිහංචිත මුද්‍රාවත්, දෙනෙත්වලින් නිමිදීත මුද්‍රාවත් දකුණු අතින් ත්‍රිපතාක මුද්‍රාවත් සංකේතවත් කරන අතර , පිරිමි රුවේ හිසින් ආවේත මුද්‍රාවත් දෙ අතින් මයූර මුද්‍රාවත් සංකේතවත් වෙයි.
- අලංකාර වස්ත්‍රාභරණයෙන් යුතු වීම, ජීව ශක්තියෙන් යුතු පිරිපුන් ශරීර, ප්‍රේමය පිළිබඳ භාවාත්මක හැඟීම්, තලයට උචිත ලෙස රූප රචනය, රිද්මානුකූල ශාරීරික ඉරියවු, මට සිලිටි නිමාව මෙම කැටයමේ දැකිය හැකි කලාත්මක ලක්‍ෂණයෝ ය.
- පෙම් යුවළ කැටයම පිළිබඳ ව විවිධ මත පවතී. ශිව-පාර්වතී බව, මංජු ශ්‍රී බෝසතාණන්ගේ වේශයක් බව, සෙබළකු හා ඔහුගේ පෙම්වතිය බව එවැනි මත කිහිපයකි.
- ගුප්ත කලා ආභාසය සහිත නිර්මාණයකි.
- ඉසුරුමුණියේ රන්මසු උයනෙන් හමු ව ඇති මෙම කැටයම ඉසුරුමුණියේ පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.

- **මිනිසා සහ අශ්ව හිස** -
  - ඉසුරුමුණි විහාරයේ පිහිටි පොකුණට යාබද ව පිහිටි ස්වාභාවික ගල් පර්වත බිත්තියේ ඇති මෙම කැටයම නෙළීමේ ශිල්ප ක්‍රමයට අනුව අර්ධ උන්නත ව නිර්මාණය කර ඇත.
  - ඉදිරිය බලාසිටින විලාශයක් දක්වෙන පිරිමි රුවේ ඉරියවුව 'මහා රාජ ලීලාසන' ලෙස හැඳින්වේ.
  - ඔහුගේ දකුණු බාහුවට ඉහළින් අශ්වයකුගේ හිසක් දක්වා ඇත.
  - සමස්ත කැටයම චාම් බවකින් යුතු ය. කෙටි ඇඳුමක් සහිත පිරිමි රුවෙහි හිස්වැස්මක් ද කන්වල හා අත්වල ආභරණ ද දක්වා ඇත. ඔහුගේ දකුණු බාහුවේ පටලවාගත් ලණුව අශ්වයාට සම්බන්ධ වේ.
  - රිද්මානුකූල ඉරියවු, මටසිලිටි නිමාව, භාවාත්මක හැඟීම් ප්‍රකාශනය, දක්ෂ රූප රචනය මෙම කැටයමේ විශේෂ ලක්ෂණ අතර වේ.
  - ප්‍රතාපවත් බව , චාම් ස්වභාවය හා දිගටි මානව හැඩතලවල ස්වරූපය නිසා මෙම නිර්මාණය ඉන්දීය පල්ලව කලා සම්ප්‍රදායයේ බලපෑම ලැබූ නිර්මාණයක් යැයි සැලකේ.
  - මිනිසා සහ අශ්ව හිස කැටයම පිළිබඳ විවිධ මත පවතී. සෙනරත් පරණවිතාන මෙම කැටයමේ මිනිස් රුවෙන් වැස්සට අධිපති පර්ජන්‍ය හා අශ්ව රූපයෙන් අග්නි නිරූපණය වන බව පවසා ඇත.
  - යුද සෙබළකු, සෙනෙවියකු, කපිල ඍෂිවරයා මෙම මිනිස් රුවෙන් නිරූපණය වන බව සෙසු විචාරක මතවලින් පැවසේ. එබැවින් මෙහි අනන්‍යතාව තවමත් විවාදාපන්න ය.

- **රජ පවුල** -
  - රජ පවුල නමින් හැඳින්වෙන මෙම නිර්මාණය අර්ධ කවාකාර ගල් පුවරුවක අර්ධ උන්නත ශිල්ප ක්‍රමයට නිමවා ඇත.
  - කැටයම මධ්‍යයේ මහා රාජ ලීලාසන ඉරියවුවෙන් හිඳ සිටින පිරිමි රුවකි. මෙම රුව කැටයමේ අනෙක් රූපවලට වඩා විශාල ව දක්වා ඇත. මෙම රුවට දකුණු පසින් තවත් පිරිමි රුවක් හා වම් පසින් කාන්තා රූප දෙකක් වේ. මධ්‍යයේ ඇති ප්‍රධාන රූපයට චාමර සලන මානව රූපයක් පිටු පසින් දක්වා ඇත.
  - තෝරාගත් ගල් තලයට උචිත පරිදි රූප සම්පිණ්ඩනය කර තිබීම කැටයමේ ඇති විශේෂත්වයකි.
  - රිද්මානුකූල ඉරියවු, මටසිලිටි නිමාව, විශිෂ්ට සංරචනය හා භාවාත්මක හැඟීම් ප්‍රකාශනය කැටයමේ ඇති කැපී පෙනෙන කලාත්මක ලක්ෂණ වේ.
  - මෙම කැටයමේ වස්තු විෂය පිළිබඳ විවිධ මත පවතී. රූපවල ඇති ප්‍රභූ බව සහ රාජකීය ඇඳුම් පැලඳුම් නිසා මෙය රාජකීය පවුලක් බව පැවසේ.
  - සෙනරත් පරණවිතාන පවසන්නේ කැටයමේ මැද සිටින රුවෙන් දුටුගැමුණු රජුත් මෙම රූපයට දකුණු පස ඉදිරිය බලා දැත් බැඳ හිඳ සිටින රුවෙන් සාලිය කුමරුත් වම් පස කාන්තා රුවෙන් රජුගේ බිසවත් නිරූපණය වන බව යි. රජුගේ වමත බිසවගේ උකුළ මත තබා ඇත. බිසවගේ යැයි සැලකෙන රුවට වම් පසින් කුඩාවට දක්වා ඇති කාන්තා රූපය අශෝකමාලාගේ බව පවසයි.
  - මෙම කැටයම ඉසුරුමුණි කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.

- **ජල ක්‍රීඩා කරන ඇත්තු -**
  - ඉසුරුමුණියේ විහාරයේ පොකුණට ඉතා ආසන්න ව පිහිටි පර්වත බිත්තියේ නෙළීමේ ශිල්ප ක්‍රමය අනුව අල්ප උන්නත ව විවිධ ඉරියව්වලින් යුතු ඇත් රූප සමූහයක් කැටයම් කර ඇත.
  - පොකුණෙන් දිය නෑම සඳහා පැමිණෙමින් සිටින, ජලයේ බැස දිය නාන, ජල ක්‍රීඩා කරන, හොඬ උස්සා දිය ඉසගන්නා වැනි විවිධ ඉරියව්වලින් යුත් ඇත් රූප දැක ගත හැකි ය.
  - පාර්ශ්වදර්ශී ලෙස නිම වූ ඇත් රූප සහ ඉදිරිපස පෙනුමෙන් යුතු ඇත් රූප ඒ අතර වේ.
  - ඉතා සියුම් නිමාවකින් යුතු ව, ඇතුන්ගේ තාත්ත්වික, ක්‍රියාශීලී, ස්වාභාවික චලන, රිද්ම, මනා ව සම්පිණ්ඩනය කර ඇත.
  - ඉන්දියාවේ පල්ලව කලා සම්ප්‍රදායයට අයත් මහා බලිපුරම්හි ආකාශ ගංගාව රෝහණ කැටයමේ ඇත් රූපවලට මෙහි ඇති රූප සමාන බව විචාරක අදහස යි.
  - මෙවැනි ක්‍රියාකාරී ඇත් රූප සහිත උන්නත කැටයමක් ඉසුරුමුණියේ රන්මසු උයනේ පොකුණ ආශ්‍රිත ව ද දැක ගත හැකි ය.

**ඇගයීම** :

- ඉසුරුමුණි විහාරයේ කලා නිර්මාණයන්හි ඓතිහාසික පසු බිම සහ ඒ සඳහා බලපෑ විවිධ කලා ආභාස පිළිබඳ විමසන්න.
- ඉසුරුමුණි කලා නිර්මාණ සහ ඒ සඳහා භාවිත මාධ්‍ය හා ශිල්ප ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ඉසුරුමුණි කැටයම් ශිල්පියා තම නිර්මාණ සඳහා පදනම් කර ගත් සංසිද්ධි සහ සංකල්ප හඳුන්වා දී ඒවා කලා නිර්මාණ මඟින් එළිදක්වා ඇති ආකාරය (කලාත්මක ප්‍රකාශනය) පිළිබඳ ව ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.8** : **අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.8.1** : **අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු.**

- **මහඉලුප්පල්ලම හිටි පිළිමය**
- **සමාධි බුද්ධ ප්‍රතිමාව**
- **තොළුවිල බුද්ධ ප්‍රතිමාව**
- **පන්කුලිය බුද්ධ ප්‍රතිමාව**
- **අවුකන හිටි පිළිමය**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමාවල ඡායාරූප, විඩියෝ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමා නම් කරයි.
- ශ්‍රී ලංකාවේ බුදු පිළිම නිර්මාණය කෙරෙහි බලපෑ විදේශීය කලා සම්ප්‍රදාය පිළිබඳ ව සාකච්ඡා කරයි.
- අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ අගය කරයි.
- අනුරාධපුර යුගයේ බුදු පිළිම පිළිබඳ ව ඇති විවිධ මතවාද සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- **මහඉලුප්පල්ලම හිටි පිළිමය** -
  - අනුරාධපුරයේ මහඉලුප්පල්ලම ගොවිපොළ භූමියේ තිබී මෙය හමු වී ඇත.
  - මෙම පිළිමය නෙළීම සඳහා හුනුවැලිගල් පාෂාණ විශේෂයක් භාවිත කර ඇත.
  - දකුණු අත කැඩී ගොස් ඇතත් වමත තිබෙන අයුරින් මෙම පිළිමය අභය මුද්‍රාවෙන් යුක්ත වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.
  - ඉන්දීය අමරාවතී බුද්ධ ප්‍රතිමා සම්ප්‍රදායයේ බොහෝ ලක්ෂණ මෙම ප්‍රතිමාවෙන් ප්‍රකට වන බව සෙනරත් පරණවිතානගේ සහ නන්දදේව විජේසේකරගේ අදහස වේ. එම ලක්ෂණ සහිත ව නිර්මාණය කරන ලද ලංකාවේ පැරණි ම හිටි පිළිමය මෙය ලෙස සැලකේ.
  - අමරාවතී සම්ප්‍රදායයේ ප්‍රමුඛ ලක්ෂණ වන ඒකාංශ ලෙස චීවරය යෙදීම, වම් උරහිස මතින් වැටෙන සිවුරු පොට වමත මතින් පාදය දක්වා යොදා තිබීම, දෙපතුල් ආසන්නයේ අඟල් 10ක් පමණ පළලට තිරස් අතට යොදා ඇති සිවුරු පොට යන ලක්ෂණ දැකගත හැකි ය.
  - අඩවන් දෙනෙත් සහිත ඕවලාකාර හැඩැති මුහුණින් ආධ්‍යාත්මික ප්‍රහර්ෂය, කරුණාව සහ මෛත්‍රිය යන ලක්ෂණ ප්‍රකාශ වේ.

- සියුම් රැළි සහිත සිවුරක් යොදා ඇති වුවත් ඒ තුළින් සිරුරේ හැඩය විනිවිද යන බවක් පෙන්වා නැත.
- මෙම පිළිමයේ උස අඩි 6ක් පමණ වේ.
- මෙය ක්‍රි. ව. 2වන සියවසට පමණ අයත් විය හැකි බව සෙනරත් පරණවිතානගේ අදහස යි.

- **මහමෙවුනා උයනේ සමාධි බුදු පිළිමය** -
    - අනුරාධපුරයේ අභයගිරි විහාර සංකීර්ණයට අයත් මහමෙව්නා උයනේ කුට්ටම් පොකුණට සමීප ව මෙම පිළිමය පිහිටුවා ඇත.
    - මෙම බුද්ධ ප්‍රතිමාවෙන් නිරූපණය වන චාම් බව සමඟ මුසු වූ ගැඹුරු ආධ්‍යාත්මික ප්‍රකාශය නිසා මෙය ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ විශිෂ්ටතම බුද්ධ ප්‍රතිමාවක් ලෙස සැලකේ.
    - මුහුණේ ඇති ගැඹුරු ආධ්‍යාත්මික ප්‍රකාශනය, කෙටි උෂ්ණීෂය, දක්ෂිණාවෘත අක්බඹරු හිසකේ, ශරීර හැඩ විදහා දක්වන සිහින් රැළි රහිත තුනී සිවුර, උස් නොවූ ග්‍රීවය යනාදිය ඉන්දීය ගුප්ත සම්ප්‍රදායයට අවේණික ලක්ෂණ වේ. ඒවා මෙම පිළිමයෙන් ද ප්‍රකට වන බැවින් මෙය ගුප්ත සම්ප්‍රදායයේ ආභාසය ලබා නිර්මාණය කරන ලද්දක් යැයි සැලකේ.
    - දෑත සමාධි මුද්‍රාවෙන් ද දෙපා වීරාසන ක්‍රමයට ද දක්වා ඇත. මෙම ප්‍රතිමාවේ උස අඩි 9ක් සහ අඟල් 6කි.
    - කළුගල් මාධ්‍යයෙන් පූර්ණ උන්නත ව නෙළා ඇති අතර අතීතයේ දී මෙහි සියුම් හුනු බදාමයක් යොදා ඒ මත වර්ණ ගන්වා තිබූ බවට සාධක පවතී. නාසය බිඳීයාම නිසා මෑත කාලයක දී එය නැවත ප්‍රතිසංස්කරණය කර තිබේ.

- **තොළුවිල සමාධි බුදු පිළිමය** -
    - අනුරාධපුර තොළුවිල ප්‍රදේශයෙන් සොයාගෙන ඇති නිසා මෙය තොළුවිල බුද්ධ ප්‍රතිමාව ලෙස හැඳින්වේ.
    - සෙනරත් පරණවිතාන මෙම පිළිමය 2 වැනි කස්සප (ක්‍රිස්තු වර්ෂ 650-659) රජුගේ කාලයට එනම්, ක්‍රිස්තු වර්ෂ 7 වන සියවසට අයත් යැයි ප්‍රකාශ කරයි. (එම පිළිමය පළමු ව තැන්පත් කර තිබූ තොළුවිල පටිමාඝරයේ, එසේ සඳහන් කොට තිබීම එයට හේතු වශයෙන් පරණවිතාන ඉදිරිපත් කරයි.)
    - සමාධිමත් බව, කරුණාව, මෛත්‍රිය, උපශාන්ත ගුණය පිළිඹිබු කෙරෙන උසස් භාව ප්‍රකාශනයකින් යුක්ත පිළිමයකි.
    - දෑත ධ්‍යානි මුද්‍රාවෙන් යුක්ත වන අතර, දෙපා වීරාසන ක්‍රමයට පිහිටුවා තිබේ ඇත. අක්බමරු හිසකේ සහ සිහින් උෂ්ණීෂයක් ද යොදා ඇත.
    - රැළි රහිත ව ඒකාංශ ලෙස යෙදූ චීවරය මගින් සිරුර විනිවිද පෙනෙන සේ දක්වෙයි.
    - ඩොලමයිට් පාෂාණයෙන් (Dolamite) නෙළා තිබෙන මෙම ප්‍රතිමාවේ උස අඩි 06ක් පමණ වන අතර, දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.
    - ප්‍රතිමාවේ දක්නට ලැබෙන ලක්ෂණ අනුව ඉන්දියාවේ ගුප්ත කලා සම්ප්‍රදායයේ ආභාසය ප්‍රකට කරයි.

- **පන්කුලිය ප්‍රතිමාව** -

  - අනුරාධපුරයේ පන්කුලිය ප්‍රදේශයේ අශෝකාරාමයෙන් මෙම පිළිමය සොයාගෙන ඇති බැවින් එය පන්කුලිය හිඳි පිළිමය ලෙසින් හැඳින්වේ.
  - මෙම පිළිමය අයත් කාල වකවනුව පිළිබඳ ව විවිධ මතවාද පවතී. පිළිම ගෙයට පිවිසෙන පියගැට පෙළෙහි ඇති, පල්ලව අක්ෂරවලින් කරවා ඇති සෙල්ලිපියට අනුව මෙය ක්‍රිස්තු වර්ෂ 07 වැනි සියවසට අයත් යැයි සැලකිය හැකි ය.
  - මෙහි දෑත්වල කොටස් බිඳී ගොස් ඇත. ඉහළට ඔසවා සිටින දකුණු අත අභය මුද්‍රාවෙන් සහ වමත කටක මුද්‍රාවෙන් යුක්ත බව අනුමාන කළ හැකි ය. දෙපා වීරාසන ක්‍රමයට පිහිටුවා තිබේ.
  - උෂ්ණීෂය මත සිරස්පතක් පිහිටුවා තිබූ බවට සලකුණු දැක ගත හැකි ය.
  - හුණුගල් ප්‍රභේදයකට අයත් මිශ්‍ර පාෂාණ විශේෂයකින් මෙය නිර්මාණය කර තිබෙන බැවින් බොහෝ ප්‍රතිමා ලක්ෂණ ක්ෂය වී ඇති අතර, දැනට ශේෂ ව පවත්නා ලක්ෂණ අනුව කරුණාව, මෛත්‍රිය හා ප්‍රඥාව මුසු වූ ආධ්‍යාත්මික ප්‍රකාශනයක් තිබෙන්නට ඇතිබව පෙනෙන්නට තිබේ. එසේ ම දෙනෙත්වලට මැණික් ඔබ්වා තිබූ බවට සාධක ශේෂ ව පවතී.
  - පිළිමය ඉදිරිපස කොටසේ සිවුරු රැළි ක්ෂය වී ගොස් ඇතත්, පිළිමය පිටුපස කොටසේ ඒකාකාරී නොගැඹුරු සිවුරු රැළි දක්නට ඇත. මෙම ප්‍රතිමාව අඩි 06 අඟල් 09කට ආසන්න උසකින් යුක්ත ය.

- **අවුකන හිටි පිළිමය** -

  - අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාවැව ආසන්නයේ අවුකන ප්‍රතිමාව පිහිටා තිබේ.
  - මෙම පිළිමය අයත් කාල වකවනුව පිළිබඳ ව විවිධ මතවාද පවතින අතර, සෙනරත් පරණවිතානගේ අදහස වන්නේ චූලවංශයට අනුව එය ධාතුසේන රජු රජකම් කළ ක්‍රිස්තු වර්ෂ 455- 473 හෙවත් ක්‍රිස්තු වර්ෂ 5 වැනි සියවසට අයත් බව යි. ෂෝඩර් සහ චන්ද්‍රා වික්‍රමගමගේ මෙය ක්‍රිස්තු වර්ෂ 9 වන සියවසට අතර කාලයට අයත් බව සඳහන් කරති.
  - පිළිමය අඩි 39ක් සහ අඟල් 10ක් පමණ උස වන අතර, එයින් බුදු රජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ සහ දශබල ගුණය දැක්වීමට උත්සාහ දරා ඇත.
  - බුදු රජාණන් වහන්සේට අදාළ ලක්ෂණ වන නිග්‍රෝධ පරිමණ්ඩල කාය (ආරෝහ පරිණාහ දේහ ය), ප්‍රලම්බ බාහු (පිරුණු බාහු), ප්‍රලම්බ කලවා (පිරුණු කලවා), පිරී පවතින පිටි අත්ල හා උරහිස් දෙක, දක්ෂිණාවෘත කෙස් පිඩු, ලම්බ කර්ණ, ඌර්ණ රෝමය, ඉතා සියුම් උෂ්ණීෂය සහ සිරස් පත ආදිය මෙම පිළිමයේ දැකගත හැකි ය.
  - කෙටි උෂ්ණීෂය මත ඇති සිරස්පත පසු ව එක් කළ අංගයක් බවට මතයක් වේ.
  - ස්වාභාවික ගල් පර්වතයක අධිඋන්නත ව නෙළා ඇති මෙම පිළිමය පද්මාසනයක් මත සමභංග ඉරියව්වෙන් වැඩ සිටී (සමභංග ඉරියව්ව යනු ශරීරයේ බර දෙපයට සම ව බෙදීයන සේ ශරීරය ඍජු ව තබාගෙන සිටීම යි).

- දකුණතේ අභය මුද්‍රාව දක්වෙන අතර ඔසවන ලද වමතෙන් වම් උරහිස මතට වැටී ඇති සිවුර අල්ලාගෙන ඇත. චන්ද්‍රා වික්‍රමගමගේ අදහස් කරන්නේ එයින් කටක හස්ත මුද්‍රාව නිරූපණය වන බව යි.

- රිද්මානුකූල සිවුරු රැළි තුළින් සිරුරේ හැඩ විනිවිද පෙනෙන සේ දක්වා ඇත.

- ප්‍රතිමා ලක්ෂණ අනුව මෙය අමරාවතී සම්ප්‍රදායයට අයත් බව සැලකේ.

**ඇගයීම** :

- අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමා නම් කරන්න.

- ශ්‍රී ලංකාවේ බුදු පිළිම නිර්මාණය කෙරෙහි බලපෑ ඉන්දීය කලා සම්ප්‍රදායවල ආභාසය සාකච්ඡා කරන්න.

- අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ව ඇගයීමක් කරන්න.

- අනුරාධපුර යුගයේ බුදු පිළිම පිළිබඳ ව ඇති විචාරාත්මක මත සාකච්ඡා කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.9** : **පොලොන්නරු, ගම්පොළ සහ මහනුවර යුගවල විවිධ ප්‍රතිමා නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.9.1** : **පොලොන්නරුවේ ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා සහ වටදා ගේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : පොලොන්නරුව ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා සහ වටදා ගේ බුද්ධ ප්‍රතිමා දැක්වෙන ඡායාරූප, වීඩියෝ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- පොලොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමා නම් කර ඒවායේ දක්නට ඇති මුද්‍රා, ආසන ක්‍රම, ඉරියවු සහ බලපා ඇති ආගමික සංකල්ප පිළිබඳ විස්තර කරයි.
- පොලොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ අගය කරයි.
- පොලොන්නරු යුගයේ බුදු පිළිම පිළිබඳ ව ඇති විචාරාත්මක මත තර්කානුකූල ව සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **පොලොන්නරුවේ ගල් විහාරයේ වැඩහිඳින විශාල බුද්ධ ප්‍රතිමාව (තොරණ සහිත) -**
  - මෙම බුද්ධ ප්‍රතිමාව ශ්‍රී ලංකාවේ නිර්මාණය වී ඇති ප්‍රතිමා අතර විශේෂවන්නේ එය තොරණක් පසුබිම් කොට නෙළා ඇති බැවිනි. එහෙත් චන්ද්‍රා වික්‍රමගමගේ එය තොරණක් නොව ආසනයේ ඇන්ද විය හැකි බව ප්‍රකාශ කරයි.
  - අඩි 15ක් පමණ උස මෙම ප්‍රතිමාව වීරාසන ක්‍රමයට වැඩ සිටින අතර දෑත ධ්‍යාන මුද්‍රාවෙන් යුක්ත ය.
  - මෙම පිළිමයේ මුහුණ මඳක් වෘත්තාකාර ආකාරයක් ගන්නා අතර නළල පටු ලෙස දක්වා ඇත. අඩවන් දෙනෙත් සහිත මෙම මුහුණින් බුදු රජාණන් වහන්සේගේ මහා කරුණාව සහ ශාන්තභාවය වැනි ගුණාංග ද ප්‍රකාශ වේ. දක්ෂිණාවෘත ව කෙස් කැරලි දක්වා තිබේ. එමෙන් ම හිස් මුදුනෙහි සිහින් උෂ්ණීෂයක් දක්වා ඇත.
  - අලංකාර ද්විත්ව රැළි සහිත සිවුර සිරුරට ඇළී ඇති ආකාරයක් පෙන්නුම් කරයි.
  - මෙම පිළිමය වැඩ හිඳින ආසනයේ වජ්‍ර සලකුණු සහ සිංහ රූප අල්ප උන්නත ලෙස කැටයම් කර තිබේ. එම ආසනය මත විවෘත පද්මයකි.

- පිළිමය පිටුපස තොරණකි. මෙම තොරණේ හරස් බාල්ක තුනෙහි කෙළවර මකර මුඛ අල්ප උන්නත ව කැටයම් කර ඇත. පිළිමය පිටුපස ඇති අර්ධ වෘත්තාකාර ආරුක්කුවේ පිපුණ නෙළුම් මල් 10කි. එමෙන් ම මෙම ආරුක්කු හැඩය සහිත කොටසේ දෙපස විමාන දෙක බැගින් දක්වා ඇති අතර ඒවායේ වැඩ හිඳින බුද්ධ ප්‍රතිමා කැටයම් කර තිබේ.

- මෙය මහායාන බුදු දහමේ සංකල්ප අනුව නිමවා ඇති බව චන්ද්‍රා වික්‍රමගමගේ ප්‍රකාශ කරයි. කුඩා විමාන තුළ ඇති ප්‍රතිමා සහ ප්‍රධාන පිළිමය සමඟ මෙහි පිළිම පහකි. ඒවා මහායන බුද්ධාගමේ එන පංච ධ්‍යානි බුදුවරුන් සංකේතවත් කරන බව ඔහුගේ අදහස යි.

- **පොලොන්නරුවේ ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ ඇති වැඩහිඳින බුද්ධ ප්‍රතිමාව (ඡත්‍රය සහිත)** -

  - පොලොන්නරුවේ ගල් විහාරයේ ඇති බුද්ධ ප්‍රතිමා අතරින් මෙය සුවිශේෂ වන්නේ, එය කපා සකස් කරන ලද ලෙනක් තුළ නිර්මාණය කර ඇති බැවිනි. මෙවැනි ආකාරයේ බුදු පිළිම ශ්‍රී ලංකාවේ ඉතා දුලබ ය.

  - අඩි 4යි අඟල් 7ක් පමණ උස මෙම ප්‍රතිමාව, වීරාසන ක්‍රමයට වැඩ සිටින අතර දෑත ධ්‍යාන මුද්‍රාවෙන් යුක්ත ය.

  - පිළිමය වැඩසිටින ආසනයේ සිංහ රූප දෙකක් සහ වජ්‍ර රූප දෙකක් අල්ප උන්නත ව කැටයම් කොට තිබේ. පිළිමය පිටුපස කුඩා තොරණකි. එහි හරස් බාල්ක කෙළවර මකර මුවකි. පිළිමය දෙපස දේව රූප දෙකක් වේ. පිළිමයට ඉහළින් ඇති දේව රූප බ්‍රහ්ම සහ විෂ්ණු ලෙසින් හඳුනාගෙන ඇත. එමෙන් ම බුදු පිළිමයට ඉහළින් පිහිටි ගලෙහි නෙළන ලද විශාල ඡත්‍රයකි.

  - මෙම පිළිමයේ මුහුණ මඳක් වෘත්තාකාර හැඩයක් ගන්නා අතර නළල පටු ලෙස දක්වා ඇත. අඩවන් දෙනෙත් යුතු මුහුණින් බුදුන්ගේ මහා කරුණාව සහ ශාන්තභාවය වැනි ගුණාංග ප්‍රකාශ වේ. දක්ෂිණාවෘත මඳක් ගැඹුරු කෙස් කැරලි දක්වා තිබේ. එමෙන් ම හිස් මුදුනෙහි සිහින් උෂ්ණීෂයක් දක්වා ඇත. සිවුරු රැළි ද්විත්ව රේඛීය ව යොදා ඇති අතර එය සිරුරට ඇලී ඇති ආකාරයක් පෙන්නුම් කරයි.

  - මෙම බුදු පිළිමය පිහිටි කුටිය කුඩා ප්‍රතිමා ගෘහයක ස්වරූපය ගනී. එහි බිත්තියෙහි පොලොන්නරු යුගයට අයත් බිතු සිතුවම් ද දක්නට ලැබේ.

- **ගල් විහාරයේ හිටි පිළිමය** -

  - ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමා I වැනි පරාක්‍රම බාහු රජුගේ කාලයට (ක්‍රි.ව. 1153-1186) අයත් බව චූලවංශයේ සඳහන් වේ. එහෙත් චූලවංශයේ ඇති පිළිම අතර මේ හිටි පිළිමය පිළිබඳ ව සඳහන් නොවේ.

  - පිහිටි ගලක අධිඋන්නත ආකාරයට නෙළා ඇති මෙම ප්‍රතිමාව ත්‍රිභංග ඉරියවුවෙන් යුක්තවන අතර, පද්මාසනයක් මත පිහිටුවා ඇත. ප්‍රතිමාව අඩි 22යි අඟල් 9ක් පමණ උසින් යුතු ය.

  - දෑත පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාවෙන් යුක්ත බව සෙනරත් පරණවිතාන පවසයි. ප්‍රතිමාව පිළිබඳ විවිධ මත පවතී. මෙය ආනන්ද තෙරුන්ගේ යැයි ඇතැමෙකු පවසන අතර, පද්මාසනයක් මත පිහිටුවා ඇති බැවින් ද එහි දක්වා ඇති මහා පුරුෂ ලක්ෂණ නිසා ද මෙය බුදුන් වහන්සේගේ ම පිළිමයක් යැයි සෙනරත් පරණවිතාන අදහස් කරයි.

  - මෙම පිළිමයේ මුහුණ මඳක් වෘත්තාකාර හැඩයක් ගන්නා අතර නළල පටු ය. අඩවන් දෙනෙත් සහිත මන්දස්මිතයෙන් යුක්ත මෙම මුහුණින් බුදුන්ගේ මහා කරුණාව සහ ශාන්තභාවය වැනි ගුණාංග ප්‍රකාශ වේ.

- දක්ෂිණාවෘත මඳක් ගැඹුරු කෙස් කැරලි දක්වා ඇත. එමෙන් ම හිස් මුදුනෙහි සිහින් උෂ්ණීෂයක් දක්වා ඇත.
- ද්විත්ව රැළි සහිත සිවුර සිරුරට ඇළී ඇති ආකාරයක් පෙන්නුම් කරයි.

- **පොලොන්නරුවේ ගල් විහාරයේ සැතපෙන පිළිමය** -
  - සැතපෙන ඉරියවුවෙන් යුත් මෙම පිළිමය පිළිබඳ විවිධ මතවාද පවතී. මෙම ප්‍රතිමාවෙන් බුදුන්ගේ සැතපෙන ඉරියවුව නිරූපණය වන බවට එක් මතයක් ද, බුදුන්ගේ පරිනිර්වාණය දැක්වෙන බවට තවත් මතයක් ද පවතී.
  - ගල් විහාරයේ ඇති අනෙකුත් පිළිමවල දැක්වෙන පොදු ලක්ෂණ මෙම ප්‍රතිමාවෙන් ද දැක්වේ. මෙය අඩි 46ක් සහ අඟල් 4ක් පමණ දිගින් යුතු ය.
  - ප්‍රතිමාවේ ශීර්ෂය රඳවා ඇති කොට්ටය හිසේ බරට එබී ඇති ආකාරයක් දක්වා ඇත.
  - බුදු සිරි පතුල්වල නෙළුම් මල් මෝස්තර කැටයම් කර ඇත.

- **පොලොන්නරුවේ වටදා ගේ බුද්ධ ප්‍රතිමා** -
  - පොලොන්නරුවේ වටදා ගේ ස්තූපයේ සතර දිශාවේ වැඩ හිඳින බුද්ධ ප්‍රතිමා සතරක් පිහිටුවා තිබේ.
  - ශෛලමය මාධ්‍යය භාවිතය, ධ්‍යානි මුද්‍රාවෙන් යුක්ත දෑත, දෙපා වීරාසන ක්‍රමයෙන් පිහිටුවීම, රැළි රහිත චීවරය, හිසකෙස් රැළි රහිත ව යෙදීම හා උෂ්ණීෂයක් හෝ සිරස්පතක් හෝ නොයෙදී ම මෙම ප්‍රතිමාවල දක්නට ඇති පොදු ලක්ෂණ කිහිපයකි.
  - පොලොන්නරු යුගයේ වෙනත් ප්‍රතිමාවලට වඩා ආධ්‍යාත්මික ගුණයක් මුහුණින් නිරූපණය වීම, රැළි රහිත චීවරය, හිසකෙස් රහිත බව ආදි ප්‍රතිමා ලක්ෂණ නිසා මෙම පිළිම සතර පොලොන්නරු යුගයට පෙර කරන ලද බව සෙනරත් පරණවිතාන සහ කඹුරුපිටියේ වනරතන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරති.

**ඇගයීම** :
- පොලොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමා නම් කර ඒවායේ දක්නට ඇති මුද්‍රා, ආසන ක්‍රම, ඉරියවු සහ ඒවාට බලපා ඇති ආගමික සංකල්ප පිළිබඳ ව විස්තර කරන්න.
- පොලොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න.
- මෙම යුගයේ බුදු පිළිම පිළිබඳ ව ඇති විචාරාත්මක මත තර්කානුකූල ව සාකච්ඡා කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.9** : **පොලොන්නරු, ගම්පොළ සහ මහනුවර යුගවල විවිධ ප්‍රතිමා නිර්මාණ පිළිබඳ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.9.2** : **පොලොන්නරුවේ පොත්ගුල් විහාර ප්‍රතිමාව අධ්‍යයනය කරමු.**

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : පොලොන්නරුවේ පොත්ගුල් විහාර ප්‍රතිමාව දැක්වෙන රූප සටහන් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් ඵල** :
- පොලොන්නරු පොත්ගුල් විහාර ප්‍රතිමාව නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ අගය කරයි.
- පොලොන්නරු පොත්ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳ ව ඉදිරිපත් වී ඇති මත තර්කානුකූල ව විචාරය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **පොලොන්නරුව පොත්ගුල් විහාර ප්‍රතිමාව** -
  - මෙම ප්‍රතිමාව පරාක්‍රම සමුද්‍රය අසල පොත්ගුල් විහාරය ඉදිරිපිට පිහිටි ගලක අධි උන්නත ක්‍රමයට නෙළා ඇත.
  - ත්‍රිභංග ඉරියව්වෙන් යුක්තවන මෙය වම්කකුලට ශරීරයේ බර දී සිටින සේ නිර්මාණය කර ඇත. සමස්ත ප්‍රතිමාවෙන් ප්‍රතාපවත් බවක් දිස් වේ.
  - ප්‍රතිමාව දෑතෙහි යම් වස්තුවක් දරා සිටී. ඒ දෙස කල්පනාකාරී ස්වරූපයකින් බලා සිටී.
  - ළය පෙදෙස දක්වා වැටී ඇති යටි රැවුලකින් හා මුඛය දෙපසින් පහතට වැටෙන සේ දක්වා ඇති උඩු රැවුලකින් යුතු ය.
  - රැළි සහිත දෝතිය වැනි යටිකය ඇඳුමෙහි ද්විත්ව රේඛා දක්වා ඇත. ඉදිරියට ගැටයක් දමා බැඳ ඇති ආකාරයකින් යුත් බඳ පටියකි. හිසෙහි උස් වූ මකුටයක් ද වේ.
  - මෙම ප්‍රතිමාවේ අනන්‍යතාව පිළිබඳ ව විවිධ මතවාද පවතින අතර, ආභරණ, ඉරියව්, ප්‍රතිමාවේ ඇති ප්‍රතාපවත් බව, දෑතෙහි ඇති වස්තුව යන කරුණු පදනම් කර ගෙන මෙම ප්‍රතිමාව පැරකුම් රජුගේ, පුලස්ති ඍෂිවරයාගේ, කපිල ඍෂිවරයාගේ නැතහොත් අගස්ති ඍෂිවරයාගේ බවට මතවාද කිහිපයක් ඉදිරිපත් ව ඇත.

**ඇගයීම** :
- පොලොන්නරුවේ පොත්ගුල් විහාර ප්‍රතිමාව නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා කලාත්මක ලක්ෂණ සාකච්ඡා කරන්න.
- පොලොන්නරුවේ පොත්ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳ ව ඇති විචාරාත්මක මත විස්තර කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.9** : පොලොන්නරු, ගම්පොළ සහ මහනුවර යුගවල විවිධ ප්‍රතිමා නිර්මාණ පිළිබඳ අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 7.9.3** : ගම්පොළ සහ මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කරමු.
- ගඩලාදෙණිය හිඳි බුද්ධ ප්‍රතිමාව
- ලංකාතිලක හිඳි බුද්ධ ප්‍රතිමාව
- දඹුල්ල බුද්ධ ප්‍රතිමා

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : ගඩලාදෙණිය, ලංකාතිලක සහ දඹුල්ල බුද්ධ ප්‍රතිමා දැක්වෙන රූප සටහන්, වැඩසටහන් හා ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර, ප්‍රක්ෂේපණ යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ගම්පොළ සහ මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා විශේෂ ලක්ෂණ උදාහරණ ඇසුරෙන් විස්තර කරයි.
- ගම්පොළ සහ මහනුවර යුගයේ ප්‍රතිමාවල දැකගත හැකි කලාත්මක ලක්ෂණ උදාහරණ ඇසුරෙන් විචාරාත්මක ව සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : පැවරුම් ක්‍රමය/ ව්‍යාපෘති ක්‍රමය/ කණ්ඩායම් ක්‍රමය ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වර්තා ඉදිරිපත් කිරීම/කලාකෘති පිටපත් ඇගයීම/සාකච්ඡා ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **ගම්පොළ සහ මහනුවර යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා -**
  - ක්‍රි. ව. 1600- 1800 දක්වා කාල වකවනුවේ දී බුද්ධ ප්‍රතිමා කලාව කෙරෙහි දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායයන්හි ආභාසය බහුල ව ලැබී තිබේ.
  - පොලොන්නරු යුගයේ ඇති වූ චෝල බලපෑම් ගම්පොළ යුගයේ සිට මහනුවර යුගය තෙක් වූ බුද්ධ ප්‍රතිමා කලාව කෙරෙහි ද මහත් බලපෑමක් සිදු කොට ඇති බව පෙනේ.
  - අනුරාධපුර සහ පොලොන්නරු යුගවල බුද්ධ ප්‍රතිමාවල වූ උපශාන්ත, කරුණාබර, ස්වරූපය වෙනුවට කේතුමාලා, ප්‍රභාමණ්ඩලය හා මකර තොරණ වැනි වෙනත් බාහිර ලක්ෂණ බුදු පිළිමයට ආරෝපණය වීම ගම්පොළ යුගයේ සිට ම සිදු විය.
  - ගම්පොළ හා මහනුවර යුගවල නිර්මිත බුදු පිළිමවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ අතර, උස් වූ සිරස්පත, තරංගාකාර රැළි / දිය රැළි ආකාරයේ සිවුරු රැළි, වෘත්තාකාර හැඩැති පළල් මුහුණ හා පටු නළලත විශේෂිත ය. ගම්පොළ යුගයට ම ආවේණික ලක්ෂණයක් ලෙස පූර්ණ විවෘත දෙනෙත් දැක්වීම දැක ගත හැකි ය.

- **ගඩලාදෙණිය හිඳි බුද්ධ ප්‍රතිමාව** -

    - ගම්පොළ යුගයට අයත් ගඩලාදෙණි විහාරයේ ගර්භ ගෘහය තුළ හිඳි බුදු පිළිමයට අමතර ව හිටි පිළිම සතරක් ද දක්නට ලැබේ. මෙම ප්‍රතිමා මහනුවර සම්ප්‍රදායේ දක්නට ලැබෙන ප්‍රතිමා ලක්ෂණ පිළිබිඹු කරයි.

    - හිඳි ප්‍රතිමා ගණයට අයත් මෙම ප්‍රතිමාවෙන් දිගින් අඩු වූ වෘත්තාකාර හැඩැති මුහුණ, පටු නළලත, විශාල දෙතොල් සහ දෙනෙත් හා කෙටි නිකට වැනි ලක්ෂණ ප්‍රකට වෙයි.

    - බුදු කෙනකුගේ මුහුණින් ප්‍රකාශ විය යුතු කරුණාව, මෛත්‍රිය වැනි භාවයන් ගෙන් සමන්විත ආධ්‍යාත්මික ප්‍රකාශයක් මෙම බුද්ධ ප්‍රතිමාවේ එතරම් ම දැකිය නොහැකි ය.

    - බුදු පිළිමයේ හිස මත උස් වූ සිරස්පතක් යොදා තිබෙන අතර ගැඹුරු දක්ෂිණාවෘත කෙස් කැරලිවලින් හිස සරසා තිබේ.

    - මෙම යුගයේ දී බුද්ධ ප්‍රතිමාවල කැපීපෙනෙන තවත් ලක්ෂණයක් වූ විශාල රැස්වළල්ල යොදා තිබීම ද දැක ගත හැකි ය.

    - වීරාසන ක්‍රමයට වැඩ හිඳින බුදු පිළිමයේ ඒකාංශ කරන ලද ගනකම් සිවුරේ රැළි තරංගාකාර ය.

    - බුද්ධ ප්‍රතිමාවට පිටුපසින් වර්ණ ගන්වන ලද අලංකාර මකර තොරණකි.

    - මෙම පිළිමය ගඩොළින් හා බදාමයෙන් සකස් කර වර්ණ ගන්වා ඇත.

- **ලංකාතිලක හිඳි බුද්ධ ප්‍රතිමාව** -

    - ගම්පොළ යුගයට අයත් මෙම හිඳි බුද්ධ ප්‍රතිමාව ලංකාතිලක විහාරයේ ප්‍රතිමා ගෘහයේ වැඩ සිටියි.

    - වීරාසන ක්‍රමයෙන් වැඩ සිටින ප්‍රතිමාව ධ්‍යාන මුද්‍රාවෙන් යුතු ය. උෂ්ණීෂය මත සිරස් පතක් දැකගත හැකි ය.

    - බුදු රජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ මතු කිරීමට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත. විවෘත දෙනෙත්, ඍජු දැඩි කාය ස්වරූපය හා සිවුරේ රැළි තරංගාකාර ව දැක්වීම එම ලක්ෂණ අතර විශේෂිත ය.

    - ප්‍රතිමාවට පිටු පසින් මල් ලියකමින් සැරසිලි කරන ලද මකර තොරණක් වේ.

- **දඹුල්ල රාජමහ විහාරයේ බුද්ධ ප්‍රතිමා** -

    - ශ්‍රී ලංකාවේ එක් විහාරස්ථානයක් තුළ දැකිය හැකි විශාල ම බුද්ධ ප්‍රතිමා සංඛ්‍යාව මෙන් ම මහනුවර යුගයට අයත් විශාලතම බුද්ධ ප්‍රතිමා සංඛ්‍යාව ද දැකිය හැක්කේ දඹුලු ලෙන් විහාරය තුළ ය.

    - දඹුළු විහාරයේ ප්‍රතිමාවල මුහුණේ ප්‍රකාශනය ඉහත විස්තර කළ ගම්පොළ යුගයේ ප්‍රතිමාවලට වඩා සෞම්‍ය ලක්ෂණ ප්‍රකට කරයි.

- විවෘත විශාල දෙනෙත් වෙනුවට මඳක් විශාල දෙනෙත් දක්වා ඇත. බොහෝ දුරට ප්‍රතිමා ප්‍රමාණ අනුගමනය කොට තිබීම නිසා පිළිමවල අස්වාභාවික බවක් දිස් නොවේ.
- සෑම ප්‍රතිමාවක ම දක්ෂිණාවෘත ගැඹුරු කෙස් කැරලි සහ උස් වූ සිරස්පත දැකිය හැකි වේ.
- බොහෝ පිළිම දැව කඳන්වලින් නිර්මාණය කොට ඒ මත හුනු බදාම තවරා වර්ණ කොට ඇති අතර අනෙකුත් පිළිම ගඩොළු සහ හුනු බදාම භාවිතයෙන් නිර්මාණය කර ඇත.
- මෙම බුදු පිළිමවල ද ඒකාංශ කරන ලද ගනකම් සිවුරේ රැළි තරංගාකාර ව යොදා තිබීම දැකිය හැකි ය.

**ඇගයීම** :

- ගම්පොළ සහ මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම හා විශේෂ ලක්ෂණ උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.
- ගම්පොළ සහ මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමාවල දැකගත හැකි කලාත්මක ලක්ෂණ තෝරාගත් නිර්මාණ ඇසුරෙන් විචාරයට ලක් කරන්න.
- අනුරාධපුර සහ පොළොන්නරු යුගවල බුද්ධ ප්‍රතිමා නිර්මාණවලට සාපේක්ෂ ව ගම්පොළ සහ මහනුවර යුගවල බුද්ධ ප්‍රතිමා නිර්මාණවල දැකගත හැකි වෙනස්කම් පිළිබඳ ව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.10** : **ශ්‍රී ලංකාවේ ලෝහ කලා නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.10.1** : **ලෝහ කලා නිර්මාණ අධ්‍යයනය කරමු.**

- **අර්ධනාරී නටේශ්වර**
- **අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව**
- **මාලා තාරා**
- **දැදිගම කොටවෙහෙර ඇත් පහන**
- **නටරාජ**
- **ශිව සෝමස්කන්ධමූර්ති**

**කාලච්ඡේද** : 03 යි.

**ගුණාත්මක යෙදවුම්** : ලෝහ මූර්ති දැක්වෙන රූප සටහන් සහ සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ශ්‍රී ලංකාවේ තෝරාගත් ලෝහ නිර්මාණවල ආගමික පසුබිම සහ සංකල්ප භාවිතය විස්තර කරයි.
- එම නිර්මාණවල මාධ්‍ය, තාක්ෂණික ක්‍රමවේද හා කලාත්මක ලක්ෂණ සාකච්ඡා කරයි.
- ලෝකඩ භාවිතයෙන් කළ කලා නිර්මාණ අගයයි, රසවිඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : ව්‍යාපෘති ක්‍රමය/සාකච්ඡා ක්‍රමය/පැවරුම් ක්‍රමය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- අර්ධනාරී නටේශ්වර -
  - අනුරාධපුර යුගයේ අවසාන කාලයට (7 -8 සියවස්වලට) අයත් මෙම ප්‍රතිමාව අභයගිරි විහාර සංකීර්ණයෙන් හමු වී ඇත.
  - ප්‍රතිමාවේ දකුණු අර්ධය ස්ත්‍රී රුවක් ලෙස, එයට අදාළ ඇඳුම් පැලඳුම්වලින් ද වම් අර්ධය පුරුෂ රුවක් ලෙස ද නිර්මාණය කර ඇත.
  - සමස්ත මූර්තිය වම්පසට ඇල වී රිද්මානුකූල ඉරියව්වකින් සිටගෙන සිටියි.
  - දෑත් සතරක් දක් වේ. ස්ත්‍රී පාර්ශ්වයේ එක් අතක් රිද්මානුකූල ව පහතට යොමුවී ඇත. අනෙක් අතෙහි සංඛයකි.
  - පිරිමි පාර්ශ්වයෙහි දෑත්වල නාගයකු පැටලී සිටින ආකාරයක් වේ.
  - ලෝකඩ මාධ්‍යයෙන් වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයට නිර්මාණය කර ඇත.
  - දැනට මෙම ප්‍රතිමාව අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරනු ලැබ ඇත.

- **අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාව** -
  - අනුරාධපුර යුගයේ අවසාන කාලයට (ක්‍රි. ව. 8-9 සියවස) අයත් මෙම ලෝකඩ ප්‍රතිමාව 1968 දී වෙහෙරගල සිරිසඟබෝ විහාරයෙන් හමු වී ඇත.
  - ලෝකඩ මාධ්‍යයෙන් ඝන වාත්තු ක්‍රමයට අනුව පූර්ණ උන්නත ව නිර්මාණය කර ඇත.
  - ප්‍රතිමාවේ ඉරියව්ව, ලලිතාසන සහ රාජ ලීලාසන යන ඉරියව් දෙක එකට එකතු කිරීමෙන් සකසා තිබේ (මහාරාජ ලලිතාසන).

- මැණික් ඔබ්වන ලද අලංකාර ඔටුන්නකින් සමන්විත මෙහි දකුණු අතෙහි කටක හස්ත මුද්‍රාව දැක්වේ. එම අතෙහි නෙළුම් මලක් තිබෙන්නට ඇතැයි අනුමාන කෙරේ.
- ප්‍රතිමාවේ ඉරියවුව සහ ඒ අනුව උදර මාංසපේෂි වෙනස් වන ස්වභාවය නිරූපණය කර ඇති ආකාරය අනුව ශිල්පියාට මානව කාය ව්‍යූහ ලක්ෂණ පිළිබඳ අවබෝධයක් තිබූ බව පෙනේ.
- ලෝකඩ මාධ්‍යයෙන් නිමවා ඇති මෙහි මතුපිට රන් ආලේප කර තිබී ඇත.

- මාලා තාරා -
  - මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම් වැව්තොට අසලින් හමු වී ඇති මෙම කාන්තා දේව රූපය සෙ. මී. 5.4ක් පමණ උසින් යුතු ය.
  - රිදී මිශ්‍රිත ලෝහයකින්  ඝන වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයට නිමවා ඇත.
  - වීරාසන ක්‍රමයෙන් හිඳ සිටින මෙම රුවෙහි හිස වම් පසටත් දෙනෙත් දකුණු පසටත් යොමු වී ඇත.
  - අනන්‍යතාව හඳුනා ගත නොහැකි යම් වස්තුවක් අතින් දරා සිටියි.
  - ත්‍රිකෝණාකාර ව ඉහළට විහිදුණු ජටා මකුටයක් පැලඳ ඇති අතර, ඊට පහළින් නළල් පටියක් ද වේ.
  - යටිකයට දුහුල් සළුවක් ඇඳ ඇති මෙම රුවෙහි උඩුකය නග්න ය. කර්ණාභරණ, ග්‍රීවාභරණ, පාද සලං ආදියෙන් හා දෙඅත් වළලුවලින් ද සරසා ඇත.

- දැදිගම කොටවෙහෙර ඇත් පහන -
  - ක්‍රි. ව. 1951 වර්ෂයේ දී දැදිගම කොටවෙහෙර චෛත්‍ය භූමිය ආසන්නයෙන් මෙම පහන සොයා ගෙන ඇත.
  - ක්‍රි. ව. 11 - 12 සියවසට  අයත් යැයි සැලකේ.
  - උස සෙ.මී. 28.5 පමණ වන මෙම පහන පිත්තල මාධ්‍යයෙන් කුහර වාත්තු ශිල්ප ක්‍රමයට අනුව නිර්මාණය කර ඇත.
  - ඇතකු පිට නැඟී යන රජෙක් ද ඔහු පිටු පසින් සිටින බිසවක් ද පහනින් නිරූපිත ය.
  - පහන එල්ලා තබන දම්වැල නර්තන විලාසයක් දක්වන ස්ත්‍රීන් දෙදෙනෙකුගෙන් සරසා ඇත.
  - පහන දැල්වීම සහ තෙල් ගලායාම සඳහා දියුණු තාක්ෂණික ක්‍රමවේදයක් භාවිත කර ඇත.

- නටරාජ -
  - හින්දු ආගමික නිර්මාණයක් වූ නටරාජ ප්‍රතිමාවෙන් ශිව හෙවත් ඊශ්වර දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසයක් පෙන්නුම් කෙරෙයි.
  - ක්‍රි. ව. 12 වැනි සියවසට අයත් මෙය පොළොන්නරුවේ අංක 01 ශිව දේවාලයයෙන් හමු වී ඇත.
  - ලෝකඩ මාධ්‍යයෙන් ඝන ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයට පූර්ණ උන්නත ව නිර්මාණය කර ඇත.
  - සමබර ව දක්වා ඇති නර්තන විලාසයත්, තාරුණ්‍ය හා ජීව ශක්තියත් සමස්ත නිර්මාණයෙන් පිළිබිඹු  වේ.
  - ශිව දෙවියන් අත් සතරක් සහිත ව දක්වා ඇති අතර ඒවායේ විවිධ සංකේත හා මුද්‍රා දැක්වේ.
    - දකුණු පස ඉහළ හස්තය - උඩැක්කිය/බෙරය
    - දකුණු පස පහළ හස්තය - අභය මුද්‍රාව
    - වම් පස ඉහළ හස්තය - ගිනි සිළුව
    - වම් පස පහළ හස්තය - ගජ හස්ත මුද්‍රාව
  - සමස්ත මූර්තියෙන් ප්‍රකාශිත මුඛ්‍ය අර්ථය වන්නේ විශ්වයේ මැවීම, රැකීම, වැනසීම, නිර්මිත කිරීම, මුදාලීම යන ශිවගේ පංචවිධි ක්‍රියා සමඟ බැඳුණු ශිවගේ බල පරාක්‍රමය සහ හින්දු ආගමික සංකල්ප සංකේතාත්මක ව භාවිත කර ඇති ආකාරය යි.
  - වම් පය ඔසවා නර්තනයේ යෙදෙන ශිවගේ දකුණු පාදය සිරුරේ බර දරා සිටින අතර එම පාදයෙන් පාගාගෙන සිටින වාමන රුවෙන් අවිද්‍යාව සංකේතවත් වෙයි.

- මුළු රූපය ම ගිනි දැල් විහිදෙන ආරුක්කුවක් ඇතුළත පිහිටුවා ඇත. මෙම ආරුක්කුව ඇරඹෙන්නේ පද්මාසනයක් මත පිහිටුවා ඇති බද්ධ කරනු ලැබූ මකර මුඛවලිනි.
- මෙම මූර්තිය කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

- **ශිව සෝමස්කන්ධමූර්ති (ශිව - පාර්වතී)** -
  - පොළොන්නරු යුගයට අයත් අංක 05 ශිව දේවාලයයෙන් හමු ව ඇත.
  - ලෝකඩ මාධ්‍යයෙන් පූර්ණ උන්නත ව නෙළා ඇති මෙම ප්‍රතිමාවෙන්, පද්ම පීඨිකාවක් මත වාඩි වී සිටින ශිව සහ පාර්වතී දේවිය නිරූපණය වෙයි.
  - ප්‍රතිමාවේ පාර්වතීගේ රූපය පරිමාණානුකූල ව ශිවගේ රූපයට වඩා කුඩා වන අතර ඔවුන් දෙදෙනා අතර අන්තර් සම්බන්ධතාව මනාව ගොඩනඟා ඇත.
  - ශිවගේ ඉදිරි දකුණතින් අභය මුද්‍රාවත් වමතින් වරද මුද්‍රාවත් දැක්වෙයි. එසේ ම ඔහුගේ පසු පස දකුණත කෙටේරියක් සහ වමත මුවකුගේ රුවක් දරා සිටී. පාර්වතී ඇගේ දකුණතින් නිල් මානෙල් මලක් රැගෙන සිටී. එයින් ඇය නිල් මානෙල්වලින් උපත ලද බව සංකේතවත් වෙයි.
  - මොවුන් දෙදෙනාගේ පාද ලලිතාසන ක්‍රමයට පිහිටුවා ඇත.
  - ශිව - පාර්වතී මූර්ති සමඟ ඔවුන්ගේ පුතා වන ස්කන්ද නිරූපණය කිරීම සම්ප්‍රදාය වුව ද මෙම මූර්තියෙහි එම රුව නැත. එහෙත් එම රූපය යොදන්නට ඇතැයි සිතිය හැකි කුහරය දක්නට ඇත.
  - මෙයින් සංකේතවත් කරන්නේ ස්ත්‍රී පුරුෂ බලයන්ගේ සුසංයෝගය යි. නැතහොත් ද්‍රව්‍ය සහ අධ්‍යාත්ම සුසංයෝගය යි.
  - මෙම මූර්තිය ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

**ඇගයීම** :
- ශ්‍රී ලංකාවේ ලෝහ කලා නිර්මාණ අතර සුවිශේෂ මූර්ති නම් කර එම නිර්මාණ වල වස්තු විෂය සාකච්ඡා කරන්න.
- එම නිර්මාණවල මාධ්‍ය භාවිතය, ශිල්ප ක්‍රම පැහැදිලි කරන්න.
- හින්දු ආගමික සංකල්ප සංකේතවත් ව නිරූපණය කර ඇති ආකාරය හින්දු ආගමික මූර්ති ඇසුරෙන් විග්‍රහ කරන්න.
- ලෝහ මූර්ති නිර්මාණකරණයේ ශිල්පීය කුසලතා හා කලාත්මක ලක්ෂණ උදාහරණ මඟින් විමසන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.11** : **ශ්‍රී ලංකාවේ ඓතිහාසික චිත්‍ර කලාව අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.11.1** : අනුරාධපුර යුගයේ සිතුවම් අධ්‍යයනය කරමු.
- **සීගිරි චිත්‍ර**
- **හිඳගල චිත්‍ර**
- **ගොනාගොල්ල චිත්‍ර**
- **මහියංගණ සෑයේ ධාතු ගර්භයේ චිත්‍ර**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** : සීගිරිය, හිඳගල, ගොනාගොල්ල, මහියංගණ සෑයේ ධාතු ගර්භය යන තැන්හි චිත්‍ර දැක්වෙන ඡායාරූප සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- අනුරාධපුර යුගයේ සිතුවම් නිර්මාණ ඇති ස්ථාන නම් කරයි.
- අනුරාධපුර යුගයේ චිත්‍ර කලාවට බලපෑ ආගමික හා ලෞකික පසුබිම පැහැදිලි කරයි.
- අනුරාධපුර යුගයේ සිතුවම්වල වස්තු විෂයය පිළිබඳ ව විස්තර කරයි.
- අනුරාධපුර යුගයේ සිතුවම්වල ශෛලිය, සංරචනය, ශිල්ප ක්‍රම, තාක්ෂණය, හා මාධ්‍ය භාවිතය පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ කලා කෘති පිටපත් ඇගයීම්/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේද එකක් හෝ කිහිපයක් හෝ භාවිත කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **සීගිරිය** -
  - අනුරාධපුර සමයට අයත් වඩාත් හොඳින් ම ආරක්ෂා වී ඇති සිතුවම් නියැදිය වන්නේ සීගිරි සිතුවම් ය.
  - සීගිරි පර්වතයේ බටහිර බෑවුමෙහි සිතුවම් කර ඇති කාන්තා රූප සමූහය සීගිරි සිතුවම් අතර ඉතා වැදගත් ය. දැනට කාන්තා රූප 22ක් පමණ සුරක්ෂිත ව පවතින අතර අතීතයේ දී මෙයට වඩා විශාල ප්‍රමාණයක් පැවති බව සීගිරි පද්‍යාවලින් පෙනී යයි. මීට අමතර ව සීගිරියේ පහළ ගුහාවල ද ශේෂ වූ සිතුවම් කොටස් දැකිය හැකි ය.
  - සීගිරි පර්වතයේ සිතුවම්වලට මූලික ව ම විෂය වී ඇත්තේ කාන්තා උඩුකය රූප ය. මෙම රූප ප්‍රධාන වශයෙන් කහ සහ නිල් පැහැති වර්ණවලින් හඳුනා ගත හැකි ය.
  - සීගිරි සිතුවම් මූලික ව ම චිත්‍රණය කර ඇත්තේ පෙරදිග සම්භාව්‍ය කලා සම්ප්‍රදායයේ රීති අනුව ය. මෙයට සමාන සිතුවම් ඉන්දියාවේ අජන්තා, භාග් වැනි ස්ථානවලින් ද හමු වේ.
  - කාන්තා රූප බෙහෙවින් ලාලිත්‍යමය ස්වරූපයෙන් යුක්ත ය. පුළුල් උකුළු, පුන් පියයුරු, දිගටි ගෙල, සිහින් අතැඟිලි, දිගටි ඇස් ආදි පෙරදිග කවි සමයේ ස්ත්‍රී ලාලිත්‍යයට අදාළ ලක්ෂණ සිහිගන්වන පරිදි සිතුවම් කර තිබේ.
  - කාන්තා රූප කේවල හා යුගල වශයෙන් දක්වා තිබේ. ඇතැම් කාන්තාවන් අත්වල මල් සහ මල් වට්ටි සහිත ව දක්වා ඇත. බොහෝ රූප තරුණ වුව ද මැදිවියට හා මහලු වියට ආසන්න රූප ද චිත්‍ර අතර දැකිය හැකි ය.

- සීගිරිය පිහිටා ඇත්තේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ඉනාමලුව කෝරලයේ ය. ක්‍රි. ව. 05 වන සියවසේ දී කාශ්‍යප රජු මෙම බලකොටුව ඉදි කර ඇත.
- කලා ඉතිහාසඥයන් විසින් සීගිරි චිත්‍ර ක්‍රි.ව. 5-7 අතර සියවස්වලට ඇතුළත් කරනු ලැබේ.
- සිතුවම් වර්ණ ගැන්වීම සඳහා කහ, රතු, නිල්, ගුරු, කළු යන වර්ණ මූලික ව ම භාවිත කර ඇත. වර්ණ ප්‍රභේදකරණය හා ත්‍රිමාණ ලක්ෂණ දැක්වීම මෙම සිතුවම්වල හඳුනාගත හැකි ය. එසේ ම ප්‍රාණ පූර්ණ රේඛාකරණය සීගිරි සිතුවම්වල විශේෂ ලක්ෂණයකි.
- සීගිරි සිතුවම්වලින් නිරූපණය වන්නෝ කවුරු දැයි යන්න විවාදාපන්න ය. විජ්ජුලතා හා මේඝලතා, මල් වැසි වස්සන දිව්‍ය අප්සරාවන්, කාශ්‍යප රජුගේ අන්තඃපුර ස්ත්‍රීන්, බෝධි සහ උප්පලවණ්ණා (කාශ්‍යප රජුගේ දියණියන්) සහ තාරා දෙවඟනගේ නිරූපණයන් මෙම රූප මඟින් දැක්වෙති යි මේ පිළිබඳ ව ඉදිරිපත් ව ඇති ඇතැම් මතවාදවලින් පැවසේ.

- **හිඳගල** -
  - බුද්ධ රූපයක් චිත්‍රයට නගා ඇති පැරණි ම ශ්‍රී ලාංකේය සිතුවම් නියැදිය හමුවන්නේ හිඳගල විහාරයෙනි. ක්‍රි.ව. 6-7 සියවස්වලට අයත් යැයි සැලකෙන මෙහි දැනට ඇත්තේ විශාල සංරචනයකින් ශේෂ වූ කොටසකි.
  - මෙම සිතුවම් නියැඳියේ බුද්ධ රූප 02ක් ශේෂ ව ඇත. දකුණු පස බුද්ධ රූපය ධර්ම දේශනා කරන විලාසයෙන් විතර්ක මුද්‍රාවෙන් දක්වා තිබේ. වම් පස බුද්ධ රූපය යමක් පිළිගැනීමට සිටින ආකාරයෙන් (ප්‍රතිග්‍රහණ මුද්‍රාවෙන්) දක්වා තිබේ.
  - ශෛලිය වශයෙන් සීගිරි චිත්‍ර සම්ප්‍රදායයෙන් තරමක් වෙනස් ලක්ෂණ පළ කරයි. සීගිරි සිත්තරා මෙන් රේඛාවට සුවිශේෂ ප්‍රමුඛත්වයක් දීමට වඩා වර්ණවලින් ත්‍රිමාණත්වය ගොඩනගමින් ස්වාභාවික ව ඇඳීමට හිඳගල ශිල්පියා උත්සාහ දරා ඇත.
  - මෙහි බුදු රුව සෙසු රූපවලට වඩා විශාල ව දක්වා ඇති හෙයින් එයට සුවිශේෂ ප්‍රමුඛත්වයක් ලැබී ඇත. ඒකාංශ පාරූපණයෙන් බුදු රුව දක්වා ඇත.
  - මෙම සිතුවමෙන් අවස්ථා කිහිපයක් නිරූපණය වන බව අනුමාන කෙරේ. තපස්සු භල්ලුක යන වෙළෙඳුන්ගේ විළඳ - මී පිඬු පූජාව හා දහම් දෙසීමට කෙරෙන සහම්පති මහා බ්‍රහ්මයාගේ ආරාධනය ඒ අතරින් ප්‍රධාන අවස්ථා දෙකකි.
  - හිඳගල පිහිටා ඇත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ය.

- **ගොනාගොල්ල** -
  - විශාල සංරචනයකින් ශේෂ වූ සිතුවම් කොටසක් ගොනාගොල්ලෙන් හමුවේ. මෙහි පුරුෂ රූපයක් හා ස්ත්‍රී රූපයක් හඳුනාගත හැකි ය. ඒවා ක්‍රි.ව. 5-7 සියවස්වලට අයත් යැයි සැලකේ.
  - පුරුෂ රුව ඉදිරිය බලා සිටින අතර වම් අතින් දිගු නටුවක් සහිත පියුමක් දරා සිටින බව පෙනේ. ස්ත්‍රී රුව මෙම පුරුෂ රුවට වන්දනා කරමින් සිටින හෙයින් පුරුෂ රූපය පූජනීය රුවක් බව පැහැදිලි ය. බොහෝ විට බෝධිසත්ත්ව රුවක් බව අනුමාන කෙරේ.
  - පුරුෂ රූපය විශාල ව දක්වා ඇති හෙයින් එයට මූලිකත්වයක් ලැබී තිබේ. එහි අණ්ඩාකාර රැස් වළල්ලක් සහ එක් ඇසක් ශේෂ ව පවතී.
  - ස්ත්‍රී රුව බැතිමතියකගේ ස්වරූපයෙන් දක්වා ඇත. ඇය සිටිනුයේ අංජලී මුද්‍රාවෙන් පුරුෂ රූපයට නමස්කාර කරන විලාසයකිනි. ඇගේ හිසෙහි නාග සලකුණක් සහිත ඔටුන්නකි.
  - සිතුවම සඳහා කහ, රතු, තැඹිලි, කළු වර්ණ කේන්ද්‍රීය ව උණුසුම් වර්ණ මාලාවක් භාවිත කර තිබේ.
  - ගොනාගොල්ල පිහිටා ඇත්තේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ය.

- **මහියංගණ ධාතු ගර්භයේ සිතුවම්** -
  - ධාතු ගර්භ අභ්‍යන්තරයක සිතුවම් කිරීම පිළිබඳ ව මහාවංශයේ ඇති විස්තරය ස්ථිර කරන සාධකයක් ලෙස මහියංගණ ධාතු ගර්භයේ සිතුවම් හඳුනා ගත හැකි ය.
  - මෙම සිතුවම් ක්‍රි.ව. 9-11 සියවස්වලට අයත් යැයි අනුමාන කෙරේ.
  - සම්පූර්ණ සිතුවම ම වර්තමානයේ දී දැකිය නොහැකි අතර විශාල සංරචනයකින් ශේෂ වූ කොටස් සමූහයක් දැනට සංරක්ෂණය කර තිබේ. ශේෂ වී ඇති කොටස් අනුව මෙම සිතුවමින් නිරූපණය වී ඇත්තේ 'බුද්ධත්වය' බව අනුමාන කෙරේ.

- මෙහි එක් සිතුවම් කොටසක බෝධි වෘක්ෂයක් යට වැඩ සිටින බුදුන් වහන්සේ නිරූපණය වෙති. මඳ සිනාවෙන් යුතු බුද්ධ රූපය ඒකාංශ පාරුපණයෙන් යුතු ය. පිටු පසින් මකර ඇඳි සහිත අලංකාර ආසනයකි. බුදුන් වහන්සේට කවාකාර රැස් වළල්ලක් යොදා ඇත.
- මල් වට්ටියක් අතැති ව සිටින විෂ්ණු දෙවියන් දක්වෙන සිතුවම මෙහි ඇති තවත් වැදගත් සිතුවම් කොටසකි. අත් 04ක් සහිත ව පෙනී සිටිති. බෙහෙවින් ලාලිත්‍යමය ඉරියව්වකින් යුක්ත ය.
- රතු, කහ, ගුරු, නිල්, කළු කේන්ද්‍රීය උණුසුම් වර්ණ මාලාවක් භාවිත කර ඇත. රේඛාකරණය මෙහි ප්‍රබල වන අතර රේඛාව මූලික ව අංග ලක්ෂණ මතු කර තිබේ.

**ඇගයීම** :

- අනුරාධපුර යුගයට අයත් සිතුවම් හමු වන ස්ථාන පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.
- සීගිරි සිතුවම්වල වස්තු විෂය පිළිබඳ ව ඉදිරිපත් ව ඇති මතවාද මොනවා දැයි සාකච්ඡා කරන්න.
- අනුරාධපුර යුගයේ ආගමික සිතුවම් කලාවේ තේමා මොනවා දැයි විමසීමක් කරන්න.
- අනුරාධපුර යුගයේ සිතුවම්වල ශෛලිය, සංරචන උපක්‍රම හා කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.11** : **ශ්‍රී ලංකාවේ ඓතිහාසික චිත්‍ර කලාව අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.11.2** : **පොලොන්නරු යුගයේ සිතුවම් අධ්‍යයනය කරමු.**
- **තිවංක පිළිම ගෙයි සිතුවම්**
- **ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ සිතුවම්**
- **දිඹුලාගල මාරාවීදිය සිතුවම්**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** : තිවංක පිළිම ගෙයි, විද්‍යාධර ගුහාවේ සහ දිඹුලාගල මාරාවීදිය සිතුවම් දැක්වෙන ඡායාරූප සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- පොලොන්නරු යුගයේ සිතුවම් දැකිය හැකි ස්ථාන නම් කරයි.
- තිවංක පිළිම ගෙයි සිතුවම්වල වස්තු විෂය පිළිබඳ ව විස්තර කරයි.
- පොලොන්නරු යුගයේ සිතුවම්වල ශෛලිය ලක්ෂණ, සංරචන ක්‍රමවේද සහ සිතුවම් ස්ථානගත කිරීම පිළිබඳ ව පැහැදිලි කරයි.
- පොලොන්නරු යුගයේ සිතුවම්වලට පදනම් වූ සංකල්ප, කලා රීතීන් හා සැලසුම්කරණය විග්‍රහ කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ කලා කෘති පිටපත් ඇගයීම්/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේද එකක් හෝ කිහිපයක් හෝ භාවිත කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **තිවංක පිළිම ගෙයි සිතුවම්** -
  - පොලොන්නරු යුගයට අයත් සිතුවම් වැඩි ම ප්‍රමාණයක් ශේෂ ව පවතින ස්ථානය වන්නේ තිවංක ප්‍රතිමා ගෘහය යි. විශේෂයෙන් ම අතීත විහාර ගෘහයන්හි බෞද්ධ චිත්‍ර සැලසුම්කරණය පිළිබඳ ව අවබෝධ කර ගැනීමට ඉතා ප්‍රයෝජනවත් මූලාශ්‍රයයකි.
  - පිළිම ගෙයි සිතුවම් ස්ථානගත කර ඇත්තේ විශේෂ අනුපිළිවෙළකට ය. එහි බාහිර කොටස් බෝධිසත්ත්ව අවධියටත්, මධ්‍ය කොටස් දිව්‍ය අවධියටත්, ගර්භ ගෘහය හෙවත් අභ්‍යන්තරය බුද්ධත්වයටත් ඉන් පසු අවධියටත් වෙන් කර ඇත.
  - මෙම ප්‍රතිමා ගෘහය 12 වැනි සියවසේ දී පරාක්‍රමබාහු රජු විසින් ඉදි කරන්නට ඇතැයි සැලකේ. එහෙත් පිළිම ගෙයෙහි වර්තමානයේ දී දක්නට ඇති සිතුවම් 12 වැනි සියවසේ දී මෙන් ම පසු කාලීන ප්‍රතිසංස්කරණවලින් ද එක් වූ ඒවා බවට අනුමාන කෙරේ. ගර්භ ගෘහය සහ අන්තරාලය කොටස්වල ඇත්තේ වඩාත් පැරණි ම සිතුවම් ය. ඒවා සම්භාව්‍ය කලා සම්ප්‍රදායයේ ලක්ෂණ ප්‍රකට කරයි.
  - ගර්භ ගෘහයේ සිතුවම් අතර බුදුන් වහන්සේ සංකස්ස නුවරට වැඩම කරන දර්ශනය ඉතා වැදගත් ය. සම්භාව්‍ය සම්ප්‍රදායයෙන් නිරූපිත මෙහි ඉණිමං ත්‍රිත්වයක් දැකිය හැකි ය. බුදුන් වහන්සේට දෙපසින් දෙවිවරු ඡත්‍ර දරා සිටිති. බුද්ධ රූපය ත්‍රිභංග ඉරියව්වෙන් නිර්මිත ය. වමත පහළට හෙළා දකුණතින් විතර්ක මුද්‍රාව දක්වනු ලැබේ.

- අන්තරාලය කොටසේ ඇති දේවාරාධනය ද තවත් වැදගත් නිරූපණයකි. වන්දනා කරන ඉරියව්වලින්, පේළි වශයෙන් දේව රූප සංරචනය කර තිබේ. දෙවිවරු අලංකාර මකුට සහ වස්ත්‍රාභරණයන්ගෙන් දක්වා ඇත.
- තිවංක පිළිම ගෙයි මණ්ඩපය ආශ්‍රිත කොටස්වල ජාතක කතා ඇඳ තිබේ. මේවා ශෛලීන් කිහිපයකින් හමු වේ. මේ නිසා එක ම කාලපරිච්ඡේදයක අඳින ලද ඒවා නොවන බව පෙනී යයි. ජාතක කතා නිරූපණය කර ඇත්තේ බිත්ති පනේලවලට බෙදමින් සංක්ෂිප්ත අඛණ්ඩකථන විලාසයකිනි. මෙහි ඇති හඳුනාගත හැකි ජාතක කතා අතර තේමිය ජාතකය, චුල්ල පදුම ජාතකය, අසංඛවතී ජාතකය. මෛත්‍රීබල ජාතකය, උම්මග්ග ජාතකය (කාල ගෝල කතාව), බන්ධන මොක්ඛ ජාතකය වැදගත් ය.
- රේඛාව කේන්ද්‍රීය ව මෙහි සිතුවම් ගොඩ නගා තිබේ. රතු, කහ, ගුරු, කළු මිශ්‍ර උණුසුම් වර්ණමාලාවක් භාවිත කර ඇත. ආභරණ, ඇඳුම් පැලඳුම්, ශරීරාංග ආදියෙහි විස්තරාත්මක ලක්ෂණ මතු කර ඇත්තේ රේඛාව ඇසුරෙනි.

- **ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ සිතුවම්** -
  - ගල් විහාරයේ ලෙන තුළ පිහිටි ඡත්‍රය සහිත බුදුරුව දෙපසින් විශාල සංරචනයකින් ශේෂ වී ඇති සිතුවම් තීරු 02ක් හමු වේ. එක් තීරුවක ප්‍රමාණය දළ වශයෙන් අඩි 06 x 01 පමණ වේ.
  - මෙහි හඳුනාගත හැකි රූප අතර මලක් අතින් ගෙන සිටින දිගු රැවුළක් සහිත බ්‍රාහ්මණ රූපය වැදගත් ය. මීට අමතර ව මකුටයක් සහ රශ්මි මාලාවකින් යුතු දෙවියකුගේ යැයි සිතිය හැකි රුවක් ද ඇත.
  - මෙම සිතුවම, බුදුරුව පිරිවරා සිටින දෙව් - බඹුන් දැක්වෙන විශාල සිතුවමකට අයත් කොටස් ලෙස අනුමාන කළ හැකි ය.
  - මෙම සිතුවම් පොලොන්නරුවේ තිවංක පිළිම ගෙයි සම්භාව්‍ය සිතුවම් සම්ප්‍රදායට සමාන ලක්ෂණ පළ කරයි. රේඛාව කේන්ද්‍රීය ව සිතුවම් ගොඩ නගා තිබේ.

- **දිඹුලාගල මාරාවීදිය සිතුවම්** -
  - පොලොන්නරු යුගයට අයත් යැයි සැලකෙන මෙහි ගුහා 02ක ශේෂ වූ සිතුවම් කොටස් දක්නට ලැබේ.
  - රේඛාකරණය, වර්ණ භාවිතය, ශෛලිය යන කරුණුවලින් පොලොන්නරු යුගයේ තිවංක පිළිම ගේ චිත්‍රවලට සමානතා දක්වයි. වර්තමානය වන විට මෙම සිතුවම් බෙහෙවින් මැකී ගොස් ඇත.
  - අංක 01 ගුහාවේ බුදු රුවක කොටස් ශේෂ වී ඇත.
  - අංක 02 ගුහාවෙහි සස ජාතකය හා ඇතෙකු හොඬින් අල්වාගෙන සිටින මිනිස් රුවක් සහිත චිත්‍ර කොටසක් ඇත. මෙය ඇතැම්විට වෙස්සන්තර ජාතකයේ කොටසක් විය හැකි ය. ඇත් රුව කෙළිලොල් ස්වභාවයකින් දක්වා ඇත.

**ඇගයීම** :

- පොලොන්නරු යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථාන පිළිබඳ සටහනක් සකස් කරන්න.
- තිවංක පිළිමගෙයි සිතුවම්වල බුද්ධ චරිතය හා බෝධිසත්ව කාලවලට අදාළ ව නිරූපිත වස්තු විෂය පිළිබඳ සාකච්ඡා කරන්න.
- පොලොන්නරු යුගයේ සිතුවම්වල ශෛලීය ලක්ෂණ, සංරචනය හා සිතුවම් ස්ථානගත කිරීම පිළිබඳ විමසීමක් කරන්න.
- පැරණි විහාර මන්දිරයක සිතුවම් සැලසුම්කරණය අවබෝධ කර ගැනීමට තිවංක පිළිම ගෙය කෙතෙක් දුරට ප්‍රයෝජනවත් දැයි සාකච්ඡා කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.11** : **ශ්‍රී ලංකාවේ ඓතිහාසික චිත්‍ර කලාව අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.11.3** : **මහනුවර සම්ප්‍රදායයේ සිතුවම් අධ්‍යයනය කරමු.**

- **උඩරට ශෛලිය**
  - **දෙගල්දොරුව**
  - **මැදවල ටැම්පිට විහාරය**
  - **දඹුල්ල ලෙන් විහාරය**

**කාලච්ඡේද** : 03 යි.

**ගුණාත්මක යෙදවුම්** : දෙගල්දොරුව, මැදවල ටැම්පිට විහාරය සහ දඹුල්ල ලෙන් විහාරයේ සිතුවම් දැක්වෙන ඡායාරූප සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- මහනුවර සම්ප්‍රදායයේ උඩරට ශෛලියට අයත් සිතුවම් සහිත ස්ථාන නම් කරයි.
- මහනුවර සම්ප්‍රදායයේ උඩරට ශෛලියට අයත් සිතුවම්වල ශෛලීය ලක්ෂණ, චිත්‍ර සංරචනය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- මහනුවර සම්ප්‍රදායයේ උඩරට ශෛලියට අයත් සිතුවම්වල තේමා හා එම තේමා විහාර අභ්‍යන්තර තුළ සැලසුම් කර ඇති ආකාරය පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ කලා කෘති පිටපත් ඇඳයීම්/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේද එකක් හෝ කිහිපයක් හෝ භාවිතකොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **උඩරට ශෛලියේ සිතුවම්වල පොදු විශේෂතා -**
  - බෙහෙවින් ම ශෛලිගත ස්වරූපයක් පළ කරන සිතුවම් ය.
  - මූලික ව ම උඩරට රජවරුන්ගේ අනුග්‍රහය සහිත ව දියුණු විය.
  - දෙගල්දොරුව රාජමහා විහාරය, මැදවල ටැම්පිට විහාරය, දඹුල්ල රාජමහා විහාරය, සූරියගොඩ රාජමහා විහාරය, ලේවැල්ලේ ගංගාරාමය, රිදී විහාරය වැනි ස්ථානවල මෙම ශෛලියේ සිතුවම් දැකිය හැකි ය.
  - රේඛාව මූලික චිත්‍ර ශෛලියකි. රූපවල විස්තරාත්මක ලක්ෂණ ද මූලික ව ම රේඛාව කේන්ද්‍රීය ව යොදා ඇත. වර්ණාලේපය සිදු වූයේ පැතලි ආකාරයට ය.
  - රූප බෙහෙවින් ම සංකේතාත්මක ය. එසේ ම චිත්‍රයට අන්තර්ගත කරනු ලැබුයේ අත්‍යවශ්‍ය ම වස්තු පමණකි.
  - පසුතලය රතු පැහැයෙන් පුරවන ලදි. එහි හිස් අවකාශ ශෛලිගත නෙළුම්, සපු, වැටකේ, කඩුපුල් ආදි මල්වලින් පුරවා තිබේ.
  - ත්‍රිමාණ ලක්ෂණ, එළිය අඳුර දැක්වීම, ස්වාභාවික පරිමාණ ලක්ෂණ ආදිය මෙම සිතුවම් සඳහා භාවිත කර නොමැත.
  - බිත්තිය තීරුවලට බෙදා අඛණ්ඩ කථන ක්‍රමයට ඇඳීම මෙම සිතුවම්වල දැකගත හැකි ප්‍රචලිත භාවිතයකි.
  - බොහෝ සිතුවම් සමඟ වස්තු විෂය පැහැදිලි කිරීමට විස්තර පාඨයක් යොදනු ලැබේ.

- සාමාන්‍ය මානව රූප, සත්ව රූප පැති පෙනුමට අඳින ලදි. බුද්ධ රූප, දේව රූප ඉදිරි පෙනුමට ඇඳීම සුලභ ව දැකිය හැකි ය.
- මෙම කාලයට අයත් සිතුවම් මූලික ව ම 18 වන සියවසේ දෙවැනි භාගයේ සහ 19 වැනි සියවසේ මුල උඩරට රාජධානිය ව්‍යාප්ත ව පැවති ප්‍රදේශවලින් හමු වේ.

- **දෙගල්දොරුව රාජමහා විහාරය** -
  - මහනුවර නගරයට ආසන්න ලේවැල්ල තොටුපළ අසල පිහිටි ගල්දොරුවක් සම්බන්ධ කරමින් තනන ලද විහාරයකි.
  - මෙහි සිත්තරුන් 04 දෙනෙකු නිර්මාණකරණයෙහි යෙදී ඇතැයි සැලකේ. ඔවුහු නම් දෙවරගම්පළ සිල්වත්තැන, දේවේන්ද්‍ර මූලාචාරී, හිරියාලේ නයිදේ සහ නීලගම පටබැඳි යන අය යි.
  - මෙහි ඇඳ ඇති වැදගත් ජාතක කථා වන්නේ වෙස්සන්තර, සුතසෝම, මහා සීලව සහ සත්තුභත්ත යන ජාතක කථායි. ඒ අතරින් දෙවරගම්පළ සිල්වත් තැන අඳින ලද වෙස්සන්තර ජාතකය වැදගත් ය. එහි ඇලි ඇතු දන් දෙන දර්ශනය ඉතා ප්‍රකට සිතුවම් කොටසකි.
  - මාර යුද්ධය දර්ශනය සිවිලිමේ ඇති වැදගත් සිතුවම්වලින් එකකි. මෙහි දී බුදුන් වහන්සේ භූමි ස්පර්ශ මුද්‍රාවෙන් පෙනී සිටිති. පසෙකින් මහී කාන්තාව දක්වා ඇත. බුදු හිමියන්ට ඔසවන ලද ඡත්‍රයක් මෙන් පිටු පස ඇති ශෛලිගත බෝධි වෘක්ෂය ඇඳ තිබේ.
  - මාර පිරිසෙහි එක් මාරයකුගේ අතෙහි ආයුධ අතර තුවක්කුවක් ද ඇඳ තිබීම වැදගත් ය.
  - පිළිම ගෙයි අභ්‍යන්තරයෙහි මහනුවර සම්ප්‍රදායයේ ප්‍රතිමා නියෝජනය කරන විශාල සැතපෙන පිළිමයක් ඇත.

- **මැදවල ටැම්පිට විහාරය** -
  - මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ, මැදවල ග්‍රාමයේ පිහිටා තිබේ.
  - මෙය ටැම්පිට විහාරයක් වීම විශේෂිත ය. ගල් ටැම් අටක් සිටුවා ඒ මත දැව සහ වරිච්චි බිත්ති ආධාරයෙන් පිළිම ගෙය තනා තිබේ. එහි ඇතුළු වන දොරටුව දකුණු පසින් පිහිටා තිබේ.
  - පිළිම ගෙයි ඇතුළත අවකාශය සීමා සහිත වුව ද ඉතා වැදගත් සිතුවම් ගණනාවක් දැක ගත හැකි ය. මෙහි ප්‍රධාන තේමා අතර වෙස්සන්තර ජාතකය, උරග ජාතකය, දැක ගත හැකි ය. වෙස්සන්තර ජාතකය අවස්ථා 09කින් ද උරග ජාතකය අවස්ථා 06කින් ද සිතුවමට නඟා තිබේ. උඩරට ශෛලියේ  සිතුවම්වල ලක්ෂණ හොඳින් හඳුනා ගැනීමට ප්‍රයෝජනවත් ස්ථානයකි.
  - මීට අමතර ව සත් සතිය, රහත් පෙරහර, සොළොස්මස්ථාන යන සිතුවම් විහාර බිත්තිවල ඇඳ ඇත. වියනෙහි මෛත්‍රී බෝධිසත්ත්වයන් දෙවියන් සත් දෙනෙකුට ධර්ම දේශනා කරන අයුරු දක්වේ.
  - මෙම සිතුවම් 18 වන සියවසේ දෙවන භාගයට අයත් යැයි සැලකේ.
  - විහාරස්ථානයේ ඉතිහාසය ඉතා පැරණි වුව ද වර්තමාන පිළිම ගෙය හා එහි නිර්මාණ අයත් වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ සමයට හා ඔහුට පසු කාලයට ය. මෙයට අනුග්‍රාහ දැක්වූ දුනුවිල නිලමේවරයාගේ රූපය ද සිතුවම් අතර දැකිය හැකි ය.

- **දඹුල්ල රාජමහා විහාරය** -
  - දඹුල්ල රාජමහා විහාරයේ ඉතිහාසය වළගම්බා සමයට අයත් වේ.  වර්තමානයේ දක්නට ලැබෙන නිර්මාණ කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයට අයත් සේ සැලකේ.
  - දඹුල්ල පිහිටා ඇත්තේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ය.
  - පිළිම ගෙවල් පහකින් මෙහි ලෙන් පන්තිය සකස් වී තිබේ. ඒවා දේවරාජ විහාරය, රාජමහා විහාරය, අලුත් විහාරය, දෙවන අලුත් විහාරය, පශ්චිම අලුත් විහාරය ලෙස හැඳින්වේ.
  - නීලගම පරම්පරාවට අයත් සිත්තරුන් විසින් මෙහි සිතුවම් නිර්මාණය කරනු ලැබ තිබේ. 'නීලගම තුඩපත' නැමැති ලේඛනය විහාර කර්මාන්තය පිළිබඳ තොරතුරු සපයන වැදගත් වාර්තාවකි.
  - මෙහි ලෙන් අංක 02හි සිවිලිමේ ඇඳ ඇති මාර පරාජය ඉතා වැදගත් සිතුවමකි. ඉතා විශාල සංරචනයක් වන මෙහි බුදු රුව භූමි ස්පර්ශ මුද්‍රාවෙන් බෝ මැඩ වැඩ සිටින සේ නිර්මිත ය. ඉතා අලංකාර රශ්මි මාලා සමූහයකින් විචිත්‍රවත් කොට ඇත. බුදු රුව වටා මාර පිරිස දක්වා

තිබෙන අතර බුදුන්ගේ පාමුල ඇතුන් පිටින් වැටෙන මාර දිව්‍ය පුත්‍රයා දක්වේ. පසෙකින් මහී කාන්තාව ද දක්වා ඇත.

- ශ්‍රී ලංකාවේ ඉතිහාසයට අදාළ වැදගත් අවස්ථා රැසක් මෙහි චිත්‍රණය කර තිබේ. විජයාවතරණය, මහින්දාගමනය, ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම, දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම ආදිය ඒ අතුරින් කිහිපයකි.
- අනෝතත්ත විල නමැති සිතුවම ද දඹුලු චිත්‍ර අතර වැදගත් වූවකි.
- මීට අමතර ව බුද්ධ චරිතයේ අවස්ථා, අටමස්ථාන, විවිධ දෙවිවරුන්ගේ රූප ආදිය සිතුවම් අතර හමු වේ.
- දඹුල්ල රාජමහා විහාරයේ හිටි, හිඳි සහ සැතපෙන යන ඉරියව්වලින් යුතු බුද්ධ ප්‍රතිමා ඉතා විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ.
- මෙයට අනුග්‍රාහකත්වය දැක්වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ප්‍රතිමාවක් ද විහාරයේ දක්නට ලැබේ.

**ඇගයීම** :

- මහනුවර සම්ප්‍රදායයේ උඩරට ශෛලියේ සිතුවම් සහිත ස්ථාන දැක්වෙන වගුවක් සකස් කරන්න.
- උඩරට ශෛලියේ සිතුවම්වල ලක්ෂණ මොනවා දැයි සාකච්ඡා කරන්න.
- උඩරට ශෛලියේ සිතුවම්වලට විෂය වූ තේමා පිළිබඳ ව විමසීමක් කරන්න.
- උඩරට ශෛලියේ සිතුවම් ඇඳි ශිල්පීන් ඇඳීම සඳහා බිත්තිය සැකසීම, භාවිත කළ වර්ණ, උපකරණ හා සිතුවම්කරණය පිළිබඳ ව විමසීමක් කරන්න.

**නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.11 : ශ්‍රී ලංකාවේ ඓතිහාසික චිත්‍ර කලාව අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.11.4 : මහනුවර සම්ප්‍රදායේ සිතුවම් අධ්‍යයනය කරමු.**

- **පහතරට ශෛලිය**
  - **කතළුවේ පූර්වාරාමය**
  - **මුල්ගිරිගල විහාරය**
  - **කරගම්පිටියේ සුබෝධාරාමය**
  - **තෙල්වත්ත විහාරය**

**කාලච්ඡේද** : 04 යි.

**ගුණාත්මක යෙදවුම්** : කතළුවේ පූර්වාරාමයේ, මුල්ගිරිගල විහාරයේ, කරගම්පිටියේ සුබෝධාරාමයේ සහ තෙල්වත්තේ විහාරයේ සිතුවම් දැක්වෙන ඡායාරූප සංයුක්ත තැටි, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- මහනුවර සම්ප්‍රදායයේ පහතරට ශෛලියට අයත් සිතුවම් හමු වන ස්ථාන ලැයිස්තු ගත කරයි.
- මහනුවර සම්ප්‍රදායයේ පහතරට ශෛලියට අයත් සිතුවම්වල පොදු විශේෂතා මොනවා දැයි සාකච්ඡා කරයි.
- උඩරට ශෛලියේ සහ පහතරට ශෛලියේ සිතුවම් අතර සමාන - අසමානකම් විමසා බලයි.
- පහතරට සිතුවම්වල වස්තු විෂය පිළිබඳ ව සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ කලා කෘති පිටපත් ඇගයීම්/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේද එකක් හෝ කිහිපයක් හෝ භාවිත කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- **පහතරට ශෛලියේ සිතුවම්වල පොදු විශේෂතා -**
  - ශෛලිය ලක්ෂණවලින් යම් සමානත්වයක් පහතරට ශෛලිය හා උඩරට ශෛලිය අතර ඇත. එසේ ම පහතරට ශෛලියට ආවේණික විශේෂතා රැසක් ද හඳුනා ගත හැකි ය.
  - පහතරට ශෛලියේ සිතුවම් බොහෝ විට විස්තරාත්මක ලක්ෂණ පළ කරයි. විශේෂයෙන් ම චිත්‍රයට නඟන ලද සෑම කොටසක් ම මානව රූපවලින් හෝ පසුබිම් වස්තුන්ගෙන් හෝ පුරවා ඇත.
  - උඩරට සිත්තරුන් පසුබිම් නිරූපණයේ දී ශාඛ ආදියෙහි අනන්‍යතාව නොපෙන්නුව ද පහතරට ශිල්පීන් ශාඛවල අනන්‍යතාව ඇඟවෙන පරිදි නිර්මාණය කර ඇත. කජු, තල්, පුවක්, කොස් ආදි ශාක හඳුනාගත හැකි පරිදි ඇඳ ඇත.
  - මානව ඉරියවු පිළිබඳ සැලකීමේ දී උඩරට සිත්තරුන්ට වඩා ඉරියවු ප්‍රමාණය වැඩි ය. එසේ ම හැඟීම් නිරූපණය ද උසස් ය.
  - යුරෝපීය ගෘහ භාණ්ඩ, ඇඳුම් විලාසිතා, ආභරණ, ගොඩනැගිලි පසුබිම් ආදිය පහතරට ශෛලියේ සිතුවම්වල සුලභ ය.

- උඩරට ඇති සරල සහ රේඛාමය සැරසිලි සහිත ඇඳුම් පැලඳුම් වෙනුවට බෙහෙවින් අලංකාර. විස්තරාත්මක සැරසිලි සහිත ඇඳුම් පැලඳුම් එකතු වී ඇත.
- රතු වර්ණයට අමතර කළු, සහ නිල් වර්ණ පසුබිමට භාවිත වී ඇත.
- පසුබිම් සැරසිලි අංගවලට රෝස, මිදි ඇතුළු යුරෝපීය කලාවේ ආභාසය සහිත සැරසිලි අංග එක් වී ඇත.
- රූපවල ත්‍රිමාණ බව හුවා දක්වීමට මඳ වශයෙන් උත්සාහ ගෙන ඇත.
- 19 වන සියවස කේන්ද්‍රීය ව වර්ධනය වූ සිතුවම් ශෛලියකි. මෙම අවධිය මූල නූතන සමය වශයෙන් ද හඳුන්වනු ලැබේ.

- **කතළුවේ පූර්වාරාමය** -
  - ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ කලාපයේ පිහිටි 19 වන සියවසේ දී ඉදි වූ වැදගත් විහාරස්ථානයකි. මෙහි පැරණි ම සිතුවම් 19 වන සියවසේ මැද භාගයට පමණ අයත් යැයි සැලකේ.
  - මීට අමතර ව අවස්ථා කිහිපයක දී ප්‍රතිසංස්කරණ කටයුතු කෙරී ඇත. ප්‍රධාන පිවිසුම් දොරටුවට ඉහළින් එහි පසුකාලීන සිතුවම් ඇඳීමකට අදාළ 1886 වර්ෂය ලියා ඇත.
  - මෙම විහාරස්ථානයේ බොහෝ සිතුවම් කඩොල්ගල්ල පරපුරේ සිත්තරුන් විසින් අඳින්නට ඇතැයි සැලකේ.
  - මෙහි ප්‍රධාන තේමා අතර මහධන සිටුවරයාගේ කථා වස්තුව, වෙස්සන්තර ජාතකය. කට්ඨහාරී ජාතකය, පටාචාරා කතා වස්තුව ආදිය වැදගත් ය.
  - මෙහි ගර්භ ගෘහයට ප්‍රවිෂ්ට වන ප්‍රධාන දොරටු 02ට ඉහළින් වික්ටෝරියා රැජිනගේ රුව සහිත ව බ්‍රිතාන්‍ය ලාංඡනය ඇඳ තිබේ.
  - සිතුවම් බොහෙවින් සැරසිලි සහිත විස්තරාත්මක ලක්ෂණ පළ කරයි. බටහිර සංස්කෘතියේ ඇඳුම් පැලඳුම්, ගෘහ නිර්මාණාංග, සිරිත් විරිත් විශාල ප්‍රමාණයක් මෙහි හඳුනාගත හැකි ය. මහධන සිටුවරයාගේ කතා පුවත මේ සඳහා මනා නිදසුනකි.

- **මුල්ගිරිගල විහාරය** -
  - හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි වැදගත් විහාරස්ථානයක් වන මෙහි අතීතය අනුරාධපුර සමයට අයත් ය.
  - ගල් පර්වතයක් ආශ්‍රිත ව මට්ටම් කිහිපයකින් මෙහි පිළිම ගෙවල් කිහිපයක් ම පිහිටා තිබේ. ඒවා අතරින් කලා නිර්මාණ පිළිබඳ ව සැලකීමේ දී පදුම රහත් විහාරය, මැද මළුව විහාරය සහ රජමහ විහාරය යන ලෙන් වැදගත් ය.
  - මෙහි ද සිතුවම් ශෛලි කිහිපයක් හඳුනාගත හැකි ය. ඒ අතරින් වඩාත් පැරණි ම යැයි සැලකෙන සිතුවම් හමුවන්නේ රාජමහ විහාරය නමැති පිළිම ගෙයිනි. සෙසු ස්ථානවල හමු වන බොහෝ සිතුවම් 19 වන සියවසේ දී අඳින ලද බව පෙනී යයි.
  - තේලපත්ත ජාතකය, සිවි ජාතකය, වෙස්සන්තර ජාතකය ආදිය මෙහි ඇති ජනප්‍රිය ජාතක කථා අතුරින් කිහිපයකි. මීට අමතර ව බුද්ධ චරිතය සහ විවිධ දේවතා රූප ද දැකිය හැකි ය.
  - තේලපත්ත ජාතකයේ එන 'පෙරහැර දර්ශනය' මුල්ගිරිගල සිතුවම් අතර ඉතා ප්‍රකට සිතුවමකි.
  - මෙහි 19 වන සියවසට අයත් සිතුවම්වල යුරෝපීය ඇඳුම් පැළඳුම්, අපරදිග ගෘහ අලංකරණාංග සහිත පසුතල, යුරෝපීය ගෘහ භාණ්ඩ ආදිය සුලභ ව දැකිය හැකි ය.

- **කරගම්පිටිය සුබෝධාරාමය** -
  - කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල කරගම්පිටියේ පිහිටා ඇත. වත්මන් විහාර ගෙය 19 වන සියවසේ මුල ඉදි කරන්නට ඇතැයි සැලකේ.
  - මෙහි පිළිම ගෙයෙහි සහ ධර්ම ශාලාවෙහි සිතුවම් දැකිය හැකි ය. විශේෂයෙන් ම ධර්ම ශාලාවෙහි ඇති වියන්තල සැරසිල්ල හා පෙරහැර දර්ශනය සැරසිලිමය වශයෙන් වැදගත් නිරූපණ ය.
  - මෙහි ඇඳ ඇති වස්තු විෂය අතර බුද්ධ චරිතය, මහා ජනක ජාතකය, නිමි ජාතකය, කට්ඨහාරී ජාතකය, ඛදිරංගාර ජාතකය, මණිචෝර ජාතකය, උම්මග්ග ජාතකය ආදිය දැකිය හැකි ය.
  - නිමි ජාතකයේ දී එක් එක් පාප කර්මයට හිමි දඬුවම් චිත්‍රයෙන් ඇඳ කවියෙන් ද එය ලියා තිබේ.

- මෙහි ඇති උම්මග්ග ජාතකය 19 වැනි සියවසේ අග භාගයට පමණ අයත් යැයි සැලකේ. එය බටහිර කලාවේ ශෛලිය ලක්ෂණ සහ දෘශ්‍ය අරමුණු රැසක් දැකිය හැකි නිර්මාණයකි.
- මෙහි සැරසිලි අංග අතර සාම්ප්‍රදායික සැරසිලි රටා මෙන් ම බටහිර කලාවේ දැකිය හැකි රෝස මල්, මිදි පොකුරු ආදි නව සැරසිලි මූලයන් ද ඇත.
- බුද්ධ චරිතයට අදාළ අවස්ථා අතර මහාමායා දේවියගේ සිහිනය, සිදුහත් උපත, වප් මඟුල, මාර යුද්ධය, යශෝදරා දේවිය සහ රහල් කුමරු, තපස්සු භල්ලුක විළඳ මී පිඬු පූජා කිරීම ආදිය දැකිය හැකි ය.

- **තෙල්වත්ත විහාරය** -
  - ගාලු දිස්ත්‍රික්කයේ පිහිටි ඉතා වැදගත් විහාරස්ථානයකි. මෙය 'තොටගමු රන්පත් රාජ මහා විහාරය' ලෙසින් ද හැඳින්වේ.
  - දීර්ඝ අතීතයකට හිමිකම් කියන ස්ථානයක් වන මෙහි වර්තමාන පිළිම ගෙවල් 18 වන සියවසේ අගත් 19 වන සියවසේ මුලත් ඉදි කර තිබේ. 1799 සහ 1805 යන වර්ෂ සහිත පිළිම ගෙවල් 02ක් මෙහි දැකිය හැකි ය.
  - මෙහි පැරණි සිතුවම් ගෙයි ශෛලීය ලක්ෂණ උඩරට සිතුවම්වලට නෑකම් කියයි.
  - බුද්ධ චරිතය, දේව ධර්ම ජාතකය, චුල්ල ධම්මපාල ජාතකය අලුත් විහාරගෙයි ඇඳ ඇත.
  - අලුත් විහාරයේ දකුණු බිත්තියේ ඇති 'කාමදේව' ප්‍රතිමාව (අනංග) විශේෂිත වන්නේ එවැනි ප්‍රතිමා විහාරගෘහ තුළ විරල බැවිනි. එක් අතක උක්දඬු දුන්න ද අනික් අතින් ඊතල මිටියක් ද සහිත ව නිරූපණය කර ඇත.
  - මෙම සිතුවම්වල ද යුරෝපීය සැරසිලි රටා, ගෘහ භාණ්ඩ, ගොඩනැගිලි සහිත පසුතල දැකිය හැකි ය.

**ඇගයීම** :

- උඩරට සම්ප්‍රදායයේ පහතරට ශෛලියේ සිතුවම්වල පොදු විශේෂතා මොනවා දැයි සාකච්ඡා කරන්න.
- උඩරට ශෛලියේ සහ පහතරට ශෛලියේ සිතුවම් අතර සමාන - අසමානකම් පිළිබඳ ව සංසන්දනයක් කරන්න.
- පහතරට ශෛලියේ සිතුවම් හමුවන ස්ථාන කවරේ දැයි ලැයිස්තුවක් සකස් කරන්න.
- පහතරට ශෛලියේ සිතුවම්වල වස්තු විෂය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 7.0** | : | **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 7.19** | : | **ඊජිප්තියානු (මිසර) වාස්තු විද්‍යාත්මක නිර්මාණ අධ්‍යයනය කරයි.** |
| **ක්‍රියාකාරකම 7.19.1** | : | **කුෆු සහ කාෆ්රේ පිරමීඩ** (Pyramid of Khufu /Cheops and Pyramid of Khafre) **අධ්‍යයනය කරමු.** |
| **කාලච්ඡේද** | : | 01 යි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර |
| **ඉගෙනුම් පල** | : | • ඊජිප්තු වාස්තුවිද්‍යාව සඳහා පදනම් වූ ඇදහිලි, සංකල්ප පැහැදිලි කරයි.<br>• පිරමීඩයේ විකාශන අවස්ථා නම් කරයි.<br>• පිරමීඩ සැලසුම්කරණය, උපයෝගීතාව, අමුද්‍රව්‍ය හා තාක්ෂණික භාවිතයන් විස්තර කරයි. |
| **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** | : | සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න. |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **ඊජිප්තු වාස්තු විද්‍යාවට පදනම් වූ පසු බිම -**
  - ඊජිප්තු වාස්තු විද්‍යාවට මූලික ව ම පදනම් වූයේ පාරාවෝවරුන්ගේ උත්තර ජීවනය (මරණින් මතු පැවැත්ම) හා සබැඳි ඇදහිලි පද්ධතිය යි.
  - පරාවෝවරු "කා" (Ka)යනුවෙන් හැඳින් වූ ස්වකීය ආත්මය මරණින් මතු ද අඛණ්ඩ පැවැත්මක් ගත කරන බව විශ්වාස කළහ. මේ නිසා ඔවුන්ගේ මාළිගා ආදි ලෞකික ගොඩනැගිලිවලට වඩා මූලිකත්වය දී ගොඩනැගුවේ මරණින් මතු ජීවිතයට අදාළ වූ පිරමීඩ, පර්වත හාරා තැනූ සොහොන් ගැබ්, දේවස්ථාන ආදිය යි.
  - මේ අතුරින් පිරමීඩය සුවිශේෂ වාස්තු විද්‍යාත්මක ඉදි කිරීමක් වන අතර එය මස්ටාබා, තට්ටු/මහල් පිරමීඩ (පඩි පිරමීඩ), සහ පිරමීඩ යන අවස්ථා 03 ක් යටතේ වර්ධනය විය. වඩාත් ප්‍රකට පිරමීඩ හමු වන්නේ පැරණි රාජධානි සමයේ දී ය.
  - නව රාජධානි සමය වන විට පිරමීඩ නිර්මාණය වීමට වඩා දේවස්ථාන සහ පර්වත හාරා කළ සොහොන් ගැබ් ඉදි කිරීමට ප්‍රමුඛත්වය ලැබුණි.

- **කුෆු (චියොප්ස්) පිරමීඩය -**
  - විශාලතම පිරමීඩය වන "කුෆු" පිරමීඩය ක්‍රි. පූ. 2580-2560 අතර කාලයේ දී ගොඩනගන්නට ඇතැයි අනුමාන කෙරේ. මෙහි ආරම්භක උස අඩි 481 ක් පමණ වූ බවට සැලකෙන අතර වත්මන් උස 455 ක් පමණ වේ.
  - මෙම පිරමීඩය කුෆු නමැති පාරාවෝවරයා විසින් ඉදි කරනු ලැබ තිබේ.

- අතීතයේ දී මෙම පිරමීඩයේ මුහුණත්වල මෘදු ගල් පුවරු අල්ලා තිබුණ ද වර්තමානයේ දී ඒවා දක්නට නොමැත.
- පිරමීඩය ප්‍රමාණයෙන් ඉතා විශාල වුව ද එහි අභ්‍යන්තරයේ භාවිතයට ගෙන ඇත්තේ ඉතා සීමිත අවකාශයකි. කුෆු පිරමීඩය ප්‍රධාන කුටි 03කින් සමන්විත ය.

- **කාෆ්රේ පිරමීඩය** -
  - ක්‍රි. පූ. 2570 දී පමණ ගොඩනගන ලද මෙය ඊජිප්තුවේ දෙවැනි විශාලත ම පිරමීඩය යි. උසින් අඩි 448කි. ආරම්භයේ දී මෙය අඩි 471ක උසකින් තිබෙන්නට ඇතැයි සැලකේ.
  - හතර වැනි රාජවංශයේ කාෆ්රේ රජු විසින් තනා තිබේ.
  - කුෆු මෙන් ම කාෆ්රේ පිරමීඩය ද එහි පාරාවෝවරුන්ගේ මරණින් මතු ආත්මයේ පැවැත්ම වෙනුවෙන් තනන ලද අතර, ඔවුන්ගේ මෘත ශරීර මමී (mummy) වශයෙන් තැන්පත් කිරීමට භාවිත වී ඇත.

**ඇගයීම** :
- ඊජිප්තු වාස්තුවිද්‍යාවට පදනම් වූ ඇදහිලි හා සංකල්ප විස්තර කරන්න.
- පිරමීඩයේ ප්‍රධාන ආකෘතික ලක්ෂණවල විකාශන අවස්ථා නම් කරන්න.
- පිරමීඩ සැලසුම්කරණය, උපයෝගිතාව, අමුද්‍රව්‍ය භාවිතය හා එහි තාක්ෂණික භාවිතය පිළිබඳ ව කුෆු සහ කාෆ්රේ පිරමීඩ ඇසුරෙන් පැහැදිලි කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 7.0** | : | **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.** |
| **නිපුණතා මට්ටම 7.19** | : | **ඊජිප්තියානු (මිසර) වාස්තු විද්‍යාත්මක නිර්මාණ අධ්‍යයනය කරයි.** |
| **ක්‍රියාකාරකම 7.19.2** | : | **අබුසිම්බල් හා ලුක්සෝර් දේවස්ථාන** (Temple of Abu Simbel and Temple of Luxor) **අධ්‍යයනය කරමු.** |
| **කාලච්ඡේද** | : | 01 යි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර |
| **ඉගෙනුම් පල** | : | • ඊජිප්තු දේවස්ථාන නම් කරයි.<br>• ඊජිප්තු දේවස්ථානවල වාස්තු විද්‍යාත්මක අංග ලක්‍ෂණ විස්තර කරයි.<br>• ඊජිප්තු දේවස්ථානවල කලාත්මක ලක්ෂණ ඇගයීමට ලක් කරයි. |
| **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** | : | සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්‍ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න. |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **අබුසිම්බල් දේවස්ථානය -**
  - අබුසිම්බල් දේවස්ථානය, නව රාජධානි සමයේ දෙවැනි රැමෙසස් රජු විසින් ඉදි කරන ලද දැවැන්ත ශෛලමය දේවස්ථානයකි. ක්‍රි. පූ. 13 වැනි සියවසට අයත් ය.
  - ජ්‍යාමිතික හැඩ බහුල ආකෘතියකින් යුතු මෙම දේවස්ථානයේ දොරටුව දෙපස විශාල ප්‍රමාණයේ ශෛලමය මූර්ති 04ක් ඇත. හිඳගෙන සිටින ඉරියවුවෙන් යුතු මෙම ප්‍රතිමා II රැමෙසස් රජුගේ යැයි විශ්වාස කෙරේ.
  - එක් ප්‍රතිමාවක උස මීටර් 20ක් පමණ වේ. ප්‍රතිමාවේ පාද අසල බිරිය, කුමරෙකුගේ හා කුමරියකගේ මූර්ති ඇත.
  - සූර්ය දිව්‍ය සංකල්පයට සම්බන්ධ ව ගොඩනඟන ලද දේවස්ථානයක් වන මෙය, අස්වාන්වේල්ල ඉදි කරන අවස්ථාවේ දී එහි මුල් ස්ථානයෙන් ගලවා වෙනත් තැනක ස්ථාපනය කරන ලදි.

- **ලුක්සෝර්/ ලක්සෝර් දේවස්ථානය -**
  - ලුක්සෝර් විශාල ආගමික ගොඩනැගිලි සංකීර්ණයක් වන අතර, එය නයිල් ගඟේ නැගෙනහිර නිම්නයේ පිහිටා තිබේ.
  - මෙය ප්‍රධාන වශයෙන් දේවස්ථාන 06කින් යුක්ත වේ. ක්‍රි. පූ. 1400 දී පමණ ගොඩනඟා තිබේ. වැලිගලින් තනා ඇති මෙම දේවස්ථානයේ මූර්ති හා උත්කීරණ කැටයම් විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ.
  - දේවස්ථානය ඉදි කර ඇත්තේ චතුරස්‍රාකාර ආකෘති බහුල ව භාවිත කිරීමෙනි. කුලුනු සහ මධ්‍යයේ විවෘත අංගණ සහිත ශාලා 02කි.
  - ලුක්සෝර් දේවස්ථානය රජවරුන් කිහිප දෙනකු යටතේ ඉදි කිරීම් සිදු වූ ගෘහ නිර්මාණ සංකීර්ණයකි.

**ඇගයීම** :

- ඊජිප්තු දේවස්ථාන නම් කරන්න.
- අබුසිම්බල් දේවස්ථානයේ වාස්තු විද්‍යාත්මක හා කලාත්මක අංග ලක්‍ෂණ විස්තර කරන්න.
- ලුක්සෝර් දේවස්ථානයේ වාස්තු විද්‍යාත්මක හා කලාත්මක අංග ලක්‍ෂණ විස්තර කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.20** : ඊජිප්තියානු මූර්ති නිර්මාණ අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 7.20.1** : නර්මේර්/නාමර් ඵලකය (Pallet of King Narmer), මෙන්කුරේ රජු සහ ඔහුගේ බිරිය (King menkaure and his wife), ස්ක්‍රයිබ් (The Seated Scribe) හා නෙෆර්ටිටි (The Bust of Nefertiti) ප්‍රතිමා අධ්‍යයනය කරමු.

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ඊජිප්තු මූර්ති නම් කරයි.
- ඊජිප්තු මූර්තිවල ශෛලිය, වස්තු විෂය විස්තර කරයි.
- ඊජිප්තු මූර්තිවල උපයෝගිතාව, ආගමික අරමුණු හා තැනීමට හේතු වූ සාධක පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **ඊජිප්තියානු මූර්ති** -
  - ඊජිප්තියානු මූර්ති සඳහා ද මූලික ව ම පදනම් වී ඇත්තේ ඔවුන්ගේ ආගමික ඇදහිලි විශ්වාස පද්ධතිය යි.
  - මූර්ති නිර්මාණ සඳහා වස්තු විෂය වූයේ පාරාවෝ රජවරු, ඔවුන්ගේ දෛනික ජීවිතය, දෙවිවරු සහ පාරාවෝවරු වෙනුවෙන් සේවය කළ පිරිස් ය.
  - පිරමිඩ තුළ රජවරුන්ගේ රූප තැන්පත් කිරීමෙන් අපේක්ෂා කරන ලද්දේ මෘත ශරීර දිරා ගියහොත් ආත්මයට ශරීරය හඳුනා ගැනීමට සුදුසු පරිසරයක් ගොඩනැඟීමයි.
  - බොහොමයක් ප්‍රතිමාවල ශරීර ඔවුන්ගේ තත්‍ය රූපකායට වඩා ආගමික අරමුණු හා අනුරූප වූ පරමාදර්ශී ආකෘතියකට අනුව තනා තිබේ. අනන්‍යතාව බොහෝවිට තීරණය වූයේ මුහුණෙනි.
  - පැරණි රාජධානි සමයේ දී ශරීර සඳහා පොදු ආකෘතියක් අනුගමනය කළ ද මධ්‍යම රාජධානි සමය වන විට ශාරීරික අනන්‍යතාව දැක්වීම කෙරෙහි ශිල්පීන් නැඹුරු වී ඇත.

- **නර්මේර්/නාමර් ඵලකය** -
  - මෙය ඊජිප්තු කලාවේ පැරණි ම කලා කෘතිවලින් එකකි. ක්‍රි. පූ. 3000ට පමණ (පැරණි රාජධානි සමය) අයත් යැයි සැලකේ.
  - අඟල් 25ක් පමණ උස මෙම ඵලකය දෙපස ම අල්ප උන්නත කැටයම් දැකිය හැකි ය.
  - නාමර් රජුගේ යුධ ජයග්‍රහණයක් දැක්වෙන මෙහි සිදුවීම් නිරූපණය කර ඇත්තේ බෙහෙවින් සංකේතාත්මක ස්වරූපයකිනි.
  - ඵලකයේ එක් පැත්තක බිම වැටුණු සතුරකුගේ හිසින් අල්ලාගෙන සිටින නාමර් රජු දැක්වේ.

පහළින් පරාජය කරන ලද තවත් සතුරෝ දෙදෙනෙකි. මෙහි ඉහළ කොටසේ හෝරස් දෙවියන් සංකේතවත් කරමින් උකුස්සකු යොදා ඇත.

- එලකයේ අනෙක් පැත්තේ සිටින්නේ ද නාමර් රජු ය. ඔහු ඡත්‍රධාරීන් පිරිසක් සමඟ පෙරහැරකින් ගමන් කරන අයුරු දක්වේ.
- නාමර් රජුගේ රූපය සෙසු රූපවලට වඩා විශාල ව දක්වා තිබීම විශේෂ ලක්ෂණයකි.
- මෙම එලකයේ දිගු ගෙලක් සහිත අද්භූත සත්ත්වයෝ දෙදෙනෙක් දක්වෙති. ඔවුන් කවුරුදැයි පැහැදිලි නැති අතර විජයග්‍රහණය පිළිබඳ සංකේතයක් විය හැකි බවට අනුමාන කෙරේ.

- **මෙන්කුරේ රජු සහ ඔහුගේ බිරිය** -
  - ක්‍රි. පූ. 2470ට පමණ අයත් යුගල මූර්තියකි. දෙදෙනා ම සිටගත් ඉරියව්වෙන් යුතු වන අතර දෙදෙනා ම වම් පය ඉදිරියට තබා සිටිති.
  - පිරිමි රුව යටි කයට කෙටි වස්ත්‍රයක් ඇඳ සිටිය ද උඩු කය ඇඳුම් රහිත ය. ආභරණ පැලඳ නැත. එහෙත් සාම්ප්‍රදායික හිස් වැස්ම සහිත ව දක්වා තිබේ. පිරිමි රුව දෑත් පහළට හෙලා අත්ල මිට මොළවාගෙන සිටියි.
  - බිසව ඔහුට ආසන්න ව සිටින අතර ඇය ඇඳ සිටිනුයේ ගෙලේ සිට දෙපා තෙක් දිගු වූ වස්ත්‍රයකි. එම වස්ත්‍රයෙන් ඇගේ ශරීරාංග මතු වී පෙනෙන සේ දක්වා ඇත.
  - බිරිය මෙන්කුරේ රජුගේ වම් බාහුවෙන් සහ දකුණු පස බඳෙන් අල්ලාගෙන සිටියි.
  - පුරුෂ රූපය බෙහෙවින් ශක්ති සම්පන්න ලෙස ද කාන්තා රූපය ඊට සාපේක්ෂ ව සැහැල්ලු ඉරියව්වකින් ද දක්වා ඇත.
  - මූර්තිය පූර්ණ වශයෙන් මතුවන පරිදි නෙළා නොමැත.

- **ස්ක්‍රයිබ් ප්‍රතිමාව** -
  - හුනු ගලින් පූර්ණ වශයෙන් නෙළන ලද රූපයකි. පින්තාරු කර ඇත.
  - පැරණි රාජධානි (ක්‍රි. පූ. 2620-2500) සමයට අයත් යැයි සැලකෙන මෙම මූර්තියෙන් ලේඛනයේ නියැළී සිටින්නෙක් දැක්වේ. වමතින් පැපිරස් පත්‍රයක් හා දකුණතින් ලියන උපකරණය දරා සිටියි (දකුණතෙහි ඇති උපකරණය වර්තමානයේ කැඩී ගොස් ඇත.)
  - ඉදිරිය බලා සිටින ඍජු හිඳි මූර්තියකි. දෙසවන් තරමක් විශාල ය.
  - ස්වාභාවිකවාදී ලක්ෂණ සමඟ යථාර්ථවාදී නිරීක්ෂණ පිහිටුවා ඇත. (ලිහිල් උදරය, නොගැඹුරු ඇස් යට ස්වභාවය, ගිලුණු යටි හනුව)
  - මේ සම්බන්ධයෙන් අදහස් දක්වන කලා ඉතිහාසඥයින් පවසන්නේ මෙම රූපය ඉහළ වරප්‍රසාද සහිත ලියන්නෙකුගේ රූපයක් බවයි.

- **නෙෆර්ටිටි උඩු කය මූර්තිය** -
  - ක්‍රි. පූ. 1345 දී පමණ තනන්නට ඇතැයි සැලකෙන මෙය උසින් අඟල් 19ක් වූ උඩුකය මූර්තියකි.
  - කළු පැහැ දිගු හිස්වැස්මක් පැලඳ ඉදිරිය බලා සිටින තරුණ නෙෆර්ටිටි රැජිනගේ උඩුකය මෙයට විෂය වී තිබේ.
  - හුනුගල් සැකසුම මත ස්ටකෝ බදාමයෙන් තනා ඒ මත වර්ණාලේප කර තිබේ.
  - පරමාදර්ශී ස්ත්‍රී සෞන්දර්යය මූර්තිමත් කෙරෙන මෙහි මුහුණෙහි ඇත්තේ මන්දස්මිතයකි.
  - හිසෙහි කායව්‍යූහ ලක්‍ෂණ පිළිබඳ අවබෝධයෙන් කරන ලද මූර්තියක් වන අතර පැරණි රාජධානි සමයේ ඇති දැඩි ජ්‍යාමිතික රූපී ස්වභාවය මෙහි නැත.
  - මූර්තියේ වම්පස ඇසට හානි වී ඇත. ගෙලෙහි ඇති මාලය සහ හිසෙහි පැලඳි දිගටි හිස්වැස්ම මෙම නිර්මාණයට විශේෂ අලංකාරයක් එක් කරයි.

**ඇගයීම** :
- මිසර මූර්ති නම් කරන්න.
- නර්මේර් රජුගේ එලකය පිළිබඳ ඇගයීමක් කරන්න.
- නෙෆර්ටිටි ප්‍රතිමාව සහ මෙන්කුරේ සහ ඔහුගේ බිරිය ප්‍රතිමාව ඇසුරෙන් මිසර රාජකීයයන්ගේ ප්‍රතිමා පිළිබඳ ව රචනයක් ලියන්න.
- ස්ක්‍රයිබ් ප්‍රතිමාව පිළිබඳ ව ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.21** : ඊජිප්තියානු (මිසර) චිත්‍ර අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම 7.21.1** : ඊජිප්තියානු චිත්‍ර අධ්‍යයනය කරමු.

- කුරුළු දඩයම (Fawling Scene)
- මීඩම්හි පාත්තයෝ (Geese of Meidam)
- නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ (Musicians and Dancers)

**කාලච්ඡේද** : 01 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :

- ඊජිප්තියානු (මිසර) චිත්‍ර නම් කරයි.
- ඊජිප්තියානු (මිසර) චිත්‍රවල පොදු ලක්ෂණ වගුගත කරයි.
- නම් කරන ලද සිතුවම්වල කලාත්මක ලක්ෂණ අගයයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ඊජිප්තියානු චිත්‍ර කලාව -
  - ඊජිප්තියානු චිත්‍ර කලාවේ අරමුණ ද උත්තර ජීවනය හා සම්බන්ධ වූවක් විය. චිත්‍රවලින් මූලික ව ම අපේක්ෂා කරන ලද්දේ පාරාවෝවරුන්ගේ ජීවන තොරතුරු වාර්තාගත කර තැබීම යි.
  - පාරාවරුන්ගේ දඩයම් දර්ශන, යුද්ධ ජයග්‍රහණ, භෝජන සංග්‍රහ, කෙත් වතු හා මිදි වතු, ආදිය මෙම චිත්‍රවලට විෂය වී ඇත.
  - ඊජිප්තියානු චිත්‍රවල මූලික ලක්ෂණ අතර, රේඛාව කේන්ද්‍රීය ව චිත්‍ර ගොඩනැඟීම, පැතලි වර්ණාලේපය, බිත්තිය තීරුවලට බෙදා සිතුවම් ඇඳීම, ප්‍රධාන පාරාවෝවරයාගේ රූපය විශාල ව ඇඳීම, රූපාක්ෂරයෙන් අදාළ දර්ශනය විස්තර කිරීම, කෙත් වතු-පොකුණු ආදිය අහසේ සිට පෙනෙන අයුරින් ඇඳීම, මානව හා සත්ත්ව රූප මූලිකව ම පැති පෙනුමින් නිරූපණය, සත්ත්ව රූප ස්වාභාවික ලක්ෂණ සහිත ව ඇඳීම, සීමිත වර්ණමාලාව ආදිය දැක්විය හැකි ය.

- කුරුළු දඩයම -
  - තීබස්හි නෙබාමුන් සොහොන් ගැබෙන් හමු වන මෙම සිතුවමෙන් දැක්වෙන්නේ වංශාධිපතිවරයකු ස්වකීය බිරිය සහ දුව ද කැටුව වගුරු බිමක පක්ෂි දඩයමේ යෙදී සිටින ආකාරය යි.
  - ක්‍රි. පූ. 1400ට පමණ අයත් මෙහි පාරාවෝවරයාගේ රූපය සෙසු සියලු ම රූපවලට වඩා විශාල ව ඇඳ තිබේ. ඔවුන් සියලු දෙනා ම සැහැල්ලු බෝට්ටුවක් මත නැගී සිටිති.
  - පාරාවෝවරයාගේ එක් අතක අල්ලාගත් පක්ෂීන් සහ අනෙක් අතෙහි හුමරංගයක් දක්වා ඇත.
  - සියලු ම මානව රූප ඇඳ ඇත්තේ පැති පෙනුමට වන අතර පැතලි ලෙස වර්ණ ගන්වා තිබේ.

- පාරාවෝවරයාගේ බිරිය ලෙස සැලකෙන අලංකාර ව සැරසුණු ස්ත්‍රිය මල් පොකුරක් ද සහිත ව බෝට්ටුව මත සිටගෙන සිටින අතර, දුව ඔවුන්ගේ දෙපා අල්ලාගෙන නෙළුම් මල් නෙළයි.
- පාරාවෝවරයාගේ බළලා ද කුරුල්ලන් දඩයම් කිරීමේ යෙදී සිටින අතර මෙම සිතුවමෙහි සත්ත්වරූප ඇඳ ඇත්තේ ස්වාභාවික ලක්ෂණ නිරූපණය කෙරෙන පරිදි ය.
- චිත්‍ර සඳහා භාවිත වී ඇත්තේ සීමිත වර්ණ මාලාවකි.

- **මීඩම්හි පාත්තයෝ** -
  - පැරණි රාජධානි සමයට අයත් මෙය ක්‍රි.පූ. 2575-2551 කාලයේ දී කරන්නට ඇතැයි සැලකේ.
  - මෙය සොහොන් දේවස්ථානයක උතුරු බිත්තියේ ඇඳ තිබූ විශාල සංරචන කොටසක් සේ සැලකේ.
  - මිසර සිත්තරාගේ සත්ත්ව රූප හා සත්ත්ව චර්යා ඇඳීමේ සමත්කම පිළිබඳ සාක්ෂ්‍ය සපයන නිර්මාණයකි.
  - ආහාර සොයමින්, තිදෙනා බැගින් දෙපසට ඇවිද යන පාත්තයන් පෙළක් මෙහි දක්නට ලැබෙන අතර දුඹුරු, කළු යන වර්ණ බහුල ව භාවිත කර තිබේ.
  - ශරීරවල විස්තරාත්මක ලක්ෂණ අවධාරණ සඳහා රේඛාව මූලික ව ම යොදා ගෙන ඇත. පියාපත්වල හා ගෙලෙහි විස්තර අඳුරු පසු බිමෙහි සුදු පැහැ රේඛාවෙන් යොදා ඇත.
  - මානව රූපවලට වඩා සත්ත්ව රූප ඇඳීමේ දී බෙහෙවින් ජීවී අයුරින් එම සතුන් හා සත්ත්ව චර්යා නිරූපණයට මිසර සිත්තරා දක්වන දක්ෂතාව පෙන්වන තවත් එක් නිර්මාණයකි.

- **නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ** -
  - තිබ්ස්වල නෙබාමුන් නම් සොහොන් ගැබෙන් හමු වන මෙම සිතුවමින් නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ පිරිසක් අමුත්තන් ඉදිරියේ ප්‍රසංගයක යෙදෙන අවස්ථාවක් දැක්වේ.
  - නව රාජධානි යුගයට අයත් මෙය ක්‍රි. පූ. 1350 පමණ කාලයට අයත් වේ. මෙම යුගයේ දී චිත්‍ර කලාවේ ශිල්පීය හා සංකල්පීය වෙනස් වීම් පෙන්වන කෘතියක් ලෙස මෙය සැලකේ.
  - ඊජිප්තු චිත්‍ර කලාවේ පැවති සම්මත රීති වෙනස් වූ අවස්ථාවක් වශයෙන් මෙම නිර්මාණය සැලකේ. පාර්ශ්වදර්ශී සෘජු ස්වරූපයෙන් රූප ඇඳීම වෙනුවට මෙම සිතුවමේ රූප ඉතා නම්‍යශීලී ලෙස චිත්‍රණය කර තිබේ.
  - බටනළා වාදනය කරන රුව සම්පූර්ණයෙන් ඉදිරිපස පෙනුමෙන් යුතු ව ද ඒ සමග දක්වන අනෙක් රූපය මඳක් හැරී සිටින සේ ද නිරූපණය වේ. ආභරණයෙන් පමණක් සැරසී නිරුවත් ව නර්තනයේ යෙදෙන කාන්තා රූප ඉතා නම්‍යශීලී ස්වරූපයෙන් දක්වා ඇත.
  - මෙම සිතුවම බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.

ඇගයීම :
- ඊජිප්තියානු චිත්‍ර කලාවේ පොදු ලක්ෂණ දැක්වෙන වගුවක් සකස් කරන්න.
- ඊජිප්තියානු චිත්‍ර කලාවේ නිරූපිත තේමා නම් කරන්න.
- කුරුලු දඩයම, මීඩම්හි පාත්තයෝ සහ නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ යන සිතුවම් පිළිබඳ ව ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.22** : **ග්‍රීක වාස්තු විද්‍යාත්මක නිර්මාණ අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.22.1** : **පාතිනොන් දේවස්ථානය** (The Parthenon Temple) **සහ ග්‍රීක කුලුනු** (Greek Columns) **අධ්‍යයනය කරමු.**

- **ග්‍රීක කුලුනු - ඩොරික් කුලුනු** (Doric), **අයොනික් කුලුනු** (Ionic), **කොරින්තියානු කුලුනු** (Corinthian)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් ඵල** :
- ග්‍රීක දේවස්ථානවල වාස්තුවිද්‍යාත්මක ව්‍යුහය විස්තර කරයි.
- පාතිනොන් දේවස්ථානයේ සැලසුම්කරණය, අලංකරණතාව සහ ආගමික අවකාශයක් ලෙස භාවිත වී ඇති ආකාරය පැහැදිලි කරයි.
- ග්‍රීක කුලුනු වර්ග නම් කර ඒවායේ උපයෝගීතාව හා කලාත්මක ලක්ෂණ විස්තර කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **පාතිනොන් දේවස්ථානය -**
  - සියුස් ප්‍රමුඛ දේවමඩුල්ල උදෙසා ග්‍රීසියේ විවිධ දේවස්ථාන ඉදි වූ අතර, පාතිනොන් දෙවස්ථානය ඉදි වූයේ ඇතීනා දෙවඟන උදෙසා ය. ක්‍රි. ව. 05 වැනි සියවසේ දී ඉදි වූ මෙය ඇතීනා වන්දනා කිරීමට භාවිත විය.
  - මෙහි ශිල්පීන් ලෙස පීඩියස්, කැලික්‍රේටිස් සහ ඉක්තිනස් කටයුතු කර තිබේ.
  - මෙය වාස්තුවිද්‍යාත්මක මෙන් ම කැටයම් කලාවේ ද දියුණුව පෙන්වන සුවිශේෂ ගොඩනැගිල්ලකි.
  - සෘජුකෝණාස්‍රාකාර ආකෘතියක් පදනම් කරගත් පාතිනොන් දේවස්ථානයේ බාහිරින් අලංකාර ඩොරික් කුලුනු පේළියකි. දේවස්ථානයේ මුහුණතෙහි කුලුනු 8ක් දක්නට ලැබෙන අතර එහි ඉහළ 'පෙඩිමන්' (Pediment) නමින් හැඳින්වෙන අලංකාර කැටයම් සහිත ත්‍රිකෝණාකාර උපරිභාග ව්‍යුහයකි.
  - කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද මෙය ග්‍රීක සම්භාව්‍ය ගෘහ නිර්මාණ කලාවේ සුවිශේෂ නිර්මාණයකි.
  - කුලුනු සහ බාල්ක ආධාර කොට ගෙන ගොඩනැගිල්ලේ වහලය ඉදි වී තිබේ. අභ්‍යන්තර අවකාශය ඇතීනා දෙවඟනගේ ප්‍රතිමාවකට වෙන් ව තිබී ඇත.
  - මෙහි අල්තාරය ඉදි වී ඇත්තේ දේවස්ථානයේ පිටත ය. සරල ආකෘතියක් වුව ද බෙහෙවින් ගම්භීර ස්වරූපයෙන් දේවස්ථානය ගොඩ නඟා තිබේ.

- **ග්‍රීක කුලුනු** -
  - **ඩොරික් කුලුනු** -
    - ග්‍රීක කලාවේ බෙහෙවින් ප්‍රචලිත හා පැරණි ම කුලුනු වර්ගය වන්නේ ඩොරික් කුලුනු ය.
    - මෙහි ආකෘතිය සරල නමුත් ගම්භීරත්වයෙන් යුක්ත ය. ගොඩනැගිලිවල විශාලත්වය අවධාරණය කර දැක්වීමට ඩොරික් කුලුනු සමත් ය.
    - මෙම කුලුනේ හිස කොටස පිටතට නෙරා ආ සරල බොරදමින් යුක්ත වන අතර පාතිනොන් දේවස්ථානය සඳහා යොදාගෙන ඇත්තේ ඩොරික් කුලුනු ය.

- **අයොනික් කුලුනු** -
  - බැටළු අං දෙකක් මෙන් ඇතුළට කැරකුණු සැරසිලි රටාවක් සහිත හිසක් අයොනික් කුලුනුවලට තිබේ.
  - අයෝනියන්වරුන් විසින් දියුණු කරන ලද මෙම කුලුන ගොඩනැගිල්ලක උස අවධාරණය කර දැක්වීමට සමත් ය.
  - අයොනික් කුලුනුවල බඳ බොහෝ විට සිරස් රේඛා ලෙස බෙදා සැරසිලි කරන අතර මෙහි පාදම ද ඩොරික් පාදම්වලට වඩා තරමක් සැරසිලි සහිත ය.
  - ඉරෙක්තියන් (Erechtheion) ගොඩනැගිල්ලේ උතුරු ප්‍රවේශයට යොදා ඇත්තේ අයොනික් කුලුනු ය. සාමෝස්හි හේරා දෙවඟනගේ දේවස්ථානයේ ද මෙම කුලුනු දැකිය හැකි ය.

- **කොරින්තියානු කුලුනු** -
  - බෙහෙවින් ම සැරසිලි සහිත හිසකින් යුක්ත කොරින්තියානු කුලුනු ගොඩනැගිල්ලක විචිත්‍රත්වය අවධාරණය කරයි.
  - කුලුනු හිස් ඇකන්තස් පත්‍රවල රටා ඇසුරෙන් නිර්මාණය වී තිබේ. කොරින්තියන් කුලුනුවලට එකී නම ග්‍රීක පෞර රාජ්‍යයක් වූ කොරින්ත් ඇසුරෙන් ලැබී තිබේ.
  - ඇතන්ස්හි සියුස් වෙනුවෙන් කළ දේවස්ථානය කොරින්තියානු කුලුනු සහිත ගොඩනැගිල්ලක් සඳහා නිදසුනකි.

ඇගයීම :
- පාතිනොන් දේවස්ථානයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ ව විස්තර කරන්න.
- ග්‍රීක දේවස්ථාන 05ක් නම් කරන්න.
- ග්‍රීක කුලුනු වර්ග නම් කර ඒවා එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. ගොඩනැගිල්ලකට ඒවායින් ලැබෙන බලපෑම විස්තර කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.23** : **ග්‍රීක මැටි බඳුන් අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.23.1** : **ග්‍රීක මැටි බඳුන් අධ්‍යයනය කරමු.**
- **කාලරූපී මැටි බඳුන්** (Black figure pottery)
- **රක්තරූපී මැටි බඳුන්** (Red figure pottery)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ග්‍රීක මැටි බඳුන් නිර්මාණකරණය අනුව වර්ග කරයි.
- ග්‍රීක මැටි බඳුන් කලාවේ තාක්ෂණය, උපයෝගීතාව සහ අලංකරණ සැරසිලි අංග විස්තර කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **ග්‍රීක මැටි බඳුන් -**
  - ග්‍රීක මැටි බඳුන් කලාව බෙහෙවින් දියුණු මට්ටමක පැවති ක්ෂේත්‍රයක් වන අතර එම බඳුන් විවිධ අරමුණු වෙනුවෙන් ඉදි කර ඇත.
  - ක්‍රි. පූ. 1000 පමණ සිට ක්‍රි. පූ. 400 පමණ තෙක් මැටි බඳුන් විශාල ප්‍රමාණයක් හමු වන අතර එකිනෙකට වෙනස් ආකෘති ගණනාවකින් තනා තිබේ. ජලය දැමීමට, තෙල් වර්ග දැමීමට, සුවඳ විලවුන් දැමීමට, ද්‍රව්‍ය පරිවහනයට, දෛනික පරිහරණයට ආදි වශයෙන් එකිනෙකට වෙනස් අරමුණු වෙනුවෙන් කළ පිඟන්, කෝප්ප, බඳුන්, ඇම්පෝරා විශාල ප්‍රමාණයක් ග්‍රීක මැටි බඳුන් අතර ඇත.
  - මෙම බඳුන් අලංකාර සිතුවම් හා සැරසිලි රටාවන්ගෙන් යුක්ත වීම විශේෂ ලක්ෂණයකි.
  - සකපෝරුව ආශ්‍රයෙන් ගොඩනඟන ලද මෙම මැටි බඳුන්වල ඇතැම් කොටස් එනම්, ඒවායේ අත් හා පාද කොටස් වෙන ම තනා සවි කර ඇත.
  - මැටිබඳුන් තැනීමට කැරමෝස් (keramos) සහ ඇටික් (attic) මැටි භාවිත වී ඇත.

- **කාලරූපී මැටි බඳුන් -**
  - මෙම මැටි බඳුන් අලංකාර කළ රූප කළු පැහැයෙන් වර්ණ ගන්වා ඇති අතර එහි රේඛාමය සැරසිලි රක්ත වර්ණයෙන් යුක්ත ය.
  - වඩාත් පැරණි සම්ප්‍රදායයක් ලෙස කාලරූපී මැටි බඳුන් සැලකෙන අතර කොරින්තියන්වරුන් මුලින් ම මෙම බඳුන් තනන්නට ඇතැයි සැලකේ.

- ක්‍රි. පූ. 700 පමණ සිට හමු වන 20,000 ආසන්න බඳුන් ප්‍රමාණයක් මේ වන විට සොයාගෙන ඇත.
- මෙම බඳුන්වල ඇති සිතුවම් ග්‍රීක මිථ්‍යා කතා, ආගමික, සමාජීය හා ක්‍රීඩා පිළිබඳ ව ඉතා වැදගත් තොරතුරු සමූහයක් අනාවරණය කරයි. එම සිතුවම්වල ග්‍රීක මිථ්‍යා කථාවල සිදුවීම්, යුද්ධ දර්ශන, සත්ත්ව රූප, ක්‍රීඩකයන්, මුහුදු ජීවීන්, මල් හා පැළෑටි ආදිය දක්නට ලැබේ.
- වඩාත් පැරණි බඳුන්වල ජ්‍යාමිතික රටා බහුල වුව ද පසුකාලීන ව විවිධ ශරීර රටා සහිත සංකීර්ණ හා ලාලිත්‍යමය මානව හා සත්ත්ව රූප එක් ව ඇත.
- මෙම කාලරූපී මැටි බඳුන්වල කළු පැහැති වර්ණය පෝරණුවේ පිච්චීමට පෙර ආලේප කර පසු ව උල්කටුවක් සහිත උපකරණයකින් මැටි පෘෂ්ඨය හාරා රූප මතු කර තිබේ. පසුකාලීන ව සුදු සහ රතු වර්ණ ද භාණ්ඩය වර්ණ ගැන්වීමට එක් කර ඇත.

- **රක්තරූපී මැටි බඳුන්** -
  - ග්‍රීක මැටි බඳුන්වල බෙදීම කර ඇත්තේ ඒවායේ පෘෂ්ඨ අලංකරණ රටාවන්හි වර්ණ මාලාව ඇසුරිණි.
  - රක්තරූපී මැටි බඳුන්වල කළු පැහැ පසු බිමෙහි රන් පැහැයෙන් රූප හා සැරසිලි රටා ඇඳ තිබේ. එම රූපවල විස්තරාත්මක ලක්ෂණ දැක්වීමට කළු පැහැති රේඛා භාවිත වී ඇත.
  - රක්ත රූප ක්‍රමයේ දී රූපවල විස්තර දැක්වීමේ දී කාලරූපී ක්‍රමයට වඩා යථාර්ථවාදී ලක්ෂණ මෙන් ම සියුම් විස්තර රැසක් දක්වා තිබේ. එසේ ම කාලරූපී ක්‍රමයේ දී රූප ඇඳ දැක්වීම බොහෝ විට පැති පෙනුමට සීමා වී තිබුණ ද රක්ත රූපී ක්‍රමයේ දී ඉදිරිපසින් මෙන් ම රූපයෙන් හතරෙන් තුනක් පෙනන (three quarter view) පරිදි ද දක්වා ඇත.
  - ක්‍රි. පූ. 530 දී පමණ සිට මෙම රක්තරූපී බඳුන් බෙහෙවින් ජනප්‍රිය විය.

**ඇගයීම** :

- ග්‍රීක මැටි බඳුන් සඳහා භාවිත කරන ලද සිතුවම් සහ සැරසිලි රටා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ග්‍රීක කාලරූපී සහ රක්තරූපී මැටි බඳුන් පිළිබඳ ව විස්තරාත්මක රචනයක් ලියන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.24** : **ග්‍රීක මූර්ති අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.24.1** : **පැරණි සහ සම්භාව්‍ය අවධියට අයත් ග්‍රීක මූර්ති අධ්‍යයනය කරමු.**
- **කුරොස් සහ කෝරේ** (kouros and Kore)
- **කවපෙත්ත විසි කරන්නා** (Discobolus)
- **හෙල්ල දරා සිටින්නා (ඩොරිෆරස් -** Doryphoros)
- **හර්මීස් සහ ඩයොනිසස්** (Hermes and the Infant Dionysus)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ග්‍රීක පැරණි සහ සම්භාව්‍ය අවධියේ මූර්ති නම් කරයි.
- ග්‍රීක පැරණි ආකේක යුගයට අයත් මූර්තිවල ලක්ෂණ විස්තර කරයි.
- ග්‍රීක සම්භාව්‍ය කලාවේ මූලික ලක්‍ෂණ වර්ගීකරණය කරයි.
- ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් තොරාගත් මූර්ති කිහිපයක් අගය කරයි, රස විඳියි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්‍ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **කුරොස් සහ කෝරේ මූර්ති -**
  - ග්‍රීක පෞරාණික ආකේක යුගයට අයත් වැදගත් මූර්ති වර්ග 02කි. මෙහි කුරෝස් ලෙස පුරුෂ රූප ද කෝරේ ලෙස ස්ත්‍රී රූප ද හඳුන්වනු ලැබේ.
  - මෙම මූර්ති සඳහා මිසර කලාවේ ආභාසය ප්‍රබල ව ලැබී තිබේ. විශේෂයෙන් ම මෙන්කුරේ සහ ඔහුගේ බිරිය වැනි මිසර මූර්තිවල ඉරියව්වලට මෙම රූපවල ඉරියව් බෙහෙවින් සමාන ය.
  - කුරෝස් සහ කෝරේ මූර්ති නිර්මාණය කර ඇත්තේ කිරිගරුඬ මාධ්‍යයෙන් වන අතර මේවා හිටි පිළිම ලෙස හමුවේ.
  - පුරුෂ රූප නිරුවත් ලෙස හමුවේ. ඒවා මිසර ප්‍රතිමාවල මෙන් දෙඅත් මිට මොළවා පහතට හෙළා වම් පය පෙරට තබා ඉදිරිය බලා හිඳියි.
  - ස්ත්‍රී රූප ගෙලේ සිට දෙපා තෙක් දිගු වස්ත්‍රවලින් සැරසී සිටියි. මෙම මූර්ති දෙවර්ගයේ ම ගොතන ලද කොණ්ඩා මෝස්තර දැකිය හැකි ය.
  - මුල් කාලීන කුරෝස් සහ කෝරේ රූපවල මුහුණු භාව විරහිත ස්වරූපයෙන් නිර්මාණය කර තිබුණ ද පසු කාලීන ව මඳ සිනාවක් මුහුණට එකතු වී තිබේ.

- **කවපෙත්ත වීසි කරන්නා** -
  - මයිරන් නමැති ශිල්පියා විසින් නිර්මාණය කරන ලද මෙයින් දැක්වෙන්නේ කවපෙත්තක් මුදා හැරීමට සූදානම්ව සිටින ක්‍රීඩකයකුගේ රූපයකි.
  - ක්‍රි. පූ. 450 දී පමණ ඉදි කරන්නට ඇතැයි සැලකෙන අතර, මෙහි මුල් කෘතිය ලෝකඩින් නිමවා ඇත. එහෙත් අද දක්නට ඇත්තේ එහි කිරිගරුඬ රෝම අනුරුවකි.
  - පරමාදර්ශී කාය විලාසයකින් යුතු ක්‍රීඩකයා සිටිනුයේ කවපෙත්ත වීසි කිරීමට ශාරීරික ජවය ලබා ගන්නා කූට ප්‍රාප්ති අවස්ථාවේ ය. ඔහුගේ ඇඹරී ගිය ශරීර විලාසයට අනුරූප ව වෙනස් වූ අස්ථි, මාංස පේශි, නහර ආදිය තියුණු අධ්‍යයනයකින් පසු ශිල්පියා ගොඩනඟා ඇත.
  - ශාරීරික ජවයට අනුරූප ව මුහුණේ භාව ප්‍රකාශන නොගැළපෙන බව මෙයට එරෙහි ව ඇති එක් චෝදනාවකි.
  - දකුණු පය තදින් පොළොවට තබා වැරගෙන කවපෙත්ත නිදහස් කිරීමට සැරසෙන ක්‍රීඩක රුව ග්‍රීක කලාවේ තේමාත්මක සුවිශේෂ භාවය ද පෙන්නුම් කරයි.

- **හෙල්ල දරා සිටින්නා (ඩොරිෆරස්)** -
  - ක්‍රි. පූ. 440 දී පමණ පොලික්ලීටස් නමැති ශිල්පියා විසින් කරන ලද්දකි.
  - ග්‍රීක මූර්ති කලාවේ බෙහෙවින් ප්‍රචලිත ඉරියව්වක් වූ එක් පාදයකට බර දී සැහැල්ලු ඉරියව්වෙන් සිටින නග්න මානව රුවක් මෙයින් දැක්වේ (Contrapposto).
  - මානව ශරීරයේ කාය ව්‍යූහ ලක්ෂණ හොඳින් අධ්‍යයනය කර තනන ලද මුල් ම ග්‍රීක කෘතිවලින් එකකි.
  - උසින් අඩි 6යි අඟල් 6ක් පමණ වේ. පරමාදර්ශී මානව ශරීරයක් වන මෙය මනා සේ වැඩුණු නීරෝග අවයවවලින් යුතු තරුණයකුගේ ශරීරයක් ලෙස නිරූපිත ය.
  - එක් පාදයකට බර දුන් විට ශරීරයේ සෙසු කොටස්වල අස්ථි හා මාංසපේශී ආදියෙහි සිදු වන වෙනස්කම් ඉතා දක්ෂ ලෙස ශිල්පියා මූර්තිමත් කොට ඇත.
  - එක් අතක හෙල්ලක් තිබුණ ද වර්තමානයේ දී එය දැකිය නොහැකි ය.

- **හර්මීස් සහ ඩයොනිසස්** -
  - ප්‍රැක්සිටේලිස් විසින් නිර්මාණය කරන ලද මෙය සම්භාව්‍ය ග්‍රීක කලාවේ ඉතා වැදගත් නිර්මාණයකි.
  - ක්‍රි. පූ. 4 වන සියවසේ දී නිර්මාණය කරන ලද මෙම යුගල මූර්තියේ උස අඩි 7.1කි.
  - පරමාදර්ශී රූපකායෙන් යුතු තරුණයකු ලෙසින් හර්මීස්ගේ රුව නිර්මාණය කර තිබෙන අතර ඔහුගේ එක් අතක ළදරු ඩයොනිසස් රැඳී සිටී.
  - එක් පාදයකට බර දී සිටගෙන සිටින ලාලිත්‍යමය ග්‍රීක ඉරියව්ව (Contrapposto - counterpose) මෙහි ද දැකිය හැකි ය. ග්‍රීක මූර්ති කලාවට 'සම්භාව්‍ය' යන අදහස එක්වීමට එහි කලාත්මක ප්‍රයෝග බලපා ඇත. විශේෂයෙන් එක් පාදයකට බර දී සිටින තිවංක ඉරියව්ව මේ සඳහා ප්‍රධාන සාධකයක් වී ඇත.
  - පරමාදර්ශී කාය ව්‍යූහ ලක්ෂණ නිවැරදි ව හර්මීස්ගේ රුව සඳහා භාවිත කර ඇත. එහෙත් ළදරු රූපයේ ප්‍රමාණානුපාත නිවැරදි නොවීම මෙම කෘතියේ එක් දුබලතාවකි.
  - හර්මීස්ගේ අතේ සිට පහළට කඩා හැලෙන වස්ත්‍ර බිලිඳා සහිත අත බිඳීයාම වැළැක්වීමට යොදන ලද තාක්ෂණික ප්‍රයෝගයකි. හර්මීස්ගේ ඉහළට එසවුණු දකුණතෙහි මිදි පොකුරක් තිබෙන්නට ඇතැයි අනුමාන කෙරේ.

ඇගයීම :
- ග්‍රීක පැරණි සහ සම්භාව්‍ය අවධියට අයත් මූර්ති නම් කරන්න.
- ග්‍රීක පෞරාණික ආකේක යුගයේ මූර්ති හඳුන්වා ඒවායේ ලක්ෂණ විස්තර කරන්න.
- ග්‍රීක සම්භාව්‍ය කලාවේ පොදු ලක්ෂණ මොනවා ද?
- ග්‍රීක සම්භාව්‍ය කලාවට අයත් මූර්ති පිළිබඳ ව ඇගයීමක් කරන්න.

**නිපුණතාව 7.0** : **දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**

**නිපුණතා මට්ටම 7.24** : **ග්‍රීක මූර්ති අධ්‍යයනය කරයි.**

**ක්‍රියාකාරකම 7.24.2** : **හෙලනිස්ටික අවධියට අයත් ග්‍රීක මූර්ති අධ්‍යයනය කරමු.**

- **ලැඔකූන්** (Laocoon)
- **සාමෝත්‍රාස්හි විජයග්‍රහණයේ දෙවඟන** (Winged Victory of Samothrace / Nike)
- **මිය යන ගෝල්වරයා** (The dying Galatian/Gual)

**කාලච්ඡේද** : 02 යි.

**ගුණාත්මක යෙදවුම්** : කලා කෘතිවල මුද්‍රිත පිටපත්, වර්ණ ඡායාස්ථ පිටපත්, ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි, Power Point Presentation, වීඩියෝ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර

**ඉගෙනුම් පල** :
- ග්‍රීක හෙලනිස්ටික අවධියේ මූර්ති නම් කරයි.
- හෙලනිස්ටික මූර්තිවල ලක්ෂණ විස්තර කරයි.
- හෙලනිස්ටික මූර්ති සඳහා බලපාන ලද මිථ්‍යා කතා පුවත් විස්තර කරයි.
- ග්‍රීක සම්භාව්‍ය හා හෙලනිස්ටික අවධිවල ප්‍රතිමා සංසන්දනාත්මක ව ඇගයීමට ලක් කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** : සාකච්ඡා ක්‍රමය/ පැවරුම් ක්‍රමය/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම/ තෝරාගත් කලා නිර්මාණ එකතුවක පිටපත් හෝ ස්ථානීය නිරීක්ෂණ/ ව්‍යාපෘති ක්‍රමය ආදී ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් හෝ භාවිත කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- **ලැඔකූන්** -
  - ඛේදනීය ඉරණමකට ගොදුරු වූ ට්‍රෝජන් පූජකයෙක් හා ඔහුගේ පුත්තු දෙදෙනා මෙයින් නිරූපණය වෙති.
  - සම්භාව්‍ය අවධියේ දී පරමාදර්ශවාදය ඉස්මතු වුව ද හෙලනිස්ටික අවධියේ දී බෙහෙවින් ඉස්මතු වූයේ භාව විෂයයික සහ ස්වාභාවිකවාදී ලක්ෂණ ය.
  - මුහුදෙන් මතු වූ සර්පයකු පූජකයා හා දරුවන් වෙළාගෙන සිටින අතර ඔවුහු සියලු දෙනා ම සර්ප ග්‍රහණයෙන් ගැලවීමට මහත් වෙහෙසක් දරති.
  - මෙහි මානව රූප තුනෙහි ම දක්නට ඇත්තේ වේදනාත්මක භාවමය තත්ත්ව තුනකි. දැඩි වේදනාත්මක භාව ප්‍රකාශනය සම්භාව්‍ය කලාවේ ඉතා විරල අතර එය හෙලනිස්ටික කලාවේ ප්‍රභල ය.
  - මානව රූප තුන ඉරියවු ත්‍රිත්වයකින් යුක්ත අතර ඔවුන්ගේ කාය ව්‍යුහ ලක්ෂණ භාවාත්මක ව හා ස්වාභාවික ව නිරූපණය කර ඇත.
  - ක්‍රි. පූ. 25 දී පමණ තනන්නට ඇතැයි සැලකෙන මෙම කෘතිය පුනරුද සමයේ බොහෝ කලා කරුවන්ට බලපෑම් ඇති කළ නිර්මාණයකි.

- **සාමෝත්‍රාස්හි විජයග්‍රහණයේ දෙවඟන** -
  - වැදගත් හෙලනිස්ටික මූර්තියක් වන මෙය ක්‍රි. පූ. 02වන සියවසට පමණ අයත් යැයි සැලකේ. නයිකී හෙවත් විජයග්‍රහණයේ දෙවඟන මෙයින් නිරූපිත ය.
  - ඉතා දක්ෂ ලෙස දෙවඟනගේ ඉරියවුව හා ශරීර කොටස් නිර්මාණය කර තිබුණ ද වර්තමානයේ දී හිස දැකිය නොහැකි ය.

- විජයග්‍රහණයේ දෙවඟන ස්වකීය පියාපත් ජවසම්පන්න ලීලාවකින් විදාගෙන නැව් බඳක ඉදිරි පස සිටින විලාසය මෙයින් නිරූපණය වේ.
- මුහුදු සුළඟින් ඇගේ වස්ත්‍රය ලෙළදෙයි. ශරීරාංගවල ඇතැම් කොටස් වස්ත්‍රයේ දුහුල් කොටස්වලින් අවධාරණය වී පෙනෙයි.
- ප්‍රතිමාවේ උස අඩි 08ක් පමණ වේ.
- අත්තටුවල පිහාටු ඉතා දක්ෂ ලෙස කැටයම්කරුවා නිර්මාණය කර ඇත. කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද මෙම ප්‍රතිමාව දැනට ලූවර් කෞතුකාගාරයේ තබා ඇත.

- **මිය යන ගෝල්වරයා -**
  - ජීව ප්‍රමාණයේ මූර්තියක් වන මෙය ත්‍රිකෝණාකාර ආකෘතියක් තුළ සංරචනය කර තිබේ.
  - මුල් කෘතිය ලෝකඩ නිර්මාණයක් සේ සැලකෙන අතර, වර්තමානයේ දක්නට ලැබෙන්නේ කිරිගරුඬින් කළ රෝම අනුරුවකි.
  - ගෝල්වරයාගේ දෙපාවල ශක්තිය ගිලිහී බිම ඇදවැටී සිටින අතර පසෙකින් ගිලිහී ගිය අසිපතකි.
  - සම්භාව්‍ය යුගයේ ඇති පරමාදර්ශී ශරීර ස්වභාවය වෙනුවට මෙහි ඇත්තේ තුවාල කැලලින් හා හැඩ පළු ගෙතී අවුල් ව ගිය හිස කෙසින් යුතු චිත්තවේගී හෝ භාව විෂයයීක ශරීර ස්වභාවයකි.
  - ශරීරයේ පාලනය ගෝල්වරයාගේ පාලනයෙන් ගිලිහී තිබේ. වේදනාත්මක භාව විලාසය හෙලනිස්ටික කලාව සම්භාව්‍ය යුගයේ කලාවෙන් වෙනස්වන වැදගත් ලක්ෂණයක් වන අතර මෙම ප්‍රතිමාවෙහි එකී ලක්ෂණය හොඳින් දැකිය හැකි ය. එසේ ම සම්භාව්‍ය යුගයේ ඇති විෂයාත්මක ඉරියවු වෙනුවට වෙනස් හෝ භාවාත්මක හෝ ඉරියවු ආදේශ වීම සම්බන්ධයෙන් ද මෙය නිදර්ශනයකි.

**ඇගයීම** :

- ග්‍රීක හෙලනිස්ටික කලාවට අයත් මූර්ති නම් කරන්න.
- හෙලනිස්ටික කලාවේ පොදු ලක්ෂණ දැක්වෙන වගුවක් සකස් කරන්න.
- ග්‍රීක හෙලනිස්ටික කලාවේ මූර්ති පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.
- ග්‍රීක සම්භාව්‍ය කලාවේ හා හෙලනිස්ටික කලාවේ සමානතා හා අසමානතා සංසන්දනාත්මක ව සාකච්ඡා කරන්න.

# චිත්‍ර කලාව

12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

# ඡායාරූප එකතුව

## නිපුණතාව 6.0

ආගමික හා සංස්කෘතික අංග, දෙස් විදෙස් තෝරාගත් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

# නිපුණතා මට්ටම 6.2




රූපය 1 - යකැදුරාගේ දියණිය, ඒ. සී. ජී. එස්. අමරසේකර



රූපය 2 - වඩුගෙදර/රැකියා නැත්තෝ/විරැකියාව, ඒ. සී. ජී. එස්. අමරසේකර



රූපය 3 - ජෙරුසෙලමට විජයග්‍රාහී ව ඇතුළු වීම, ඩේවිඩ් පේන්ටර්



රූපය 4 - යහපත් සමරිතානුවා, ඩේවිඩ් පේන්ටර්



රූපය 5 - නළඟන (චන්ද්‍රලේඛා/ලෝරෙත්), ජේ. ඩී. ඒ. පෙරේරා



රූපය 6 - සීතා ද සේරම්ගේ ආලේඛ්‍ය චිත්‍රය, ජේ. ඩී. ඒ. පෙරේරා



රූපය 7 - මහාමායා දේවියගේ සිහිනය, එම්. සාර්ලිස්



රූපය 8 - සරණ මංගල්‍යය, එම්. සාර්ලිස්



රූපය 9 - බුදු රජාණන් වහන්සේ මහියංගණයට වැඩම කිරීම,
කැලණිය නව විහාරයේ බිතු සිතුවමකි, සෝලියස් මැන්දිස්



රූපය 10 - ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීම, කැලණිය නව විහාරයේ බිතු සිතුවමකි, සෝලියස් මැන්දිස්




රූපය 11 - සරණ මංගල්‍යය, බෙල්ලන්විල විහාරයේ බිතු සිතුවමකි, සෝමබන්දු විද්‍යාපති



රූපය 12 - මාර පරාජය, බෙල්ලන්විල විහාරයේ බිතු සිතුවමකි, සෝමබන්දු විද්‍යාපති



රූපය 13 - සුර සම්හාරම්, මුත්තු අම්මාන් කෝවිලේ බිතු සිතුවමකි, නාරායණ ස්වාමි



රූපය 14 - අසංකාසුර සම්හාරම්, මුත්තු අම්මාන් කෝවිලේ බිතු සිතුවමකි, නාරායණ ස්වාමි


# නිපුණතා මට්ටම 6.3



රූපය 15 - සරස්වතී, රාජා රවි වර්මා



රූපය 16 - ඉන්ද්‍රජිත්ගේ ජයග්‍රහණය, රාජා රවි වර්මා



රූපය 17 - භාරත මාතා, අබනින්ද්‍රනාත් තාගෝර්



රූපය 18 - අශෝක දේවිය සහ බෝධිය, අබනින්ද්‍රනාත් තාගෝර්



රූපය 19 - ශිව වස බීම, නන්දලාල් බෝස්



රූපය 20 - රාධාගේ විරහව, නන්දලාල් බෝස්

# නිපුණතා මට්ටම 6.4



රූපය 21 -
**මොනාලිසා (Mona Lisa),**
**ලියොනාඩෝ ඩාවින්චි**
**(Leonardo da Vinci)**



රූපය 22 - අවසාන භෝජන සංග්‍රහය **(The Last Supper)**, ලියොනාඩෝ ඩාවින්චි **(Leonardo da Vinci)**



රූපය 23 - පර්වත මස්තකයේ දේව මෑණියෝ/ගිරි අරණෙහි කන්‍යා මරිය තුමිය
**(Vergin of the Rocks)**, ලියොනාඩෝ ඩාවින්චි **(Leonardo da Vinci)**



රූපය 24 - අවසාන විනිශ්චය **(Last Judgement),** මයිකල්/මීකෙල් ආන්ජිලෝ **(Michelangilo)**



රූපය 25 - ආදම් මැවීම **(Creation of Adam),** මයිකල්/මීකෙල් ආන්ජිලෝ **(Michelangilo)**



රූපය 26 - පියෙටා ප්‍රතිමාව **(Pieta),** මයිකල්/මීකෙල් ආන්ජිලෝ **(Michelangilo)**



රූපය 27 - ඩේවිඩ් ප්‍රතිමාව **(David),**
මයිකල් /මීකෙල් ආන්ජිලෝ **(Michelangilo)**



රූපය 28 - මෝසස් ප්‍රතිමාව **(Moses),**
මයිකල් /මීකෙල් ආන්ජිලෝ **(Michelangilo)**



රූපය 29 - ඇතන්ස් ගුරුකුලය **(School of Athens),** රෆායල් සන්සියෝ **(Raphael Sanzio)**



රූපය 30 - පර්නාසස් **(Parnassus),** රෆායල් සන්සියෝ **(Raphael Sanzio)**



රූපය 31 - ඇල්බා මැඩෝනා **(Alba Madona),** රෆායල් සන්සියෝ **(Raphael Sanzio)**

# නිපුණතා මට්ටම 6.5



රූපය 32 - හිරු උදාවඃ ධාරණාවක් **(Sunrise;Impression), ක්ලෝඩ් මොනේ (Claude Monet)**




රූපය 33 - වෝටර් ලිලී සහ ජපන් පාලම **(Water Lilies and the Japanese Bridge)**
**ක්ලෝඩ් මොනේ (Claude Monet)**



රූපය 34 - රොවුන් දේවස්ථානයඃ පූර්ණ හිරු එළිය **(Rouen Cathedral; Full Sunlight),** ක්ලෝඩ් මොනේ **(Claude Monet)**



රූපය 35 - නැටුම් පන්තිය **(The Dance Class),** එඩ්ගා ඩෙගා **(Edgar Degas)**



රූපය 36 - නාන බේසම **(The Tub),** එඩ්ගා ඩෙගා **(Edgar Degas)**



රූපය 37 - හිස පීරන ස්ත්‍රිය **(Women Combing Her Hair),** එඩ්ගා ඩෙගා **(Edgar Degas)**



රූපය 38 - නිල් කාමරය **(The Blue Room)**, මේරි කසාට් **(Mary Cassat)**



රූපය 39 -
හිස කෙස් සකසන ගැහැනු ළමයා
**(Girl Arranging her Hair),**
මේරි කසාට් **(Mary Cassat)**



රූපය 40 - ස්නානය **(The Bath)**, මේරි කසාට් **(Mary Cassat)**




රූපය 41 - අර්තාපල් බුදින්නෝ **(The Potato Eaters)**, වින්සන්ට් වැන්ගෝ **(Vincent Van Gogh)**




රූපය 42 - තරු පිරි රැය **(The Starry Night)**, වින්සන්ට් වැන්ගෝ **(Vincent Van Gogh)**




රූපය 43 - පුටුව **(Vincent's Chair),** වින්සන්ට් වැන්ගෝ **(Vincent Van Gogh)**



රූපය 44 - කහ පැහැති ක්‍රිස්තුන් වහන්සේ **(The Yellow Christ),**
පෝල් ගොගැන් **(Paul Gauguin)**



රූපය 45 - දෙවියන්ගේ දිනය **(The Day of the God),** පෝල් ගොගැන් **(Paul Gauguin)**




රූපය 46 - අප එන්නේ කොහි සිට ද?, අපි කවුරු ද?, අප යන්නේ කොහාට ද? **(Where do we come from? What are we? Where are we going?),** පෝල් ගොගැන් **(Paul Gauguin)**



රූපය 47 - කාඩ් සෙල්ලම් කරන්නෝ **(The Card Players),** පෝල් සෙසාන් **(Paul Cezanne)**



රූපය 48 - ඇපල් වට්ටිය **(The Basket of Apple),** පෝල් සෙසාන් **(Paul Cezanne)**



රූපය 49 - ඉරිතැළුණු බිත්ති සහිත නිවස **(The House with the Cracked Walls),**
**පෝල් සෙසාන් (Paul Cezanne)**

# නිපුණතා මට්ටම 6.6



රූපය 50 - අවිග්නොන්හි යුවතියෝ **(The Maids of Avignon /Les Demoiselles d' Avignon),**
පැබ්ලෝ පිකාසෝ **(Pablo Picasso)**



රූපය 51 - ගුවර්නිකා **(Guernica),** පැබ්ලෝ පිකාසෝ **(Pablo Picasso)**



රූපය 52 - වැලපෙන කත **(The Weeping Woman),** පැබ්ලෝ පිකාසෝ **(Pablo Picasso)**



රූපය 53 - නිවාස සහ ගස් **(Houses and Trees)**, ජෝර්ජස් බ්‍රාක් **(Georges Braque)**



රූපය 54 - ගිටාරයක් සහිත මිනිසා **(Man with a Guitar)**, ජෝර්ජස් බ්‍රාක් **(Georges Braque)**




රූපය 55 - පාදම සහිත මේසය **(Pedestal Table)**, ජෝර්ජස් බ්‍රාක් **(Georges Braque)**

## නිපුණතාව 7.0

**දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදායන්හි අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.**


# නිපුණතා මට්ටම 7.1




රූපය 56 - තන්තිරිමලේ ඇති සිතුවම් සහිත ගුහාවක්



රූපය 57 - දුනුවායා,
තන්තිරිමලේ ගුහා සිතුවම්




රූපය 58 - සතෙකුගේ පිට මත මිනිසා,
තන්තිරිමලේ ගුහා සිතුවම්




රූපය 59 - තිත් මුවකු පිටුපස සිටින මිනිසා,
තන්තිරිමලේ ගුහා සිතුවම්



රූපය 60 -
විවිධ සංකේත,
තන්තිරිමලේ ගුහා සිතුවම්



රූපය 61 - දොරවක්කන්ද (දොරවක) ලෙන



රූපය 62 - මාළුවා සහ මිනිස් රුව, දොරවක ලෙන




රූපය 63 - ඇතා සහ පැටවා, දොරවක ලෙන



රූපය 64 - මානව රූපයක්, දොරවක ලෙන



රූපය 65 - උත්කීරණය කරන ලද විවිධ රූප, දොරවක ලෙන



රූපය 66 - බිල්ලෑව ගුහාව



රූපය 67 - ගොනෙකුගේ රූපයක්, බිල්ලෑව ගුහාව



රූපය 68 - ජ්‍යාමිතික හැඩයෙන් යුත් මානව සහ සත්ව රූප, බිල්ලෑව ගුහාව





රූපය 70 - සංකීර්ණ වෘත්තාකාර හැඩ, වෙට්ටම්බුගල ගුහාව

රූපය 69 - වෙට්ටම්බුගල ගුහාව





රූපය 71 -
මානව රූප දෙකක්,
වෙට්ටම්බුගල ගුහාව

රූපය 72 -
අලි ඇත්තු සමූහයක්,
වෙට්ටම්බුගල ගුහාව



රූපය 73 - ඇතා, වෙට්ටම්බුගල ගුහාව



රූපය 74 -
දුන්න සහ ඊතලය,
වෙට්ටම්බුගල ගුහාව

# නිපුණතා මට්ටම 7.2



රූපය 75 - ලැස්කෝ ගුහාව, ප්‍රංශය **(Main hall - Lascaux, France)**



රූපය 76 - අශ්වයා **(Hourse with arrow, Lascaux - France)**



රූපය 77 - මුවා **(Engraved deer, Lascaux-France)**



රූපය 78 - බයිසන් ගව රූප **(Crossed bison, Lascaux - France)**



රූපය 79 - කළු හිස සහිත එළදෙන **(Black headed cow, Lascaux - France)**



රූපය 80 - කඟවේනා **(Unicorn, Lascaux - France)**



රූපය 83 -
කුරුළු හිසක් සහිත මිනිසා
**(Man with a bird's head, Lascaux - France)**



රූපය 81 - ගොනුන් සහ මුවන් **(Aurochs and deers, Lascaux - France)**



රූපය 82 - යටි රැවුළ සහිත අශ්වයා **(Engraved bearded horse, Lascaux - France)**



රූපය 84 - අල්ටමීරා ගුහාව, ස්පාඤ්ඤය **(Altamira, Spain)**



රූපය 85 -
බයිසන් ගවයා
**(Bison, Altamira - France)**



රූපය 86 - බයිසන් ගවයා/ තුවාලලත් බයිසන්
**(Bison, Altamira - France)**



රූපය 87 - මුව දෙන
**(Hind, Altamira - Spain)**



රූපය 88 -
වල් ඌරා
**(Wild boar, Altamira - Spain)**



රූපය 89 -
අත් සලකුණු -සෘණ ඵලක
**(Negative hand print, Altamira - Spain)**



රූපය 90 -
අත් සලකුණු - ධන ඵලක
**(Positive hand print, Altamira - Spain)**



රූපය 91 - සංකේත
**(Sign, Altamira - Spain)**



රූපය 92 - චෝවේ/ ෂොවේ ගුහා සංකීර්ණයේ කොටසක්, ප්‍රංශය
**(Chauvet, France)**



රූපය 93 - කුඩා ළමයකුගේ යැයි සැලකෙන අඩි සලකුණ
**(Chauvet, France)**



රූපය 94 - අශ්ව රූප **(Chauvet, France)**



රූපය 95 - රයිනෝසිරස් රූප **(Chauvet, France)**



රූපය 96 - මැමත් රූප **(Chauvet, France)**



රූපය 97 - සිංහ රූප **(Chauvet, France)**




රූපය 98 - පිණි මුවන් **(Chauvet, France)**




රූපය 99 - ගුහා වලසා **(Chauvet, France)**



රූපය 100 - අඳුන් දිවියා **(Chauvet, France)**



රූපය 101 - අත් සලකුණු **(Chavet, France)**




රූපය 102 - ෆොන්ඩ් ගෝම් ගුහාව, ප්‍රංශය **(Font de Gaume, France)**



රූපය 103 - බයිසන් සහ මුවන් **(Font de Gaume, France)**




රූපය 104 - කළු අශ්වයා **(Font de Gaume, France)**



රූපය 105 - බයිසන් රූප **(Font de Gaume, France)**



රූපය 106 - බයිසන් **(Font de Gaume, France)**



රූපය 107 - පිනි මුවන් **(Font de Gaume, France)**

# නිපුණතා මට්ටම 7.3



රූපය 108 - ථූපාරාම දාගැබ, අනුරාධපුරය



රූපය 109 - රුවන්වැලි මහා සෑය, අනුරාධපුරය



රූපය 110 - අභයගිරි දාගැබ, අනුරාධපුරය



රූපය 111 - ජේතවනාරාම දාගැබ, අනුරාධපුරය



රූපය 112 - රන්කොත් වෙහෙර, පොළොන්නරුව



රූපය 113 - කිරි වෙහෙර, පොලොන්නරුව



රූපය 114 - හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ ස්තූපය, හඟුරන්කෙත


# නිපුණතා මට්ටම 7.4



රූපය 115 - ආසනඝරය, පුලුකුනාව ආසනඝරය, ත්‍රිකුණාමලය



රූපය 116 - බෝධිඝරය, නිල්ලක්ගම බෝධිඝරය, කුරුණෑගල



රූපය 117 - පධානඝරය, පශ්චිමාරාමය, අනුරාධපුරය



රූපය 118 - උපෝසථඝරය, අනුරාධපුර ලෝවා මහා පාය, අනුරාධපුරය



**රූපය 119 - ජන්තාඝරය, අරන්කැලේ**

# නිපුණතා මට්ටම 7.5



රූපය 120 - වාහල්කඩ, මිහින්තලේ කණ්ඨක චෛත්‍ය



රූපය 121 - සඳකඩපහණ, අනුරාධපුර බිසෝ මාළිගය



රූපය 122 - සඳකඩපහණ, පොලොන්නරුව වටදා ගෙය



රූපය 123 - සඳකඩපහණ, මහනුවර දළදා මාළිගය



රූපය 124 - මුරගල, අනුරාධපුර රත්න ප්‍රාසාදය



රූපය 125 - කොරවක්ගල, අනුරාධපුර රත්න ප්‍රාසාදය



රූපය 126 - පියගැට පෙළ, අනුරාධපුර බිසෝ මාළිගය



රූපය 127 - පුන් කලස්, අනුරාධපුර කුට්ටම් පොකුණ

# නිපුණතා මට්ටම 7.6



රූපය 128 - තිවංක පිළිම ගෙය, පොලොන්නරුව



රූපය 129 - ථූපාරාම පිළිම ගෙය, පොලොන්නරුව




රූපය 130 - ලංකාතිලක පිළිම ගෙය, පොළොන්නරුව



රූපය 131 - ශිව දේවාලය අංක 01, පොළොන්නරුව



රූපය 132 - ශිව දේවාලය අංක 02, පොලොන්නරුව



රූපය 133 - විජයොත්පාය (වෛජයන්ති ප්‍රාසාදය), පොලොන්නරුව



රූපය 134 - නිශ්ශංක ලතා මණ්ඩපය, පොළොන්නරුව



රූපය 135 - පොළොන්නරුව වටදා ගෙය



රූපය 136 - තිරියාය වටදා ගෙය



රූපය 137 - මැදිරිගිරිය වටදා ගෙය



රූපය 138 - කුට්ටම් පොකුණ, අනුරාධපුරය



රූපය 139 - කුමාර පොකුණ, පොළොන්නරුව



රූපය 140 - නෙළුම් පොකුණ, පොලොන්නරුව



රූපය 141 - රන්මසු උයනේ පොකුණ, පොලොන්නරුව

# නිපුණතා මට්ටම 7.7



රූපය 142 - පෙම් යුවළ කැටයම, ඉසුරුමුණිය



රූපය 143 - මිනිසා සහ අශ්ව හිස කැටයම, ඉසුරුමුණිය



රූපය 144 - රජ පවුල කැටයම, ඉසුරුමුණිය



රූපය 145 - ජල ක්‍රීඩා කරන ඇත්තු, ඉසුරුමුණිය

# නිපුණතා මට්ටම 7.8



රූපය 146 - මහඉලුප්පල්ලම බුදු පිළිමය



රූපය 147 - සමාධි බුද්ධ ප්‍රතිමාව (මහමෙවුනා උයන), අනුරාධපුරය



රූපය 148 - තොළුවිල බුද්ධ ප්‍රතිමාව





රූපය 149 - පන්කුලිය බුද්ධ ප්‍රතිමාව, අනුරාධපුරය




රූපය 150 - අවුකන බුද්ධ ප්‍රතිමාව

# නිපුණතා මට්ටම 7.9




රූපය 151 - ගල් විහාරයේ හිටි පිළිමය, පොලොන්නරුව



රූපය 152 - ගල් විහාරයේ වැඩහිඳින පිළිමය (තොරණ සහිත), පොළොන්නරුව




රූපය 153 - ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ වැඩහිඳින පිළිමය (ඡත්‍රය සහිත), පොළොන්නරුව



රූපය 154 - ගල් විහාරයේ සැතපෙන පිළිමය, පොලොන්නරුව



රූපය 155 - පොලොන්නරුවේ වටදා ගේ බුද්ධ ප්‍රතිමා




රූපය 156 - පොත්ගුල් විහාර ප්‍රතිමාව, පොළොන්නරුව



රූපය 157 - ගඩලාදෙණිය හිඳි බුද්ධ ප්‍රතිමාව



රූපය 158 - ලංකාතිලක හිඳි බුද්ධ ප්‍රතිමාව



රූපය 159 - දඹුල්ල රාජ මහා විහාරයේ බුද්ධ ප්‍රතිමා

# නිපුණතා මට්ටම 7.10




රූපය 160 - අර්ධනාරී නටේශ්වර ප්‍රතිමාව



රූපය 161 - අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාව



රූපය 162 - මාලා තාරා ප්‍රතිමාව



රූපය 163 - දැදිගම කොට වෙහෙර ඇත් පහණ



රූපය 164 - නටරාජ මූර්තිය



රූපය 165 - ශිව සෝමස්කන්ධමූර්ති

# නිපුණතා මට්ටම 7.11



රූපය 166 - සීගිරි සිතුවම්



රූපය 167 - හිඳගල සිතුවම්



රූපය 168 - ගොනාගොල්ල සිතුවම්




රූපය 169 - මහියංගණය සෑයේ ධාතු ගර්භයේ සිතුවම්












(අ) දේවාරාධනය
(ආ) බුදු රජාණන් වහන්සේ සංකස්ස නුවරට වැඩම කිරීම
(ඇ) චුල්ල පදුම ජාතකය


රූපය 170 - පොලොන්නරුවේ තිවංක පිළිම ගේ සිතුවම්



රූපය 171 - පොලොන්නරුවේ ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ සිතුවම්



රූපය 172 - දිඹුලාගල මාරා වීදිය සිතුවම්




(අ) ඇලි ඇත්තු දන් දීම - වෙස්සන්තර ජාතකය





(ආ) මාර යුද්ධය

රූපය 173 - දෙගල්දොරුව රාජ මහා විහාරයේ සිතුවම්, මහනුවර



(අ) දෙදරුවන් දන් දීම - වෙස්සන්තර ජාතකය



(ආ) පණිවුඩය - උරග ජාතකය

රූපය 174 - මැදවල ටැම්පිට විහාරයේ සිතුවම්, මහනුවර



(අ) මාර පරාජය



(ආ) අනෝතත්ත විල

**රූපය 175 - දඹුල්ල ලෙන් විහාරයේ සිතුවම්**



(අ) මහාධන සිටුවරයාගේ කථාව - සංගීතය හා විනෝද වීම



(ආ) මහාධන සිටුවරයාගේ කථාව - නැට්ටුවා සහ බෙරකරු



(ඇ) වෙස්සන්තර ජාතකය - වෙස්සන්තර කිරි මව්වරුන්ට තෑගි දීම

රූපය 176 - කතළුවේ පූර්වාරාමයේ සිතුවම්, ගාල්ල



(අ) තේලපත්ත ජාතකය - ශ්‍රවණේන්ද්‍රිය ආකර්ෂණය කරයි



(ආ) සිවි ජාතකය - රාජකීය පෙරහැරේ සංගීතකරුවෝ



(ඇ) සිවි ජාතකය - අරිට්ඨපුර සිවි රජතුමා

රූපය 177 - මුල්කිරිගල විහාරයේ සිතුවම්, හම්බන්තොට



(අ) වප් මඟුල සහ සිදුහත් කුමරුගේ ප්‍රථම ධ්‍යානය



(ආ) මහාජනක ජාතකය - විදේහයෙහි රජකමට පත් කර ගැනීම




(ඇ) කට්ඨහාරි ජාතකය - මාළිගාව තුළ සිටින බරණැස් රජතුමා

රූපය 178 - කරගම්පිටිය සුබෝධාරාමයේ සිතුවම්, කොළඹ



(අ) දහම්සොඬ ජාතකය (ධම්මසොන්ඩ කථාව) - පරිත්‍යාගය සහ ප්‍රතිවිපාකය



(ආ) චුල්ල ධර්මපාල ජාතකය - ඊර්ෂ්‍යාපරවශ රජ

රූපය 179 - තෙල්වත්ත රාජ මහා විහාරයේ සිතුවම්, ගාල්ල

# නිපුණතා මට්ටම 7.12



(අ) නාන තටාකය/ ජල තටාකය



(ආ) නිවාස



(ඇ) ජල ටැංකියක්



(ඈ) ජලාපවහන කාණුවක්



(ඉ) ළිඳක්

රූපය 180 - වාස්තු විද්‍යා නිර්මාණ, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය



(අ) රතු වැලි ගලින් කළ  කවන්ධ මිනිස් රූපය







(ආ) අළු වැලි ගලින් කළ කවන්ධ මිනිස් රූපය

රූපය 181 - කවන්ධ රූප, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය



රූපය 182 - නළඟන රූපය, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය




රූපය 183 - පූජක රූපය, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය



රූපය 184 - මවු දෙවඟන රූප, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය



රූපය 185 - යෝගාසන දේව රූපය සහිත මුද්‍රාව,
ඉන්දු නිම්න ශිෂ්ටාචාරය




රූපය 186 - රුක් දෙවියෝ ( දෙවියා, ශ්‍රාවකයින් සහ එළුවා) සහිත මුද්‍රාව, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය



රූපය 187 - ව්‍යාඝ්‍රයින්/කොටියන් දෙදෙනෙකු සමඟ සටන් කරන මිනිසා සහිත මුද්‍රාව, ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

# නිපුණතා මට්ටම 7.13





රූපය 188 - සාංචි ස්තූපය, ඉන්දීය මෞර්ය කලාව



රූපය 189 - ලෞරියා නන්දන්ගර් ස්තම්භය, ඉන්දීය මෞර්ය කලාව



**රූපය 190 - සාරානාත් ස්තම්භ ශීර්ෂය, ඉන්දීය මෞර්ය කලාව**



රූපය 191 - රාම්පූර්වා ස්තම්භ ශීර්ෂය, ඉන්දීය මෞර්ය කලාව

# නිපුණතා මට්ටම 7.14



(අ) නැගෙනහිර තොරණ කැටයම් - සාංචි තොරණ, ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණ



(ආ) බටහිර තොරණ කැටයම් - සාංචි තොරණ, ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණ

රූපය 192 - සාංචි තොරණ කැටයම්, ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණ



(ඇ) උතුරු තොරණ කැටයම් - සාංචි තොරණ, ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණ



(ඈ) දකුණු තොරණ කැටයම් - සාංචි තොරණ, ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණ

රූපය 193 - සාංචි තොරණ කැටයම්, ඉන්දීය සාතවාහන යුගයේ කලා නිර්මාණ









(අ) මහාමායා දේවියගේ සිහිනය, භාරුත් කැටයම්



(ආ) රුරු මිග ජාතකය, භාරුත් කැටයම්



(ඇ) මහාකපි ජාතකය, භාරුත් කැටයම්



(ඈ) අනේපිඩු සිටුතුමා ජේතවනාරාමය පූජා කිරීම, භාරුත් කැටයම්

රූපය 194 - භාරුත් ගල්වැට කැටයම්, ඉන්දීය ශුංග යුගයේ කලා නිර්මාණ

# නිපුණතා මට්ටම 7.15




රූපය 195 - කණිෂ්ක රජුගේ කාසිය



රූපය 196 - හෝර්ට් මන්දාර් බුදු පිළිමය, ගන්ධාර කලාව



රූපය 197 - බ්‍රෙගම් පිළිමය, ගන්ධාර කලාව



රූපය 198 - තක්තිබහීර් පිළිමය, ගන්ධාර කලාව



රූපය 199 - සහරි බහ්ලොල් පිළිමය, ගන්ධාර කලාව



රූපය 200 - දුෂ්කර ක්‍රියාව පිළිමය, ගන්ධාර කලාව



රූපය 201 - කත්‍රා බුදු පිළිමය, මථුරා කලාව



රූපය 202 - කණිෂ්ක රුව, මථුරා කලාව

# නිපුණතා මට්ටම 7.16



රූපය 203 - මහාමායා සිහිනය, අමරාවතී කැටයම්



රූපය 204 - රාහුල කුමරු දායාද ඉල්ලීම, අමරාවතී කැටයම්



රූපය 205 - නාලාගිරි දමනය, අමරාවතී කැටයම්



රූපය 206 - අභිනිෂ්ක්‍රමණය, අමරාවතී කැටයම්




රූපය 207 - බුද්ධ රූපය ඇතුළත් කැටයම් පුවරුවක් (අභිනිෂ්ක්‍රමණය, බුද්ධත්වය, දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව සහ පරිනිර්වාණය), අමරාවතී කැටයම්

# නිපුණතා මට්ටම 7.17



රූපය 208 - මථුරා හිටි බුදු පිළිමය, ගුප්ත කලා සම්ප්‍රදාය



රූපය 209 - සාරානාත් හිඳි බුදු පිළිමය, ගුප්ත කලා සම්ප්‍රදාය


# නිපුණතා මට්ටම 7.18



රූපය 210 - පද්මපාණී බෝසත් රුව, අජන්තා චිත්‍ර



රූපය 211 - අප්සරා රූව, අජන්තා චිත්‍ර




රූපය 212 - මරණාසන්න කුමරිය, අජන්තා චිත්‍ර



රූපය 213 - සීහළාවදානය, අජන්තා චිත්‍ර



රූපය 214 - බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම, අජන්තා චිත්‍ර



රූපය 215 - ඡද්දන්ත ජාතකය, අජන්තා චිත්‍ර

# නිපුණතා මට්ටම 7.19



රූපය 216 - කුෆු (චියොප්ස්) පිරමීඩය **(Pyramid of Khufu /Cheops),** ඊජිප්තුව



රූපය 217 - කාෆ්රේ පිරමීඩය **(Pyramid of Khafre),** ඊජිප්තුව





රූපය 218 - අබුසිම්බල් දේවස්ථානය **(Temple of Abu Simbel),** ඊජිප්තුව





රූපය 219 - ලුක්සෝර්/ ලක්සෝර් දේවස්ථානය **(Temple of Luxor),** ඊජිප්තුව


# නිපුණතා මට්ටම 7.20



රූපය 220 - නර්මේර්/නාමර් ඵලකය **(Pallet of King Narmer),** ඊජිප්තුව



රූපය 221 - මෙන්කුරේ රජු සහ ඔහුගේ බිරිය **(King Menkaure and his wife, queen Khamererernebty),** ඊජිප්තුව




රූපය 222 - ස්ක්‍රයිබ් ප්‍රතිමාව **(The Seated Scribe)**, ඊජිප්තුව



රූපය 223 - නෙෆර්ටිටි උඩුකය මූර්තිය **(The Bust of Nefertiti)**, ඊජිප්තුව

# නිපුණතා මට්ටම 7.21



රූපය 224 - කුරුලු දඩයම (Fawling Scene), ඊජිප්තුව



රූපය 225 - මීඩම්හි පාත්තයෝ **(Geese of Meidum)**, ඊජිප්තුව



රූපය 226 - නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ **(Musicians and Dancers)**, ඊජිප්තුව

# නිපුණතා මට්ටම 7.22



රූපය 227 - පාතිනොන් දේවස්ථානය **(The Parthenon Temple),** ග්‍රීසිය



**ඩොරික් (Doric)** **අයොනික් (Ionic)** **කොරින්තියන් (Corinthian)**

රූපය 228 - ග්‍රීක ස්තම්භ **(Greek Columns),** ග්‍රීසිය



රූපය 229 - ඩොරික් ස්තම්භ **(Doric Columns)**, ග්‍රීසිය



රූපය 230 - අයොනික් ස්තම්භ **(Ionic Columns)**, ග්‍රීසිය



රූපය 231 - කොරින්තියානු ස්තම්භ **(Corinthian Columns)**, ග්‍රීසිය

# නිපුණතා මට්ටම 7.23





රූපය 232 - කාලරූපී මැටි බඳුන් **(Black - figure pottery)**, ග්‍රීසිය





රූපය 233 - රක්තරූපී මැටි බඳුන් **(Red - figure pottery)**, ග්‍රීසිය

# නිපුණතා මට්ටම 7.24



කුරොස් (Kouros)



කෝරේ (Kore)

රූපය 234 - කුරොස් සහ කෝරේ මූර්ති (Kouros and Kore), ග්‍රීසිය



රූපය 235 - කවපෙත්ත විසි කරන්නා **(Discobolus),** ග්‍රීසිය



**රූපය 236 - හෙල්ල දරා සිටින්නා (ඩොරිෆරස් - Doryphoros), ග්‍රීසිය**







රූපය 237 - හර්මීස් සහ ඩයොනිසස් **(Hermes and the Infant Dionysus),** ග්‍රීසිය



රූපය 238 - ලැඕකුන් **(Laocoon),** ග්‍රීසිය



රූපය 239 - සාමෝත්‍රාස්හි විජයග්‍රහණයේ දෙවඟන **(Winged Victory of Samothrace / Nike),**
ග්‍රීසිය



රූපය 240 - මිය යන ගෝල්වරයා **(The dying Galatian/Gaul)**, ග්‍රීසිය

# අතිරේක කියවීම් සඳහා ග්‍රන්ථ නාමාවලිය


කුමාරස්වාමි, ආනන්ද. (1994). *මධ්‍යකාලීන සිංහල කලාව,* කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

ගොඩකුඹුරේ, චාල්ස්. (1981). *පනාවිටියේ අම්බලමේ කැටයම්*, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, සමයවර්ධන ප්‍රින්ටර්ස්.

ගොඩකුඹුරේ, චාල්ස්. (1982). *මුරගල*, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

ගොඩකුඹුරේ, චාල්ස්. (1982). *තිවංක පිළිම ගෙයි බිතු සිතුවම්,* පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

ගොඩකුඹුරේ, චාල්ස්. (1982). *සඳකඩපහණ*, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

ගොඩකුඹුරේ, චාල්ස්. (1982). *පොළොන්නරුවේ ලෝකඩ රූප*, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

ගොඩකුඹුරේ, චාල්ස්. (1984). *බුදු පිළිම,* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වනරතන හිමි. කඹුරුපිටියේ. (1983). *ලක්දිව බුදු පිළිම,* සීමාසහිත මාතර වෙළෙන්දෝ.

චාල්ස්, එස්. පී. (2000). *පැරණි බිතුසිතුවම්*, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1995). *අනුරාධපුර පූජනීය හා රාජකීය ස්ථාන*, කොළඹ: ශ්‍රී දේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1995). *ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු*, කොළඹ: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1998). *ගල් විහාරයේ කලාව හා වාස්තු විද්‍යාව*, කොළඹ: ශ්‍රී දේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (2001). *අටමස්ථාන*, කොළඹ: තරංජි ප්‍රින්ටර්ස්.

විජේසේකර, නන්දදේව. (1990). *මූර්ති කලාව*, සංස්කරණය, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර, නන්දදේව. (1970). *පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය*, කොළඹ: ගුණසේන සමාගම.

චූටිවොන්ග්ස්, නන්දන හා තවත් අය. (1990). *ශ්‍රී ලංකාවේ බිතු සිතුවම්-මැදවල*, මධ්‍යම සංස්කෘතික අරමුදල,කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

චූටිවොන්ග්ස්, නන්දන හා තවත් අය. (1990). *ශ්‍රී ලංකාවේ බිතු සිතුවම්-දෙගල්දොරුව*, මධ්‍යම සංස්කෘතික අරමුදල,කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

චූටිවොන්ග්ස්, නන්දන හා තවත් අය. (1990). *ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් දඹුල්ල,* මධ්‍යම සංස්කෘතික අරමුදල,කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

චූටිවොන්ග්ස්, නන්දන හා තවත් අය. (2004). *ශ්‍රී ලංකාවේ මූර්ති-බුද්ධ*, මධ්‍යම සංස්කෘතික අරමුදල,කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

චූටිවොන්ග්ස්, නන්දන හා තවත් අය. (1990). *ශ්‍රී ලංකාවේ බිතු සිතුවම්-කතළුව*, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

චූටිවොන්ග්ස්, නන්දන හා තවත් අය. (1990). *ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් කරගම්පිටිය,* මධ්‍යම සංස්කෘතික අරමුදල,කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

පරණවිතාන, එස්. (1963). *ශ්‍රී ලංකාවේ ස්තූප: v වැනි කාණ්ඩය*, කොළඹ: ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය.

පරණවිතාන, එස්. (1995). *පුරා විද්‍යා සඟරාව*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, ප්‍රියශාන්ත. (2005). *පෞරාණික ස්ථාන හා ස්මාරක*, කොළඹ: පුරා විද්‍යා දෙපාර්තමේන්තුව.

දයානන්ද, චාල්ස්. (2002). *සෝලියස් මැන්දිස්: කැලණි විහාර බිතු සිතුවම්*, සොලියස් මැන්දිස් සංස්කෘතික පදනම.

දිසානායක, ජේ. බී. (1996). *රටක මහිම (දෙගල්දොරුව),* කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම.

ධර්මසිරි, ඇල්බට්. (2013). *බෙල්ලන්විල බිතු සිතුවම්*, කොළඹ: සරසවි ප්‍රකාශකයෝ.

බෂාම්, ඒ. එල්. (1995). *අසිරිමත් ඉන්දියාව*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බණ්ඩාරනායක, සේනක. (1970). *සඳකඩපහණ සහ වෙනත් ලිපි*, කොළඹ: ඇම්.ඩී.ගුනසේන සහ සමාගම.

බස්නායක, එච්. ටී. (1998). *පුරාතන ඉන්දීය ශිෂ්ටාචාරය*, කොළඹ: ගුණසේන සමාගම.

ලක්දුසිංහ, සිරිනිමල්. (1990). *මහනුවර සමය,* නන්දදේව විජේසේකර සංස්., චිත්‍ර කලාව, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර, නන්දදේව. (1990). *චිත්‍ර කලාව*, සංස්කරණය, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර, නන්දදේව. (1964). *පැරණි සිංහල බිතුසිතුවම්*, කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

වීරසිංහ, ජගත්. (2006). *උපස්ථිතිවාදය හෙවත් මහත්වරුන්ගේ කලාව*, නුගේගොඩ: තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව.

සමරසිංහ, එස්. ජී. (1999). *ශ්‍රී ලංකා කලා සංගමයේ කලා සඟරාව*, කොළඹ: සමයවර්ධන ප්‍රින්ටර්ස්.

සිරිසේන, සිහිල් ඇම්. (1992). *හෙළ කලා පුවත*, මහරගම: සතර ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ.

සෙනෙවිරත්න, අනුරාධ. (1966). *ලක්දිව වටදා ගේ*, කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුනසේන සහ සමාගම.

සෙනෙවිරත්න, අනුරාධ. (1995). *අනුරාධපුරය*, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න, අනුරාධ. (1998). *පොළොන්නරුව,* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න, අනුරාධ. (2013). *කන්ද උඩරට: මහනුවර,* කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

සෝමතිලක, එම්. (2004). *පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමානන්ද, ටී. කුලසූරිය, ඒ. ගුණරත්න, ඊ. එම්. (1991). *ශ්‍රී ලංකා කලා සංගමයේ තෛමාසික කලා සඟරාව*, 36වන කලාපය, ශ්‍රී ලංකා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, මහරගම: තරංග ප්‍රින්ටර්ස්.

සෝමානන්ද, ටී. කුලසූරිය, ඒ. ගුණරත්න, ඊ. එම්. (1992). *ශ්‍රී ලංකා කලා සංගමයේ තෛමාසික කලා සඟරාව*, 4වන කලාපය, ශ්‍රී ලංකා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, දෙහිවල: ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.

සෝමානන්ද, ටී. කුලසූරිය, ඒ. ගුණරත්න, ඩී. එම්. (1992). *ශ්‍රී ලංකා කලා සංගමයේ තෛමාසික කලා සඟරාව*, ශ්‍රී ලංකා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, මහරගම: තරංග ප්‍රින්ටර්ස්.

සෝමානන්ද, ටී. කුලසූරිය, ඒ. ගුණරත්න, ඩී. එම්. (1991). *ශ්‍රී ලංකා කලා සංගමයේ තෛමාසික කලා සඟරාව*, 36වන කලාපය, ශ්‍රී ලංකා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, දෙහිවල.

Adams, Laurie Schneider. (2008). *A History of western Art*, John Jay College and the Graduate Center, New York: City University of Newyork, McGraw-Hill.

Bandaranayaka, Senaka. (1986). *The Rock and Wall painting of Sri Lanka*, Colombo: Lakehouse.

Bronze from Ceylon, (1986). *Bronze from Ceylon,* Colombo: National musium.

Dharmasiri, Albert. (1988). *Modern Art in Sri Lanka,* Colombo: Lakehouse.

Janson, H.W (2011). *History of Art: The Western Tradition*, London: laurence King Publishing Ltd.

Paranavithana, Senarath. (1971). *Art of Ancient Sinhales*, Maharagama: Visudunu Prakashakayo.

Premathilaka, Lilananda. (1986). *Sri Lankan Bronzes*, Colombo: National musium.

Premathilaka, Lilananda. (1995). *The Heritage of Sri Lanken Bronze Sculpture,* lilananda Premathilaka, Colombo: National musium.

Rathus, Lois Fichner. (2004). *Undestanding Arts*, USA, Thomson Wordsworth.

Sholder, Von. (1992). *Buddhist Sculpture of Sri Lanka*, Hongkong.

Sholder, Von. (1992). *The Golden Age of Sculpture in Sri Lanka*, Hongkong.

Somadeva, Raj. (2012). *Rock Painting and Engraving Sites in Sri Lanka*, Colombo: PGIAR-Publication.

Turner, J. (1996). *The Dictionary of Art*, London: Macmillan Publisher Limited.